
321 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 321 - இல. 07
Volume 321 - No. 07

2025 සැප්තැම්බර් 25 වන බ්‍රහස්පතින්දා
2025 செப்ரெம்பர் 25, வியாழக்கிழமை
Thursday, 25th September, 2025



# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 1061]

**නිවේදන:**
ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාව පිළිබඳ තීරණය [තීරුව 1062]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1070]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1072-1111]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
සේවක වැටුප් ගෙවීමේදී පළාත් පාලන ආයතන මුහුණ දෙන ගැටලු [තීරුව 1111]
යෝජිත අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ [තීරුව 1115]

**"නා උයන" ආරණ්‍ය සේනාසනයේ සිදු වූ ඛේදජනක අනතුර:**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1118]

**ආනයන හා අපනයන (පාලන) පනත:**
රෙගුලාසි [තීරු 1120-1219]

**කල්තැබීමේ යෝජනාව:**
යෝජිත විදුලි ගාස්තු අඩු කිරීම [තීරු 1220-1234]


---

# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1061]

**அறிவிப்புகள்:**
பாதுகாப்புப் பிரதி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான தீர்மானம் [ப: 1062]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1070]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1072-1111]

**தனி அறிவித்தல் மூல வினா:**
ஊழியர்களின் சம்பளத்தை வழங்குவதில் உள்ளூராட்சி சபைகள் எதிர்கொள்ளும் பிரச்சினைகள் [ப: 1111]
உத்தேச கல்விப் பாடத்திட்ட மறுசீரமைப்பு [ப: 1115]

**"நா உயன" ஆரண்ய சேனாசனவில் இடம்பெற்ற துயர விபத்து:**
புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1118]

**இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1120-1219 ]

**ஒத்திவைப்புப் பிரேரணை:**
உத்தேச மின் கட்டணத்தைக் குறைத்தல் [ப: 1220-1234 ]


---

# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1061]

ANNOUNCEMENTS:
Ruling on Vote of No-Confidence against Deputy Minister of Defence [Col. 1062]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1070]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1072-1111]

QUESTION BY PRIVATE NOTICE:
Issues Faced by Local Authorities in Paying Employees' Salaries [Col. 1111]
Proposed Education Curricula Reforms [Col. 1115]

TRAGIC ACCIDENT OCCURRED AT "NA UYANA" MONASTERY:
Statement by Minister of Buddhasasana, Religious and Cultural Affairs [Col. 1118]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Cols. 1120-1219]

ADJOURNMENT MOTION:
Reduction of Proposed Electricity Tariff [Cols. 1220-1234]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 සැප්තැම්බර් 25 වන බ්‍රහස්පතින්දා***
*2025 செப்ரெம்பர் 25, வியாழக்கிழமை*
*Thursday, 25th September, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/7/IX/3/01

2025 සැප්තැම්බර් මස 22 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාව පිළිබඳ තීරණය
### பாதுகாப்புப் பிரதி அமைச்சருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான தீர்மானம்
### RULING ON VOTE OF NO-CONFIDENCE AGAINST DEPUTY MINISTER OF DEFENCE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to make this Announcement in furtherance to the Announcement made by me on 10th September, 2025 on the Motion titled the "No-Confidence Motion" submitted by a group of 32 Members of Parliament in the Opposition, including the Hon. Leader of the Opposition, in Parliament on 12th August, 2025 against the Hon. Major General (Rtd.) Aruna Jayasekera, MP and Deputy Minister of Defence.

At the outset, I wish to remind this House of Standing Order No. 76(1), which states that the Speaker in Parliament shall be responsible for the observance of the Rules of Order in Parliament and his/her decision upon any point of Order shall not be open to appeal and shall not be reviewed by Parliament except upon a Substantive Motion made after notice.

However, considering the queries raised in Parliament, I wish to further substantiate the factors highlighted in the previous Announcement for ruling the said Motion out of order.

The 1978 Constitution of Sri Lanka and the Standing Orders of Parliament are silent on moving a No-Confidence Motion against an individual Cabinet Minister, Deputy Minister or any other holder of portfolios. The only existing provision on No-Confidence Motion is Article 49(2) of the Constitution, which provides only to move a No-Confidence Motion against a Government.

However, No-Confidence Motions have been moved against the Prime Minister, individual Ministers of the Cabinet of Ministers, notwithstanding the said silence in the Constitution and the Standing Orders, thus questioning the legal basis of such precedents.

It is noted that in Parliamentary context, the Speaker, the Deputy Speaker, the Deputy Chairman of Committees, the Leader of the House of Parliament, the Chief Government Whip, the Leader of the Opposition and the Chief Opposition Whip are considered Parliamentary office-bearers and that a Substantive Motion of this nature may appropriately be brought against them.

[ගරු කථානායකතුමා]

I wish to emphasize that in the international context, No-Confidence Motions have been allowed only in respect of the Government/Council of Ministers as a whole - Erskine May: "Treatise on the law, Privileges, Proceedings and Usage of Parliament", 25th Edition and M.N. Kaul and S.L. Shakdher, "Practice and Procedure of Parliament", 8th Edition. Further, M.N. Kaul and S.L. Shakdher highlight that a Motion of No-Confidence can be moved only against the Council of Ministers as a whole and not against any individual Minister, as per the Indian constitutional provisions regarding the collective responsibility of the Council of Ministers to the Lok Sabha.

Similarly, Articles 42, 43 and 44 of the Constitution of Sri Lanka provide for the collective and individual ministerial responsibility of the Cabinet of Ministers.

In Sri Lanka, at present, Deputy Ministers have been appointed under Article 46(1) of the Constitution to assist the Ministers of the Cabinet of Ministers. However, the Ministers of the Cabinet of the present Government, acting under Article 46(2) of the Constitution, have not delegated any power or duty pertaining to any subject or function to the Deputy Ministers. Nevertheless, I wish to place on record that the Deputy Ministers function in terms of Standing Order No. 32(2) on behalf of the Ministers in compliance with Article 46(1) of the Constitution read with Article 74 of the Constitution.

Due to aforesaid reasons, I rule that the Motion is out of order in terms of Standing Order No. 27(3).

In the alternative, I wish to note that the incidental criticism of conduct of Members of Parliament or particularly, Members in their capacity as office-holders in the House of Commons including the Speaker is permitted only through a Substantive Motion - Erskine May, "A Treatise upon the Law, Privileges, Proceedings and Usage of Parliament", 25th Edition - and in the UK practice, Censure Motions can be tabled criticizing a Government policy or a Minister. M.N. Kaul and S.L. Shakdher, "Practice and Procedure of Parliament", 8th Edition states that Censure Motions can be moved against the Council of Ministers or an individual Minister or a group of Ministers for their failure to act or not to act or for their policy and may express regret, indignation or surprise of the House at the failure of the Minister or Ministers.

Accordingly, I wish to inform this House to explore the possibility of submitting a Substantive Motion instead of the current Motion in issue, in view of the national importance of the matters relating to the Easter Sunday Attack stated therein and as opined by the Attorney-General, the specific facts in the Motion has no direct bearing to the cases pending before courts.

## II

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2025 සැප්තැම්බර් 25වන බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00 ට කාරක සභා කාමර අංක 2හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ඔබතුමාට අපි භාර දුන් විශ්වාස භංග යෝජනාව පිළිබඳ ඔබතුමා දෙවන වරටත් අද පැහැදිලි කිරීමක් නිවේදනයක් හැටියට මේ සභාවට ඉදිරිපත් කළා. අපි විශේෂයෙන්ම කියන්න අවශ්‍යයි, පළමුවැනි වතාවට තමයි විශ්වාස භංග යෝජනාවක් ප්‍රතික්ෂේප වුණේ කියන එක. පළමුවැනි වතාවට තමයි කථානායකවරයෙකු මේ පිළිබඳ දෙවැනි වරටත් නිවේදන නිකුත් කළේ. අපි ඔබතුමාට ඉතා පැහැදිලිව කිව්වේ මේ ප්‍රතික්ෂේප කරපු කාරණා පිළිබඳව ඔබතුමා උපුටා ගත් ඒ වාර්තා දෙක අපට සභාගත කරන්න කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ ඒ කාරණා ටික,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලුවේ වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහත්මයාගේ නමට එවපු වාර්තාවක් නොවෙයි. ගරු කථානායකතුමා වෙත රාජ්‍ය නිලධාරින් හැටියට ලේකම් මණ්ඩලය වාගේම අධිකරණයට බලපෑමක් තිබෙනවාද කියලා අහලා නීතිපතිතුමාගෙන් ලබා ගත්ත වාර්තාව තමයි අපි ඉල්ලුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ සම්බන්ධයෙන් අද සඳහන් කරලා තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

අනෙක් එක, ඔබතුමා එදා නොකිව්ව කාරණාත් ඇතුළත් කරන්න අවශ්‍ය නිසා වෙන්න ඇති, අදත් නිවේදනයක් ඉදිරිපත් කළේ. ඔබතුමාට තේරෙන්න ඇති, එදා ඔබතුමා කළ නිවේදනය බොහොම දියාරු නිවේදනයක් කියන එක. පැහැදිලිව මේ මොහොතේදීත් මම කියනවා, ඇත්තවශයෙන්ම මම එදා අර්ථ නිරූපණය ආඥාපනතේ 2 (ඇ) වගන්තිය පැහැදිලි කළ බව. ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* මට පොඩ්ඩක් ඉඩ දෙන්න, විනාඩියක්. ඊට පස්සේ ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මෙහෙම දෙයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න. Standing Order No. 76 (1) කියවන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ස්ථාවර නියෝග 76 (1) යටතේ තමයි මමත් කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට බලන්න පුළුවන්, ස්ථාවර නියෝග 76(1)හි මෙසේ සඳහන් වනවා:

> "…..upon any point of order shall not be open to appeal and shall not be reviewed by Parliament except upon a substantive motion made after notice."

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර ඒ විධියට අවශ්‍ය කටයුතු කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, ISir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පළමුවෙනි කරුණ තමයි 76වන ස්ථාවර නියෝගය අනුව ඔබතුමාගේ නියෝගයක් විවාදයට ලක් කරන්න බැහැ. දෙවැනි එක, ගරු මන්ත්‍රීතුමා මතු කළ ඉල්ලීමක් තිබුණා, Attorney-Generalගේ සහ ලේකම් මණ්ඩලයේ ලියවිලි දෙක සභාගත කරන්න කියලා. ඔබතුමා මේ සභාවට කිව්වා නම් හරි, ඔබතුමා ඒවා සභාගත කරනවාද, නැද්ද කියලා. නැත්නම් මේ පිළිබඳව විවාදයක් ඇති කරන්න දෙන්න බැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඒ ලියකියවිලි දෙක මම අද දැන් සභාගත කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ඒ ලියකියවිලි දෙක සභාගත කරනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ලියකියවිලි දෙක සභාගත කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට විනාඩි භාගයක් දෙන්න, මේක කියලා අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විනාඩි භාගය නොවෙයි. ඔබතුමන්ලා ඉල්ලපු ලියකියවිලි දෙක එතුමා සභාගත කරනවා නම්,- *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
සභාගත කරන්න කියලා තමයි අපි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැන් ඒවා සභාගත කරනවා. ඔබතුමන්ලාට ඒවා පරිශීලනය කරන්න පුළුවන්. මා වෙත එවන ලද එම ලේඛන දෙක මම **සභාගත*** කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දැන් ඒවා සභාගත කරලා තිබෙන්නේ. මෙතුමා දැන් ඒක කියනවා නේ.

---

***** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් සභාගත කරලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ලියවිලි දෙක සභාගත- *[බාධා කිරීමක්]* දැන් සභාගත කරලා තිබෙන්නේ. ඉතින්, මොකක්ද තවත් වාද කරන්නේ? ගරු කථානායකතුමා එතුමාගේ Statement එක කරන කොට ඒ ගැන කිව්වා, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඒවාට ඇහුම්කන් දෙන්නේ නැහැ නේ. ඔබතුමන්ලාට පුදුම හදිසියක් නේ තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, Attorney-General විසින් එවන ලද ලිපියත්, ලේකම් මණ්ඩලයෙන් ලබා දුන් පිළිතුරත් මම මීට සුළු මොහොතකට පෙර සභාගත කළා. ඒවා මගේ පරිශීලනය සඳහා තමයි එවලා තිබෙන්නේ. ඒ මත පදනම් වෙලා තමයි මගේ තීරණය දැනුම් දුන්නේ. නමුත්, ඔබතුමන්ලාගේ ඉල්ලීම මත මම ඒවා සභාගත කළා. ඔබතුමන්ලාට දැන් ඒවා බලන්න පුළුවන්. මීළඟට, ලිපි ලේඛනාදිය පිළිගැන්වීම.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මට තත්පර කිහිපයක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ඔබතුමාට පොඩි වෙලාවක් දෙන්නම්. දැන් කියන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ඔබතුමා සභාගත කළේ, පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලය විසින් ඔබතුමාට ලබා දුන් වාර්තාවයි, නීතිපතිතුමා විසින් එවන ලද වාර්තාවයි නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ඇයි, ඒක තේරුණේ නැද්ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
තේරුණේ නැති නිසායි ඇහුවේ. තේරුණේ නැහැ, ඔබතුමාට විතර අපට තේරෙන්නේ නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 76 (1) වගන්තිය මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට වාගේම ගරු කථානායකතුමාටත් අදාළයි. ඔබතුමා එක කරුණක් පිළිබඳව එක් වරක් නියෝගයක් දුන්නා. එම නියෝගය ලබා දුන්නේ මේ මාසයේ 10වැනි දා. එදා විස්තරාත්මක නියෝගයක් දීලා විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කළා. එදා අපි කිව්වා, ඔබතුමා ලබා දුන් නියෝගය සාරගර්භ නැහැ, පදනම් නැහැ, ළමයෙක්ගේ වාගේ කියලා. ඔබතුමා අද දෙවැනි වතාවටත් ඒක ප්‍රතික්ෂේප කරනවා. මේක ඔබතුමාටත් අදාළයි. ඔබතුමා අද ලබා දුන් මේ නියෝගය ස්ථාවර නියෝග 76 (1)ට පටහැනියි. මම ඉල්ලා සිටිනවා, මේ නියෝගය කපා හරින්න කියලා. ඔබතුමාට ඒ සඳහා බලයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක අදාළ නැහැ. ඔබතුමාට අවස්ථාව දුන්නාම, ඔබතුමා තව තවත් කථා කරනවා නේ. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා එදා ඔබතුමාගේ නියෝගය ලබා දුන්නා. එම නියෝගය මත පදනම් වෙලා තවත් විස්තරාත්මකව තොරතුරු ලබා දීම වැදගත් නිසා, මන්ත්‍රීවරුන්ට තවත් මේ ගැන ප්‍රජාතන්ත්‍රවාදීව enlighten කරන්න ඕනෑ නිසා ඔබතුමා තව විස්තරාත්මක වාර්තාවක් ලබා දීලා තිබෙනවා. ඒක පළමුවෙනි නියෝගයට පටහැනි නැහැ. ඒකෙන් පළමුවෙනි නියෝගය තව පැහැදිලි කරනවා.

අනෙක ගරු කථානායකතුමනි, ඔබතුමා බැඳී නැහැ, ඔබතුමාට ලබා දෙන සියලු වාර්තා මෙතැන ඉදිරිපත් කරන්න. ඔබතුමා හෝ කිසිම කථානායකවරයෙක් බැඳී නැහැ. ගරු අනුර බණ්ඩාරනායක - *[බාධා කිරීම්]* නැහැ, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* ඇහුම්කන් දෙන්න. *[බාධා කිරීම්]* ඇහුම්කන් දෙන්න මන්ත්‍රීතුමා. ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමාවත්, මීට කලින් හිටපු කිසිම කථානායකවරයෙක්වත් තමන්ගේ පරිශීලනයට එවපු සියලු documents මෙතැන ඉදිරිපත් කළේ නැහැ. එහෙම කරන්න බැඳී නැහැ. නමුත් ගරු කථානායකතුමනි, ඔබතුමා අද මේක ඉදිරිපත් කළා. ඒක හොඳයි. අපිත් දැන ගන්න කැමැතියි ඒක. නමුත් කථානායක ධුරය මෙතරම් ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරද්දී ඒක හෑල්ලු කරමින්, "ළමයෙක් වාගේ" කියමින් මොකක්ද මේගොල්ලන් කරන්නේ? මොකක්ද මේගොල්ලන්ට වෙලා තිබෙන්නේ? ඔබතුමාගේ තිබෙන නිහතමානීකම නිසා දැන් මේගොල්ලන් ඔබතුමාගේ ඔළුවට උඩින් යන්න හදනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඉතා සවිස්තරානුකූලව වාර්තාවක් ඉදිරිපත් කළා. විපක්ෂයේ සංවිධායකතුමනි, ඔබතුමන්ලා මේවා අධ්‍යයනය කරලා ඒ අනුව කටයුතු කරන්න. සභානායකවරයා වශයෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න කියලා. එහෙම නැතුව පාර්ලිමේන්තුව කෝලම් මඩුවක් කරන්න දෙන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි සභාවේ ඉදිරි වැඩ කටයුතුවලට යොමු වෙමු.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the Annual Report of the University of Vavuniya for the year 2023.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 01.08.2025 to 31.08.2025 in terms of Section 6(1) of the Appropriation Act, No. 3 of 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට point of Order එකක් තිබෙනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් ඔබතුමාගෙන් ලබා ගැනීමට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථාව නැහැ, ගරු විපක්ෂ නායකතුමා. ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා. *[බාධා කිරීමක්]* නැහැ, point of Order එකක් නැතුව කථා කරන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, 2025 අංක 03 දරන පරිපූරක ඇස්තමේන්තුව මම ඉදිරිපත් කරමි.

මෙම පරිපූරක ඇස්තමේන්තුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේකේ මූලික කථාව කියන්න මට විනාඩියක් දෙන්න. Economic crisis එක තිබුණු වෙලාවේ වාහන import කරන එක නවත්වලා තිබුණා. එම නිසා tourism sector එකට අවශ්‍ය වාහන ගෙන්වන්න අවස්ථාවක් ලබා දුන්නා, යම් බදු ව්‍යුහයක් මත. ඒක ඉවත් කරලා දැන් වාහන ගෙනෙන්න පුළුවන් නිසා LCs විවෘත කරපු වාහන 13ක කුඩා ප්‍රමාණයකට අවසර දීම තමයි මේකෙන් සිදු වෙලා තිබෙන්නේ.

ඒකත් එක්ක මම මේ කාරණයත් කියන්න ඕනෑ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරින් අපේ කාරක සභාවට පැමිණිලා විස්තර ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම අපි බොහොම සතුටු වුණා. ඔවුන්ගේ හොඳ වැඩ පිළිවෙළක් තිබෙන බවට අපට පෙනී ගියා. ඒ වාගේ හොඳ දේවල් දකින කොට ඒක කියන්න ඕනෑ කියලා අපි විශ්වාස කළා. එක ප්‍රශ්නයක් තිබෙනවා. Tourism දැන් ගොඩාක් දියුණු වෙලා තිබෙනවා. ඒකට අවශ්‍ය logistics කරන්න වාහන ගෙනෙන්න tourism sector එකේ බොහෝ දෙනා රජයෙන් ඉල්ලීම් කරලා තිබෙනවා. හැබැයි IMF වැඩ පිළිවෙළ යටතේ එහෙම එක එක්කෙනාට tax breaks දෙන්න හැකියාවකුත් නැහැ. හැබැයි, SLTDA එකෙන් TDL කියලා සියයට එකක් එකතු කරනවා. අපි දැන ගත් විධියට, බොහෝ දෙනෙක් ඒ TDL එක ගෙවන්නේ නැහැ. ඒ TDL එක ගෙවන්න පුළුවන් නම් ඒක පාවිච්චි කරලා SLTDA එක හරහා tourism sector එකට IMF ක්‍රමවේදය ඇතුළේ යම්කිසි සහනයක් දෙන්න පුළුවන් කියන එක කාරක සභාව නිරීක්ෂණය කරලා, ඒක අපි ගරු ඇමතිතුමන්ලාගේ අවධානය සඳහා ඉදිරිපත් කරනවා.

බොහොම ස්තුතියි.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පේරාදෙණිය, දොඩම්වලපිටිය, අංක 72/ඊ යන ලිපිනයෙහි පදිංචි ටී.බී.ඒ.සී. කුලතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු කථානායකතුමනි, නල්ලදරන්කට්ටුව, හැලඹවටවන, අංක 131/1 යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ.එම්. රංජිත් සූරියහෙට්ටි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) ගම්පහ, මුදුන්ගොඩ, මැදවත්ත, අංක 1/30 යන ලිපිනයෙහි පදිංචි ඒ.ඒ. රංජනී මෙන්ඩිස් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) රත්නපුර, කොළඹ පාර, අංක 269/1 සී යන ලිපිනයෙහි පදිංචි බී. ඥානවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) බෙලිහුල්ඔය, පඹහින්න, සමනළ මාවත යන ලිපිනයෙහි පදිංචි බී.ආර්. පොඩිමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) මීරිගම, නාවාන, කෙසෙල්කොටුව වත්ත, අංක 38/2 යන ලිපිනයෙහි පදිංචි අයි.කේ. මාලනී විජේරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(5) ලෝලුවාගොඩ, අමරගිරි වත්ත, අංක 1/167 යන ලිපිනයෙහි පදිංචි පී.ඒ.වී.ඩබ්ලිව්. දයානි කුමාරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) වෙයන්ගොඩ, මාළිගාතැන්න, අංක 96/2/2 යන ලිපිනයෙහි පදිංචි එස්.ආර්.එම්.ඒ. ලීලාවතී සමරදිවාකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

Hon. Speaker, I present a petition from Mr. H.G. Ariyawansa of Samara House, Buluwana, Pitabeddara.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මණ්ඩාවල, මාහේන, අංක 130/2බී යන ලිපිනයෙහි පදිංචි අයි.පී. සෝමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගණේමුල්ල, කැන්දලියද්ද පාළුව, අංක 177/3 යන ලිපිනයෙහි පදිංචි ඩබ්.ඩී. මහේන්ද්‍ර උදය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුරුවිට, උඩකඩ වත්ත, අංක 676/ඊ යන ලිපිනයෙහි පදිංචි එස්. නලින් ප්‍රදීප් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුරුවිට, වතු යාය, ශ්‍රී සුමන විද්‍යාල පාර යන ලිපිනයෙහි පදිංචි ටී.බී.ජී. ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -204/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (වැඩබලන විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பதில் அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Acting Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -227/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය, වැඩබලන අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு பதில் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media, Acting Minister of Justice and National Integration and Chief Government Whip)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 - 298/2024 - (1), ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## සමෘද්ධි බැංකුව සහ සමෘද්ධි මහා සංගම්: වත්කම්
## சமுர்த்தி வங்கிகள் மற்றும் சமுர்த்தி மகா சங்கங்கள்: சொத்துகள்
## SAMURDHI BANK AND SAMURDHI GENERAL SOCIETIES: ASSETS

314/2024

**4. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමෘද්ධි බැංකුව සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;
(ii) ශ්‍රී ලංකාවේ තිබෙන සමෘද්ධි බැංකු සංඛ්‍යාව සහ සමෘද්ධි මහා සංගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) සියලු සමෘද්ධි මහා සංගම් සතු වත්කම්වල වර්තමාන වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) සමෘද්ධි බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන්නේද;
(ii) නොඑසේ නම්, එය එකී අධීක්ෂණයෙන් බැහැර කිරීමට හේතු කවරේද;
(iii) සමෘද්ධි බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුව ලැබූ ලාභ/අලාභ වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) පසුගිය වසර 10 තුළ සමෘද්ධි බැංකුවේ ශේෂ පත්‍ර අගය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) සමෘද්ධි බැංකුවේ කොටස් හිමියන් කවුරුන්ද;
(iv) සමෘද්ධි බැංකුව විසින් ගළපන ලද පරිදි, තැන්පතුකරුවන්ට ගෙවන පොලී අනුපාතය සහ ණය ගැනුම්කරුවන්ට ණය දීමේ පොලී අනුපාතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமுர்த்தி வங்கியின் வசமுள்ள சொத்துகளின் தற்போதைய பெறுமதி யாது என்பதையும்;
(ii) இலங்கையிலுள்ள சமுர்த்தி வங்கிகள் மற்றும் சமுர்த்தி மகா சங்கங்களின் எண்ணிக்கை யாது என்பதை வெவ்வேறாகவும்;
(iii) அனைத்து சமுர்த்தி மகா சங்கங்கள் வசமுள்ள சொத்துகளின் தற்போதைய பெறுமதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சமுர்த்தி வங்கிகள் இலங்கை மத்திய வங்கியின் கண்காணிப்பின்கீழ் உள்ளனவா என்பதையும்;
(ii) இல்லையெனின், அதன் கண்காணிப்புக்கு உட்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;
(iii) சமுர்த்தி வங்கியின் பணிப்பாளர் சபையின் தலைவர் யார் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) கடந்த 10 வருடங்களில் சமுர்த்தி வங்கியால் ஈட்டப்பட்ட இலாபம்/நட்டம் யாது என்பதை வெவ்வேறாகவும்;
(ii) கடந்த 10 வருடங்களில் சமுர்த்தி வங்கியின் ஐந்தொகைப் பெறுமதி யாது என்பதை வெவ்வேறாகவும்;
(iii) சமுர்த்தி வங்கியின் பங்குதாரர்கள் யார் என்பதையும்;
(iv) வைப்பாளர்களுக்குச் செலுத்தப்பட்ட வட்டி வீதம் மற்றும் சமுர்த்தி வங்கியால் சீரமைக்கப்பட்டவாறு கடன் பெறுநர்களுக்கான கடன் வீதம் வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -
(i) the current value of assets owned by the Samurdhi Bank;
(ii) the number of Samurdhi Banks and Samurdhi General Societies in Sri Lanka, separately; and
(iii) the current value of assets owned by all Samurdhi General Societies?

(b) Will he also inform this House -
(i) whether Samurdhi Banks fall under the scrutiny of Central Bank of Sri Lanka;
(ii) if not, the reasons for their exclusion; and
(iii) the Chairman of the Board of Directors of the Samurdhi Bank?

(c) Will he further inform this House the -
(i) profit/loss of Samurdhi Bank for the last 10 years, separately;balance sheet value of Samurdhi Bank for the last 10 years, separately;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) shareholders of the Samurdhi Bank; and

(iii) interest paid to the depositors and lending rate to the borrowers as adjusted by the Samurdhi Bank, separately?

(d) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සියලු සමෘද්ධි ප්‍රජා මූල බැංකු සතු වත්කම්වල වටිනාකම 2025.06.30 වන දිනට රුපියල් 316,654,917,651.49කි.

(ii) සමෘද්ධි ප්‍රජා මූල බැංකු සංඛ්‍යාව - 1,097කි.

ගරු කථානායකතුමනි, එතුමා ප්‍රශ්නයේ ඊළඟ කොටසින් අහන්නේ, සමෘද්ධි මහා සංගම් සංඛ්‍යාව ගැන. දැනට සමෘද්ධි මහා සංගම් නැහැ. නමුත් 2013 දිවි නැගුම පනත සම්මත කිරීමට ප්‍රථම සමෘද්ධි මහා සංගම් තිබුණා. දැනට ඒවා හඳුන්වන්නේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් කියලා. මම ඒ ඇසුරෙන් පිළිතුර ලබා දෙන්නම්.

සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති සංඛ්‍යාව - 335කි.

(සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 2014.01.02ට පෙර සමෘද්ධි මහා සංගම් ලෙස හඳුන්වන ලදී.)

(iii) සියලු සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති (මහා සංගම්) සතු වත්කම්වල වටිනාකම 2025.06.30 වන දිනට රුපියල් 196,268,268,199.44කි.

(ආ) (i) නැත.

2013 අංක 1 දරන **සමෘද්ධි** පනතේ 35 වන වගන්තිය අනුව මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන්නේ නැහැ.

(ii) ඒකට හේතු තමයි, 2013 අංක 1 දරන **සමෘද්ධි** පනතේ විධිවිධාන.

2013 අංක 1 දරන **දිවි නැගුම** පනතේ විධිවිධාන අනුව සඳහන්ව ඇත්තේ, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන සහ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ විධිවිධාන සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සම්බන්ධයෙන් අදාළ කර නොගත යුතු බවයි.

(iii) සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,097කුත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335කුත් තමයි තිබෙන්නේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයෙකු නොමැත. සමෘද්ධි බැංකුව සඳහා පාලක මණ්ඩලයක් ඇති අතර, එහි සභාපතිවරයා වනුයේ ප්‍රජාවගෙන් පත් වූ ප්‍රජා නායකයෙකි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති සඳහා මූල්‍ය කටයුතු නියාමනය හා අධීක්ෂණය සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලයක් ඇති අතර, එම කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ නිල බලයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ය.

(ඇ) (i) පසුගිය වසර 10ම details වෙන වෙනම තිබෙනවා. මම ඒවා ප්‍රකාශ කරන්නද, නැත්නම් සභාගත කරන්නද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්තිම අවුරුදු දෙකේ ඒවා කියන්න, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
2023 - රුපියල් 23,273,115,267.49

2024 - රුපියල් 11,053,228,810.49

(ii) සමෘද්ධි බැංකු වෙන වෙනම 1,097ක් තිබෙන නිසා consolidated balance sheet එකක් අපි හදන්නේ නැහැ. මොකද, 2013 අංක 1 දරන සමෘද්ධි පනතට අනුව, එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකු අවිච්ඡින්න බැංකු විධියට තමයි හඳුන්වන්නේ; separate banks විධියට තමයි හඳුන්වන්නේ. ඒ නිසා පසුගිය වසර 10 පුරාවටම consolidated balance sheet එකක් හදලා නැහැ. ඒ වුණාට අපි කියලා තිබෙනවා, 2025 වසරේදී හදන්න කියලා. පසුගිය කාලයේ ඒවා හදලා නැති නිසා පසුගිය වසර 10 තුළ ඒවා දෙන්න අපහසුයි. නමුත්, 2025 වසරේ සිට ඒවා සකස් කරන්න කියලා අපි කියා තිබෙනවා. නමුත්, පසුගිය අවුරුදු 10 තුළ ඒවා හදලා නැහැ.

(iii) සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත් රුපියල් 500ක් වටිනා කොටසක් හෝ ඊට වැඩි කොටස් ප්‍රමාණයක් මිලදී ගත් සියලු සාමාජිකයන් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ කොටස් හිමියන් වේ.

(iv) සමෘද්ධි බැංකු තැන්පතු වර්ග 8ක් තිබෙනවා. ඒ තැන්පතු වර්ග 8ට ලබාදෙන පොලිය සියයට 5 සහ සියයට 3 වශයෙන් වෙනස් වෙනවා. උදාහරණයක් විධියට, සාමාජික තැන්පතු සඳහා සියයට 3ක පොලියකුත් ළමා තැන්පතු සඳහා සියයට 5ක පොලියකුත් ආදී වශයෙන් තමයි වෙනස් වෙන්නේ. ඊට අමතරව ස්ථාවර තැන්පතු සඳහා දැනට ගෙවනු ලබන පොලිය මාස 3 සිට මාස 36 දක්වා වෙන්නේ. මාස 3ට පොලී ප්‍රතිශතය 6යි. මාස 6ට පොලී ප්‍රතිශතය 6.5යි. මාස 12ට පොලී ප්‍රතිශතය 7.5යි. මාස 24ට පොලී ප්‍රතිශතය 7.75යි. මාස 36ට පොලී ප්‍රතිශතය 8යි.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ඉහත ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, Standing Order No. 141 යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "The Speaker shall be responsible for the management of buildings,..."

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ අර එළියේ තිබෙන පොදු වැසිකිළිය හවස හතරහමාරට වහනවා කියලා පොලීසිය කියනවා. කැලි ගලවාගෙන යනවා කියලා පොදු වැසිකිළිය හතරහමාරට වහනවා, ඒ නිසා ඒගොල්ලන්ට යන්න තැනක් නැහැ කියනවා. ඒ නිසා කරුණාකරලා ඒ පොදු වැසිකිළිය රෑටත් ඇරලා තියන්න, ඉබ්බා දමන්න එපා කියන්න.

Thank you.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඒකට උත්තරයක් දුන්නා නම් හොඳයි. වැදගත් ප්‍රශ්නයක් නේ අහලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි මගේ ප්‍රශ්නයට අදාළව අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහි ලාභය ලෙස බිලියන 196ක වත්කමක් තබා ගෙන, 2024 වර්ෂයේදී බිලියන 11ක් ලබා ගැනීමෙන් සියයට හතරහමාරක ප්‍රතිශතයක් තමයි net return එකක් විධියට ලැබී තිබෙන්නේ. මෙහිදී ඔබතුමන්ලා අනුගමනය කරන, ණය දෙන පොලී ප්‍රතිශතය මට ආරංචියි. ඒක සියයට 12ත්, සියයට 14ත් අතර ප්‍රමාණයක්. ඒක හරි ද? තැන්පතුවලට සියයට 4 ඉඳන් සියයට 8 වෙනතුරු පොලියක් දෙනවා. නමුත්, ණයක් දෙනකොට පොලිය සියයට 12 ඉඳන් සියයට 14ක්, සියයට 15ක් ලු. ඒ විධියට බැලුවොත්, යොමු වෙලා තිබෙන ප්‍රාග්ධනයට ලැබෙන ලාභය ඉතා අඩු ලෙස තමයි මා සලකන්නේ. ඒ ගැන ඔබතුමා මොනවාද හිතන්නේ?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු කථානායකතුමනි, දැනට ණය ලබා දෙන්නේ ඉල්ලුම් කරන ආකාරයට. අපි දැනට ණය වර්ග 20ක් නිකුත් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොලී අනුපාතය කීයද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
පොලී අනුපාතය මම සඳහන් කළා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. තැන්පතුවලට දෙන පොලියයි ඒ කියලා තිබෙන්නේ. ණය දෙන එකට පොලිය කීයද?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ඔව්, ණය වර්ග 20ක් දෙනවා. ඔබතුමා කියපු පොලී අනුපාතය හරි. සියයට 12 සිට සියයට 14 දක්වා vary වෙනවා. සියයට 17ට දෙන ඒවාත් තිබෙනවා. උදාහරණයක් කිව්වොත්, වගා ණය සියයට 12යි, පාරිභෝගික ණය සියයට 13යි. සියයට 10ට දෙනවා, සුවශක්ති ණය. ඒ වාගේ vary වෙනවා. ඔබතුමා කිව්වා වාගේ සියයට 10ත්, සියයට 12ත්, සියයට 14ත් දක්වා යන එකක් තමයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ බැංකුව ඉදිරිපත් වෙලා තිබෙන්නේ microfinancing සඳහා තරග කිරීම සම්බන්ධයෙනුයි. අද සාමාන්‍ය බැංකු සියයට 6, 7, 8 පොලී අනුපාතයට කෘෂිකර්මයට ණය දෙනකොට, සමෘද්ධි බැංකුව සියයට 12, 14 පොලී අනුපාතයට ණය දීම අසාධාරණයි කියලා මම හිතනවා. ඒ ණය ගන්න බලාපොරොත්තු වන පාරිභෝගිකයාට මීට වඩා අඩු පොලියකට ණය ලබා දීම සම්බන්ධයෙන් කරන්න පුළුවන් වන්නේ මොනවාද? ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සාකච්ඡා කරලා කටයුතු කරගෙන යනවා. ඒ අනුව අනිවාර්යයෙන්ම මේ බැංකු මහ බැංකුව යටතේ එන්න අවශ්‍යයි කියන එක ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි මම මේ ප්‍රශ්නය ඇහුවේ. ඒකට ඔබතුමන්ලාගෙන් උත්තරය ලැබුණේ 2013 දිවි නැඟුම පනත අනුව කටයුතු කරන බවයි. ඒක බාධාවක් වේවි කියලා තමයි මම හිතන්නේ. මොකද, IMF එකේ fifth tranche එක දෙන්නේ, මේකත් මහ බැංකුවේ control එක යටතේ එන්න ඕනෑය කියන එක යටතේයි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු කථානායකතුමනි, සමෘද්ධි ව්‍යාපාරය 1995දී තමයි ආරම්භ කළේ. 1995දී එය ආරම්භ කළේ මහජනතාව අතර ඉතුරුම් වර්ධනය කර, ඔවුන් අතර අන්‍යෝන්‍ය වශයෙන් මූල්‍ය හුවමාරුවක් ඇති කර ඔවුන්ව ස්වයං මූල්‍ය විනයකට හුරු කිරීමටයි. 2013දී දිවි නැඟුම පනත සම්මත වීමත් එක්ක මේක දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පත් වුණා. ඒ අනුව නැවත සංශෝධනයක් වුණා. ඊට පස්සේ නැවත මේක සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පත් වුණා. දැනට තිබෙන පනත අනුව තමයි මම පිළිතුර ලබා දුන්නේ. ඒ 2013 පනත තමයි දැනට බලාත්මක වෙලා තිබෙන්නේ.

ඊට අමතරව මේ සමෘද්ධි බැංකු සංගම්වල තිබෙන ඒ වත්කම් හෝ ඒ ගනුදෙනු රජයේ විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට යටත් වුණේ නැහැ. අපේ ආණ්ඩුව ආවාට පස්සේ අපි මීට මාසයකට ප්‍රථම මේ පනත සංශෝධනය කරලා සමෘද්ධි බැංකු සතු සියලු වත්කම් සහ ගනුදෙනු රජයේ විගණකාධිපතිවරයාගේ අධීක්ෂණයට හා විගණනයට යටත් කළා.

ඊට අමතරව, ගරු මන්ත්‍රීතුමා මතු කරන කාරණය වන එම බැංකු, මහ බැංකුවේ අධීක්ෂණයට යටත් කිරීම සම්බන්ධයෙන් එම පනත සංශෝධනය වීමට අවශ්‍ය නම්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙනුත් සාකච්ඡා කරලා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

## 2022-2024 දක්වා බොර තෙල් සහ පිරිපහදු කරන ලද තෙල් ආනයනය: විස්තර

2022-2024 வரை இறக்குமதி செய்யப்பட்ட மசகு எண்ணெய் மற்றும் சுத்திகரிப்புச் செய்யப்பட்ட எண்ணெய்: விபரம்

IMPORT OF CRUDE OIL AND REFINED OIL FROM 2022-2024: DETAILS

824/2025

**5. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 වර්ෂයේ සිට 2024 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම තෙල් ආනයනය කිරීමේදී ඊට අදාළ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම කාලසීමාව තුළදී හදිසි මිලදී ගැනීම් ලෙස මිලදී ගෙන ඇති, බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) හදිසි මිලදී ගැනීම් හා සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය හරහා කරනු ලබන මිලදී ගැනීම් අතර පවතින මූල්‍යමය වෙනස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை இலங்கை பெற்றோலியக் கூட்டுத் தாபனத்தால் இறக்குமதி செய்யப்பட்ட மசகு எண்ணெய் மற்றும் சுத்திகரிப்புச் செய்யப்பட்ட எண்ணெயின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி எரிபொருள் இறக்குமதியின்போது அதற்குரியதான பெறுகை நடைமுறைகள் பின்பற்றப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி காலப்பகுதியினுள் அவசரக் கொள்வனவின் அடிப்படையில் கொள்வனவு செய்யப்பட்டுள்ள மசகு எண்ணெய் மற்றும் சுத்திகரிப்புச் செய்யப்பட்ட எண்ணெயின் அளவு ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) அவசரக் கொள்வனவு மற்றும் சாதாரண பெறுகை நடைமுறைகள் ஊடாகச் செய்யப் படுகின்ற கொள்வனவுகளுக்கு இடையில் நிலவும் பணத்தொகை வித்தியாசம் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the quantity of crude oil and refined oil imported by the Ceylon Petroleum Corporation from the year 2022 to 2024, separately in each year;

(ii) whether the prescribed procurement procedure was followed in importing the said oil;

(iii) if not, the reasons for it;

(iv) the quantity of crude oil and refined oil purchased as emergency purchases during that period, separately in each year; and

(v) the financial difference between the purchases made through emergency purchases and the purchases made through the normal procurement procedure?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2022, 2023, 2024 වර්ෂවල ආනයනය කළ බොර තෙල් ප්‍රමාණය සහ පිරිපහදු කරන ලද තෙල් ප්‍රමාණය පහත දක්වා ඇත.

| වර්ෂය | 2022 | 2023 | 2024 |
|---|---|---|---|
| ආනයනය කරන ලද බොරතෙල් ප්‍රමාණය (මෙ.ටොන්) | 839,606.57 | 1,571,066.29 | 1,519,284.00 |
| පෙට්‍රල් 92 Unl (මෙ.ටොන්) | 888,404.10 | 793,879.33 | 585,709.00 |
| පෙට්‍රල් 95 Unl (මෙ.ටොන්) | 46,269.11 | 28,367.44 | 19,541.00 |
| ලංකා ඔටෝ ඩීසල් (මෙ.ටොන්) | 1,266,795.58 | 695,448.16 | 505,954.00 |
| ලංකා සුපිරි ඩීසල් (මෙ.ටොන්) | 128,222.00 | 23,594.72 | 26,945.00 |
| ජෙට් A-1 | 268,654.42 | 168,415.17 | 315,812.00 |
| දැවිතෙල් (Fuel Oil) | 124,368.86 | 124,420.32 | 35,468.00 |
| නැප්තා (මෙ.ටොන්) | - | 16,218.51 | - |
| ඒවියේෂන් ගැසොලින් (AV Gas) ලීටර් | 192,000.00 | 48,000.00 | 224,000.00 |

(ii) ඔව්.

(iii) අදාළ නැත.

(iv) හදිසි මිලදී ගැනීම් සිදු කර නොමැත.

(v) අදාළ නැත.

(ආ) අදාළ නැත.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, 2022 - 2024 කාලය තුළ හදිසි මිලදී ගැනීම් කරලා නැහැ කියලා ඔබතුමා කියනවා. එහෙම නම් මගේ ප්‍රශ්නය ටිකක් වෙනස් කරලා අහන්න තිබුණා. ඒ කියන්නේ, 2021 ඉඳලා කියලා අහන්න තිබුණා. එහෙම නේද? අවුරුද්ද පොඩ්ඩක් වෙනස් කරන්න තිබුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කැමැති නම් උත්තර දෙන්න. හදිසි මිලදී ගැනීම් යටතේ පසුගිය කාලයේ ලංකාවට බොරතෙල් ගෙනාවා. ඒ, 2021- 2022 කාලයේ වෙන්න පුළුවන්. ඔබතුමාට අවබෝධයක් තිබෙනවා නම් කියන්න, එතකොට සාමාන්‍යයෙන් තෙල් බැරලයකට කොච්චර ඩොලර් ප්‍රමාණයක් වැඩි කරලා දීලා තිබෙනවාද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
"වැඩි කරලා" කිව්වේ මොකක්ද කියලා පැහැදිලි කළා නම් හොඳයි.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සාමාන්‍යයෙන් world market price එකට අමතරව, මම අහන්නේ premium එක?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
දැන් මා ළඟ සංඛ්‍යාලේඛන නැහැ. ඇත්තෙන්ම premium එක ඩොලර් 30ට, 35ට ගත්ත කාලයකුත් තිබුණා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
දැන් සාමාන්‍යයෙන් කීයද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
දැන් යන්නේ සාමාන්‍යයෙන් ඩොලර් දෙකයි ගණනට වාගේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය නිවැරදි කර නැවත දවසක ඉදිරිපත් කරන්නම්. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. තෙල් සංස්ථාව පසුගිය කාලයේ NRR ක්‍රමයට තෙල් ගෙනාවා. අඩු ලන්සුවක් තියපු පුද්ගලයාට ටෙන්ඩරය දෙන්නවත් පසුගිය කාලයේ මහ බැංකුවට ඩොලර් නැති වුණා. ඊට වඩා වැඩි ලන්සුවක් තියන්න කෙනෙක් ඇවිල්ලා තෙල් නැව ආවාම සල්ලි දෙන්න කිව්වත්, ඒ අත්තිකාරම් මුදල විධියට ඩොලර් ලක්ෂ 5ක් දෙන්න ඒගොල්ලන්ට තිබුණේ නැහැ. හැබැයි, මාස පහකට පස්සේ US Dollars five million දෙන්න පුළුවන් වුණා. ඔබතුමාට ඒ පිළිබඳව යම් කිසි දෙයක් කියන්න පුළුවන්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔබතුමා විධිමත්ව ප්‍රශ්නය ඇහුවොත් මට ඒ ගැන නිවැරදි සංඛ්‍යාලේඛන එක්ක විස්තර ඉදිරිපත් කරන්න පහසුයි.

## සත්ව සංගණනය: අරමුණු සහ පිරිවැය
## விலங்குகள் கணக்கெடுப்பு: நோக்கங்கள் மற்றும் செலவினம்
## ANIMAL CENSUS: OBJECTIVES AND COST INCURRED

902/2025

**6. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සත්ව සංගණනය සිදු කරන ලද දිනය කවරේද;
(ii) එම සංගණනය සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;
(iii) එම සත්ව සංගණනය කිරීමේ අරමුණු කවරේද;
(iv) එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;
(v) මේ වන විට එම සංගණනයට අදාළ ප්‍රගතිය කවරේද;
(vi) එම සංගණනය අනුව රිළවුන්, වඳුරන්, දඬු ලේනුන් සහ මොනරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සත්ව සංගණනය සිදු කරන ලද ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;
(ii) සත්ව සංගණනය සිදු නොකරන ලද ග්‍රාම නිලධාරි වසම් කවරේද;
(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල සත්ව සංගණනය සිදු නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் விலங்குகள் கணக்கெடுப்பு மேற்கொள்ளப்பட்ட திகதி யாது என்பதையும்;
(ii) மேற்படி கணக்கெடுப்புக்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;
(iii) அக்கணக்கெடுப்பை மேற்கொண்டதன் நோக்கங்கள் யாவை என்பதையும்;
(iv) அந்நோக்கங்களை அடைவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;
(v) இன்றளவில் அக்கணக்கெடுப்புடன் தொடர்புடைய முன்னேற்றங்கள் யாவை என்பதையும்;
(vi) அக்கணக்கெடுப்புக்கு அமைவாக மந்திகள், குரங்குகள், மர அணில்கள் மற்றும் மயில்களின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி விலங்குகள் கணக்கெடுப்பு மேற்கொள்ளப்பட்ட கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை யாது என்பதையும்;
(ii) விலங்குகள் கணக்கெடுப்பு மேற்கொள்ளப்படாத கிராம அலுவலர் பிரிவுகள் யாவை என்பதையும்;

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(iii) அக்கிராம அலுவலர் பிரிவுகளில் கணக்கெடுப்பு மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -
 (i) date on which the animal census was conducted in Sri Lanka;
 (ii) amount of money that was spent on the said census;
 (iii) objectives of the said animal census;
 (iv) measures that will be taken to fulfill those objectives;
 (v) progress pertaining to the said census, as at present; and
 (vi) number of toque macaques, monkeys, giant squirrels and peacocks, separately as per the said census?

(b) Will he also inform this House the -
 (i) number of Grama Niladhari Divisions in which the animal census referred to above was conducted;
 (ii) Grama Niladhari Divisions in which the animal census was not conducted; and
 (iii) reasons for not conducting the animal census in the Grama Niladhari Divisions concerned?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2025.03.15

(ii) සංගණන පත්‍රිකා මුද්‍රණය සඳහා

| | |
|---|---|
| (රජයේ මුද්‍රණාලය) | - රු. 2,478,000 |
| පුවත් පත් දැන්වීම් සඳහා | - රු. 65,844 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා මහජනයාට සංගණන පත්‍රිකා බෙදා හැරීම සඳහා වූ පරිපාලන වියදම් | - රු. 1,200,000 |
| (එක් දිස්ත්‍රික්කයකට රුපියල් 48,000 බැගින්) පූර්ව සංගණන වියදම | - රු. 18,030 |
| ප්‍රවාහන වියදම | - රු. 154,440 |
| මුළු වියදම | - රු. 3,916,314 |

නමුත්, රුපියල් කෝටි 7කට වැඩි වියදමක් මේ සඳහා දැරුවා කියලා විවිධ අසත්‍ය ප්‍රචාර ගියා. අපි ඒවා සම්පූර්ණයෙන්ම බැහැර කරලා තිබෙනවා. මේ සංගණනය සඳහා සමස්ත වියදම වශයෙන් ගියේ රුපියල් 3,916,314යි.

(iii) මින් පෙර මෙවැනි සංගණනයක් සිදු කර නොමැති බැවින් ආහාර භෝග වගාවන්ට සිදුවන වන සත්ව හානි අවම කිරීම සඳහා හානිකර වන සතුන්ගේ ගහනයන් පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම හා නිර්දේශ සකස් කිරීම කියන කාරණය තමයි මෙහි මූලික අරමුණ වෙන්නේ.

(iv) ආහාර භෝග වගාවන්ට බහුල වශයෙන් හානි සිදු කරන එමෙන්ම ක්ෂේත්‍රවලට ඉහළින් පැමිණෙන වන සතුන් ලෙස සැලකෙන වඳුරා, රිළවා, දඬු ලේනා හා මොනරා පිළිබඳ ගහන සමීක්ෂණයක් පවත්වන ලද අතර, ද්විකරණය වැළැක්වීමට දිවයින පුරා එකම වේලාවට නිවෙස්වල සාමාජිකයන් හා පොදු ස්ථානවල රජයේ නියෝජිතයන් විසින් සත්ව සංගණනය සිදු කරන ලදී.

(v) ඉහත සත්ව සංගණනයේ ප්‍රතිඵල 2025 අප්‍රේල් මස වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් අමාත්‍යාංශය වෙත ලැබුණු අතර, අනතුරුව එහි සත්‍යාපන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිඵල සත්‍යාපනයේදී තහවුරු වූයේ ප්‍රජාව විසින් ලබා දෙන ලද වඳුරන් හා රිළවුන් සම්බන්ධ තොරතුරුවල සියයට 50ක සත්‍යතාවක් පවතින බවයි. ඒ අනුව සමීක්ෂණයේ අදාළ සංඛ්‍යාත්මක අගයන්හි සියයට 50ක අගය නිවැරදි අගය ලෙස සැලකීමට ආහාර භෝග වගාවන්ට සිදුවන වන සත්ව හානි අවම කිරීම සඳහා නිර්දේශ සකස් කිරීමේ කමිටුව තීරණය කරන ලදී.

සත්‍යාපන කටයුතුවලින් අනතුරුව අදාළ සත්ව කාණ්ඩයේ පැතිරීම, අවදානම් කලාප හඳුනාගත හැකි ලෙස ප්‍රදේශ අනුව සිතියම්ගත කරන ලදී.

සිතියම්ගත කිරීම මඟින් සත්ව ගහන වැඩිපුර පවතින දිස්ත්‍රික්ක සහ දිස්ත්‍රික්ක වෙන් වෙන් වශයෙන් සැලකීමේදී අදාළ දිස්ත්‍රික්ක තුළ වැඩි සත්ව ගහනයක් සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හඳුනා ගැනීම මෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ වැඩි ගහනයක් පවතින අදාළ ග්‍රාම නිලධාරි වසම් හඳුනා ගැනීමේත් හැකියාව ඇත.

ඒ අනුව, රට තුළ දීපව්‍යාප්තව සිදු කරන ලද ජාතික සත්ව සංගණනයට අදාළ සම්පූර්ණ නිල වාර්තාව මේ වන විට සකසා අවසන් කර රටේ ප්‍රසිද්ධ කර ඇත.

(vi) ජාතික සත්ව සංගණනයට අදාළ නිල වාර්තාවට අනුව,

| | | |
|---|---|---|
| රිළවුන් | - | 5,197,517 |
| වඳුරන් | - | 1,747,623 |
| දඬු ලේනුන් | - | 2,666,630 |
| මොනරුන් | - | 4,285,745ක් |

ඉන්න බව එම වාර්තාවල තිබෙනවා. *[බාධා කිරීමක්]* තලගොයි පිළිබඳව කළේ නැහැ. ඒ සමීක්ෂණයට ඔබතුමන්ලාත් අහුවෙයි, ඉදිරියේදී කරනකොට.

(ආ) (i) දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් යොමු කරන ලද තොරතුරු අනුව යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් දූපත හැර දිවයිනේ අනෙක් සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි සත්ව සංගණනය සිදුකර ඇත.

(ii) යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ් දූපතට අයත් ග්‍රාම නිලධාරි වසම් 06ක සිදු කර නැත.

(iii) ඩෙල්ෆ්ට් දූපත තුළ සත්ව සංගණනයේදී සලකා බැලූ සතුන් වර්ග 04 වාසය නොකිරීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, සත්ව සංගණනය සඳහා ගිය වියදම පිළිබඳව. මාර්තු මාසයේ තමයි ඒ සංගණනය කළේ, ඒකට රුපියල් ලක්ෂ 39කට ආසන්න මුදලක් වියදම් වුණා කිව්වා. රුපියල් ලක්ෂ 39කට ආසන්න මුදලකින් ඒ සත්ව සංගණනය කරලා රිළවු ලක්ෂ 51ක්, වඳුරන් ලක්ෂ 17ක්, දඬු ලේනුන් ලක්ෂ 26ක්, මොනරු ලක්ෂ 42ක් වශයෙන් ලක්ෂ 140කට ආසන්න සංඛ්‍යාවක් ගණනය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, ඩෙල්ෆ්ට් දූපතේ ග්‍රාම සේවා වසම් 6ක් විතරයි එහිදී අතහැරුණේ කියලා. එහෙම නම්, කොළඹ 07 ප්‍රදේශයේත් ඒ සංගණනය කරලා තිබෙන්න ඕනෑ; කොළඹ 07, කොළඹ 05 වැනි නාගරික ප්‍රදේශවලත් ඒ සංගණනය කර තිබෙන්න ඕනෑ. මරික්කාර් මන්ත්‍රීතුමන්ලාගේ පැතිවලත් බලන්න වෙනවා. හැම තැනම බලන්න ඕනෑ. මම අහනවා, ඒ තැන්වලත් එම සත්ව සංගණනය කළාද කියලා. ඔබතුමා කිව්වා, මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටම අනුව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වාර්තාවක් හදලා තිබෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

විනාඩියක් දෙන්න. උත්තරය ලොකුයි, ගරු කථානායකතුමනි. මේක දිග උත්තරයක්; දීර්ඝ පිළිතුරක්. වඳුරන් ගණන බලන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

උපරිම විනාඩි දෙකයි ගන්න පුළුවන්. ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බලන්නකෝ, රිළවු ගණන?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ බුද්ධිමය සංවාදයක් කරන තැනක් නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

සංවාදයක් නොවෙයි, ගරු කථානායකතුමා. මම ප්‍රශ්නයක් අහනකොට එයට අදාළ පිළිතුර කෙටි නම් මම ප්‍රශ්නය අහලා නිකම් ඉන්නවා. නමුත් මේ ප්‍රශ්නය අහන්නේ රට වෙනුවෙන්, අපි වෙනුවෙන් නේ. එතුමාටත් හොඳ නැහැ, හරි උත්තරය දුන්නේ නැත්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් ඔබතුමා විනාඩි දෙකක් ගත්තා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

පොඩ්ඩක් ඉන්න. අපි මෙහෙම හිතමු. මෙතැන එක දිස්ත්‍රික්කයක්, එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ගත්තොත්, රිළවු වැඩියි, වඳුරන් වැඩියි, දඬු ලේනුන් වැඩියි. මොකක්ද කරන්න යන වැඩ පිළිවෙළ? උන්ව මරාගෙන කනවාද? එහෙම නැත්නම් උන්ව අරගෙන ගිහිල්ලා කොහේ හරි රටකට දමනවාද? මොකක්ද කරන්න යන්නේ? *[බාධා කිරීමක්]* දූපතකට දමනවාද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය ඇතුළේ ප්‍රශ්න ගණනාවක්ම තිබුණා. අපි ඩෙල්ෆ්ට් දූපත හැර කොළඹ නගරය ඇතුළු සියලුම වසම්වල මේ සමීක්ෂණය සිද්ධ කළා. පත්‍රිකාව නොලැබුණු අයට අපි වරින් වර නිවේදනය කළා, වෙනත් කඩදාසියක ලියලා ඒක භාර දෙන්න, අපි එය ලබා ගැනීමට සූදානම් කියලා. ඒ අනුව මුළු රටේම මේ සමීක්ෂණය සිද්ධ කළා.

මේ සම්බන්ධයෙන් ගිය වියදම පිළිබඳව එතුමා නැවතත් ප්‍රශ්න කළා. මෙය රුපියල් ලක්ෂ 39ක් වාගේ කුඩා මුදලකින් -කුඩා කියන්නේ, මේ වැඩේට සාපේක්ෂව- රටක සමස්ත ජනතාවම -නිලධාරින් ඇතුළු ඔක්කෝම- සම්බන්ධ කරගෙන කරපු සංගණන ක්‍රියාවලියක්, මේ වාගේ මුදලකින් මේ වාගේ දැවැන්ත තොරතුරු පද්ධතියක් ලබා ගැනීම පිළිබඳව කවුරුත් පුදුම වෙනවා. අපි ඒක දන්නවා. අපට තිබෙන අත්දැකීම් අනුව වෙනත් තත්ත්වයන් තුළ, වෙනත් කාලයක මේ සමීක්ෂණය කළා නම්, වියදම් වෙන්නේ රුපියල් ලක්ෂ 39 නොවෙයි, රුපියල් කෝටි 39ක් වෙන්න පුළුවන්. එහෙම අත්දැකීම් තමයි තිබෙන්නේ. ඒ තත්ත්වය තුළ මේ වාගේ මුදලකින් මුළු රටක් සම්බන්ධ වෙච්ච මේ වාගේ ක්‍රියාවලියක් කොහොමද කළේ කියන එක පිළිබඳව කාටත් ප්‍රශ්නයක් තිබෙනවා තමයි.

ඊළඟ කාරණය මේකයි. මේ සතුන්ට අදාළව මෙතෙක් අපේ රටේ තොරතුරු තිබුණේ නැහැ. අලින් පිළිබඳව අපේ රටේ සංගණනයක් කර තිබෙන්නේ 2011දී. 2011දී ලබා ගත් තොරතුරු තමයි තවමත් අපි කියන්නේ. රිළවා, වඳුරා, දඬු ලේනා, මොනරා කියන සත්තු පිළිබඳව අපේ රටේ දත්ත තිබුණේ නැහැ. නමුත්, දැන් දත්ත තිබෙනවා. ඒ නිසා මේ සතුන් සංඛ්‍යාව කළමනාකරණය කරන ඕනෑම පාර්ශ්වයකට, ඕනෑම අධ්‍යාපන ආයතනයකට මේක පරිශීලනය කරලා විසඳුම්වලට යන්න පුළුවන්. පරිසර අමාත්‍යාංශය ඇතුළු අපි ඔක්කෝම එකතු වෙලා ඒ පිළිබඳ සාකච්ඡා ආරම්භ කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා ඇහුවා, මේ සත්තු මරාගෙන කනවාද කියලා. ඔබතුමාට කැමති තීරණයක් ගන්න පුළුවන්, රටේ තිබෙන නීතියට

[ගරු නාමල් කරුණාරත්න මහතා]

අනුව. ඒ සත්තු මරන්න හෝ මොකක්වත් කරන්න අපි තීරණය කරලා නැහැ. නමුත් මේ සත්තු සංඛ්‍යාව අනිවාර්යයෙන්ම කළමනාකරණය කරන්න ඕනෑය කියන තැන අපි ඉන්නවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න කලින් මේ කාරණය කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මරාගෙන කන කථාවක්. මට තීන්දු ගන්න බැහැ, සත්තු මරාගෙන කන්න. සත්තු මරාගෙන කන එක නොවෙයි කරන්න ඕනෑ. මම අහන්නේ මොකක්ද කරන්නේ කියන එක. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ සංඛ්‍යාලේඛන අනුව සියයට 50යි නිවැරදි කියලා. ඒ කියන්නේ, සියයට 50ක් වැරදියි; සියයට 50යි නිවැරදියි.

එතකොට, ඒ අනුව තමයි ඔබතුමා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. සියයට 50ට අනුව ඔබතුමා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. සංගණනය සිදු නොවුණු ප්‍රදේශත් එක්ක බලනකොට සතුන්ගේ ප්‍රමාණය වැඩි නම් ඒ සතුන් වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා ඔබතුමා පැහැදිලිව කියන්න. එක්කෝ, කලින් කිව්වා වාගේ ඒ සතුන් කොහේ හරි දූපතකට ගෙනිහිල්ලා දමනවාද, එහෙම නැත්නම් ඒ සතුන්ව අරගෙන ගිහිල්ලා වෙනත් දෙයක් කරනවාද කියා ඔබතුමා පැහැදිලිව කියන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. මේක ජනතා සහභාගිත්වය සහිතව කරපු සමීක්ෂණයක් නේ. ඇත්තටම මේකට "සංගණනය" කියන වචනය පාවිච්චි කළාට සමාජ විද්‍යාත්මකව ගත්තොත් මේක සංගණනයක් නොවෙයි. ඒ කළේ සමීක්ෂණයක්. එතකොට ඒ සමීක්ෂණයේ තොරතුරු දෙන්නේ මේ රටේ සාමාන්‍ය සිවිල් පුරවැසියෝ, සාමාන්‍ය ජනතාව. එතකොට මේ ප්‍රශ්නයෙන් බැට කන ප්‍රමාණයට සාපේක්ෂව ඒ ජනතාව පෙලඹෙනවා, මේ සංඛ්‍යාව ටිකක් වැඩිපුර පෙන්නුම් කරන්න. ඒ ලක්ෂණ අපි දැක්කා. ඒ අනුව මේ වෙනුවෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවේ විද්වත් මණ්ඩලයක් ඉන්නවා. ඊට අදාළ ආචාර්යවරු, මහාචාර්යවරු වාගේම පරිසර අමාත්‍යාංශයට, වනජීවී දෙපාර්තමේන්තුවට, කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළ වගකිව යුතු කණ්ඩායමක් තමයි ඒ කමිටුව නියෝජනය කරන්නේ. මේකේ සත්‍යයෙන් තොර වූ තොරතුරු තිබෙනවා කියන කාරණයත් එක්ක තමයි සියයට 50ක් ඉවත් කරලා දත්ත ලබා ගන්නේ. මේ ඉදිරිපත් කරලා තිබෙන දත්ත සියයට සියයක්ම නිවැරදිම දත්ත කියලා අපි කියන්නේ නැහැ. නමුත් මේක සමීක්ෂණයක් නේ. මේක සංගණනයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ සංගණනයක් ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ පිළිතුර කෙටි කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ඒ අනුව අපට දත්තයක් -තොරතුරක්- තිබෙනවා. ඒ තොරතුරු පදනම් කරගෙන මේ සතුන්ගේ ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා අදාළ විද්වත් මණ්ඩලයට තීන්දු තීරණ ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ පිළිබඳව අපි අතරේ සාකච්ඡාවක් තිබෙනවා. මොකද, රිළවු, වඳුරෝ අපි අරගෙන ඇවිල්ලා නොවෙයි නේ. මේක අවුරුදු ගණනාවක් තිස්සේ තිබුණු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය දඩිං බිඩිං ඩෝං ගාලා එක වතාවටම අපට බේරන්න පුළුවන්කමක් නැහැ.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයන්: වැටුප්

## ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபை ஊழியர்கள்: சம்பளம்

## EMPLOYEES OF EMPLOYEES' TRUST FUND BOARD: SALARIES

983/2025

7. **ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සියලුම කාර්යාලවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මණ්ඩලයේ සේවය කරනු ලබන සේවකයන්ගේ වැටුප් සහ ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් නොපිරිහෙළා ලබා දිය යුතු බව පිළිගන්නේද;

(iii) වැටුප් කප්පාදු කිරීමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ සේවකයන් පසුගිය දිනවල උද්ඝෝෂණයක නිරත වූ බව දන්නේද;

(iv) එසේ නම්, එම වැටුප් කප්පාදු කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதியச் சபையின் தலைமை அலுவலகம், பிரதேச அலுவலகங்கள் உள்ளிட்ட அனைத்து அலுவலகங்களிலும் பணியாற்றும் ஊழியர்களின் எண்ணிக்கை யாது;

(ii) சபையில் பணியாற்றும் ஊழியர்களின் சம்பளம் மற்றும் அவர்களுக்குத் தேவையான ஏனைய வசதிகளை முழுமையாக வழங்க வேண்டும் என்பதை அவர் ஏற்றுக்கொள்வாரா;

(iii) சம்பளக் குறைப்புத் தொடர்பில் சபை ஊழியர்கள் கடந்த தினங்களில் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டனர் என்பதை அறிவாரா;

(iv) ஆமெனில், இந்தச் சம்பளக் குறைப்புத் தொடர்பில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(I) the number of employees working at all the offices of the Employees' Trust Fund Board, including its Head Office and the regional offices;

(ii) whether he acknowledges that the salaries and other facilities required by the employees working at the Board should be provided without a default;

(iii) whether he is aware that the employees of the Board recently engaged in a protest against a salary cut; and

(iv) if so, the measures that have been taken regarding the said salary cut?

(b) If not, why?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ වැඩබලන මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා )**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Acting Minister of Finance, Planning and Economic Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල ඇතුළු සියලුම කාර්යාලවල සේවය කරනු ලබන සේවකයින් සංඛ්‍යාව 2025.08.31 දිනට 837කි.

(ii) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල වැටුප් ගෙවීම සම්බන්ධයෙන් රජය මඟින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව හා ව්‍යවස්ථාපිත වගකීමක් වශයෙන් මණ්ඩලයේ සේවයේ නියුතු සේවකයින්ගේ වැටුප් හා ඔවුන්ට අවශ්‍ය අනෙකුත් ගෙවීම්, පඩි නඩි ලබා දිය යුතු බව පිළිගන්නවා.

(iii) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 මඟින් රජයේ සියලුම සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට වැටුප් වැඩිවීමක් ලබා දී ඇත. එකී චක්‍රලේඛයේ අනු අංක 3:3 අනුව, 2025.01.01 දිනට නිලධාරින්ට අදාළ වැටුප තීරණය කිරීමේදී, 2006.01.01 දින හෝ එදිනට පසු සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප් සැකසීම හා නිලධාරින්ට අදාළ වැටුප් පරිවර්තනය නිවැරදිව සිදු කර ඇති බවට අදාළ බලධාරින් තහවුරු කර ගත යුතුයි.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවකයින් සඳහා 2006.01.01 දිනට වැටුප් පරිවර්තනය කිරීමේදී මෙන්ම 2013 සහ 2015 වර්ෂයන්වලදී ද අදාළ චක්‍රලේඛයන් ප්‍රකාරව කටයුතු නොකර අවිධිමත් ආකාරයට වැටුප් වැඩි කරදීම් තුළින් මණ්ඩලය තුළ යම් වැටුප් විෂමතාවක් මතු වී තිබේ.

ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 01/2025 චක්‍රලේඛයේ අනු අංක 3:3 ප්‍රකාරව වැටුප නිවැරදි කර ගෙවීම් කිරීමට පියවර ගෙන තිබේ.

මේ පිළිබඳව අසතුටට පත් සේවක සංගම් කිහිපයක් මඟින් 2025 ජූනි මාසයේදී උද්ඝෝෂණයක නිරත වෙලා තිබෙනවා. එම පාර්ශ්වයන් විසින් අභියාචනාධිකරණයේ CA/WRIT/709/2025 යටතේ නඩුවක් පවරා පවත්වා ගෙන යමින් තිබෙනවා.

(iv) සේවක වැටුප් කප්පාදුවක් කිසිසේත්ම සිදු වී නැහැ. ඒ වාගේම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025හි ප්‍රතිපාදන අනුව කටයුතු කර නිවැරදිව වැටුප් සකසා මණ්ඩලයේ සේවකයින් අතර පැවති වැටුප් විෂමතාව ඉවත් කර ඇත.

මෙම හේතුව මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව ඊට කලින් වැටුප් වැඩි කර තිබූ සේවක සංඛ්‍යාවකගේ වැටුප්, 01/2025 චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිවැරදිව සකස් කිරීමේදී එම සේවකයන් හට ඉහත කී විධිමත් අනුමැතියකින් තොරව ප්‍රදානය කර තිබූ වැටුප් වර්ධකවල වටිනාකම අඩු කිරීම හේතුවෙන් 01/2025 චක්‍රලේඛය අනුව සිදු කරන ලද වැටුප් වැඩි කිරීම සංඛ්‍යාත්මකව විද්‍යමාන නොවීම පමණක් සිදු වී ඇත.

ඒ අනුව, මණ්ඩලය තුළ 2006 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදීම විධිමත් අනුමැතියකින් තොරව සේවකයින්ට වැටුප් වර්ධක ලබා දීම මඟින් හටගෙන තිබූ වැටුප් විෂමතාව ඉවත් කර සියලු සේවකයින් නීත්‍යානුකූලව නිවැරදි වැටුප් තලයන්හි පිහිටුවා 01/2025 චක්‍රලේඛ ප්‍රකාරව ලබා දී තිබූ වැටුප 2025 මැයි මස සිට ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයක් නැත්නම් මොකටද ඒගොල්ලන් අභියාචනාධිකරණයට යන්නේ? ඇයි, ඒගොල්ලන් උද්ඝෝෂණය කරන්නේ? ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කියලා තිබෙනවා, Board එක විධිමත් විධියට එය සිදු කළා කියලා. මුදල් අමාත්‍යාංශයේ තුන්දෙනෙක් ETF Board එකේ ඉන්නවා. එතකොට මේක Board එකක් ගත්ත තීන්දුවක්. අධ්‍යක්ෂ මණ්ඩලය -Board එක- වැරදි තීන්දුවක් ගත්තා නම් ඒ අය ඒකට වග කියන්න ඕනෑ. ඔබතුමා යටතේ නේද, කම්කරු කොමසාරිස් ජනරාල් ඉන්නේ? ඔබතුමා යටතේ ඉන්න කම්කරු කොමසාරිස් ජනරාල් මේ වැටුප් වැඩි කරන්න කියලා නිර්දේශ කර තිබෙනවා. ඊට අදාළ ලේඛනය ඕනෑ නම් මම සභාගත කරන්නම්. කම්කරු කොමසාරිස් ජනරාල් මේ වැටුප දෙන්න කියලා නිර්දේශ කරලා තිබෙනවා. මා ළඟ මේ තිබෙන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද ලේඛනයක්. කම්කරු කොමසාරිස් ජනරාල් ඔබතුමා යටතේ නේ, ඉන්නේ. කම්කරු කොමසාරිස් ජනරාල් තමයි නිර්දේශය දීලා තිබෙන්නේ වැටුප් වැඩි කරන්න කියලා. 523දෙනෙකුගේ ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ. ඔයගොල්ලන් අය වැයෙන් - Budget එකෙන් - ලබා දුන් වැටුප මේ 523දෙනාට දීලා නැහැ. ඒකට හේතුව තමයි, අධ්‍යක්ෂ මණ්ඩලය -Board එක- තීන්දුවක් අරගෙන මේවා වැඩි කිරීම. සමහර සංස්ථාපිත ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය -Board එක- වැටුප් වැඩි කරනවා. Board එකට එන මුදල් අමාත්‍යාංශයේ අය දැනගන්න ඕනෑ, ඒ වෙලාවට නිර්දේශ නොදී ඉන්න. කම්කරු කොමසාරිස් ජනරාල් මේ සේවකයින්ගේ වැටුප් වැඩි කරන්න කියලා ලබා දී තිබෙන නිර්දේශ ඇතුළත් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඔබතුමාටත් මම මෙහි පිටපතක් ඔබතුමාට ලබා දෙන්නම්. මේ ලේඛනය ඔබතුමා යටතේ ඉන්න කම්කරු කොමසාරිස් ජනරාල් නිර්දේශ කරපු එක. අනෙක, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලබා දුන් ලේඛනය. දැනට ඒගොල්ලන් අභියාචනාධිකරණයේ පැමිණිල්ලක් දාලා තිබෙනවා. ඔක්කොම සේවකයන් අටසිය ගණනක් ඉන්නේ. මේක 523කගේ ප්‍රශ්නයක්. එදා මම ඔබතුමාට මේ ගැන කිව්වා. මේ වෘත්තීය සමිති ඔයගොල්ලන්ගේ වෘත්තීය සමිති නොවෙයි, (Dr.) Anil Jayantha. අනෙක් වෘත්තීය සමිතිත් තිබෙනවා. ඒ අය ගෙන්වලා සාකච්ඡාවක් තියන්න. අද වනතුරු ඔබතුමා සාකච්ඡාවක් තියලාවත්, ඒ අය කැඳවලා කථා කරලාවත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. දෙවන අතුරු ප්‍රශ්නය මේකට පිළිතුරු දුන්නාට පස්සේ මම අහනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, සාකච්ඡාවක් පැවැත්වූයේ නැහැ කියලා ගරු මන්ත්‍රීතුමා කියන කාරණය වැරදියි. වෘත්තීය සමිති සමඟ අවස්ථා කිහිපයකදී අපි සාකච්ඡාවක් පැවැත්වූවා. සේවකයන්ට පැහැදිලි කළා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මෙතැන එක සේවකයාද, අටසිය ගණනද, කීයද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. කලින් අවස්ථාවේදී ඒ මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන චක්‍රලේඛවලට අමතරව ඒගොල්ලන්ගේ ක්‍රියා පටිපාටිය යටතේ කරන ලද අවිධිමත් වැඩි කිරීම් ප්‍රමාණයක් නිසා තමයි මේ ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ. 01/2025 චක්‍රලේඛය මඟින් ඒක අපි නිවැරදිව කරලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ඒ සියලු වැටුප් විෂමතා අයින් කරලා තමයි ගෙවීම සිද්ධ කරලා තිබෙන්නේ.

ඒ නිසා ප්‍රශ්නයක් විධියට පැහැදිලි කළාට, ඒගොල්ලන්ගේ පැත්තෙන් දකින්නේ යම් විධියකට,-වැරදි විධියකට හෝ අඩු පාඩු සහිතව. ඒගොල්ලන්ට වැටුපක් ලැබිලා තිබෙනවා නම් ඒක මේ මොහොතේ නිවැරදි කරන්න යනවා නම් ඔවුන්ට සංඛ්‍යාත්මකව විද්‍යමාන වෙන්නේ නැහැ, අපි කරන වැටුප් වැඩි කිරීම. ඒ නිසා තමයි අපි මෙතැන සංඛ්‍යා නිවැරදි කර ගන්න ඕනෑ. ඔබතුමා පන්සිය ගණනක සංඛ්‍යාවක් කිව්වා; ඒක නොවෙයි. මගේ අතේ තිබෙන මේ ලේඛනය මම **සභාගත*** කරනවා. 77දෙනෙකුගේ සංඛ්‍යාත්මකව මේක විද්‍යමාන වෙන්නේ නැහැ. හේතුව, වැටුප් තල කලින් අනුමත කළ නිසා.

01/2025ට අනුව ඉතාම නිවැරදිව වැටුප් ලේඛනය ස්ථානගත කරලා තිබෙනවා. ඒ වුණත්, ඒ අයගේ මේක සංඛ්‍යාත්මකව විද්‍යමාන නොවුණත් 2026 ජනවාරි 01වෙනි දා වෙනකොට ඒ විෂමතා අයින් වෙනවා. 2025දී අපි විශාල වැටුප් වැඩි කිරීමක් කළා, සියයට 80කින් පමණ. එය අදියර 3කින් දුන්නේ. ඒකේ පළමුවෙනි අදියර තමයි 2025දී පටන් ගත්තේ. දෙවෙනි අදියරය 2026 ජනවාරි 01වෙනි දා වෙනකොට ආරම්භ වෙනවා. අන්න එදා වෙනකොට මේ කියන 77දෙනාගෙත් විෂමතාව අයින් වෙනවා, කිසිම ආකාරයකින් සංඛ්‍යාත්මකව විද්‍යමාන නොවුණු එක. ඒ නිසා ගැටලුවක් වෙන්නේ නැහැ. නමුත් මේ සම්බන්ධයෙන් සේවකයන්ට අපි යෝජනා කළා මේ විෂමතාවට යම් අතුරු ගෙවීමක් ගෙවන ක්‍රමවේදයේ යන්න පුළුවන්ද කියලා. නමුත් ඔවුන් අධිකරණයට ගිහින් තිබෙනවා. දැන් අධිකරණයේ ඒ කටයුතු විභාග වෙන නිසා යම් තීන්දුවක් ලැබෙනකම් අපට මොකුත් කථා කරන්න බැහැ, ගරු කථානායකතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ඇයි අධිකරණයට යන්නේ? අධිකරණයට යන්නේ ආයතනවල වැරදි නිසා නේ. ගරු ඇමතිතුමා යටතේ තමයි කම්කරු කොමසාරිස් ජෙනරාල් ඉන්නේ. එතුමාත් නිර්දේශ දීලා තිබියදී අධිකරණයට යන්නේ ඒකයි. අනිල් ජයන්ත මහත්තයා, නිකම් බොරු කියන්න එපා. ඇල් වතුරෙන් කැවුම් බදින්න හදන්න එපා. ඔබතුමා හැම ප්‍රශ්නයෙන්ම ලිස්සලා යන්න එපා. ඔබතුමා හොඳ උගතෙක්, පිළිගත්ත කෙනෙක්. උත්තරයක් දෙනකොට ඒ අය ගෙනැල්ලා, සාකච්ඡා කරන්න. අධිකරණවලට යන්න දෙන්න එපා මේ වාගේ ඒවා. 513දෙනෙකුට අදාළයි, මේ ප්‍රශ්නය.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ETF එක කියන්නේ අපේ සල්ලි නොවෙයි; ඔබතුමාගේ සල්ලිවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සල්ලිවත් නොවෙයි අහිංසක කම්කරුවන්ගේ, සාමාජිකයන්ගේ සල්ලි ඒකේ තිබෙන්නේ. අපේ පළාතේ වතු කම්කරුවන්ගේ සල්ලි තමයි වැඩියෙන්ම ETF එකේ තිබෙන්නේ. පසුගිය කාලයේ ETF එකේ තමන්ගේ සල්ලි බැංකුවට ඇපයට තියලා රුපියල් ලක්ෂ 20ක housing loan එකක් ගන්න අවස්ථාව දුන්නා. දැන් අලුත් සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඒකත් නතර කරලා. ගරු කථානායකතුමනි, ETF එකේ තමන්ගේ මුදල් ඇපයට තියලා වත්තේ කම්කරුවාට ලයින් කාමරය හරි repair කර ගන්න ලක්ෂ 20ක housing loan එකක් දුන්නා. දැන් ඒ housing loan එකත් වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයයි, සභාපතියි නතර කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* බදුල්ලේ විතරක් නොවෙයි ලංකාවේම.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමා, ණය සම්බන්ධයෙන් ඔය අහන කාරණය මුල් ප්‍රශ්නයට අදාළව පැන නඟින අතුරු ප්‍රශ්නයක් නොවෙයි. කෙසේ වෙතත්, ETF එක පුළුල් විෂයක්. ETF එක ගැන කථා කරනවා කියලා මේකේ ප්‍රශ්න නැහැ. ETF එකේ ණය ලබා දීම් සිදු කරන්නේ හිතුවක්කාර ලෙස, ඕනෑ ඕනෑ විධියට නොවෙයි, දීලා තිබෙන නීති රීති, රෙගුලාසි යටතේ. නැවතත් මම ඔබතුමාට කියනවා අර සංඛ්‍යා, ඔබ ලබා දුන්නු 513යි කියන එක වැරදියි කියලා.

ගරු මන්ත්‍රීතුමනි, වැරදි විධියට වැටුප් වර්ධක ලබා දීම නිසා තමයි මේ ප්‍රශ්නය පැන නැඟී තිබෙන්නේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2025 අනුව ඒක නිවැරදි වෙනවා. ඒ වුණත්, ඒක සංඛ්‍යාත්මකව විද්‍යමාන වෙන්නේ නැහැ. මොකද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් වැඩි වීම වෙන්නේ අදියර 3කින්. ඒකයි මම කිව්වේ, 2026.01.01 වෙනකොට කිසිම සේවකයකුගේ වැටුප වෙනස් වෙන්නේ නැහැ කියලා. එසේ වෙනස් වන බවට දැනට පෙන්නුම් කරන්නේ සේවකයින්

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

77දෙනෙකුගේ පමණයි. ඔබතුමා මතු කරපු ඒ "නිර්දේශ" කියන කාරණය තිබෙන්නේ, මේ වැටුප් තලවල සංඛ්‍යා අතර තිබෙන වෙනස ඉදිරිපත් කරලා තිබෙන නිසායි. එහෙම නැතුව, මේක ගෙවන්න කියලා කවුරුවත් තීන්දු කරලා නැහැ. එහෙම තීන්දු කරන්නත් බැහැ. එම නිසා 01/2025 චක්‍රලේඛයට අනුව වැටුප් ගෙවීම සිදු කළ යුතු වෙනවා.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව හැර ගිය සෙබළුන්: ගත් පියවර

## இலங்கை விமானப் படையைவிட்டு வெளியேறியோர்: நடவடிக்கை

## DESERTERS OF SRI LANKA AIR FORCE: ACTION TAKEN

1123/2025

**8. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවය අතහැර ගොස් සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෙබළුන්/නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ශ්‍රී ලංකා පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව සහ භාරවී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iv) ඔවුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් ඉවත් කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට C-130 ගුවන් යානයක් මිලදී ගැනීමට කටයුතු කරන බව දන්නේද;

(ii) මේ වනවිට ගුවන් හමුදාව සතු C-130 ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගුවන් යානාවල නඩත්තු කටයුතු අවසන්වරට සිදු කරන ලද කාල වකවානු කවරේද;

(iv) නව C-130 ගුවන්යානයක් මිලදී ගැනීමේ අරමුණ කවරේද;

(v) එම නව C-130 යානය පරිත්‍යාගයක්ද; නොඑසේ නම්, මිලදී ගැනීමක්ද;

(vi) එමඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා ඉටු කර ගත් ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதவியைக் கைவிட்டுச் சென்றுள்ள இலங்கை விமானப் படையைச் சேர்ந்த வீரர்கள்/ அதிகாரிகளின் எண்ணிக்கை யாது;

(ii) அவர்களில் இலங்கை பொலிசாரினால் கைது செய்யப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை மற்றும் சரணடைந்துள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iii) அவர்கள் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(iv) அவர்களை இலங்கை விமானப் படையிலிருந்து நீக்குவதற்கு எடுக்கும் காலம் எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை விமானப் படைக்கு C-130 விமானம் ஒன்றைக் கொள்வனவு செய்ய நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றது என்பதை அறிவாரா;

(ii) தற்போது விமானப் படைக்குச் சொந்தமாகவுள்ள C-130 விமானங்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி விமானங்களின் பராமரிப்பு நடவடிக்கைகள் இறுதியாக எக்காலப் பகுதிகளில் மேற்கொள்ளப்பட்டன;

(iv) புதிய C-130 விமானம் ஒன்றைக் கொள்வனவு செய்வதன் நோக்கம் யாது;

(v) மேற்படி புதிய C-130 விமானம் ஓர் அன்பளிப்பா; இன்றேல், புதிய கொள்வனவா;

(vi) அதன்மூலம் நிறைவேற்றிக்கொள்ள எதிர்பார்த் துள்ள பணிகள் இதுவரை காலம் நிறைவேற்றிக் கொள்ளப்பட்ட முறை யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House the -

(i) number of soldiers/ officers who have deserted the Sri Lanka Air Force;

(ii) number of those among them who have been arrested by the Sri Lanka Police and who have surrendered, separately;

(iii) action to be taken regarding them; and

(iv) time taken to remove them from the Sri Lanka Air Force?

(b) Will he also inform the House -

(i) whether he is aware that arrangements are being made to purchase a C-130 aircraft to the Sri Lanka Air Force;

(ii) the number of C-130 aircraft currently in possession of the Sri Lanka Air Force;

(iii) the period when maintenance activities were last conducted on the aircraft concerned;

(iv) the objective of purchasing a new C-130 aircraft;

(v) whether the new C-130 aircraft is a donation or a purchase; and

(vi) how the intended objective has been satisfied so far?

(c) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (වැඩබලන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பதில் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Acting Minister of Defence)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නිලධාරීන් (නිත්‍ය / ස්වේච්ඡා) - 45

සෙසු නිලධාරීන් (නිත්‍ය / ස්වේච්ඡා) - 3,402

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

(ii) 2025 පෙබරවාරි මස 22වන දින සිට 2025 සැප්තැම්බර් මස 01වන දින දක්වා

සිවිල් පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව - 109

ගුවන් හමුදා පොලීසිය වෙත භාරවී ඇති සංඛ්‍යාව - 355

ගුවන් හමුදා පොලීසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව - 289

(iii) සේවය අතහැර ගොස් සිටීම සම්බන්ධයෙන් විනයානුකූලව පියවර ගෙන "සේවය තව දුරටත් අවශ්‍ය නොවේ" යන වගන්තිය යටතේ ගුවන් හමුදා සේවයෙන් ඉවත් කරලීමට කටයුතු සිදු කිරීම සහ කැමැති අයවළුන් ගුවන් හමුදා නීති රීතිවලට අනුකූල වන්නේ නම්, තවදුරටත් සේවය කිරීමට ඉඩ ලබා දීම.

සේවයේ රඳවා තබා ගැනීම පිළිබඳව සලකා බැලීමේදී ඔවුන් නිවාඩු නොමැතිව සිටි කාල පරිච්ඡේදය තුළ ඔවුන් විසින් සිදු කර ඇති වැරදි සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය සහ අදාළ සිවිල් පොලිස් ස්ථානයන් මඟින් නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම.

(iv) ආසන්න වශයෙන් දින 30ක පමණ කාලයක්. (මෙය ඔවුන් සේවය අතහැර ගොස් සිටි කාල සීමාවට අනුව ගනු ලබන විනය ක්‍රියාමාර්ගයේ තීරණ මත වෙනස් වේ.)

(ආ) (i) මෙය ඉඳුරාම මිලදී ගැනීමක් නොව අත්පත් කර ගැනීමක්. ඒ කියන්නේ, ඇමෙරිකාව සහ ශ්‍රී ලංකාව අතර ඇති කරගත් අවබෝධතාවක් මත කරන ලද අත් පත් කර ගැනීමක්. එතැන C-130 ගුවන් යානා 2ක් තිබෙනවා.

(ii) ගුවන් යානා දෙකක් පමණි.

(iii) ගුවන් යානා දෙකටම මේ දක්වා දිගු කාලීන නවතා තැබීමේදී සිදු කෙරෙන සියලු සේවා දිගටම පවත්වා ගෙන යන අතර, SCH 881 ගුවන් යානය 2014 ජනවාරි මස 11 වන දින සහ SCH 880 C-130 ගුවන් යානය 2019 මාර්තු මස 23 වන දින නඩත්තු ඩිපෝ වැඩසටහන් සිදු කිරීමට නියමිතව තිබුණ ද, යානා දෙකම පසුව නඩත්තුවක් ලබා නොමැත. ඒ නිසා යානා දෙකම 2014 සහ 2019 වර්ෂවලදී ගුවන්ගත කිරීම නවතා දමා ඇති අතර, ගුවන් හමුදාවේ බර ප්‍රවාහන හැකියාව බරපතළ ලෙස අඩාළ වීම හේතුවෙන් තමයි අපි මේ ගුවන් යානා දෙක අත්පත් කර ගැනීමට තීරණය කර තිබෙන්නේ.

(iv) මෙය මිලදී ගැනීමක් නොවන අතර අත්පත් කර ගැනීමකි. ජාතික ආරක්ෂක මෙහෙයුම්, මානුෂීය මෙහෙයුම් සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා දේශීය හා ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන හැකියාව වැඩිදියුණු කිරීම.

ඒ වාගේම මෙම යානා ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් අත්‍යවශ්‍ය සේවා ඉටු කර තිබෙන ගුවන් යානා දෙකක්. දේශීයව යුද්ධය පැවැති කාල වකවානුව තුළ උතුර සහ දකුණ යා කරමින් සෘජු සහාය ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම හට පිරිස්, යුධ ආයුධ වාගේම විශේෂ පුද්ගල සහ බෙහෙත් ප්‍රවාහනය කිරීම සඳහා මෙම යානා විශේෂ කාර්යයක් ඉටු කර තිබෙනවා. මෙමඟින් ඉඳුරාම ගුවන් හමුදාවේ උපාය මාර්ගික ප්‍රවාහන හැකියාව - Strategic Airlift Capability එක - වැඩිදියුණු කර ගැනීමට හැකියාව ලැබෙනවා. ඒ වාගේම මෙම යානා ජාතික ආරක්ෂක උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද විශේෂයෙන් දායක වෙනවා. අපගේ බහුකාර්ය අවශ්‍යතා අඩු වියදමකින් කර ගැනීම සහ ජාතික ආරක්ෂාවට සූදානම් වීමේ හැකියාව වර්ධනය කර ගැනීමත් මෙයින් ඉෂ්ට වෙනවා.

(v) අතිරික්ත ආරක්ෂක උපකරණ වැඩසටහන යටතේ ගුවන් යානාවන්ගේ වටිනාකම ගෙවීමකින් තොරව අලුත්වැඩියා කටයුතු, ප්‍රවාහන සහ තාක්ෂණික සහාය සඳහා වන පිරිවැය වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 15 (ගුවන් යානා දෙකට ඇමෙරිකානු ඩොලර් මිලියන 30) පමණක් ගෙන, එම ගුවන් යානා අත්පත් කර ගැනීමට අවස්ථාව සලසයි.

වත්මන් C- 130 යානා සේවයට ගැනීම ඉතා වියදම් අධිකව පවතින අතර දිගු කාලීන විසඳුමක් ලෙස ඇමෙරිකා එක්සත් ජනපදයෙන් - මා ඉහතින් ද කියූ පරිදි - අතිරික්ත ආරක්ෂක උපකරණ වැඩසටහන යටතේ C- 130 H ගුවන් යානා දෙකක් ලබා ගැනීම මඟින් යානාවල වටිනාකම ගෙවීමකින් තොරව නඩත්තු සහ ප්‍රවාහන පිරිවැය පමණක් දරනු ලබන අතර යානා ලබා ගැනීමෙන් සේවයට යෙදවිය හැකි බවත් දන්වනවා.

(vi) දැනට ඇන්ටනෝව් 32 බී ගුවන් යානා භාවිත කරමින් අපේක්ෂිත කාර්යයන් සිදු කරන අතර එමඟින් රැගෙන යා හැක්කේ ටොන් 6.7ක් පමණි. යෝජිත පරිත්‍යාගී C- 130 ගුවන් යානය මඟින් ටොන් 18ක් දක්වා අපේ උපායිය ප්‍රවාහන හැකියාවන් වැඩි දියුණු කර ගැනීමට පුළුවන්.

(ඇ) පැන නොනඟී.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ දවස්වල රටේම, විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ ඒ වාගේම පාතාල ක්‍රියාකාරකම්වලට එරෙහිව තීරණාත්මක ලෙස වැටලීම් සිදු වෙනවා. අපි හැමෝම පැහැදිලිව දන්නවා, අතීතයේ ඉඳන් ඒ සඳහා යම් දේශපාලන අනුග්‍රහ, දේශපාලන රැකවරණ තිබුණු බව. "ගෝනවල සුනිල්" කිව්වාම මතක් වෙන දේශපාලනඥයන් ඉන්නවා. "සොත්ති උපාලි" කිව්වාමත් එසේ මතක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

මම ප්‍රශ්නයට අදාළ කාරණාවට එනවා, ගරු කථානායකතුමනි. ඒ දේශපාලන රැකවරණය අපට පැහැදිලියි. පාතාල ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවන පිරිස් අතර

යුද්ධ හමුදාව හැර ගිය යම් සීමිත පිරිසක් ඉන්න බව පැහැදිලියි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ වාගේ දෙයකදී ඒ සීමිත පිරිසට නීතිය ක්‍රියාත්මක වන කොට "රණවිරුවන් දඩයම" වාගේ කාරණාත් මතු කරනවා. මෙය සූක්ෂ්මව කරන්න ඕනෑ දෙයක්. ඒවාට සම්බන්ධ වෙලා ඉන්න හමුදාව අත්හැරලා ගිය අතළොස්සක් හෝ ඉන්නවා නම්, ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේදී ආරක්ෂක අමාත්‍යාංශය විධියට ලබා දෙන සහයෝගය සහ ඒ නීතිය ක්‍රියාත්මක වන ආකාරය කවරේද යන්නයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

එම ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. පසුගිය කාල වකවානු තුළ මත්ද්‍රව්‍ය ජාවාරම වාගේම අපරාධකාරී කටයුතුවලට හමුදාවේ සිටින සමහර සෙබළුන්ගේ, ඒ වාගේම හමුදාව අත්හැර ගිය අයවලුන්ගේත් සම්බන්ධතා තිබෙන බව දැන ගන්නට ලැබුණා; අපට වාර්තාත් වුණා. ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශය වශයෙන් ත්‍රිවිධ හමුදාපතිවරුන්ට දැනුම් දීලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි දැන ගන්නට ලැබුණු ආකාරයට, වාර්තා කරපු ආකාරයට සම්බන්ධතාවක් තිබෙන අය අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව භාර දෙනවා. එයට හමුදාපතිවරුන්ගෙන්වත්, හමුදාවෙන්වත්, ආරක්ෂක අමාත්‍යාංශයෙන්වත් කිසිදු බලපෑමක් සිදු කරන්නේ නැහැ.

මොකද, නීතිය ක්‍රියාත්මක කිරීමට අපි බැඳී සිටිනවා. අපි එයට සහයෝගය දිය යුතුයි. ඒ වාගේම, ඒ සම්බන්ධතා තිබෙන අය පිළිබඳව තවත් තොරතුරු අවශ්‍යතාව අනුව අප විසින් ලබා දෙනවා. ඒ, හමුදාව අත්හැර ගිය අයවලුන් සම්බන්ධව සිවිල් නීතිය අනුව කටයුතු කිරීම සඳහා කරන දේවලටත් අපි සහයෝගය ලබා දෙනවා. ඒ වාගේම, ඒ අපරාධවලට සම්බන්ධ වන අයවලුන්ට හමුදා නීතිය යටතේ ගත යුතු ක්‍රියාමාර්ගත් අපි උපරිමයෙන් ගන්නවා කියාත් දන්වන්න කැමැතියි.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය දවස්වල විපක්ෂයෙන් කියැවුණා, විශේෂයෙන් කුඩු හා අයිස් අල්ලා ගැනීමේදී ගොඩබිමේදී කරන මෙහෙයුම් ගොඩක් සිදු වන නමුත් මුහුද ආශ්‍රිතව කරන මෙහෙයුම් අඩු වෙලා තිබෙනවා වාගේ කථාවක්. ගරු වැඩබලන අමාත්‍යතුමනි, මේ මත්ද්‍රව්‍ය සහ පාතාල ක්‍රියාකාරකම්වලට එරෙහිව ගුවන් හමුදාවේ වැඩි දියුණු කර තිබෙන ගුවන් යානා, ගුවන් හමුදා බළඇණි, ඒ වාගේම හෙලිකොප්ටර් යොදා ගැනීමේ ක්‍රමවේදය සහ ඒකට ලබා දෙන සහයෝගය පිළිබඳව මම දැන ගන්න කැමැතියි. මොකද, පසුගිය දවස්වල ඒ ගැන කථා වුණා. පසුගිය දිනවල ඇල්ල බස් අනතුර සිදු වූ අවස්ථාවේදීත් හෙලිකොප්ටර් යොදා ගන්න තිබුණා කියලා සමහර අය කියලා තිබුණා. නමුත්, ඒ වාගේ කඳු බෑවුම් ප්‍රදේශයක හෙලිකොප්ටර් යොදා ගැනීම කිසිසේත් කළ නොහැකි දෙයක්. එයයි, ප්‍රායෝගික තත්ත්වය. එවැනි හදිසි ආපදාවලදී සහ හදිසි වැටලීම්වලදී යොදා ගැනීම සඳහා ගුවන් හමුදාව සතු යානා capacity එක වැඩි කිරීම සම්බන්ධයෙන් සහ ඒකට ඉදිරියේදී ලබා දෙන සහයෝගය කොහොමද කියන ප්‍රශ්නයයි මා ඊළඟ අතුරු ප්‍රශ්නය විධියට ඉදිරිපත් කරන්නේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ඒ ප්‍රශ්නය නැඟීම සම්බන්ධවත් බෙහෙවින් ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. හදිසි ආපදා අවස්ථාවලදී ඉඳුරාම ඒ අවශ්‍යතා අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි යුද, ගුවන් හා නාවික හමුදා තුනේම හට පිරිස් සූදානම් කරලා තිබෙනවා. ඒ හට පිරිස් අවශ්‍යතාව අනුව යෙදවීම සඳහා සහ ඔවුන්ට සහයෝගය දීමක් වශයෙන් ගුවන් හමුදාවේ සහායත්, නාවික හමුදාවේ සහායත් ඒ ඒ අවස්ථාවල ලබා දෙනවා. විශේෂයෙන් අපරාධ කටයුතු සිදු වන අවස්ථාවල පොලීසියෙන් ඉල්ලීමක් කළාට පස්සේ, ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඒ ඒ හමුදාවලට දැනුම් දීලා, ගුවන් හමුදාව, යුද්ධ හමුදාව හා නාවික හමුදාව ඒ කටයුතුවලට සහයෝගය දීමට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම නාවික හමුදාව මත්ද්‍රව්‍ය ජාවාරම්වල යෙදී සිටින අයවලුන් පිළිබඳව සොයා බලා කටයුතු කිරීමටත්, ඒ සඳහා භාවිත කරන දේවල් අත්පත් කර ගැනීමටත්, උදේ, දිවා, රාත්‍රී ගැඹුරු මුහුදේ විශේෂ මෙහෙයුම් දියත් කර තිබෙනවා. ඒ නිසා ත්‍රිවිධ හමුදාවේම සහයෝගය වාගේම සිවිල් ආරක්ෂක බළඇණියේ සහයෝගය පොලීසියෙන් ඉල්ලන අවස්ථාවලදී ලබා දීමට අපි කටයුතු කර තිබෙනවා, ඉදිරියේදීත් ඒ කටයුතු කරගෙන යනවා.

බොහොම ස්තුතියි.

## ඉස්සන් ප්‍රතිඅපනයනය: විස්තර
## இறால் மீள் ஏற்றுமதி: விபரம்
RE-EXPORT OF SHRIMP : DETAILS

1159/2025

**9. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිපළ ඉස්සන් වගාව සිදු කරන බවත්;

(ii) එහෙත් වෙනත් රටවලින් ශ්‍රී ලංකාවට ඉස්සන් ආනයනය කර ප්‍රතිඅපනයනය කරන බවත්;

(iii) ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කර්මාන්තයට සහ එම කර්මාන්තයේ නිරත වන පුද්ගලයන්ට අහිතකර බලපෑමක් සිදු වන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) එසේ නම්, ඉස්සන් ප්‍රතිඅපනයනය කිරීම වෙනුවට ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව දිරිගැන්වීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பண்ணை முறையில் இறால் வளர்ப்பு மேற்கொள்ளப்படுகின்றது என்பதையும்;

(ii) எனினும் வெளிநாடுகளிலிருந்து இலங்கைக்கு இறால் இறக்குமதி செய்யப்பட்டு மீள் ஏற்றுமதி செய்யப்படுகின்றது என்பதையும்;

(iii) இதன் காரணமாக, இலங்கையின் இறால் வளர்ப்புத் தொழிற்றுறைக்கும் அத்தொழிற்றுறையில் ஈடுபட்டுள்ள மக்களுக்கும் பாதகமான தாக்கம் ஏற்படுகிறது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

[ගරු අජිත් ගිහාන් මහතා]

(ஆ) அவ்வாறெனில், இறாலை மீள் ஏற்றுமதி செய்வ தற்குப் பதிலாக இலங்கையில் இறால் வளர்ப்பை ஊக்குவிப்பதற்கான வேலைத்திட்டம் ஒன்றைச் செயற்படுத்துவாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he accept that -

(i) shrimp farming is carried out in Sri Lanka;

(ii) however, shrimp are imported to Sri Lanka from other countries and re-exported; and

(iii) this has caused an adverse impact on the shrimp farming industry in Sri Lanka and on the people engaged in that industry?

(b) If so, will he inform this House whether a course of action will be adopted to encourage shrimp farming in Sri Lanka instead of re-exporting shrimp?

(c) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources**)**
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පිළිගනී.

(ii) පිළිගනී.

(iii) නොපිළිගනී.

ඒ අනුව මෙම ප්‍රතිඅපනයන ක්‍රියාදාමය ඉතා සුපරීක්ෂාකාරී ලෙස සිදු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඒ සඳහා SOP - Standard Operating Procedure - ක්‍රමවේදය හඳුන්වා දී ඇත. ප්‍රතිඅපනයනය සිදු කරන ලද ඉස්සන් ප්‍රමාණය පහත පරිදි වේ.

2024 වර්ෂය - මෙට්‍රික් ටොන් 1,187යි.

(ආ) ඔව්.

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ඉස්සන් වගාව දිරි ගැන්වීම සඳහා වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරමින් පවතී. එම වැඩ පිළිවෙළ පහත පරිදි වේ.

ඉස්සන් වගාවේ ප්‍රධාන යෙදවුමක් වන ගුණාත්මක ඉස්සන් පැටවුන් (පසු කීටයන්) ගොවි පොළවලට ලබා දීම සඳහා පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

- ඉස්සන් විශේෂ දෙකක් මේ වන විට වාණිජ වශයෙන් වගා කරන අතර, මෙයින් L.vannamei ඉස්සන් වගා ගොවිපොළ වෙත EHP නමැති පරපෝෂී රෝගයක් ආසාදනය වී තිබීම නිසා ඉස්සන්ගේ වර්ධන වේගය අඩු වීම හේතුවෙන් ඉස්සන් නිෂ්පාදනයේ යම් අඩු වීමක් පෙන්නුම් කරයි. මෙයට පිළියමක් ලෙස EHP රෝග පාලනයද ඇතුළත්ව අභිජනනාගාර සහ ගොවිපොළ සඳහා යහපත් ජලජීවී වගා කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දී ක්‍රියාත්මක කරමින් පවතී.
- EHP රෝගය හේතුවෙන් වගාකරුවන් SPF P. monodon ඉස්සන් වගාව සඳහා වැඩි නැඹුරුතාවක් දක්වන බැවින්, එම වගා විශේෂයේ පැටවුන්ගේ ඌනතාවක් පවතී. මෙයට පිළියමක් ලෙස සංවර්ධනය කරන ලද අභිජනනාගාර 5ක් සඳහා SPF P. monodon අභිජනනයට අවසර ලබා දී ඇති අතර, තවත් එක් අභිජනනාගාරයක් අලුතින් ඉදිකිරීම සඳහා අවසර ලබා දී ඇත.

  මෙම අභිජනනාගාර සියල්ල ක්‍රියාත්මක තත්ත්වයට පැමිණීමෙන් පසු නිෂ්පාදන ඉලක්කය සඳහා අවශ්‍ය ගුණාත්මක පැටවුන් ගොවිපළ වෙත ලබා දීමට හැකිවේ.
- ඉන්දියාව හා ඉක්වදෝරය තම නිෂ්පාදන අඩු නිෂ්පාදන පිරිවැයකින් නිපදවා අඩු මිලකට අන්තර්ජාතික වෙළඳපොළ වෙත නිකුත් කිරීම හේතුවෙන් නිෂ්පාදන අන්තර්ජාතික මිල සමඟ සැසඳීමේ දී පිරිවැයට සාපේක්ෂව ඉස්සන් කර්මාන්තය ලාභදායී නොවන තත්ත්වයකට පත් වී ඇත. මෙයට පිළියමක් ලෙස විශේෂ වෙළඳපොළක් වෙත යොමු කිරීමේ අරමුණින් "Sri Lankan Jumbo Shrimp" නාමය යටතේ වැඩි විශාලත්වයෙන් යුත් ඉස්සන් වගා කිරීමට වගාකරුවන් දිරිගැන්වීමට කටයුතු කරමින් පවතී.
- ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව ප්‍රධාන වශයෙන් වෙරළබඩ දිස්ත්‍රික්ක පහක එනම්, පුත්තලම, මඩකලපුව, මන්නාරම, යාපනය හා හම්බන්තොට ක්‍රියාත්මක අතර, මෙයින් සියයට 70කට ආසන්න ඉස්සන් ප්‍රමාණයක් ලබා දෙන පුත්තලම දිස්ත්‍රික්කය ඉස්සන් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පුත්තලම, මුන්දලම හා හලාවත කලපු යාකරන ඕලන්ද ඇළ හා හලාවත මුන්දලම කළපුවල වඩදිය බාදිය ක්‍රියාත්මක වන ලෙස රොන් මඩ ඉවත් කිරීමට අවශ්‍යව ඇත.
- මෙම රොන් මඩ ඉවත් කිරීම තුළින් ඉස්සන් වගාව හා ධීවර කර්මාන්තය මඟින් ලබාගත හැකි නිෂ්පාදනය වැඩිවීම සිදු වෙන අතර, මේ සඳහා ප්‍රතිපාදන 2026 වර්ෂය සඳහා ඉල්ලුම් කර ඇත.
- විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ඉස්සන් වගාව සඳහා හඳුනා ගන්නා ලද ඉඩම් පරිසර හිතකාමී ගොවිපළ ආකාරයට ඉස්සන් වගාව සංවර්ධනය කිරීම සඳහා ලබා ගැනීමට කටයුතු කිරීම මගින් අපනයනය සඳහා ප්‍රමාණවත් ඉස්සන් අස්වැන්නක් සැකසුම් මධ්‍යස්ථාන වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, මේ වෙනකොට විශේෂයෙන් යුරෝපය සහ බටහිර රටවලට ඉස්සන් අපනයනය කරනවා.

හැබැයි, අපි දන්නවා ඒ රටවලින් සමහර රටවල නිෂ්පාදනවලට බදු පනවා තිබෙන බව. ඒ වාගේම ban කරලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ අපේ රටට ඉස්සන් ගෙනැල්ලා අපනයනය කිරීමේ ක්‍රියාවලිය වැඩි වෙන්න පුළුවන්. එම තත්ත්වය

අපේ ඉස්සන් කර්මාන්තයට බලපානවා. මේ ගෙනෙන ඉස්සන්ගෙන් ජල ජීවී වගා ක්ෂේත්‍රයට බලපාන විවිධ ලෙඩ රෝග රට තුළට එන්න පුළුවන්. ඒවා processing කරන කර්මාන්තශාලා ඒ ප්‍රදේශවල තිබෙන නිසා එහෙම බලපෑමක් ඇති වෙන්න පුළුවන්.

අනෙක් ප්‍රශ්නය මේකයි. මේ ගෙනෙන ඉස්සන් ශ්‍රී ලාංකික නාමය යටතේ අපනයනය කිරීමේදී රෝගී තත්ත්වයක් වාගේ යම් ප්‍රශ්නයක් ආවොත්, ඒ රටවලදී ඒක අහුවුණොත් අපේ රටේ ඉස්සන් කර්මාන්තයටත් බලපෑමක් වෙන්න පුළුවන්. එතකොට ban කරන්නත් පුළුවන්. අනෙක් කාරණාව තමයි, මේ ආනයනය කරන ඉස්සන් දේශීය වෙළෙඳ පොළට සැපයීමෙන් අපේ දේශීය ඉස්සන් වගාකරුවන්ට මිල ස්ථාවර කරගන්න බැරි ප්‍රශ්නයක් එන්න පුළුවන්. මෙන්න මේ ප්‍රශ්න තුන මේ කර්මාන්තයට අදාළව මගේ පළමු අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහනවා, ගරු අමාත්‍යතුමනි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ඉස්සන් කර්මාන්තය ගත්තාම, මේ ප්‍රශ්නයට විශේෂයෙන්ම මුහුණ දී තිබෙන දිස්ත්‍රික්කය තමයි පුත්තලම දිස්ත්‍රික්කය. ඒ දිස්ත්‍රික්කයේ තමයි අපේ ඉස්සන් නිෂ්පාදනයෙන් සියයට 70ක් කළේ. මෑත කාලයේදී අපට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. පසුගිය කාලයේ අපි හොඳටම පරීක්ෂා කර බැලුවා. විශේෂයෙන්ම පිට රටින් import කරන ඉස්සන් අපේ නමින් export කරනකොට අපේ රටට තිබුණු නම සහ අපේ ඉස්සන් පිළිබඳ තිබුණු තත්ත්වය පලුදු වෙලා තිබෙනවා. පිට රටින් ගෙනෙන ඉස්සන් රෝගවලින් පෙළෙන නිසා, ඒවායින් අපේ රටේ ඉස්සන් ආසාදනයට ලක්වන නිසා අපේ ඉස්සන් කර්මාන්තයට විශාල හානිදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි පැහැදිලිව එකක් කියන්න ඕනෑ,

ගරු මන්ත්‍රීතුමනි. අපි පිට රටින් import කරන ඉස්සන් අපේ දේශීය වෙළෙඳ පොළේ විකිණීමට අවසර දෙන්නේ නැහැ. ඒක පළමු කරුණ. ඊළඟ කරුණ තමයි, අපේ රටට ගෙන්වන ලද පිට රට ඉස්සන් ලංකාවේ නමින් export කරන්න අපි අවසර දෙන්නේ නැහැ. අන්න ඒ කාරණාව සැලකිල්ලට ගන්න. මේකට අපට විසඳුම් සොයාගන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

මේ කර්මාන්තය රටට ඩොලර් ගෙනෙන කර්මාන්තයක් නිසා මෙය ඉදිරියට ගෙනයන්න වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. එකක් තමයි, මේ ඉස්සන් අභිජනනාගාරවලට - hatcheriesවලට - තාක්ෂණය ගෙනැල්ලා ගුණාත්මක ඉස්සන් පැටව් නිෂ්පාදනය කිරීමේ අවශ්‍යතාව.

ඒ වාගේම තමයි, මේ ගොවීන්ට තිබෙන ගැටලුවලට මැදිහත්වීම. ඔවුන්ගේ production cost එක අඩු කර ගැනීමට ඔබතුමාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? මේ exportersලා අපි හැදුවාට export කර ගන්නත් ඕනෑ නේ. ඒ නිසා ඒ exportersලාට තිබෙන ප්‍රායෝගික ගැටලුත් අපි සොයා බලන්න ඕනෑ. මේ ක්ෂේත්‍ර තුන කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරලා නිවැරදිව වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා ද කියලා අහන්න කැමැතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ සිට උතුරු-නැඟෙනහිර ඉස්සන් කර්මාන්තය සඳහා වැඩි දායකත්වයක් ලබා දෙමින්, විශාල ඉස්සන් ගොවි පොළවල් හදමින් ඉදිරියේදී විශාල ලෙස රටට වාසිදායක තත්ත්වයක් ඇති වන ආකාරයට පරිවර්තනය වෙමින් තිබෙනවා. කෙසේ වෙතත්, පුත්තලම් දිස්ත්‍රික්කය තමයි පසුගිය කාලයේදී මේකෙන් වැඩි දායකත්වයක් අපට ලබා දුන්නේ. පසුගිය කාලයේ මේ කර්මාන්තයේ යෙදෙන පිරිසට, මේ ක්ෂේත්‍රයට දේශපාලන අත පෙවීම් පවා තිබුණා. ඒ දේශපාලන අත පෙවීම් නිසාම මේ කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැටීමට ලක් වෙලා තිබුණා. ඒ නිසාම දැන් අපි මේ ක්ෂේත්‍රය පිළිබඳ නැවත සැලකිල්ලට ලක් කර තිබෙනවා. ඒ සැලකිල්ලට ලක් කරනවා විතරක් නොවෙයි, අපි ළඟදීම export කරන සියලුදෙනාම කැඳවලා ඒගොල්ලන් එක්ක සාකච්ඡා කරලා මෙන්න මේ කටයුතු සමථයකට පත් කර ගන්නත් බලාපොරොත්තු වෙනවා.

ඊළඟ කාරණාව හැටියට ඉස්සන් නිෂ්පාදනය කරන සියලු දිස්ත්‍රික්කවලම අය මැදිහත් වන ආකාරයට අපි සාකච්ඡා කරමින් යනවා. ඒගොල්ලන් එක්කම එකතු වෙලා මේක කොහොමද ගොඩ නඟන්නේ කියලා අපේ පැත්තෙන් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ ඒගොල්ලත් එක්ක සාකච්ඡා කරමින් ඉස්සරහට යන්නත් අපි සූදානම් වෙලා තිබෙනවා. ඒ වාගේම, මේ ඉස්සන් කර්මාන්තය පෙරට වඩා විශාල වෙනසකට භාජන කරලා, වර්ධනයකට ලක් කරලා, නවීන පන්නයේ දේවල් යොදාගෙන, මේ ක්ෂේත්‍රයට අදාළ breeding centres, නැත්නම් hatcheries හදමින් විශාල වෙනසකට අපි ප්‍රවේශ වෙලා තිබෙනවා කියන එකත් මේ වෙලාවේ ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ.

## ගාල්ල දිස්ත්‍රික්කයේ තේ තවාන්: ලබා දුන් ආධාර
## காலி மாவட்டத்திலுள்ள தேயிலை நாற்று மேடைகள்: வழங்கப்பட்ட உதவிகள்
## TEA NURSERIES IN GALLE DISTRICT: ASSISTANCE PROVIDED

1279/2025

**10. ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2022 සහ 2023 වර්ෂවල ගාල්ල දිස්ත්‍රික්කය තුළ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් තේ තවාන් පවත්වාගෙන යෑම සඳහා ආධාර ලබා දී තිබේද;

(ii) එසේ නම්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තේ තවාන් සංඛ්‍යාව, ආධාරලාභියාගේ නම, ලබා දුන් ආධාර මුදල සහ තේ තවානේ ලියාපදිංචි අංකය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ආධාරලාභීන් අතරින් මේ වන විට තේ තවාන් පවත්වාගෙන යනු ලබන ආධාරලාභීන්ගේ සහ තේ තවාන් පවත්වාගෙන යනු නොලබන ආධාරලාභීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු නිශාන්ත පෙරේරා මහතා]

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022 மற்றும் 2023ஆம் ஆண்டுகளில் காலி மாவட்டத்தில் சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை மற்றும் இலங்கை தேயிலைச் சபைமூலம் தேயிலை நாற்று மேடைகளைப் பேணி வருவதற்கு உதவிகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகாரசபை மற்றும் இலங்கை தேயிலைச் சபைமூலம் உதவி வழங்கப்பட்டுள்ள தேயிலை நாற்று மேடைகளின் எண்ணிக்கை, உதவி பெறுநரின் பெயர், அளிக்கப்பட்ட உதவித் தொகை மற்றும் தேயிலை நாற்று மேடையின் பதிவு இலக்கம் ஒவ்வொரு பிரதேச செயலகம் வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி உதவி பெறுநர்கள் மத்தியில் இன்றளவில் தேயிலை நாற்று மேடைகளைப் பேணிவருகின்ற உதவிபெறுநர்கள் மற்றும் தேயிலை நாற்று மேடைகளைப் பேணிவராத உதவிபெறுநர்களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether the Tea Smallholdings Development Authority and the Sri Lanka Tea Board granted assistance for running tea nurseries within the Galle District in 2022 and 2023;

(ii) if so, the number of tea nurseries so assisted by the Tea Smallholdings Development Authority and the Sri Lanka Tea Board, the names of the recipients of such assistance, amount of such assistance, and the registration number of each such tea nursery in each DS Division, separately; and

(iii) the names of those, out of the recipients referred to above, who maintain tea nurseries at present and those who do not, separately?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තවාන් සංඛ්‍යාව 30කි. 2020 වර්ෂයේදී තවාන්19ක් සඳහා ද, 2024 වර්ෂයේදී තවාන් 11ක් සඳහා ද ආධාර ලබාදී ඇත.

2020 හා 2024 වර්ෂවලට අදාළව තවාන් විස්තරය මෙසේයි.

ලියාපදිංචි අංක SLTB/TCD/DEV.NUR/2024/GI/02 බද්දේගම Galle Ray කියන tea factory එකට රුපියල් 250,000යි. SLTB/TCD/DEV.NUR/2024/GI/04 යක්කලමුල්ලේ නිල්මිණි කියන වත්තට ලක්ෂ 5යි. නාගොඩ, තලාව කියන වත්තට ලක්ෂ 5යි. ඉමදූව වලාගොඩබැද්ද කියන වත්තට ආධාර දීලා නැහැ. ඉමදූව කොස්මුල්ල කන්ද කියන වත්තට රුපියල් 250,000යි. බද්දේගම ඉඳුරුව කන්ද වත්තට රුපියල් 250,000යි. බද්දේගම තිසර කියන වත්තට ලක්ෂ 5යි. නෙළුව, වීරවර්ධන මහත්මයාගේ Silver Valley කියන වත්තට ලක්ෂ 5යි. වැලිවිටිය, දිවිතුර, ගුණවර්ධන මහත්මයාගේ වත්තට රුපියල් 250,000ක් දීලා තිබෙනවා.

ඊට අමතරව 2020දී තවත් වතු 19ක් සඳහා ආධාර ලබා දීලා තිබෙනවා.

යක්කලමුල්ල, ධර්මප්‍රිය කියන මහත්මයාගේ වත්තට ලක්ෂ 15යි. ඉමදූවේ, අමරසූරිය කියන මහත්මයාට ලක්ෂ 15යි. වැලිවිට, ද සිල්වා මහත්මයාගේ රෙකඩහේන වත්තට ලක්ෂ 15යි. Baddegama South Tea Smallholders' සමූපකාර සමිතියක ගහබොඩ වත්තට ලක්ෂ 15යි. බදේදේගම වී.පී.ජී.ඒ.ඩී. ද සිල්වා මහත්මයාට ලක්ෂ 15යි. බද්දේගම ආර්.ජේ.ටී. අබේවර්ධන මහත්මයාට ලක්ෂ 15යි. එතුමන්ලාගේ වතුවලට මේ ආධාර දුන්නේ. වැලිවිටිය, පී.ජී.ඒ. ඉන්දිකාට ලක්ෂ 15යි. ගුණවර්ධන මහත්මයාගේ කිතුල්ගල හේන වත්තට ලක්ෂ 15යි. නෙළුව, ගුණරත්න මහත්මයාගේ වත්තට ලක්ෂ 15යි. තවලම, එච්.සී. ජයසිංහ මහත්මයාගේ වත්තට ලක්ෂ 15යි. වැලිවිටිය, දිවිතුර, බොරලුහේන වත්තට ලක්ෂ 15යි.

තවලම, එස්. අබේවික්‍රම මහත්මයාගේ වත්තට රුපියල් ලක්ෂ 15යි. වැලිවිටිය, දිවිතුර, එච්.එල්. සමන්ත මහත්මයාගේ වත්තට රුපියල් ලක්ෂ 15යි. නාගොඩ, Kudamanana (Pvt.) Limited එකට රුපියල් ලක්ෂ 7 ½යි. තවලම, Himara Tea Factory එකට රුපියල් ලක්ෂ 12 ½යි. යක්කලමුල්ල, කේ.එච්. අමරවික්‍රම මහත්මයාගේ වත්තට රුපියල් ලක්ෂ 15යි. අක්මීමන, වලහන්දූව වත්තට රුපියල් ලක්ෂ 7 ½යි. යක්කලමුල්ල, සී. ජයසිංහආරච්චි මහත්මයාගේ වත්තට රුපියල් ලක්ෂ 7 ½ක් වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් ආධාර ලබා දී තිබෙනවා.

එම තවාන්වලට ලබා දුන් ආධාර සම්බන්ධයෙන් වැඩි විස්තර ඇතුළත් ලේඛන ඇමුණුම 01 වශයෙන් මම **සභාගත*** කරනවා.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් 2022 හා 2023 වර්ෂවල ආධාර ලබා දුන් අතර තවාන් සංඛ්‍යාව 17කි. ඊට අදාළව තවාන් පිළිබඳ විස්තර ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරමි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විශේෂ තවාන් ව්‍යාපෘතිය

2022/2023 ප්‍රතිලාභී නාම ලේඛනය

ඇමුණුම 02

| අනු අංකය | කොට්ඨාශය | නම | අවසරපත්‍ර අංකය | පළමු වාරිකය රු. | දෙවන වාරිකය රු. | වතුර මෝටරය | ගේජ්150 පොලිතින් | ගේජ් 300 පොලිතින් රෝල් | 70% සෙවන දැල් ව.මී. | මෙතිල් සෝඩියම් බෝතල් | වර්තමානයේ ක්‍රියාකාරී තවානක්ද යන වග |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඉමදූව | කේ.එච්.එම් සරත් කුමාරසිංහ | SP500/CN/GA/395/IMA | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 2 | ඉමදූව | ඩබ්.ජී රසිකා නදීෂානි | SP500/CN/GA/396/IMA | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 3 | ඉමදූව | ආර්.කේ.පී. ලක්මාල් | SP500/CN/GA/397/IMA | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 4 | කොට්ටව | ඩබ්.ජී. ජගත් මිහිරාන් | SP500/CN/GA/398/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 5 | කොට්ටව | කේ.වයි.ජී. කරුණාදාස | SP500/CN/GA/399/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 6 | කොට්ටව | කේ.ජී. ගුණපිලි | SP500/CN/GA/401/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 7 | කොට්ටව | චන්ද්‍රසිරි කුලසිංහ | SP500/CN/GA/402/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 8 | කොට්ටව | කේ.කේ.පී. හේමන්ත පයලාල් | SP500/CN/GA/403/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 9 | කොට්ටව | එච්.එල්. නිරංජන | SP500/CN/GA/404/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 10 | කොට්ටව | කේ.එච්. ඥානදාස | SP500/CN/GA/405/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 11 | කොට්ටව | සීතා සූරවීර | SP500/CN/GA/406/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 12 | කොට්ටව | ජී.ජී. මොහාන් පියනන්ද | SP500/CN/GA/408/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 13 | කොට්ටව | එච්.ජ්. සමන් | SP500/CN/GA/409/KOT | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | √ |
| 14 | ඕපාත | ජේ.කේ.ඒ. සුනීතා අමරසිරි | SP500/CN/GA/410/OPA | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | |
| 15 | හල්විටිගල | පී.අමරපාල | SP500/CN/GA/411/HAL | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | |
| 16 | හල්විටිගල | ඩබ්.ජී.එස්.ආර්. වික්‍රමසිංහ | SP500/CN/GA/412/HAL | 50000 | 50000 | 1 | 26250 | 0.5 | 500 | 50 | |
| 17 | බටපොල | ඒ.ජී. කමල් කුමාර | SP500/CN/GA/413/BAT | 50000 | | | 26250 | 0.5 | 500 | 50 | |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් ආධාර ලබා දුන් තවාන් 17න් මේ වන විට තවාන් 13ක් ක්‍රියාකාරී මට්ටමේ පවතින අතර, එයින් 04ක් අක්‍රිය තත්ත්වයේ පවතී. අක්‍රිය තවාන්කරුවන්ගේ නම් පහත පරිදි වේ.

1) ජේ.කේ.ඒ. සුනීතා අමරසිරි මහත්මිය - ඕපාත කොට්ඨාසය

2) පී.අමරපාල මහතා - හල්විටිගල කොට්ඨාසය

3) ඩබ්ලිව්.ජී.එස්.ආර්. වික්‍රමසිංහ මහතා - හල්විටිගල කොට්ඨාසය

4) ඒ.ජී. කමල් කුමාර මහතා - බටපොල කොට්ඨාසය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තවාන් අතරින් තවාන් 02ක් අක්‍රිය මට්ටමේ පවතියි. එම අක්‍රිය තවාන්කරුවන්ගේ නම් පහත පරිදි වේ.

1) ඩී.එල්.ආර්. වසන්ත මහතා - යක්කලමුල්ල කොට්ඨාසය

2) වලහන්දූව ස්ටේට් ප්ලාන්ටේෂන් - අක්මීමන කොට්ඨාසය

(ආ) අදාළ නොවේ.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. එතුමා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ප්‍රශ්නයට අදාළව ගරු ඇමතිතුමා පැහැදිලි කළා, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය මඟින් ආධාර ලබා දුන් තවාන් ගැන. ගරු ඇමතිතුමනි, නමුත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ඔබතුමාගේ නාම ලේඛනයේ සඳහන් කළ තවාන්වලට අමතරව තවත් තවාන් විශාල ප්‍රමාණයකට 2022, 2023 කාලයේ ආධාර මුදල් දුන් බව. ඒ තවාන් එකක්වත් දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒවා දැනටත් නටබුන් වෙලා. එවැනි තවාන් විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටියේ තිබෙනවා.

තේ පර්යේෂණ ආයතනය සාමාන්‍යයෙන් හොඳ තේ ප්‍රභේදත් එක්ක තමයි තේ තවාන් නිර්දේශ කරන්නේ, ගරු ඇමතිතුමනි. නමුත්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි නොවුණු තවාන්වලටත් ආධාර දුන්නා. තේ තවානක් කියන්නේ, සාමාන්‍යයෙන් තේ වගාවේ ගර්භාෂය. ඒක සැලසුම් සහගතව විනාශ කිරීමේ පැත්තට තල්ලු කළා. එම නිසා 40-42 වැනි තේ ප්‍රභේද, 40-49 වැනි තේ ප්‍රභේද සම්පූර්ණයෙන්ම වගාවෙන් ඈත් වුණා. ඒකත් එක්ක තේ කර්මාන්තය අර්බුදයකට ගිහින් තිබෙනවා. ගරු ඇමතිතුමනි, දේශපාලන අරමුණු වෙනුවෙන් දුන් තේ තවාන් තිබෙනවා. ඒ කියන්නේ මනාප හඳා ගැනීම සඳහා තේ තවාන් විශාල ප්‍රමාණයකට ආධාර දුන්නා. ඒ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක තමයි ඔබතුමාගෙන් මම පළමු අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පැහැදිලි කිරීමක් එක්ක තමයි අතුරු ප්‍රශ්නය ඇහුවේ. නාම ලේඛනයේ සඳහන් තවාන් ප්‍රමාණයට අමතරව තව තවාන් තිබෙන බව ඔබතුමා කිව්වා. ඒ තවාන් ගැන ඔබතුමා අපට වාර්තා කරනවා නම් ඒ සම්බන්ධයෙන් අපට සොයා බලන්න පුළුවන්. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තිබෙන තවාන් පිළිබඳ විස්තරය තමයි මා ඒ ඉදිරිපත් කළේ. ඊට අමතරව තවාන් අපේ අමාත්‍යාංශයෙන් නොකෙරුණා කියන විශ්වාසය අපට තිබෙනවා.

නැත්නම්, ඒ වර්ෂවල වෙනස්කමක් තිබෙන්න පුළුවන්. ඔබතුමා විමසූ වර්ෂවලට පෙර වර්ෂවල නම් එහෙම තවාන් තිබෙන්න පුළුවන්කමක් තිබෙනවා. ඊට අමතරව වෙනත් ව්‍යාපෘතියක් මඟින් මේ තවාන් ක්‍රියාත්මක වුණා ද කියන එක සොයා බලන්න පුළුවන්. ඔබතුමා කියපු කාරණය අනුව දේශපාලන චුවමනාවන් මත රාජ්‍ය මුදල් යොදවලා යමක් කෙරිලා අසාර්ථක වෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් අපි සොයන්න සූදානම්. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දෙන්න කියලාත් ඔබතුමාට කියන්න කැමැතියි.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම ඇමතිතුමාට විශේෂ ස්තුතියක් කරනවා. මොකද, රුපියල් 30,000ට, රුපියල් 40,000ට තිබුණු පොහොර හොණ්ඩරය කුඩා තේ වතු හිමියන්ට, වගාකරුවන්ට සහන මිලකට ලබා දෙන්න අලුත් ක්‍රමවේදයක් - QR code එකක් - හඳුන්වා දීලා තිබෙනවා, open වෙළෙඳ පොළෙන් ලබා ගන්න. මම ඒකට නැවතත් ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ තේ තවාන් ලබා දීමේ දී ගත්ත ක්‍රියාමාර්ගය සහ නිර්ණායක මොනවාද කියන එක ගැන අපි ඔබතුමාගෙන් විමසන්න කැමැතියි. ගරු කථානායකතුමනි, විශේෂයෙන් මම කලින් සඳහන් කළා වාගේ ඇත්තටම දැන් මේ තිබෙන තේ තවාන් කිසිදු ප්‍රමිතියකින් තොරව පසුගිය කාලයේ කරගෙන ගියා. ඒකත් එක්ක මේ වෙනකොට තේ වගාව දැවැන්ත අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ තේ තවාන් සඳහා ආධාර දීපු නිර්ණායකය මොකක්ද කියන එක ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඔබතුමා විමසුවා වාගේ අපි හෙට පස්වරු 1.00ට වැලිපැන්නේ දී තේ පොහොර සහනාධාරය නව ක්‍රමවේදයකට - QR code එකක් මඟින් - ලබා දීමට සූදානම් කරලා තිබෙනවා. ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට, අපේ අමාත්‍යාංශයට රුපියල් මිලියන 2,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඔබතුමා ඇහුවා වාගේ අපේ තේ තවාන්කරුවන් මේ වෙනකොට ලහි ලහියේ ලියාපදිංචි කරමින් සිටිනවා; වෙනම App එකකට ගනිමින් සිටිනවා. ඒ සඳහා අපේ අමාත්‍යාංශයේ පහළ නිලධාරින් මඟින් කුඩා තේ වතු සමිති සාමාජිකයන්ගේ තොරතුරු එක්රැස් කරමින් දත්ත එකතු කරන එක; දත්ත ගබඩා කරන එක මේ මොහොත වන විට කරමින් පවතිනවා. ඊට අමතරව අපි තේ ෆැක්ටරි හිමියන් එක්ක සාකච්ඡා කරනවා. ඔවුන් ළඟ තිබෙනවා, දලු දෙන ගොවීන්ගේ නාම ලේඛන. අපි එම නාම ලේඛන ටිකඑකතු කරමින්, නිලධාරීන්ගේ අනුමැතියක් සහිතව බිම් මට්ටමෙන් පරීක්ෂා කරලා නිවැරදි දත්ත එකතු කරමින් ඉන්නවා. ඒ නිසා අපි මේ රටේ කුඩා තේ වතු ගොවීන්ට කියනවා, "දැන් ඔබේ තේ කර්මාන්තයේ අපේ අදාළ නිලධාරින්; තේ පරීක්ෂක නිලධාරින් ඉන්නවා. ඔවුන්ව හමුවෙලා පොහොර සහනාධාරය සඳහා දැන් ඔබට ලියාපදිංචි වෙන්න පුළුවන්. ඒ නිලධාරින් හමු වෙන්න. නැත්නම් තේ දලු දෙන ෆැක්ටරියේ තොරතුරු තිබෙනවා නම් අපි එතැනින් ඇතුළත් කර ගන්න සූදානම්" කියලා. කොහොම නමුත්, අපි හෙට ආරම්භ කරන වැඩසටහන අනුව ඔක්තෝබර් පළමුවෙනි දා ඉඳලා ක්‍රියාත්මක වන විධියට ගොවීන්ට පොහොර ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාලයේ පැන නැඟුණු ප්‍රශ්න කිහිපයක් නිරාකරණය කරන්න අපි මහන්සි ගන්නවා. තනි සමාගමක් විතරයි; රජයේ පොහොර සමාගමේ පොහොර විතරයි අපි පසුගිය කාලයේ නිකුත් කළේ. දැන් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමාගම් ගණනාවකින් ගොවියන්ගේ කැමැත්ත අනුව පොහොර ගන්න පුළුවන් විධියට අපි ඒ සඳහා මේ QR codes හරහා ක්‍රම සකස් කරලා තිබෙනවා. ඊට අමතරව ගත්තොත්, ඔබතුමා ඇහුවා වාගේ විශාල මිල ගණන් ලෙස තිබූ පොහොරවලට අපි කිලෝ 50ක මිටියකට රුපියල් 4,000ක සහනාධාරයක් රජය මඟින් ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම මේ සැරේ විශේෂ ක්‍රමවේදය ගැන ඔබතුමා විමසුවා. මේ සැරේ අපි ඉඩම් ප්‍රමාණය අනුව පොහොර දෙනවා නොවෙයි. නෙළන දලු ප්‍රමාණය පරීක්ෂා කරමින් ඒකට ප්‍රතිශතාත්මක අගයක් එකතු කරමින් තමයි පොහොර ලබා දෙන්නේ. ඉතින්, හොඳින් වගා කරලා වැඩි දලු ප්‍රමාණයක් ගන්න කෙනාට පොහොර ප්‍රමාණය ටිකක් වැඩියෙන් ගන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරලා තිබෙනවා. ඉදිරි දිනවල ඒ ගැන අදාළ නිලධාරින් මඟින් අපි බිම් මට්ටමේ පැහැදිලි කිරීමක් කරන්න සැලසුම් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## ලුණු නිෂ්පාදනය සහ ආනයනය: විස්තර
## உப்பு உற்பத்தியும் இறக்குமதியும்: விபரம்
PRODUCTION AND IMPORT OF SALT: DETAILS

298/2024

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ලුණු ප්‍රමාණය කොපමණද;

(ii) එම ලුණු ප්‍රමාණය සපයා ගන්නා ආකාරය කෙසේද;

(iii) ලුණු නිෂ්පාදනය කරනු ලබන රජයේ ආයතන සහ පෞද්ගලික ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩි වශයෙන් ලුණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ලුණු අස්වැන්න ගබඩා කරනු ලබන ගබඩා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(vi) එම ගබඩාවල ධාරිතාවය සහ එකී ධාරිතාවයන් කොපමණ කාලසීමාවක් සඳහා ප්‍රමාණවත් වන්නේද යන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2024.01.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලුණු ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, ලුණු ආනයනය කරන ලද අවස්ථා සංඛ්‍යාව සහ එම එක් එක් අවස්ථාවේදී ආනයනය කරන ලද ලුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලුණු ආනයනය කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் நுகர்வுக்காக வருடமொன்றுக்கு தேவைப்படும் உப்பின் அளவு யாது என்பதையும்;

(ii) மேற்படி அளவிலான உப்பை பெற்றுக்கொள்ளும் வழிவகைகள் யாவை என்பதையும்;

(iii) உப்பு உற்பத்தி செய்யும் அரச நிறுவனங்கள் மற்றும் தனியார் நிறுவனங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) எப்பிரதேசங்களில் அதிகளவில் உப்பு உற்பத்தி செய்யப்படுகின்றது என்பதையும்;

(v) உற்பத்தி செய்யப்படும் உப்பை களஞ்சியப்படுத்துவதற்கான களஞ்சியசாலைகள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(vi) மேற்படி களஞ்சியசாலைகளின் கொள்திறன் மற்றும் அக்கொள்திறன் போதுமானதாக அமையும் கால அளவு என்பன வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2024.01.01ஆம் திகதி தொடக்கம் தற் போதுவரை இலங்கைக்கு உப்பு இறக்குமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், உப்பு இறக்குமதி செய்யப்பட்ட சந்தர்ப்பங்களின் எண்ணிக்கை மற்றும் மேற்படி ஒவ்வொரு சந்தர்ப்பத்திலும் இறக்குமதி செய்யப்பட்ட உப்பின் அளவு என்பன வெவ்வேறாக யாது என்பதையும்;

(iii) உப்பு இறக்குமதி செய்யப்பட்டமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) quantity of salt required for annual consumption in Sri Lanka;

(ii) manner in which the said quantity of salt is procured;

(iii) names of the government and private institutions which produce salt, separately;

(iv) areas where salt is produced the most;

(v) warehouse locations where the salt harvest is stored; and

(vi) capacity of the warehouses and the duration for which the said capacity will be sufficient, separately?

(b) Will he also inform this House -

(i) whether salt has been imported to Sri Lanka from 2024.01.01 to date;

(ii) if so, the number of occasions on which salt was imported and the quantity of salt imported on each occasion, separately; and

(iii) the reasons for importing salt?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සාමාන්‍ය වාර්ෂික ලුණු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 180,000 පමණ වේ. (ගෘහස්ථ පරිභෝජනය සඳහා ලුණු මෙට්‍රික් ටොන් 130,000ක් ද, කර්මාන්ත සඳහා ලුණු මෙට්‍රික් ටොන් 50,000ක් ද අවශ්‍ය වනු ඇත.)

(ii) හම්බන්තොට, පුත්තලම, අලිමංකල, මන්නාරම සහත්‍රිකුණාමලය යන ප්‍රද්ශවල පිහිටා ඇති ලුණු ලේවායන් මඟින් මෙම ලුණු ප්‍රමාණ සපයා ගනු ලබයි.

(iii) කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව පහත සඳහන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් ලුණු නිෂ්පාදනය කරනු ලැබේ.

<u>රජයේ ආයතන</u>

ජාතික ලුණු සමාගම

ලංකා ලුණු සමාගම

<u>පෞද්ගලික ආයතන</u>

පුත්තලම සෝල්ට් ලිමිටඩ්

රයිගම් වයඹ සෝල්ටන් පී.එල්.සී.

රයිගම් ඊස්ටන් සෝල්ටන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

සදර්න් සෝල්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

පුත්තලම ලුණු නිෂ්පාදකයින්ගේ සුබසාධක සංගමය

වෙනත් සුළු හා මධ්‍ය පරිමාණ ලුණු ලේවා - පුත්තලම

(iv) කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව හම්බන්තොට, පුත්තලම, ත්‍රිකුණාමලය, යාපනය හා මන්නාරම යන ප්‍රදේශයන්හී වැඩි වශයෙන් ලුණු නිෂ්පාදනය කරයි.

(v) කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව සෑම ලුණු ලේවායකම අස්වනු නෙළීමෙන් පසුව එළිමහන් පීඨිකාවල - platforms - ලුණු ගබඩා කරනු ලබන අතර, එම සෑම ලුණු ලේවායකම වර්ෂයක අවශ්‍යතාවට වඩා ගබඩා කිරීමට අවශ්‍ය ධාරිතාවක් පවතී.

(vi) කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තාවන්ට අනුව ගබඩා ධාරිතාවය හා ධාරිතාවන් ප්‍රමාණවත් වන කාල සීමාව පහතින් දක්වා ඇත.

| අනු අංකය | ආයතනය | රාජ්‍ය ගබඩා ධාරිතාවය (මෙට්‍රික් ටොන්) | පෞද්ගලික ගබඩා ධාරිතාවය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|
| 1 | ජාතික ලුණු සමාගම - මන්නාරම | 6,000 | - |
| 2 | ජාතික ලුණු සමාගම - අලිමංකඩ | 17,000 | - |
| 3 | ලංකා ලුණු සමාගම | 110,000 | - |
| 4 | පුත්තලම සෝල්ට් ලිමිටඩ් | - | 20,000 |
| 5 | රයිගම් වයඹ සෝල්ටන් පී.එල්.සී. | - | 12,000 |
| 6 | රයිගම් ඊස්ටන් සෝල්ටන් කම්පැනි (ප්‍රයිවට් ලිමිටඩ්) | - | 25,000 |
| 7 | සදර්න් සෝල්ට් කම්පැනි (ප්‍රයිවට් ලිමිටඩ්) | - | 10,000 |
| 8 | පුත්තලම ලුණු නිෂ්පාදකයින්ගේ සුහසාධක සංගමය | - | 25,000 |
| 9 | වෙනත් සුළු හා මධ්‍ය පරිමාණ ලුණු ලේවා - පුත්තලම | - | 13,000 |
| | එකතුව | 133,000 | 105,000 |
| | | 56% | 44% |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

* ලබා ගන්නා ලුණු අස්වැන්න වර්ෂ 03ක පමණ කාලයක් ගබඩා කොට තබා ගත හැකි අතර සෑම වර්ෂයකදීම සම්පූර්ණ අස්වැන්න ලබා ගත නොහැක. නමුත්, විශේෂ කාලගුණ බලපෑමක් සිදු නොවුනහොත් 75% - 80% අස්වැන්නක් ලබා ගත හැකිය. එය දේශීය අවශ්‍යතාවට ප්‍රමාණවත් ය.

(ආ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා රේගු වාර්තාවන්ට අනුව 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලුණු මෙට්‍රික් ටොන් 1,282.0 ආනයනය කර ඇති අතර, 2025.01.01 දින සිට 2025.09.10 දින දක්වා ලුණු මෙට්‍රික් ටොන් 142,549.3 ආනයනය කර ඇත.

(iii) 2024 වර්ෂයේ අගභාගයේ දී ශ්‍රී ලංකාව තුළ සිදු වූ කාලගුණික විපර්යාසයන් හේතුවෙන් (ලුණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශවල තිබූ අධික වර්ෂාව) ලුණු නිෂ්පාදන ක්‍රියාවලිය අඩාළ වීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### සේවක වැටුප් ගෙවීමේදී පළාත් පාලන ආයතන මුහුණ දෙන ගැටලු
### ஊழியர்களின் சம்பளத்தை வழங்குவதில் உள்ளூராட்சிச் சபைகள் எதிர்கொள்ளும் பிரச்சினைகள்
### ISSUES FACED BY LOCAL AUTHORITIES IN PAYING EMPLOYEES' SALARIES

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

சர்வதேச நாணய நிதியத்தின் நிபந்தனைகளுக்கு அமைய, நமது நாட்டில் இருக்கின்ற உள்ளூராட்சிச் சபைகள் தமது உத்தியோகத்தர்களுடைய சம்பளத்தில், மாநகர சபைகள் 2024ஆம் ஆண்டு தொடக்கம் 20 சதவீதத்தையும், பிரதேச சபைகள் மற்றும் நகர சபைகள் 2025ஆம் ஆண்டு சனவரி மாதம் தொடக்கம் 20 சதவீதத்தையும் தத்தமது சபை நிதியிலிருந்து வழங்கி வருகின்றன. ஒவ்வொரு வருடமும் 20 சதவீதமாக அதிகரித்து, 2028ஆம் ஆண்டாகும்போது உள்ளூராட்சிச் சபை ஊழியர்களின் சம்பளத்தை 100 சதவீதம் அந்தந்த உள்ளூராட்சிச் சபைகளே வழங்க வேண்டும் என்ற நிபந்தனையின் அடிப்படையில் தற்போது உள்ளூராட்சிச் சபைகள் நிதியை வழங்கி வருகின்றன.

கௌரவ சபாநாயகர் அவர்களே, இன்று நாட்டில் இருக்கின்ற பொருளாதாரச் சூழ்நிலையில், நாடு முழுவதும் இருக்கின்ற உள்ளூராட்சிச் சபைகள் குறிப்பாக வட, கிழக்கு மாகாணங்களிலுள்ள பொருளாதார முன்னேற்றம் இல்லாத, அபிவிருத்தி நிதியங்கள் இல்லாத, எந்த முதலீடுகளும் இல்லாத, யுத்தத்தாலும் 'சுனாமி' போன்ற இயற்கை அனர்த்தங்களாலும் பாதிக்கப்பட்ட உள்ளூராட்சிச் சபைகள் தமது ஊழியர்களின் சம்பளத்தில் 20 சதவீதத்தைக் கொடுப்பதில் மிகவும் கஷ்டமான நிலையை எதிர்நோக்குகின்றன. இந்தச் சூழ்நிலையில் கழிவகற்றல், சுகாதார வசதிகளை வழங்கல், வடிகான் துப்புரவு, மின் விளக்குள் பொருத்துதல் போன்ற பல்வேறுபட்ட பணிகளையும் இந்த உள்ளூராட்சிச் சபைகளே செய்யவேண்டியுள்ளது. இப்பொழுது மாநகர சபைகள் உட்பட உள்ளூராட்சிச் சபைகள் இந்தச் சம்பளத்தை வழங்கவேண்டி இருப்பதால், எந்தவொரு பணியையும் பொது மக்களுக்குச் செய்ய முடியாமல் இருக்கிறது. நகரங்களில் இருக்கின்ற ஒருசில சபைகளைத் தவிர, ஏனைய சபைகள் கடுமையான சிரமங்களை எதிர்நோக்குகின்றன.

குறிப்பாக, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற ஒரு மாநகர சபை தனது ஊழியர்களுக்கு இந்த செப்ரெம்பர் மாதச் சம்பளத்தைக் கொடுப்பதற்குக்கூட கஷ்டமான நிலையில் இருக்கின்றது. இதனால் ஏனைய அரச உத்தியோகத்தர்கள் இந்த உள்ளூராட்சிச் சபைகளுக்கு சேவையாற்றுவதற்கு வர விரும்புவதில்லை. அத்துடன், தற்போது அந்த உள்ளூராட்சிச் சபைகளில் பணியாற்றுகின்றவர்கள் இடமாற்றம் பெற்று வேறு அரச நிறுவனங்களுக்குப் போகின்ற நிலைமையும் காணப்படுகின்றது. இவ்வாறு செயற்படும்போது எதிர் காலத்தில் உள்ளூராட்சிச் சபைகள் நிறையப் பிரச் சினைகளையும் கஷ்டங்களையும் எதிர்நோக்கவேண்டி ஏற்படும். அரசாங்கத்தின் "வளமான நாடு - அழகான வாழ்க்கை" மற்றும் Clean Sri Lanka போன்ற வேலைத் திட்டங்களை நடைமுறைப்படுத்துவதற்குரிய முக்கியமான நிறுவனங்கள்தான் உள்ளூராட்சிச் சபைகள்! உள்ளூராட்சிச் சபைகள் பலமில்லாமல் இருந்தால், இவற்றைச் செய்ய முடியாத சூழ்நிலை ஏற்படும்.

எனவே, அரசாங்கம் இது தொடர்பில் கவனம் செலுத்த வேண்டும். இவ்வாறான சபைகளுக்கு நீங்கள் குறிப்பிட்டதொரு கால அவகாசத்தைக் கொடுக்க வேண்டும்; அதுமாத்திரமன்றி, வட்டியில்லாக் கடன் வசதிகளையும் வழங்க வேண்டும். அதன்மூலம் சந்தைகளை அமைத்தல், எரிபொருள் நிலையங்களை அமைத்தல், வருமானத்தை ஈட்டக்கூடிய ஏனைய விடயங்களை மேற்கொள்ளல் தொடர்பில் அவற்றின் ஆலோசனைகளைப் பெற்று, ஒவ்வொரு சபை ஊடாகவும் அவற்றை மேற்கொள்வதற்கான முயற்சிகளை மேற்கொண்டால் அவை வருமானத்தைப் பெறக்கூடியதாக இருக்கும். எந்த வருமானமும் இல்லாத நிலையில் இருக்கும்போது, திடீரென்று சம்பளத்தைக் கொடுக்கச் சொன்னால், குறித்த உள்ளூராட்சிச் சபைகளால் அதனைச் செய்ய முடியாது. இந்த நிலைமை நீடித்தால், எதிர்காலத்தில் தத்தமது சபைகளின் எல்லைக்குட்பட்ட பிரதேசங்களிலுள்ள குப்பை கூளங்களை அகற்றுதல், வடிகான்களைத் துப்புரவாக்குதல் போன்ற விடயங்களைச் செய்வதில் அவை கடுமையான சவால்களை எதிர்கொள்ள நேரிடும்.

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த ஆட்சியில் casualஆக வேலைசெய்த ஊழியர்களை எந்தவிதமான cadre creationஉம் இல்லாமலும் Treasuryஇன் அனுமதி இல்லாமலும்

permanent பண்ணி இருக்கிறார்கள். உதாரணத்துக்கு, கிழக்கு மாகாணத்திலுள்ள எல்லா உள்ளூராட்சிச் சபைகளிலும் மொத்தமாக 280 cadresதான் இருந்தன. ஆனால், கடந்த ஆட்சியில் கிழக்கு மாகாணத்தில் மாத்திரம் 1,900 பேரை எந்தக் cadre creationஉம் இல்லாமல் permanent பண்ணி இருக்கிறார்கள். அந்த ஊழியர்களின் மொத்த சம்பளத்தையும் அந்த உள்ளூராட்சிச் சபைகளே வழங்கவேண்டி இருக்கின்றது. இதனால் அந்த உள்ளூராட்சிச் சபைகள் மிகவும் சிரமப்படுகின்றன. இந்த விடயத்தில் ஆளுங்கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு கிடையாது. நாட்டிலுள்ள எல்லா உள்ளூராட்சிச் சபைகளும் இந்தப் பிரச்சினையை எதிர்நோக்குகின்றன. எனவே, இது தொடர்பில் விசேட குழுவொன்றை நியமித்து, உடனடியாக இதற்குத் தீர்வு காண வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, இது தொடர்பில் நீங்கள் எடுக்கின்ற நடவடிக்கைகள் என்ன? உள்ளூராட்சிச் சபைகளின் நிதிப் பற்றாக்குறையைத் தீர்ப்பதற்கு அரசாங்கம் எடுக்கும் நடவடிக்கைகள் என்ன? அவற்றின் வருமானத்தை அதிகரிப்பதற்காக நீங்கள் எடுக்கும் முயற்சிகள் என்ன? எனக் கேட்கின்றேன். இவற்றுக்கான பதில்களை நான் உங்களிடம் எதிர்பார்க்கின்றேன். நன்றி!

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මැතිතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට මේ විධියට පිළිතුරක් ලබා දෙන්න මම කැමැතියි.

මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත ඇතුළු අනෙකුත් ආඥාපනත්වල සඳහන් විධිවිධාන ඔස්සේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මහජන උපයෝගිතා සේවා සැපයීම සඳහා අවශ්‍ය වන අරමුදල් සම්පාදනය කර ගැනීමට එකී අණ පනත් ඔස්සේ විවිධ ක්‍රමවේද අනුගමනය කරනු ලබනවා.

පළාත් පාලන ආයතන ස්වකීය බල ප්‍රදේශය තුළ මහජනතාවගේ බදු මුදල් ඇතුළු ස්වයං උත්පාදන ආදායම් මත ක්‍රියාත්මක වන ආයතන වන අතරම, ස්වකීය ආදායම් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාගැනීමට ද නෛතික විධිවිධාන සම්පාදනය වී පවතිනවා. තනි ව්‍යුහ ඒකක ලෙස ක්‍රියාත්මක වන මෙම ආයතනවල ආදායම් ඇතුළු අනෙකුත් සේවා සම්පාදනය කිරීම සඳහා පෙර වසරවලට සාපේක්ෂව දෙගුණයක් ඉක්ම වූ මුදල් ප්‍රතිපාදන 2025 වසරේදී මුදල් කොමිෂන් සභාව හරහා ලබා දී ඇත. එසේම 2026 වසරේ අය වැය යෝජනා සඳහා ද අතිවිශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කිරීම සඳහා වන ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබී ඇති බැවින් 2026 වසර සඳහාද අතිවිශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

සියලුම පළාත් පාලන ආයතන එක හා සමාන ආදායම් මට්ටම් පවතින ආයතන නොවන අතරම, අතිවිශාල ආදායම් ප්‍රමාණයක් ලබා ගන්නා මහ නගර සභා, නගර සභා මෙන්ම ප්‍රාදේශීය සභාද පවතින අතර, ඒවා බැංකු ස්ථාවර තැන්පතු විශාල ප්‍රමාණයක් ඇතිව ශක්තිමත්ව ක්‍රියාත්මක වේ.

නිදසුනක් හැටියට ගත්තොත්, කොළඹ මහ නගර සභාවේ වත්කම්වලින් රුපියල් බිලියන 4ක පමණ ස්ථාවර තැන්පතු තිබෙන බව වාර්තා වනවා. නමුත් අපි කරුවලගස්වැව වැනි ප්‍රාදේශීය සභාවකට ගියොත්, තමන්ගේ මූලික කටයුතු කරගැනීමටවත් අවශ්‍ය ප්‍රතිපාදන එම ආයතනයට ලැබෙන්නේ නැහැ.

එබැවින් 341ක් වන සියලුම පළාත් පාලන ආයතනවල වාර්ෂික අය වැය ලේඛන මත පදනම්ව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සමීක්ෂණයේදී එම ආයතනවල මූල්‍ය ශක්තිය පිළිබඳ පැහැදිලි නිර්ව්චනයක් ලබා ගත් අතර, ඒ අනුව වැටුප් සඳහා ලබා දෙන අරමුදල් කෙසේ ලබා දිය යුතුද යන්න පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත යෝජනාමාලාවක් ලබා දී ඇත.

තවද, පළාත් පාලන ආයතනවල ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් ඉතා අඩු පොලී ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර පළාත් පාලන ආයතන දැනුවත් කර එමඟින් සහනදායී පොලී මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

සියයට 4ක අවම පොලියක් යටතේ මේ ණය ක්‍රමය ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තිබෙනවා. සම්පූර්ණයෙන් නොමිලේ දෙන්න බැහැ. මධ්‍යම සංස්කෘතික අරමුදල වාගේ එකක් නොවෙයි මේක. ඒ නිසා අපට යම් පොලියක් අය කර ගන්න වෙනවා.

එසේම පළාත් පාලන ආයතන සියල්ල ඉදිරි වසර 4 තුළ ශක්තිමත් ආයතන බවට පරිවර්තනය කිරීම සඳහා ඒවායේ ආදායම් ප්‍රභව වර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අමාත්‍යාංශය විසින් කාර්ය සාධන ප්‍රධාන ලෙස රුපියල් මිලියන 3,475ක් ආදායම් උත්පාදක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වසර දෙක තුළ ලබා දීමට කටයුතු කරනු ලැබේ.

එසේම එම ආයතනවල නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පුහුණුවීම් ලබා දීමට වසරකට වරක් එක් එක් ආයතනයේ කාර්ය සාධනය මැන බලමින් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ද අමාත්‍යාංශය විසින් ශක්තිමත් වැඩසටහනක් දියත් කර ඇත.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයේ සඳහන් වුණා, IMF යෝජනාවකට අනුව කියන කාරණය. මේ, අර්ධ සත්‍යයක්. රජයේ වියදම් කපා හරින්න කියන යෝජනාව තමයි තිබුණේ. නමුත් පළාත් පාලන ආයතනවල වියදම් කපා හැරීමට කටයුතු කරලා තිබෙනවා, පසුගිය කාලය තුළ.

ඒ වාගේම එතුමා සඳහන් කළා, උතුරු, නැඟෙනහිර පළාත්වල කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් හෝ කිසිදු නව ආයෝජනයක් සිදු වී නැති බව. නමුත් අපි පසුගිය කාලය පුරා දැක්කා, විවිධ වැඩසටහන් යටතේ -"උතුරු වසන්තය" වෙන්න පුළුවන්, "නැඟෙනහිර නවෝදය" වෙන්න පුළුවන්- මහජන මුදල් විශාල ප්‍රමාණයක් ඒ ප්‍රදේශවලට යොදවපු බව. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය අනුව ඒ සංවර්ධන ව්‍යාපෘතිවලින් ඵලදායී යමක් සිදු වී නැති බවක්ද පෙනී යන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ වාගේම එතුමා නිවැරදිව සඳහන් කළා, අවිධිමත් ආකාරයට බඳවා ගැනීම් බරපතළ ප්‍රශ්නයක් හැටියට තිබෙන බව. පෞද්ගලික හිතවත්කම් මත බඳවා ගැනීම් සිදු වූ බවට හඳුනා ගන්න පුළුවන්. ඒ නිසා මේ ආයතන බරපතළ ප්‍රශ්නවලට දැන් මුහුණ දෙමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, මේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් 5,000කට ආසන්න ප්‍රමාණයක් තමයි හිටියේ කියලා. ඊට පසුව එය 8,000කට ආසන්න ප්‍රමාණයක්

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

දක්වා -3,000කින් පමණ- වැඩි කිරීමට කටයුතු කළා. මම ඒ ගැන දන්නේ නැහැ. මා ළඟ නිවැරදි තොරතුරු නැහැ, අවශ්‍යතා විමර්ශනයක්, අධ්‍යයනයක් සිදු කරලාද මේ වැඩි කිරීම කළේ කියන එක සම්බන්ධයෙන්. ඒකත් බරපතළ ප්‍රශ්නයක් හැටියට තිබෙන බව අපි දන්නවා. කොහොම වුණත්, දැන් ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආයතන පවත්වා ගෙන යෑමේ ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුවට විසඳුම් ලබා දීම සඳහා රජය හැටියට අපි මැදිහත් වෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වනවිටත් අපි මේ ආයතනවලට ආදායම් උත්පාදන ක්‍රියාවලිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය බැකෝ, මෝටර් ග්‍රේඩර් වාගේ යන්ත්‍රෝපකරණ ලබා දීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එමඟින් ඔවුන්ගේ ආදායම් වර්ධනය කරගන්න පුළුවන් වෙයි. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමනි, ඔබතුමාට කරුණු පැහැදිලි කිරීමක් කරගන්න ඕනෑද? පොඩි වෙලාවක් ඇතුළත ඒ ගැන කියන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා, පැහැදිලිව පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට ව්‍යාපෘති ආරම්භ කරලා ආදායම් ලැබෙන්න කාලයක් ගත වෙනවා. ඒ නිසා 2026 - 2028 කියන අවුරුදු දෙකට හෝ ඒ සේවකයන්ගේ පඩි ක්‍රමානුකූලව - සියයට 20ත්, 40ත් අතර- ගෙවන්න මුදල් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු මන්ත්‍රීතුමා, අපි ඒ පිළිබඳව අධ්‍යයනය කරලා තොරතුරු ඉදිරිපත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

# II

## යෝජිත අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ
உத்தேச கல்விப் பாடத்திட்ட மறுசீரமைப்பு
PROPOSED EDUCATION CURRICULA REFORMS

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, இலங்கையின் கல்வித்துறையில் புதிய கலைத்திட்ட மறுசீரமைப்பு வேலைத்திட்டங்கள் இப்பொழுது கொண்டுவரப்படுகின்றன. இவ்விடயம் தொடர்பான சில விளக்கமூட்டும் கூட்டங்களும் தங்களின் தலைமையில் நடைபெற்றுள்ளன. புதிய கலைத்திட்டம் மாணவர்களுக்குச் சுமையைக் குறைப்பதாகவும் கல்வியில் புதிய புத்தாக்கத் தேடல்களைக் கொண்டுவருவதற்கான வழிமுறையாகவும் இருக்குமெனக் கூறப்படுகின்றது. 6ஆம் தரத்துக்கு 15 கட்டாய பாடங்களும் 3 தெரிவுப் பாடங்களும் என 18 பாடங்களாயின் நேர அட்டவணை தயாரிப்பதிலுள்ள இடர்பாடுகள், நிலைமாற்றுத் திறன்களில் மாணவன் 2 பாடங்களைத் தெரிவு செய்தல், இவ்வளவு காலமும் தவணைக்கு 265 மணித்தியாலயங்களாக இருந்த மாணவனின் கற்றல் நேரம் தற்போதைய புதிய கலைத்திட்ட வரவால் 365 மணித்தியாலங்களாக வரவுள்ளமை என்பன இதுவரை காலமும் இருந்ததைவிட மாணவனுக்கு 30% சுமையை அதிகரித்துள்ளது. சமயப் பாடங்களில் சைவ சமயம் சீராக முன்னெடுக்கப்படவில்லை. வரலாறு, சித்திரம் போன்ற பாடங்களில் தமிழர் வரலாறுகள், தமிழ் இலச்சினைகள், அடையாளங்கள் திட்டமிட்டே மறைக்கப்படுகின்றன.

01. இவற்றுக்கான தீர்வுகள் புதிய கல்விச் சீர்த்திருத்தத்தினூடாகக் கொண்டுவரப்படுமா? புதிய கல்விக் கலைத்திட்டம் எப்போது நடைமுறைக்கு வரும்?

    அதற்கான வெள்ளை அறிக்கை வெளியிடப்படுமா?

02. தேசிய கல்வி நிறுவகத்தில் அமைக்கப்பட்டுள்ள கல்விசார் அலுவல்கள் சபை, கல்விப் பேரவைக் குழு ஆகிய இரண்டிலும் தமிழ் மொழி சார்ந்த உத்தியோகத்தர்கள் யாராவது உள்ளடக்கப்பட்டுள்ளார்களா?

03. கலைத்திட்டக் கொள்கை அல்லது வெள்ளை அறிக்கை சம்பந்தமான விடயங்களில் ஈடுபடுகின்றவர்களின் பெயர்ப்பட்டியலைச் சபைக்குச் சமர்ப்பிக்க முடியுமா?

04. புதிய கல்விச் சீர்திருத்த அமுலாக்கக் குழுவில் தமிழ் மொழிமூல பேராசிரியர்கள், பாட நிபுணத்துவம் கொண்டவர்கள் எத்தனை பேர் உள்ளடங்கி உள்ளார்கள்?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, the Answer to the Question raised by the Hon. Sivagnanam Shritharan is as follows:

1. We intend to initiate the education curriculum reforms for Grades 1 and 6 in January, 2026. Then, subsequently in each year, we will be introducing the reforms for each grade progressively. The complete document on the reforms will be submitted very soon to the Cabinet for approval. Actually, prior to that, it will also be presented to the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education and the Subcommittee on

Education Reforms, of which the Hon. Member is also a Member. The education reforms that we are seeking stress inclusivity and acknowledgment of the plurality within our society. So, all of that will be included and will be apparent in the curriculum reforms that are proposed.

2. Yes. There are Tamil-speaking members in all of the committees appointed by the NIE.

3. Yes. We are able to submit the names of those involved in drafting the concept paper as well as those engaged in the curriculum reform process.

4. The Hon. Member has requested for the names of the Tamil-speaking members involved. There are over 100 involved in that process. I received this Question yesterday. So, I need a little more time to give you the names, Hon. Member, as they are still being collated. Also, the implementation of the curriculum reforms is under the purview of the officials of the Ministry of Education that we have appointed. There are Tamil-speaking members who are part of this process. Once again, if the Hon. Member requires, I will submit the names to him.

Thank you.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதம அமைச்சர் அவர்களே, விடையளித் தமைக்கு நன்றி!

கல்வி அமைச்சில் கிட்டத்தட்ட 20 துறைகளில் தமிழ் மொழிமூல உத்தியோகத்தர்கள் இல்லாத நிலைமை காணப்படுகின்றது. சைவ சமயப் பாடத்துக்கான symbolicஆக நடராஜரைக் கொண்டுவருவதற்குத் தீர்மானிக்கும்போது, சிலர் அதனை எதிர்ப்பதாகவும் செய்திகள் வெளியாகின்றன. சமயப் பாடங்கள் தொடர்பில் குறிப்பாக கிறிஸ்தவம், கத்தோலிக்கம், பௌத்த சமயம், சைவ சமயம் தொடர்பில் முடிவுகளை எடுக்கும்போது, அது சம்பந்தமாகவுள்ள பல்கலைக்கழக விரிவுரையாளர்கள், நிபுணர்கள், ஏனைய வெளி அமைப்புக்கள், சமய நிறுவனங்களை அழைத்துக் கலந்துரையாடியும், ஒரு கூட்டத்தை ஏற்பாடு செய்து எங்களோடு கதைத்தும் முடிவுகளை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். அதேநேரம், வரலாறு, சித்திரம் போன்ற பாடங்களில் தமிழர்களுடைய வரலாறுகள், அடையாளங்கள், மன்னர்களுடைய பெயர்கள் நிறைய இல்லாமற் செய்யப்படுகின்றன. இந்த விடயம் தொடர்பில் உங்களுடைய கரிசனை என்ன என்பதை அறிய முடியுமா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, if there is any distortion or exclusion of any historical events or people that should be included, we will certainly look into it.

Then, with regard to the subject of Religion, for each religion, there is an Advisory Committee in the Ministry; for Hinduism also, there is an Advisory Committee. All the modules on religions are first submitted to that Committee for review and approval, and it is with their suggestions that the final module is sent for publication. Just two weeks ago also, I met with the Hindu Religious Advisory Committee to discuss some of these issues that the Hon. Member is raising. Their opinion on this matter was sought and their recommendations had been sent to the National Institute of Education. In fact, the NIE member in charge of the Hinduism subject was also present at that Committee when this discussion took place.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා.

## "නා උයන" ආරණ්‍ය සේනාසනයේ සිදු වූ ඛේදජනක අනතුර: බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## "நா உயன" ஆரண்ய சேனாசனவில் இடம்பெற்ற துயர விபத்து: புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று

## TRAGIC ACCIDENT OCCURRED AT "NA UYANA" MONASTERY: STATEMENT BY MINISTER OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, අමාත්‍යාංශ නිවේදනයක් වාගේම ලංකා රජයට සම්බන්ධ තොරතුරක් තමයි මට කියන්නට තිබෙන්නේ. අප සියලුදෙනාම මේ වෙනකොට දැනුවත් වෙලා තිබෙනවා, ඊයේ රාත්‍රියේ මැල්සිරිපුර, පන්සියගම ප්‍රදේශයේ තිබෙන "නා උයන" ථේරවාද බෞද්ධ ආරණ්‍ය සේනාසනයේ සිදු වූ හදිසි අනතුර පිළිබඳව. ඒ හදිසි අනතුර නිසා අපේ ස්වාමීන් වහන්සේලා හත්නමක් අවාසනාවන්ත ලෙස අපවත් වෙලා තිබෙනවා. ඒ වාගේම තවත් හයනමක් තුවාල ලබා තිබෙනවා. එයින් දෙනමක් මේ වන විට දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටිනවා. ප්‍රථමකොටම, අපවත් වී වදාළ ඒ පූජනීය ස්වාමීන් වහන්සේලා හත්නම වෙනුවෙන් අපේ අමාත්‍යාංශයේත්, ලංකා රජයේත්, සමස්ත පාර්ලිමේන්තුවේත් ශෝකය, සංවේගය පළ කර සිටිනවා. ඒ භික්ෂූන් වහන්සේලා සත්නම අතරින් සතරනමක් ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලා. තුන්නමක් විදේශීය ස්වාමීන් වහන්සේලා. පූජ්‍ය මල්වානේගම සමිද්ධි හිමි, පූජ්‍ය නාවලපිටියේ උත්තරානන්ද හිමි, පූජ්‍ය නුගේගොඩ විපස්සී හිමි, පූජ්‍ය උඩවලවේ සාන්තසුමන හිමි කියන අපේ රටේ ස්වාමීන් වහන්සේලා සිව්නමක් මෙලෙස අපවත් වී තිබෙනවා.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

පූජ්‍ය ධම්මරංසි ස්වාමීන් වහන්සේ රුමේනියානු ජාතික හිමිනමක්. පූජ්‍ය ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ රුසියානු ජාතික හිමිනමක්. පූජ්‍ය ධම්මගවේසී ස්වාමීන් වහන්සේ ඉන්දියානු හිමිනමක්. ඒ ස්වාමීන් වහන්සේලා සියලු දෙනාගේම අපවත් වීම වෙනුවෙන් මා නැවත වතාවක් අපගේ ශෝකය, සංවේගය පළ කරනවා. අතිපූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද මහ තෙරුන් වහන්සේ තමයි "නා උයන" ථේරවාද බෞද්ධ මධ්‍යස්ථානයේ, ආරණ්‍ය සේනාසනයේ අධිපතිත්වය දරන්නේ. මේ තොරතුර අපට ලැබුණු මොහොතේ ඉඳලා අපි මේ සඳහා මැදිහත් වීම් කරනු ලැබුවා. විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු ගමගෙදර දිසානායක මැතිතුමා එම ස්ථානයට යන්න පිටත් වුණා. ඒ වාගේම වයඹ ආණ්ඩුකාරතුමා, වයඹ සෞඛ්‍ය ලේකම්තුමිය සහ අදාළ වෛද්‍යවරුන් ඉතා කඩිනම් මැදිහත් වීම් කර දුන්නා. නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න මැතිතුමාත් සහයෝගය ලබා දුන්නා. ඒ වාගේම මේ සඳහා විදෙස් කටයුතු පැත්තෙනුත් අපට සහයෝගය අවශ්‍ය වෙනවා. අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමාට මම කථා කළා. මොකද, නාඋයනේ නායක ස්වාමීන් වහන්සේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගෙන් විමසා තිබෙනවා, විදේශීය ගෞරවනීය භික්ෂූන් වහන්සේලා තුන්නමගේ ආදාහන පූජෝත්සව කටයුතු අපේ රටේදීම පැවැත්වීමට අවශ්‍ය අවසරය සහ මඟ පෙන්වීම ලබා දෙන්න කියලා. ඒ සම්බන්ධ කටයුතු කෙරෙමින් පවතිනවා.

අනතුරට පත් වෙලා ප්‍රතිකාර ලබමින් ඉන්න ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට ඉක්මන් නිරෝගී සුව අපි සියලු දෙනාම ප්‍රාර්ථනා කළ යුතුයි. මෙම ආදාහන පූජෝත්සව සම්බන්ධයෙන් අද රාත්‍රී 7.00ට කමිටුවක් රැස් වෙනවා, එහිදී. ඒ සඳහා අපගේ සහභාගීත්වයත් සිදු කරන්න බලාපොරොත්තු වන අතර, රජය හැටියට ඒ සම්බන්ධයෙන් කළ යුතු ඉහළම මැදිහත්වීම ඉතාම ගෞරවයෙන් සිදු කරන්නට අපේක්ෂා කරන බවත් දැනුම් දෙන්නට ඕනෑ. නැවත වතාවක්, අපවත් වී වදාළ ඒ පූජනීය ස්වාමීන් වහන්සේලා සියලු දෙනාටම ලක් රජයේත්, අප සියලු දෙනාගේත්, අමාත්‍යාංශයේත් ශෝකය, සංවේගය පළ කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම "නා උයන" ආරණ්‍ය සේනාසනය කේන්ද්‍රගත කරගෙන සිදුවුණු මහා ඛේදවාචකය තුළ ඒ අපවත් වී වදාළ සියලුම ගෞරවනීය ස්වාමීන්ද්‍රයන් වහන්සේලා වෙනුවෙන් අපගේ බලවත් ශෝකය, කනගාටුව, සාතිශය සංවේගය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා. ඒ ආරණ්‍ය සේනාසනයට සම්බන්ධ වෙලා ඒ දානමය පුණ්‍ය කටයුතුවලට ප්‍රායෝගිකව අපිත් මැදිහත් වෙලා තිබෙනවා. මේ සිදුවුණු ඛේදවාචකය පිළිබඳව අපේ සාතිශය සංවේගය පළ කරන අතර, රජය දක්වන මැදිහත්වීම අගය කොට සලකනවා. ඒ සඳහා හැම අතකින්ම කළ හැකි උපකාර, උපරිම වශයෙන් ඉෂ්ට සිද්ධ කිරීම අපේ වගකීමයි, අපේ යුතුකමයි. ඒ වෙනුවෙන් මේ අවස්ථාවේදී අපේ සහයෝගයත්, අවශ්‍ය මැදිහත්වීමත් ලබා දෙන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අපවත් වූ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් නැවත නැවතත් අපගේ බලවත් ශෝකය පළ කර සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු (අචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. You have 15 minutes.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

[පූ.භා. 11.33]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ වැඩබලන මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා )**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்திப் பதில் அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Acting Minister of Finance, Planning and Economic Development)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 15 දිනැති අංක 2449/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.09.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි තමයි අද දින විෂය අංක 1 යටතේ ඉදිරිපත් කරන්නේ. අපි කවුරුත් දන්නවා, රට ඒකපාර්ශ්විකව බුන්වත්භාවයට පත් වෙලා, රටේ ආර්ථිකය බිඳ වැටිලා තිබුණු අවස්ථාවේදී ආණ්ඩුව තීන්දුවක් ගන්නවා විශේෂයෙන් වාහන ආනයනය කිරීම නවත්වන්න, විදේශ විනිමය ගැටලුව නිසා. කෙසේ වෙතත්, එය නැවත යථාවත් වෙමින් ඉදිරියට එනකොට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you may continue your speech.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024.04.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින්, "සංචාරක ක්ෂේත්‍රයේ වේගවත් වර්ධනයක් අත්පත් කර ගැනීම" කියන තේමාවට අනුව යම් යම් තීරු බදු සහන යටතේ වෑන් රථ 750ක්, බස් රථ 250ක් -ඔක්කොම වාහන 1,000ක්- ආනයනය කිරීම සඳහා වූ රෙගුලාසියක් පනවා තිබුණා. ඒ රෙගුලාසිය බලපවත්වන කාල පරිච්ඡේදය විධියට සඳහන් වෙලා තිබුණේ 2025 ජූනි 30 දක්වා යනුවෙනුයි. අපේ ආණ්ඩුව පත් වුණාට පසුව ආර්ථිකය ස්ථාවර කිරීමේ මූලික අඩිතාලම දමමින් ඉදිරියට එනකොට ආණ්ඩුව තීන්දුවක් ගත්තා, වාහන ආනයනය සම්බන්ධයෙන් තිබෙන බාධක සියල්ල ක්‍රමිකව අදියර තුනක් යටතේ ඉවත් කරන්න. ඒ අනුව, 2025.02.01වැනි දා වනකොට සියලුම ආකාරයේ වාහන ආනයනය කිරීමට තිබූ සීමා අයින් වුණා. කෙසේ වෙතත්, මේ රෙගුලාසිය විශේෂ බදු සහනයක් යටතේ බලපැවැත්වුණා, ජූනි 30 දින දක්වා. ඒක එහෙමම ක්‍රියාත්මක වුණා. කෙසේ නමුත්, විශේෂ අවසරය යටතේ ගෙන්වන ලද වාහන වරායෙන් නිදහස් කර ගැනීමේදී විවිධ තාක්ෂණික කරුණු කිහිපයක පමාවෙන් තවදුරටත් ඒගොල්ලන්ට ඒ සහනය ලබා දීමේ අවශ්‍යතාව අපට පැන නැඟුණා. 2025.06.30වන දිනෙන් අවසන් වීමට තිබුණු ඒ නීතිය වෙනුවට නව රෙගුලාසියක් පැනවීම කළා. ඒ අනුව, එම කාල සීමාව 2025 සැප්තැම්බර් 30වන දා දක්වා මාස 3කින් වැඩි කළා. ඒ නීතිමය අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට තමයි මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිවරයා විසින් අත්සන් කරන ලද ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. එතකොට පැවැති තත්ත්වයත්, අද පවතින ආර්ථික තත්ත්වයත්, විශේෂයෙන්ම සැප්තැම්බර් 21 වෙද්දී අපේ ආණ්ඩුවට වසරක් පිරීම වනකොට ලබා ගත් ප්‍රගතිය පිළිබඳවත් යම් අදහසක් ඉදිරිපත් කරන්න මම කැමැතියි.

අපි කවුරුත් දන්නවා, අපේ ආණ්ඩුව ප්‍රධාන තේමාවක් යටතේ තමයි සියලු වැඩ කටයුතු ඉදිරිපත් කළේ කියන එක. ඒ තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමාව. එය භාරදූර කාර්යයක්, දීර්ඝ කාලයක් පැති ගණනාවකින් ඉදිරියට යා යුතු කාරණයක්. ඒ කාරණය ඉෂ්ට කර ගැනීම සඳහා ඒ ඒ මොහොතේ පවතින තත්ත්වයන්ට යටත්ව කටයුතු කළ යුතු වෙනවා.

ඒ වාගේම දේශීය වශයෙන් හා විදේශීය වශයෙන් අපි අපේක්ෂා නොකරන දේවලට අපට මුහුණ දෙන්න සිදු වන තත්ත්වයන් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයෙන් reciprocal tariff පැනවීම වැනි තත්ත්වයන් පැන නැඟුණා. මේ විවිධ තත්ත්වයන් කළමනාකරණය කරමින් අපි පළමුවැනි අවුරුද්ද තුළදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ කාරණයක් තමයි, ආර්ථික ස්ථායීකරණය. ඒ ආර්ථික ස්ථායීකරණය පිළිබඳ විවිධ දත්ත එළියට එමින් තිබෙනවා. ඒ පිළිබඳ ආර්ථික විද්‍යාඥයන්, විශ්ලේෂකයන්, ඒ වාගේම ජාත්‍යන්තර ආයතන දත්ත ඉදිරිපත් කරනවා. මෑතකදී බ්ලූම්බර්ග් ආයතනය විසිනුත් දත්ත ඉදිරිපත් කළා. මේ දත්ත අනුව පෙනෙනවා, ඒ ස්ථායීකරණය දැන් සෑහෙන මට්ටමකට ඇවිත් තිබෙන බව සහ ඉදිරිය සඳහා අවශ්‍ය පාර නිර්මාණය වෙලා තිබෙන බව. රට දියුණු කිරීම සඳහා අප කවුරුත් අපේක්ෂා කරනවා නම්, මේ ස්ථායීකරණය යටතේ නව ආයෝජන කැන්දන්නට ඕනෑ. මොකද, ප්‍රමාණවත් ආයෝජන නැතිව ආර්ථික වර්ධනයක් ලබා ගන්න බැහැ. ඒ වෙනුවෙන් ඉදිරියට යනවා නම් බෙහෙවින්ම වැදගත් වන්නේ දේශීය විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කර ගන්න අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමයි. ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු අපි කරමින් ඉන්නවා. අවශ්‍ය නීතිමය රාමුව, ප්‍රතිපාදන අපි සකස් කරමින් ඉන්නවා. හැබැයි, ඒ අතරතුරේම බොහෝ දුරට දේශපාලන හේතු නිසා හෝ වෙනත් හේතු නිසා සමාජය තුළ තවදුරටත් අවිශ්වාසය නිර්මාණය කරන කථා, තොරතුරු, වැරැදි තොරතුරු, ඇත්ත තොරතුරු විකෘති කිරීම් ආදි විවිධ දේවල් සිදු වනවා.

ආර්ථික ස්ථාවරත්වයට බලපාන කාරණා මොනවාද කියන එක සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. ඒවායින් ප්‍රධාන වන්නේ උද්ධමනය පාලනය කිරීම කියන කාරණයයි. අපට තේරෙන භාෂාවෙන් ගත්තාම, උද්ධමනය කියන්නේ අප මිල දී ගන්නා බඩු මුට්ටුවල මිල අඛණ්ඩව වැඩි වීමයි. පසුගිය ආණ්ඩු කාලවල අර්බුදකාරී තත්ත්ව පැවැති අවස්ථාවලදී එය සියයට 70, 80 දක්වා අගයකට ගියා. ඒ කියන්නේ, රුපියල් 100කට ගන්න තිබුණු භාණ්ඩ ප්‍රමාණය මිල දී ගැනීමේදී එකවර රුපියල් 170ක්, 180ක් ගෙවන්න සිද්ධ වුණා. ඒ නිසා සියයට 70ක, 80ක විතර උද්ධමනකාරී තත්ත්වයක් පැවතුණා. එහෙම වුණාම මිනිසුන්ගේ මිල දී ගැනීමේ හැකියාව -ක්‍රය ශක්තිය- අඩු වෙනවා. ඒක ආර්ථිකයකට හොඳ නැහැ. එහෙම වුණාම ආර්ථිකයක් ඉදිරියට යන්නේ නැහැ.

එවැනි තත්ත්වයක තිබුණු රටක් ක්‍රමිකව අපේ ආණ්ඩුවේ පාලනයට පත් වුණාට පසුව ස්ථාවරභාවයේ ලක්ෂණ පෙන්නුම් කළා. අපට පුළුවන්කම ලැබුණා ඒ උද්ධමනය පාලනය කරලා, පසුගිය මාස 11 තුළදීම උද්ධමනය බින්දුව හෝ සෘණ කියන තැනක පවත්වාගෙන යන්න. ඒ කියන්නේ, රුපියල් 100කින් ගත්තු භාණ්ඩය මේ මාස 11 ඇතුළත තවදුරටත් රුපියල් 100ටම ලබා ගැනීමේ හැකියාව පැවතීමයි. ඒ නිසා තමයි උද්ධමනය බින්දුවත්, සියයට දශම එකක වාගේ ආසන්න ප්‍රමාණයක තිබුණේ. ඉදිරියේදී උද්ධමනය බින්දුවේම හෝ සෘණ මට්ටමක තියාගෙන ඉන්නවාට වඩා මේ ආර්ථිකය තවත් වේගවත්ව ඉදිරියට වර්ධනය වෙනවා කියන සලකුණ පෙන්වන්න උද්ධමනය යම් ප්‍රමාණයක, සැලකිය යුතු මට්ටමක පවත්වා ගැනීම වැදගත්. ඒ උද්ධමනය පාලනය කරන්න පුළුවන් එකක් වෙන්න ඕනෑ. ඒ නිසාම 2023දී මුදල් අමාත්‍යාංශයත්, මහ බැංකුවත් ලංකාවේ ඉදිරිය පිළිබඳව හිතලා පැවැති ආර්ථික දත්ත සහ ලෝක දත්ත පිළිබඳව -global economic outlook එක- හිතලා යම් එකඟතාවකට ආවා. අපි ඒකට කියනවා "Flexible Inflation Target" කියලා.

අපි නම්‍යශීලී උද්ධමන ඉලක්කයක් යොමු කර ගත්තා. ඒ කියන්නේ, මහ බැංකුව ස්වාධීනව වැඩ කටයුතු කරන කොට මේ අවුරුදු තුන තුළ -2023 ඉඳලා 2026 වනකල්- ඉලක්කයක් විධියට උද්ධමනය සියයට 5 තුළ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගැනීමයි. ඒක හොඳයි. ඒ කියන්නේ එය ආර්ථික ස්ථායීකරණයේ ඉලක්කයක්. අපි කලබල වෙන්න ඕනෑ මෙන්න මේ කියන සියයට 5 තුළ රඳවා ගන්නේ නැත්නම් විතරයි. සියයට 5 තුළ රඳවා ගන්න බැරිව සියයට 20ට, 30ට, 40ට යනවා නම් තමයි, එවැනි තත්ත්වයකදී තමයි මහ බැංකුව මැදිහත් වෙලා

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

කටයුතු කරන්න ඕනෑ. මහ බැංකුවට අදාළ tools -උපකරණ- තිබෙන නිසා එවැනි තත්ත්වයක් ආවත් ඒක පාලනය කරාවි. නමුත්, දැන් තිබෙන තත්ත්වය මොකක්ද? බින්දුවත් ඍණ මට්ටමක අගයකත් තිබුණු උද්ධමනය අගෝස්තු මාසයේදී සියයට 1.2ක් වෙනවා. එතකොටම ප්‍රවෘත්ති මවනවා, "ඔන්න ආයෙත් උද්ධමනය සියයට 1.2ක් වුණා" කියලා. ඒකත් වැරැදි විධියටයි - 1.5ක් කියලායි- මාධ්‍ය වාර්තා කරලා තිබුණේ. ඒ විධියට මේ සමාජයේ භයක් හදන්න යනවා. නමුත්, උද්ධමනය ඇත්තටම සියයට 5 ඇතුළේ තිබෙනවා කියන්නේ target එක ඇතුළේ තිබෙනවා කියන එකයි. අපට කියා තිබෙනවා එය ධන 2ත්, ඍණ 2ත් ඇතුළේ විචලා වෙන්න ඕනෑ කියලා. උද්ධමනය සියයට 3ත්, 7ත් ඇතුළේ විචලනය වීම කියන්නේ අප මේ කියන Target එක ඇතුළේ ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා කියන එකයි. තවමත් ඒ සීමාව ධන 3ට ඇවිල්ලා නැහැ. එය 1.2යි. ඒ නිසා විශේෂයෙන් අපි මහ ජනතාවටත් යෝජනා කරනවා මේ තොරතුරු විවිධාකාරයෙන් ඉදිරිපත් කරද්දී ඔබත් විචක්ෂණශීලී වෙන්න කියලා. ඒ වාගේම මේ තොරතුරු බෙදා හරින අයත් නිල තොරතුරු, නිවැරැදි තොරතුරු ඉදිරිපත් කරන්න. එහෙම නැතිව සමාජයේ සැකය, අවිශ්වාසය නිර්මාණය කරන කටයුතු කරන්න එපා. මොකද, අප ඔක්කෝටම අයිති මේ රට වැටිලා තිබුණු තැනින් සමස්තයක් විධියට ඉදිරියට ගෙන යාමේ ක්‍රියාමාර්ගයට අකුල් හෙළීමක් තමයි ඒ සිදු කරන්නේ.

මේ ස්ථායීකරණයේ ප්‍රතිඵල පෙනෙමින් තිබෙනවා. ඒ තමයි, ආර්ථික වර්ධනය. ඒ පිළිබඳවත් වැරැදි දත්ත හදනවා. බිඳ වට්ටපු රටක් ජාත්‍යන්තර ආයතන මැදිහත් වෙලා ඒ තිබුණු තත්ත්වයෙන්ම පුරෝකථනය කරන්නේ නැහැ, අඛණ්ඩව ගලාගෙන යන ආර්ථිකයක් විධියට පුරෝකථනය කරන්නේ නැහැ. මොකද, අපට ලැබුණේම සාමාන්‍ය ආර්ථිකයක් නොවෙයි, බිඳ වට්ටපු ආර්ථිකයක්. ඒ අනුව, පැවැති දත්ත, ලෝක ආර්ථික දත්ත අනුව ඒගොල්ලන් පුරෝකථනය කර තිබුණා සියයට 3.5ක ආර්ථික වර්ධනයක් ලබා ගැනීම මේ ස්ථායීකරණයට ප්‍රමාණවත් කියලා. අපේ ඉලක්කය, අපේ වැඩ පිළිවෙළ ඇතුළේ ඒ සියයට 3.5 ළඟා කරගෙන තිබුණා නම් එය හොඳටම ප්‍රමාණවත්. ඒ තිබුණු ආර්ථික අර්බුදයේ ගැඹුර හරියට විශ්ලේෂණය කර ගත්තොත් ඒ ප්‍රමාණය ළඟා කර ගන්න බැරි වුණත් අපි එච්චර කලබල වෙන්න ඕනෑ නැහැ. ඇත්ත ප්‍රතිඵලය මොකක්ද? අපට පුළුවන් වෙලා තිබෙනවා ඒ ඉලක්ක අභිබවමින් 2025 පළමුවෙනි කාර්තු දෙකේම ආර්ථිකය වර්ධනය කරන්න. ඇත්ත ප්‍රතිඵලය තමයි එය. පළමුවෙනි කාර්තුවේදී 4.8ක්, දෙවැනි කාර්තුවේදී 4.9ක්. ඒ ඉලක්කය අභිබවමින් යනවා කියන්නේ ඒ ස්ථාවරභාවය හරහා ආයෝජන එමින් තිබෙනවා කියන එකයි. ඒ ආයෝජන කැඳවීම සඳහා රාජ්‍යය විධියට මැදිහත් **වෙමින් දරපු** ප්‍රාග්ධන වියදම් ප්‍රමාණයකුත් තිබෙනවා.

විශේෂයෙන් මේ ආර්ථික වර්ධනය සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම බෙහෙවින් කැපී පෙනෙන දෙයක්. බැංකු පද්ධතිය හරහා ලබා ගන්නා ණය තමයි මුදල් සැපයුම කියලා කියන්නේ. ඒක මුදල් අච්චු ගැසීම නොවෙයි. මේ පිළිබඳව විවිධ වැරැදි අර්ථකථන ඉදිරිපත් කළා. මුදල් සැපයුම ප්‍රසාරණය වෙන්න පුළුවන් පවතින මුදල් ප්‍රමාණය, සංචිත මුදල් ප්‍රමාණය වැඩියෙන් ක්‍රියාකාරිව ආර්ථිකයට එකතුවීමෙනුත්, සංචිත මුදල් ප්‍රමාණය වැඩි කිරීමෙනුත්. ඔබතුමන්ලා ඒකට තමයි මුදල් අච්චු ගහනවා කියන්නේ. අපේ ආණ්ඩුව සත පහක හෝ මුදල් අච්චු ගැසීමක් කරලා නැහැ. මේ ආර්ථික ප්‍රසාරණය සිද්ධ වෙන්නේ, මුදල් සැපයුම සිද්ධ වෙන්නේ ආර්ථික ක්‍රියාවලිය වර්ධනය වෙලා. ඒ අනුව පෞද්ගලික අංශය ලබා ගත්තු ණය ප්‍රමාණය මේ වර්ෂය තුළදී රුපියල් ට්‍රිලියන 1.4කින් වැඩි වෙලා තිබෙනවා. එයින් හොඳ ප්‍රවණතාවකුයි පෙන්නුම් කරන්නේ. ඒ වාගේම මේ දත්ත ඉදිරිපත් කරන අය අපේ ආර්ථික වර්ධනය පිළිබඳව දැන් වැරැදි මත හදනවා. මේ වසරේ දෙවෙනි කාර්තුවේදී එම අගය 4.9ක් වෙනවා. 2024දී, මේ කියන තත්ත්වයේදී, ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ දෙවෙනි කාර්තුවේ මොකක්ද තිබුණු තත්ත්වය? ඍණ 4.1යි.

අපි බලන්න ඕනෑ සංසන්දනාත්මකව. 2024 දෙවැනි කාර්තුවේ සියයට ඍණ 4.1ක්ව තිබුණු වර්ධනය අපි සියයට ධන 4.9ක් දක්වා ගෙන ඒම ඉතාම අගය කළ යුතු කාරණයක්. මේකෙන් පෙන්නුම් කරන්නේ වෙන මොකවත් නොවෙයි, ස්ථායීකරණය කියන කාරණයමයි.

මෙම ස්ථායීකරණයේ තවත් වැදගත් කොටසක් තමයි ආණ්ඩුවේ ආදායම. ආණ්ඩුව කරන්නේ මේ සමස්තයේ පොදු අවශ්‍යතාව වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරන්න රටේ ආර්ථිකයෙන් ජනනය වන ආදායමින් ප්‍රමාණාත්මක බදු මුදලක් එකතු කර ගන්න එක. ඒ බදු ආදායමින්, රටේ ආදායමින් කොටසක් තව තැනකට විතැන් කර ගන්නවා. ඒක නිසි පරිදි වියදම් කරන්න සැලසුම් හදනවා. ඒක තමයි "අය වැය" කියන්නේ. ඒ අය වැය ඇතුළේ අතිරේක ඇස්තමේන්තු නැතුව වියදම් කරන්න පුළුවන් වෙන්නේ රාජ්‍ය ආදායම නිසි පරිදි එකතු කර ගත්තොත් විතරයි.

අපේ ඇස්තමේන්තු පිළිබඳව විවිධ විවේචන එල්ල කළා. "මේ ඇස්තමේන්තුවලට යන්න බැහැ, එකතු කර ගන්න බැහැ, බිඳ වැටෙනවා, මේවා කරන්න බැහැ, වියදම් වැඩි වෙනවා." කිව්වා. නමුත්, ඇත්ත තත්ත්වය තමයි, කැලැන්ඩර් වර්ෂය අනුව 2025 අවුරුද්දේ මුල් මාස අට -අපි බලයට ඇවිල්ලා අවුරුද්දක් ගතවෙලා තිබෙනවා- යනකොට, ඒ කියන්නේ 2025 අගෝස්තු මාසය වන විට අපි සියලු ආදායම් ඉලක්ක ඉක්මවා ගිහින් තිබෙනවා. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දත්ත මම ඉදිරිපත් කරන්න කැමැතියි. රුපියල් බිලියන 1,500ක්ව තිබුණු ඉලක්කය, සැප්තැම්බර් 23 වෙනකොට රුපියල් බිලියන 1,545 දක්වා වැඩිවෙලා සියයට 103ක වර්ධනයක් ලබාගෙන තිබෙනවා. ශ්‍රී ලංකා රේගුවේ ඉලක්කය වුණු රුපියල් බිලියන 1,485ක ආදායම ඉක්මවා, ඒක රුපියල් බිලියන 1,679 දක්වා වැඩි වෙලා තිබෙනවා. එය සියයට 113ක වර්ධනයක්. සුරාබදු දෙපාර්තමේන්තුවේ රුපියල් බිලියන 167ක්ව තිබුණු ඉලක්කය ඉක්මවා ගිහිල්ලා රුපියල් බිලියන 176ක වර්ධනයක් ලබාගෙන තිබෙනවා. එහි වර්ධනය සියයට 105ක්. එයින් පෙන්නුම් කරනවා, අපේ අපේක්ෂිත ආදායම් ඉලක්ක පන්නලා ගිහින් තිබෙන බව. ඒ අනුව ඉතාම පැහැදිලියි අපි මේ ස්ථාවරභාවය අත් පත් කරගෙන තිබෙන බව.

ඒ වාගේම අද ඉදිරිපත් කර තිබෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි අනුව වාහන ආනයනය කිරීමේදී අපි ඉලක්ක දෙකකට යොමු වෙනවා. ඒ තමයි, බදු ආදායම වැඩි කර ගැනීමත්, සංචිත නිසි පරිදි කළමනාකරණය කර ගැනීමත්. එතැනදීත් චෝදනාවක් එල්ල කරනවා, අපට ඒ ආදායම එකතු කර ගන්න බැරි වෙයි කියලා. වාහන ආනයනයෙන් මුළු වර්ෂයටම අපේ ඉලක්කය රුපියල් බිලියන 450යි. මම කියන්න සන්තෝෂයි, මේ මොහොත වන විට -මේ සැප්තැම්බර් 23වැනි දා වෙනකොට- ඒ ඉලක්කය පසු කරමින් ශ්‍රී ලංකා රේගුව රුපියල් බිලියන 470ක් එකතු කරගෙන තිබෙන බව. එම නිසා අවිනිශ්චිතතාවක් හදන්න එපා. මේ ඇත්ත සංඛ්‍යා දත්ත මත කථා කරන්න.

ආදායම වැඩි වීමේ ඊළඟ ප්‍රතිඵලය ගැනත් මම කියන්නම්. අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක තිබුණු වැඩසටහන

ඇතුළේ බාධක, නැත්නම් අමාරුවෙන් ළඟා කරගත යුතු ඉලක්ක කිහිපයක් තිබුණා. ඒ තමයි ණය සීමාව පවත්වා ගැනීම සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ණය ප්‍රමාණය අඩු කර ගැනීම. ඒ වාගේම, ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 2.3කට අරගෙන යෑම. ඒක ටිකක් අමාරුයි; අපි ඒවාට කියනවා, "austerity measures" කියලා. මේ මඟින් සාමාන්‍ය ජනතාව පීඩනයට පත් වෙනවා. ඔවුන්ට පටි තද කර ගන්න සිද්ධ වෙනවා. එවැනි තත්ත්වයකදී අපි ඉතා අමාරුවෙන් මෙන්න මේ ප්‍රාථමික ශේෂය 2025 වර්ෂයේදීත් අඛණ්ඩව කළමනාකරණය කරගෙන තිබෙනවා. මේ වර්ෂයේ ප්‍රාථමික ශේෂයේ ඉලක්කය රුපියල් බිලියන 750යි. මේ වෙනකොට එය රුපියල් බිලියන 970යි. නමුත් ඉදිරියේදී වියදම් වැඩි වෙනකොට අපට ලේසියෙන් -පහසුවෙන්- ඒ ඉලක්කයට යන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Anil Jayantha, you have only two more minutes.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
අපි අය වැය පරතරය රුපියල් බිලියන 2,200ක් විධියට ඇස්තමේන්තු කළාට, අපට ඊට වඩා අඩු අගයකින් ඒක නිම කරන්න පුළුවන්. අපි අනවශ්‍ය ණය ගැනීම්වලට යන්නේ නැහැ. වර්තමාන ස්ථාවරභාවයේ ගති ලක්ෂණ හැම තැනකින්ම පෙන්නුම් කරමින් තිබෙනවා.

විදේශීය අංශය ගත්තත්, පසුගිය මාස අටේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 11.6යි, විදේශීය ප්‍රේෂණ ඩොලර් බිලියන 5.1යි, සංචාරක කර්මාන්තයෙන් ලද ආදායම ඩොලර් බිලියන 2.29යි. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි 2025 වර්ෂයේදී එම සංඛ්‍යා දත්තවල වැඩි වීමේ වාර්තාව සිද්ධවෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුවට අවුරුද්දක් පිරෙන මේ මොහොතේ මගේ කථාව අවසන් කිරීම සඳහා අපේ අතිගරු ජනාධිපතිතුමා ඇමෙරිකා එක්සත් ජනපදයේදී ඊයේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතා සිදු කරනු ලැබූ කථාව සම්බන්ධ කර ගන්න කැමතියි. ඒ කථාවෙන් ගතයුතු ගොඩක් දේවල් තිබෙනවා. අපේ රටේ දැක්ම, ඒ සඳහා අපේ මැදිහත් වීම වාගේ කරුණු ගණනාවක් එතුමා ඉදිරිපත් කළා. එහිදී විශේෂ අවධානය යොමු කළ කාරණා කිහිපයක් තිබෙනවා. එතුමා මතු කරලා පෙන්නුවා, මේ මොහොතේ රටක් විධියට අපේ පැත්තෙන් ඉතාම කැපවීමෙන්, සාමාන්‍ය ජනතාවට උඩින් සිටින වරප්‍රසාද ගන්නේ නැති පිරිසක් විධියට මේ වැඩේ කරන ගමන්ම, ලෝක පරිමාණයෙන් විසඳිය යුතු ප්‍රශ්න ගණනාවක් තිබෙනවා කියලා. අපි ඒ ප්‍රශ්නවලට මැදිහත් වෙනවා. ඒ අතරින් අංක එක තමයි, දුප්පත්භාවය. දුප්පත්කම තුරන් කිරීම සඳහා විශේෂ වැඩසටහන් සකස් කරමින්, මහජනතාවට අවශ්‍ය සේවා සපයමින් අපි ඉදිරියට යනවා. ඒ වාගේම එතුමා පැහැදිලිව පෙන්නුම් කළා, අපට ජයග්‍රහණය කළ යුතු විශාල අභියෝගයක් තිබෙනවා කියලා. ඒ තමයි මත්ද්‍රව්‍ය උවදුර සහ අපරාධ. ඒ සඳහා අපේ මැදිහත් වීම කරන්නේ මොන විධියටද කියලා ඔබ දකිනවා. මේක අපි ලෝක පරිමාණයෙන් ජයග්‍රහණය කළ යුතු දෙයක්. ඒ වාගේමයි දූෂණය පිටු දැකීමත්. මේ කාරණා තුන තමයි ප්‍රධාන කාරණා. එහිදී ගරු ජනාධිපතිතුමා අවධාරණය කරනවා, සමහර දූෂණ කටයුතු, මත්ද්‍රව්‍ය, අපරාධ වාගේ දේවල්වලට විරුද්ධව සටන් කරමින්, ක්‍රියාමාර්ග ගනිමින් ආණ්ඩු කිරීම ඉතාම භයානක දෙයක් කියලා. හැබැයි, ඒ භයානක වැඩේ අපි නොකර සිටීම, ඒවාට විරුද්ධව සටන් නොකිරීම ඊටත් වඩා භයානක මෙන්ම, අතිවිනාශකාරී කාරණයක් කියන එකත් එතුමා පැහැදිලි කළා.

එම කරුණු කාරණා මත, ඒ ඉදිරිපත් කළ තත්ත්වය මත මම සඳහන් කරන්නට කැමැතියි, අද ලෝකය පෙළ ගැසී තිබෙන්නේ තාක්ෂණයත් එක්ක ඉදිරියට යන තත්ත්වයකට බව. ඒ තාක්ෂණයේ, ප්‍රජාතන්ත්‍රවාදයේ කැඳවීම ගැන එතුමාගේ කථාවේදී මතු කළා. ලෝක පරිමාණයෙන් ගත්තාම, අපට ලෝකයාත් එක්ක එකට ගැට ගැහිලා තොරතුරු බෙදා හදා ගනිමින්, සහයෝගයෙන් එකට වැඩ කටයුතු කරමින්, මනුෂ්‍යත්වයෙන් වෙළී, ලෝක පරිමාණ ප්‍රශ්න විසඳීම සඳහා මහඟු අවස්ථාවක් මෙන්ම ආණ්ඩුවක් අද නිර්මාණය වෙලා තිබෙනවා. අපි ඒ සඳහා විවෘතයි. ඒ නිසා මේ රට මේ අර්බුදයෙන් ගොඩගෙන මනුෂ්‍යත්වයේ නාමයෙන් රට සංවර්ධනය කිරීමට මේ වේදිකාව තුළ සැබෑ ලෙස අපි වැඩ කටයුතු කරමු කියා ඔබ සියලු දෙනාටම යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sajith Premadasa. You have 12 minutes.

[පූ.භා. 11.50]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපනයන ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ විශේෂයෙන්ම අමාත්‍යවරයා ඉදිරිපත් කරපු අදහස්වලට අපි සවන් දුන්නා. එතුමා සඳහන් කළා උද්ධමනය ගැන. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, උද්ධමනය කිව්වාම, cost-push inflation තිබෙනවා, demand-pull inflation තිබෙනවා. නමුත් මම හිතන විධියට සාර්ව ආර්ථික කරුණු - macro-economics - ගැන කථා කරනවා වාගේම, ඇමතිතුමා ප්‍රමුඛ රජයට කාලය එළඹී තිබෙන්නේ, ක්ෂුද්‍ර ආර්ථිකය - microeconomics - දිහා බලන්නයි. ඒ කියන්නේ තනි පුද්ගලයන්, ගෘහ ඒකක, ව්‍යවසායකයන් සහ ව්‍යාපාර - individuals, households, entrepreneurs and businesses - ගැන බලන්නයි.

ක්ෂුද්‍ර ආර්ථිකය දිහා බැලුවාම, අදටත් බරපතළ පීඩනයක් පුද්ගලයා මත, ජන ප්‍රජාව මත, ගෘහ ඒකක මත, ව්‍යාපාර සහ ව්‍යවසායකයන් මත පැටවිලා තිබෙන මොහොතක්. එවැනි තත්ත්වයක් පවතින මෙවන් මොහොතක ඔබතුමා කථා කළා, ආර්ථික වර්ධන වේගය පිළිබඳව, සාර්ව ආර්ථික ඉලක්ක පිළිබඳව, අපනයන ප්‍රවර්ධනය පිළිබඳව, විදේශ ප්‍රේෂණ පිළිබඳව. මම අහන්න කැමැතියි ඔබතුමාගෙන් මෙච්චර අපනයන හිතකාරී ප්‍රතිපත්තියක් ඔබ අනුගමනය කරනවා නම්, IMF එක කියන පදයට නටලා, ඔක්තෝබර් 01වැනි දා ඉඳලා SVAT එක අයින් කරන්නේ ඇයි කියලා. ඔබතුමන්ලා මැතිවරණයේදී පොරොන්දු වූ ආකාරයට, අලුත් IMF ගිවිසුමකට ගියා නම්, අපනයන හිතකර SVAT එක සාකච්ඡා කරගෙන තබා ගන්න තිබුණා. නමුත් IMF බලපෑම තුළ ඔබතුමන්ලා අද SVAT එක ඉවත් කරනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මොකක්ද, මේ SVAT එකෙන් අපනයනකරුවාට සිදු වන වාසිය? ඒකෙන් මුදල් ප්‍රවාහ ගැටලු ලිහිල් කරනවා. ඒ කියන්නේ cash flow ප්‍රශ්න ලිහිල් කරනවා. ලියාපදිංචි SVAT සහභාගිවන්නන් අතර සැපයුම් කිරීමේදී එකතු කළ අගය මත බදු අත්හිටුවනවා. ඒ කියන්නේ, ගනුදෙනු අදියරයේදී භෞතිකව එකතු කළ අගය මත බදු ගෙවීමක් සිදු කෙරෙන්නේ නැහැ. ඒක අපනයනවලට හිතකරයි. ඒක අපේ අපනයන ප්‍රවර්ධනයට වැදගත් වෙනවා. සැපයුම්කරුවන්ගෙන් VAT එක අය කරනවා වෙනුවට, SVAT invoice එකක් නිකුත් කිරීම තමයි මේ SVAT පහසුකම කියන්නේ. අපනයනකරුවන් ගැන ඔච්චර කැක්කුමක් තිබෙනවා නම් ඇයි, IMF කොන්දේසි මත ඒක ඉවත් කරන්නේ ඔක්තෝබර් 01වැනි දා ඉඳලා? අපනයනකරුවන් VAT ගෙවීමෙන් අනතුරුව ආපසු මුදල් ඉල්ලීමේ අවශ්‍යතාව ඉවත් කළ පහසුකම, ආපසු දමනවා. මොකක්ද ඒ බලපෑමේ අහිතකරභාවය? ඇත්ත වශයෙන්ම මේ නිසා අපේ රටේ අපනයනකරුවන් තුළ මුදල් ප්‍රවාහ ප්‍රශ්න - cash flow issues - නිර්මාණය කරනවා.

ප්‍රමාදයන් සිදු වෙනවා. කාලය මිඩංගු වෙනවා. කාර්යක්ෂමතාව අඩු වෙනවා. පරිපාලන වියදම් වැඩි වෙනවා. අපනයන ක්ෂේත්‍රයේ අපට තරග කරන්න තිබෙන වියට්නාමය, බංග්ලාදේශය වාගේ රටවල් මේ ප්‍රශ්නයේදී වේගවත්ව කටයුතු කරනවා. විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ අපනයනකරුවන්ට කාරක ප්‍රාග්ධන ප්‍රශ්න - working capital issues - නිර්මාණය වෙනවා, ඔබතුමන්ලා IMF එක කියන පදයට කටයුතු කිරීම තුළ. IMF එක 2024 ජූනි මාසයේ VAT අනුකූලතාව සහ බදු එකතු කිරීම වැඩිදියුණු කිරීමේ අරමුණින් කියලා කොන්දේසියක් පැනෙව්වා. Extended Fund Facility එකේ කාර්තුවක්, කාර්තුවක් පාසා අපට ලබා දෙන US ඩොලර් බිලියන තුනකට ආසන්න ප්‍රමාණයට -බිලියන 2.9ක් ද කොහේද - කොන්දේසියක් කර ගත්තා. SVAT එක ඉවත් කිරීමත් එක කොන්දේසියක්. විශේෂයෙන්ම අපේ රටේ අපනයනකරුවන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. මම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අවසාන මොහොතේ හරි IMF එකත් එක්ක සාකච්ඡා කරලා SVAT එක ඉවත් කරන එක කරුණාකරලා පුළුවන් නම් කල් දමා ගන්න කියලා.

විශේෂයෙන්ම ඩිජිටල්කරණය සම්පූර්ණ කිරීම තවම අවසන් නැහැ. ඒක කල් දමා ගන්න. මොකද Inland Revenue Department එකෙන් ඒවා ගෙවනකොට ප්‍රමාද දෝෂයක් සිද්ධ වෙනවා. ඒක අපේ රටේ ක්ෂුද්‍ර, මධ්‍ය හා සුළු පරිමාණයේ ව්‍යාපාරිකයන්ට සහ ව්‍යවසායකයන්ට අපනයන ක්ෂේත්‍රයට අදාළව ලොකු ගැටලුවක්. ඔවුන් දුෂ්කරතාවන් රැසකට මුහුණ දෙනවා. විශේෂයෙන්ම මම රජයෙන් ඉල්ලීමක් කරනවා, IMF කොන්දේසිවලට යටත් වෙන්නේ නැතුව රජයේ වාර්තාව ඉදිරිපත් කරන්න කියලා. ඔබතුමන්ලා ඒ කාලවකවානුවේ රජයේ නොසිටියත්, අරගෙන බලන්න ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ - Department of Census and Statistics - වාර්තාව. පසු ගිය කාලයේ රට බංකොලොත්වීම තුළ ව්‍යවසායකයන් 260,000කට වැඩි ප්‍රමාණයක් මහා බේදවාචකයකට ලක් වුණා. අඩුම ගණනේ ඒ ගැන හිතලා IMF එක කියන පදයට නටන්නේ නැතුව කරුණාකරලා මේ කොන්දේසියවත් ඉවත් කර ගන්නට ඔබතුමන්ලා උනන්දු වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු අමාත්‍යතුමා අපට සුබවාදී තොරතුරු ඉදිරිපත් කළා. ඒ සුබවාදී තොරතුරු මත කිසිම මොහොතක අපි කුහක දේශපාලනයක් කරන්නේ නැහැ. ඔබතුමා සඳහන් කළා, කාර්තු දෙකේ ආර්ථික වර්ධන ඉලක්ක අභිභවා ගිහිල්ලා තිබෙනවා කියලා. ඉතා හොඳයි. ඒක රටට හොඳ දෙයක්. හැබැයි, 2028 ඉඳලා අපේ විදේශ ණය වශයෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන 5.5ක් - ඇමෙරිකානු ඩොලර් මිලියන 5,500ක් - වාර්ෂිකව ගෙවන්න අපි සූදානම් ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි. මම කියන්නේ සාමාන්‍ය ගණනයක් හැටියට. අපි ඒ තත්ත්වයේ ඉන්නවාද? ඔබතුමන්ලා පසුගිය රජය අනුගමනය කරපු IMF ගිවිසුම අනුගමනය කරන්නේ නැතුව නැවත සාකච්ඡාවකට ගියා නම්, IMF documentsවල තිබෙන ආපසු ණය ගෙවීම කල් දමා ගන්න ඔබතුමන්ලාට පුළුවන්කම ලැබෙනවා. ඒගොල්ලන් කිව්වේ 2028 නොවෙයි, 2033 ඉඳන් පටන් ගත්තාට කමක් නැහැ කියලා; ප්‍රමාණවත් කියලා. "Amortization period will commence from 2033.", එහෙම සාකච්ඡාවකට ගියා නම්, එහෙම අලුත් කොන්දේසිවලට ගියා නම් 2028 වසරේ සිට ඇමෙරිකන් ඩොලර් බිලියන 5.5ක් - අමෙරිකන් ඩොලර් මිලියන 5,500ක් - වාර්ෂිකව ගෙවීමේ තත්ත්වය අපට 2033 දක්වා කල් දමා ගන්න තිබුණා. ඒක කර ගන්නට බැරි වුණා.

ඊළඟට මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. දළ වශයෙන් අපේ රටේ සියයට 50ක් විවිධ දරිද්‍රතාවන්ගෙන් පෙළෙනවා කියන එක Centre for Poverty Analysis ආයතනය ඇතුළු ආයතන ගණනාවක් ප්‍රකාශ කළා.

ඒක පරිභෝජන දරිද්‍රතාව - consumption poverty - වෙන්න පුළුවන්; ආදායම් දරිද්‍රතාව - income poverty - වෙන්න පුළුවන්; නිෂ්පාදන දරිද්‍රතාව - production poverty - වෙන්න පුළුවන්; ආයෝජන දරිද්‍රතාව - investment poverty - වෙන්න පුළුවන්. අපේ රටේ දරිද්‍රතාව අනුව ජනගහනයෙන් සියයට 50කට ආසන්න ප්‍රමාණයක් මේ හැම අංශයකින්ම ආවරණය වෙනවා කියන එක Centre for Poverty Analysis ඇතුළු ආයතන ගණනාවක මේ විෂය පිළිබඳ විශ්ලේෂකයින් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු අනිල් ජයන්ත ඇමතිතුමනි, ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතමින් දුප්පත්කම ගැන කථා කළා කියලා දැන් ඔබතුමා ප්‍රකාශ කළා. ඉතා හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නමුත්, අස්වැසුම වැඩසටහන තුළින් දුප්පත්කමින් මිදෙනවා කියලා ඔබතුමා පිළිගන්නවාද? අස්වැසුම වැඩසටහන කියන්නේ පරිභෝජන ආධාරයක් ලබා දීම. ඒක මම නරකයි කියන්නේ නැහැ. ඒක ජනතාවට සහනයක්, හොඳ දෙයක්. නමුත්, ඒක දුප්පත්කම තුරන් කිරීමේ අංග සම්පූර්ණ වැඩසටහනක් නොවෙයි. අපි පුන පුනා කියලා තිබෙනවා, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනකට පරිභෝජන කොටසක් තිබෙන්නට ඕනෑ කියලා. ආයෝජනය තිබෙන්නට ඕනෑ, නිෂ්පාදනය තිබෙන්නට ඕනෑ, ඉතිරිකිරීම තිබෙන්නට ඕනෑ, අපනයනය තිබෙන්නට ඕනෑ. That is, consumptions, investments, productions, savings and exports.

අස්වැසුම වැඩසටහනේ ඔය අංග පහම තිබෙනවාද? අස්වැසුමේ තිබෙනවාද, නිෂ්පාදනය? අස්වැසුමේ තිබෙනවාද, පරිභෝජනය? අස්වැසුමේ තිබෙනවාද, ඉතිරිකිරීම? අස්වැසුමේ තිබෙනවාද, අපනයනය? නැහැ, ඇත්ත වශයෙන්ම ඒකේ තිබෙන්නේ දුෂ්කරතාවලින් පෙළෙන ජනතාවට පරිභෝජනය සඳහා මූල්‍ය ශක්තියක් ලබා දීම. ඒ නිසා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ දී දුප්පත්කම තුරන් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වනවා සේම, අපේ රටෙත් දුප්පත්කම තුරන් කිරීමේ පැහැදිලි, ප්‍රශස්ත වැඩසටහනක් ක්‍රියාත්මක විය යුතුයි කියන එක මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි.

Hon. Deputy Speaker, in addition to those points with regard to the economy - especially the export sector - I would like to bring the attention of this august Assembly

to what transpired in the morning. Unfortunately, it has become a standard operating procedure for the Hon. Speaker when he is in the Chair to always obstruct the opportunities for the Opposition Leader to express his or her views. That is a very unfortunate situation.

Today, he attempted for the second time to justify the denial of a No-Confidence Motion against one of the Deputy Ministers of this administration. And in doing so, as part of his justification, he mentioned and tabled several reports and also quoted from Erskine May and also the Indian publication, "Practice and Procedure of Parliament" by M.N. Kaul and S.L. Shakdher.

What does the Report provided by the Secretary-General of Parliament, Deputy Secretary-General of Parliament and the Assistant Secretary-Genera of Parliament - which was tabled by the Hon. Speaker himself - say? It states, I quote:

> "There is no specific legal provision regarding a No-Confidence Motion against a Deputy Minister, according to the Constitution of Sri Lanka, the Standing Orders or the Westminster system."

It sates that there is no specific legal provision. So, basically, there is silence on that.
And, it goes on to state, I quote:

> ".... a No-Confidence Motion may be moved in line with said precedence considering that the Deputy Minister is an Office bearer."

නියෝජ්‍ය අමාත්‍යවරයෙක් කියන්නේ ඇත්තවශයෙන්ම නිලයක් දරන පුද්ගලයෙක්. නිලයක් දරන පුද්ගලයෙකුට එහෙම විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමේ බාධාවක් නැහැයි කියන එක පාර්ලිමේන්තුවේ ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ඒ වාර්තාව table කරපු නිසා තමයි අපිටත් ඒ ගැන දැන ගන්නට ලැබුණේ. ඒ නිසා පැහැදිලිවම විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම ප්‍රතික්ෂේප කරන්නට, එය තහවුරු කරන්නට අද දවසේ කථානායකතුමාම යොදා ගත් ඒ පත්‍රිකා - documents - තුළින්ම එතුමා ඉදිරිපත් කරපු තර්කය සම්පූර්ණයෙන්ම නිෂේධ වෙනවා කියන එක කනගාටුවෙන් හෝ මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැහැදිලිව කියලා තිබෙනවා, මේ කාරණාව පිළිබඳව පාර්ලිමේන්තුවේදී ඉදිරි කටයුතු කරන්නට නීතිමය බාධාවක් නැහැ කියලා. ඒ කියන්නේ විශ්වාස භංග යෝජනාව ක්‍රියාත්මක කරන්න කියන එකයි.

ගරු කථානායකතුමා Erskine May එකෙන් quote කළා. What does Erskine May say when the Standing Orders are silent or ambiguous? Erskine May records that No-Confidence Motions are primarily political devices, and while they often target the Government as a whole, they can also be directed against individual Ministers. සමූහයක් වශයෙන් රජයකට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එනවා වාගේම, තනි පුද්ගල අමාත්‍යවරුන් වෙනුවෙනුත් අපට ඒක ගෙනෙන්නට පුළුවන් කියන එක Erskine May කියනවා.

Practical examples of such motions being entertained in the UK House of Commons, showing that accountability applies across the ministerial spectrum - අමාත්‍යවරුන් කියන සමූහය පුරාවටම මේ වගවීම - accountability - කියන කාරණාව ව්‍යාප්ත වෙන බව Erskine May කියනවා. Sri Lanka inherited not just the structure of Parliament but its conventions, and in the absence of domestic written provisions, Westminster practice provides the most credible interpretive guidance. ඒ කියන්නේ, පාර්ලිමේන්තු ව්‍යුහය පමණක් නොවෙයි, පාර්ලිමේන්තුව හරහා ක්‍රියාත්මක වන සම්ප්‍රදායන්, රටාවන් - traditions and customs - ක්‍රියාත්මක කිරීම ද අපට දායාද වුණා. ඇත්තවශයෙන්ම මම ප්‍රශ්න කරනවා, ගරු කථානායකතුමා Erskine May හරියට කියවා බලලා ද, එය උපයෝගී කරගෙන ද මේ විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කිරීමේ තමන්ගේ තීන්දුව තවදුරටත් ප්‍රත්‍යක්ෂ කරන්නට, තහවුරු කරන්නට කටයුතු කළේ කියලා.

ඒ වාගේම Indian precedent එක තමයි, the Vice President's No-Confidence Motion in 2023. මොකක්ද ඒකෙන් පෙන්වන්නේ? In 2023, Opposition parties in the Rajya Sabha moved a Motion of No-Confidence against Vice President Jagdeep Dhankhar. That particular example underscores that No-Confidence Motions are not confined to Cabinet Ministers or the Executive alone. They may extend to Constitutional office-holders whose conduct is seen as undermining Parliamentary confidence. ව්‍යවස්ථාපිත නිලධාරින්ට පමණක් නොව, විශ්වාස භංග යෝජනාවක් තවදුරටත් ඉලක්ක කරන්නට පුළුවන්, තනතුරු හොබවන්නන්ටත් -office holdersලාටත්. ඒ අය පාර්ලිමේන්තුවේ විශ්වාසය කඩ කිරීම පිළිබඳව යම් කිසි ක්‍රියාදාමයකට අනුගත වෙනවා නම්, ඒ අයටත් විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නට පුළුවන් කියන එක ඉන්දියාවේ ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු සම්ප්‍රදායේත් බොහොම පැහැදිලිව තිබෙනවා.

So, I am very inquisitive to find out as to who wrote this particular justification for the Speaker. I would love to know the individual or the group of people who were involved, because they have done so without an ounce of awareness and intelligence regarding Constitutional matters and Parliamentary practices.

මට මේ කරුණු කාරණා ටික ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා. මොකද රාජ්‍ය පාර්ශ්වයෙන් කියනවා අපට ඇහුණා, අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ සම්ප්‍රදාය ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියලා. ඒක පුදුම කථාවක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක වෙලාවකට කියනවා, ආවේ system එක change කරන්නය කියලා. පරණ සම්ප්‍රදාය ක්‍රියාත්මක කරන්නේ නැහැයි ලු. නමුත් තම තමන්ට ඔබින වෙලාවට අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ සම්ප්‍රදායත් උපුටා දක්වනවා. හැබැයි අනුර බණ්ඩාරනායක මැතිතුමාට සම්ප්‍රදායක් තිබුණා, විපක්ෂ නායකවරයා නැඟිටිනකොට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන්න. ඒ නිසා අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ සම්ප්‍රදාය ගැන කථා කරන අයගෙන් මම අහන්න කැමැතියි, අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ සම්ප්‍රදාය පිළිපදිමින්, අනුගමනය කරමින්, විපක්ෂ නායකවරයාට අදහස් ඉදිරිපත් කරන්නට දෙන සම්ප්‍රදාය ක්‍රියාත්මක කරන්නට අවස්ථාව තිබෙනවාද, නැද්ද කියලා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමාත්, අජිත් පී. පෙරේරා අපේ නියෝජ්‍ය සංවිධායකතුමාත් බොහොම තර්කානුකූලව, විධිමත්ව, කාර්යක්ෂමව, පදනම් සහිතව, දත්ත කේන්ද්‍රීයව ඒ සම්බන්ධව අදහස් ඉදිරිපත් කළ බව. ඉතින්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එතුමන්ලාට කියනවා, ළමයි වාගේ හැසිරෙන්න එපා ලු. එතුමන්ලා හරියට නිකම් ළමයින් ගණනට දමලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපි ඊයේ කථා කළේ මොන මාතෘකාව යටතේද? ළමයින්ගේ අයිතිවාසිකම් ගැන අපි කථා කළේ. ඊයේ ළමයින්ගේ අයිතිවාසිකම් ගැන කථා කළා, කෲරත්වයෙන් තොරව, හිංසනයෙන් තොරව මේ දේවල් වෙන්න ඕනෑය කියලා. ඒ ඔක්කෝම හරි, අපි එකඟයි. එතකොට ළමයින්ටත් කථා කිරීමේ නිදහස තිබෙනවා නේ. එතකොට ඊයේ ළමයින්ගේ අයිතිවාසිකම් ගැන කථා කරලා, අද අපේ කථා කරපු ඒ ප්‍රබුද්ධ මහජන නියෝජිතයින්ව ළමයින් ගානට දාලා ඒ අයිතිවාසිකමත් එතුමන්ලාට නැහැයි කියනවා. මොනවාද, මේ කථා? මොනවාද, මේ විහිළු?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ගරු කථානායකතුමාට කරන අපහාසයක් නොවෙයි. මේ අවස්ථාවේදීත් පැහැදිලිවම මම කියන්න කැමැතියි, එතුමා ඒ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන්නට පදනම් කරපු ඒ තීන්දුව සහ කරුණු කාරණා දෝෂ සහිත බව. දෝෂ රහිත නොවෙයි, දෝෂ සහිතයි. පදනම් විරහිතයි. ස්තුතියි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Anil Jayantha?

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, SVAT සම්බන්ධයෙන් පුංචි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. IMF එකේ කොන්දේසියක් ක්‍රියාත්මක වනවා, අපි ඒකට යටත් වෙලාය කියලා කියනවා නම් ඇත්තටම එය වැරදියි. මොකද, ආර්ථික අර්බුදය මතුවෙලා අපි ප්‍රශ්නයකට මුහුණ දීලා තිබියදී ආදායම් කළමනාකරණය පිළිබඳව එක එක දත්ත සාකච්ඡා කරලා තිබෙනවා. හැබැයි, SVAT කියන්නේ VAT අය කිරීමේ හොඳ ක්‍රමවේදයක් නොවෙයි. මොකද, ලංකාවේ VAT ක්‍රමය හරියටම සමස්ත වෙළෙඳාමම ආවරණය වන විධියට, ලංකාවම ආවරණය වන විධියට ක්‍රියාත්මක වෙලා නැති නිසා, ඒ ඒ අවස්ථාවලදී ගත් තාවකාලික පියවර තමයි ඒ. නමුත් දැන් අධ්‍යයනයකින් හොයාගෙන තිබෙනවා, මේ SVAT ක්‍රමය නිසා ආණ්ඩුවට ලැබිය යුතු ආදායම විශාල වශයෙන් අහිමි වන බවත්, ඒ වාගේම වංචාවටත්, දූෂණයටත් එතැනින් පාර කැපෙනවා කියන එකත්. අපි ඒක වළක්වන්න කටයුතු කරනවා. ඒ වාගේම simulation process එකක් ගිහිල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ වැඩකටයුතු අධ්‍යයනය කරලා තමයි මේ පළමුවෙනි දා ඉඳලා මේ බදු ක්‍රමය අයින් කරන්නේ. එතැනින් කාර්යක්ෂමතාව වැඩි වෙනවා විතරක් නොවෙයි, දින 45ක් ඇතුළතදී average එක, ඒ අපනයනකරුවන්ට මේ refund එක ගන්න පුළුවන් වනවා. එතැනත් වර්ග තුනක් තිබෙනවා, low-risk, medium-risk and high-risk කියලා. එතැනදී low-risk කියන අවදානම අඩුම අයට දින 20ක් ඇතුළත එය ලබා දෙන්න පුළුවන්. ඒ නිසා ඒගොල්ලන්ගේ වගකීම තමයි, ආදායම් බදු වාර්තාව ලබා දීම. එය ලබා දීලා දින 20ක් ඇතුළත මේක ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රවේශය, ප්‍රශ්න කොච්චර ගැඹුරු වුණත්, අමාරු වුණත් අපේ ගරු ජනාධිපතිතුමා සඳහන් කළා වාගේ, දූෂණයට, මත්ද්‍රව්‍යවලට විරුද්ධව සටන් කරන එක කොච්චර භයානක වුණත් අපි ඒ සටන කරනවා. ඒ වාගේම මෙතැනත් තිබෙන්නේ අක්‍රමවත්, අවිධිමත් ගැටලු සහිත ක්‍රමවේදයකට යන්න ඉඩ ඇරලා වංචාවට, දූෂණයට හවුල් වෙනවා වෙනුවට ඒක හෙමින් හෙමින් අවසන් කර ගැනීම. මේ SVAT ක්‍රමය අයින් කිරීම තුළින් ඒ සම්බන්ධ සියලු ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. නමුත් අපේ ප්‍රවේශය තමයි, වඩාත් හොඳ ක්‍රමයකට ඉදිරියට යන්න පියවරෙන් පියවර මැදිහත්වීම.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, your time starts now. You have 12 minutes.

[අ.භා. 12.14]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු විපක්ෂ නායකතුමා ඇසූ, 2028දී ණය ගෙවන විට අපේ රාජ්‍යයේ ආර්ථික ස්ථායීකරණය කෙසේද සිදු වන්නේ කියන ප්‍රශ්නයටත් අවශ්‍ය උත්තර මගේ කථාව තුළ අන්තර්ගත කරමින් කථාව ආරම්භ කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විවාදයට මූලික වෙන්නේ අපේ සංචාරක කර්මාන්තය සහ වාහන ආනයනය සම්බන්ධ කාරණයක්. ඒ නිසා ඉස්සෙල්ලාම සංචාරක කර්මාන්තයෙන් මම කථාව පටන් ගන්නම්. අපේ සංචාරක කර්මාන්තය ගත්තොත්, 2018 වසරේ තමයි වැඩිම සංචාරකයින් පිරිසක් ලංකාවට එන්නේ. ඒ සංඛ්‍යාව ඉලක්කමක් වශයෙන් ගත්තොත්, ලක්ෂ 23ක වාගේ ප්‍රමාණයක් වනවා. සංචාරකයෙක් ලංකාව තුළ ගත කරන කාලයට අපි කියනවා, tourist's days කියලා. දළ වශයෙන් දින 8.5ක -දින අටහමාරක- විතර කාලයක් තමයි සංචාරකයෙක් ලංකාව තුළ ගත කරන්නේ. ඒ වාගේම සංචාරකයෙක් ලංකාව තුළ දවසකට වියදම් කරන ප්‍රමාණය ගත්තොත්, ඩොලර් 172ක් වාගේ වනවා. එතකොට අපි සංචාරක කර්මාන්තයේ ඊළඟ පිම්ම පනින්න නම් අපේ අවධානය යොමු විය යුතුයි, සංචාරකයා මෙහි ගත කරන දවස් ගණන කීයද කියන කාරණයට. ඒ වාගේම දවසක් තුළ ඔවුන් වියදම් කරන මුදල් ප්‍රමාණය වැඩි කර ගන්නත් අපි කටයුතු කළ යුතුයි.

සැප්තැම්බර් මාසයේ 21වෙනි දා වෙනකොට ලංකාවට සංචාරකයින් 1,678,346ක් ඇවිල්ලා තිබෙනවා. මේ, ඉතිහාසයේ මේ කාලය වෙනකම් ආපු වැඩිම සංචාරකයින් ප්‍රමාණය. ගිය අවුරුද්දේ යම්කිසි මාසයකදී ආපු සංචාරකයින් ප්‍රමාණය මේ අවුරුද්දේ ඒ මාසයේදී ආ සංචාරකයින් ප්‍රමාණයත් එක්ක සංසන්දනය කරනකොට, සියයට 10කට, 20කට වැඩි ප්‍රමාණයකින් මෙවර සංචාරකයන් ඇවිල්ලා තිබෙනවා. ඒ අනුව මේ වෙනකොට සංචාරක කර්මාන්තයෙන් ආදායම විධියට ඩොලර් බිලියන 2.3ක් අපට ලැබිලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න සතුටුයි, මේ යන ඉලක්කම් මේ විධියට ගියොත් ඉදිරියේදී අපේ ආදායම තවත් වැඩි වන බව. මොකද, ඊළඟ මාසය ඇතුළත peak එක අනිවාර්යයෙන් එනවා. ඒ අනුව ලංකා ඉතිහාසයේ වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් ලංකාවට

ආපු වසරත්, සංචාරකයින්ගෙන් වැඩියෙන්ම ආදායම උත්පාදනය කරපු වසරත් බවට මේ 2025 වසර පත් කර ගන්න අපට පුළුවන්. ඒක මේ රජය ලැබූ ජයග්‍රහණයක්.

ඒ වාගේම මෙකේ තවත් නොදුටු පැත්තක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි බලමු, මේ සංචාරකයින් පාවිච්චි කර තිබෙන airlines මොනවාද කියලා. අපි දන්නවා, SriLankan Airlines එකට මොකද වෙලා තිබුණේ කියලා. සියයට 24.1ක් සංචාරකයින් පාවිච්චි කර තිබෙන්නේ SriLankan Airlines එක. SriLankan Airlines එකේ ආදායම සියයට 10කට වඩා වැඩි වෙලා තිබෙනවා, මඟින් එය පාවිච්චි කිරීම නිසා. මේක වෙනත් පැත්තකින් අපට ලැබුණු ආදායමක්. ඒක තමයි, පළමුවන කරුණ.

දෙවන කරුණ තමයි, විදේශ ප්‍රේෂණ. ඒ කියන්නේ, පිට රට ඉන්න විදේශ ශ්‍රමිකයින් ලංකාවට එවන මුදල්. මේ අවුරුද්දේ පළමු මාස 8ට රුපියල් මිලියන 5,116ක් අපට ලැබී තිබෙනවා, විදේශ ප්‍රේෂණ වශයෙන්. මේක 2024 අවුරුද්දේ ජනවාරි සිට අගෝස්තු සමඟ සන්සන්දනය කර බලනකොට සියයට 19.3ක වැඩිවීමක්. අපි දන්නවා, විදේශ රටක ඉන්න ශ්‍රමිකයෙක් ලංකාවට මුදල් එවන්නේ නැහැ කියලා රුපියල fluctuate වෙනවා නම්. ඒක පිං පොං බෝලය වාගේ අඩු වැඩි වෙනවා නම් එතැන සුදුවක් වෙන්නේ. ඩොලරයේ අගය අඩු වෙනකල් බලාගෙන ඉන්නවා මුදල් නොඑවා ඉන්න, වැඩි වෙනකල් බලාගෙන ඉන්නවා මුදල් එවන්න. හැබැයි, අද වෙනකොට ඩොලර් බිලියන 1.5ක වාහන ආනයනය සඳහා LC open කර තිබියදීත් අපි රුපියල ස්ථාවරව තබාගෙන ඉන්නවා; ඒ guarantee එක අපි විදේශ ශ්‍රමිකයාට දීලා තිබෙනවා. ඒ වගවීම නිසා අපට විදේශ ප්‍රේෂණ ගලා එනවා. මේ යන විධියට බැලුවොත්, මේ මාස 8ට ලැබුණු මුදල රුපියල් මිලියන 5,116 නම්, අපි මේ මුදල මාස 8න් බෙදලා, 12න් වැඩි කළොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ වැඩිම විදේශ ප්‍රේෂණ එන අවුරුද්ද බවට 2025 අවුරුද්ද පත් කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒක අපි ලබන ජයග්‍රහණයක්.

තුන්වන කරුණ තමයි, අපනයන ආදායම. අපි භාණ්ඩ හා සේවා පිට රටට යවලා ලංකාවට මුදල් උත්පාදනය කරනවා. ඒක ලංකාවට ඩොලර් එන තවත් ආදායම් මාර්ගයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අගෝස්තු මාසය වෙනකොට අපට විදේශ අපනයන හරහා ඩොලර් මිලියන 11,554ක් ලැබී තිබෙනවා. මේක පසුගිය අවුරුද්දත් එක්ක සන්සන්දනය කරනකොට පෙනෙනවා, 2024 අවුරුද්දේ ඩොලර් මිලියන 10,850 ගණනයි අපට ලැබී තිබෙන්නේ කියලා. ඒ අනුව, පැහැදිලි වැඩිවීමක් සිදුව තිබෙනවා. ඒ කියන්නේ, සියයට 6.61ක වර්ධනයක් අපට දකින්නට ලැබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය ළඟා කරගන්න අපි අපනයන තරගකාරිත්වය ඇති කළා. ඒ වාගේම, වෙළෙඳ පොළ අවස්ථා විවිධාංගීකරණය කළා. මේ හරහා ශ්‍රී ලංකාව වැඩි වශයෙන් ගෝලීය වෙළෙඳාම හා ඒකාබද්ධ වීමක් අපට දකින්න ලැබුණා. මේ හරහා තමයි අපට විදේශ අපනයනවලින් ලැබෙන ආදායම වැඩි වෙන්නේ.

හතරවන කාරණය තමයි, සෘජු විදේශ ආයෝජන -Foreign Direct Investment - FDI. 2024 අවුරුද්දේ පළමු මාස 6 ඇතුළත අපට ආපු FDI ප්‍රමාණය ගත්තොත්, ඩොලර් මිලියන 252යි. 2025 අවුරුද්දේ ජනවාරි සිට පළමු මාස 6 ගත්තොත්, ඩොලර් මිලියන 507යි. සියයට 101ක වැඩිවීමක් පළමු මාස 6 තුළ සිදුව තිබෙනවා. 7වන මාසය ගත්තොත්, තවත් ඩොලර් මිලියන 100ක් වැඩි වෙනවා; එතකොට ඩොලර් මිලියන 607යි. 8වන මාසය ගත්තොත් තවත් ඩොලර් මිලියන 120 ගණනක් වැඩි වෙනවා; එතකොට ඩොලර් මිලියන 720 ගණනක් බවට පත් වෙනවා. මේ යන ශීඝ්‍රතාව ගත්තොත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනවාරි සිට මාස්පතා ලංකාවට එවන FDI ප්‍රමාණය වැඩි වෙනවා. මේක අපි ලබන විශාල ජයග්‍රහණයක්.

ඒ වාගේම, අපට BOI එක හරහා ආයෝජන එනවා. මේ වෙනකොට ආයෝජන යෝජනා 79ක් අපට ලැබී තිබෙනවා. ඒ යෝජනාවලින් 40ක් අලුත් ආයෝජන. තව යෝජනා 39ක් තිබෙන ව්‍යාපෘති වැඩි කිරීම. මේ සඳහා ලැබෙන මුළු ආයෝජන ප්‍රමාණය ඩොලර් බිලියන 4.6ක්. එම ඩොලර් බිලියන 4.6න්, ඩොලර් බිලියන 3.8ක් විදේශ ආයෝජන. මේක තමයි අපි ඩොලර් ආර්ථිකය ස්ථායීකරණය කරගන්නා විධිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අපි රුපියල ස්ථායීකරණය කරගන්නේ කොහොමද කියලා ගත්තොත්, සුරාබදු දෙපාර්තමේන්තුවේ ඊයේ වෙනකොට ආදායම් ඉලක්කය හැටියට තිබුණේ රුපියල් බිලියන 173යි. ඕනෑ නම් අපට ඒක ගිය අවුරුද්දේ ආදායමත් එක්ක සන්සන්දනය කරන්න පුළුවන්. නමුත්, ඊයේ වෙනකොට රුපියල් බිලියන 185.68ක් ලැබී තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 12කට වඩා වැඩි ප්‍රමාණයක් අපට ලැබී තිබෙනවා. මොකද, ගිය අවුරුද්දේ පළමු මාස 9ට වඩා මේ අවුරුද්දේ පළමු මාස 9 තුළ අපේ කට්ටිය බීලා වැඩිවෙලා නොවෙයි නේ. අපි රාජ්‍ය නිලධාරින්ට දීපු වගකීම, වගවීම ඒගොල්ලන් ඉටු කර තිබෙනවා. රේගුවේ ආදායම රුපියල් බිලියන 1,600 ගණනක්. ඒ වාගේම, රාජ්‍ය මඟින් පාලනය වන අපේ ආයතන තිබෙනවා. අපේ අමාත්‍යාංශය යටතේ වරාය තිබෙනවා. අපි VAT එක ගෙවලාත් ගිය අවුරුද්දේ පළමු මාස 6ට සාපේක්ෂව operational profit එක සියයට 66ක්. ගිය අවුරුද්දේ තිබුණේ රුපියල් බිලියන 14.6යි, මේ අවුරුද්දේ රුපියල් බිලියන 24.4ක්. රුපියල් බිලියන 9ක වර්ධනයක් තිබෙනවා. ඒ කියන්නේ, සියයට 66ක්.

Bandaranaike International Airport - BIA - එක ගත්තත්, operational profit එක සියයට 78ක්. Sri Lanka Telecom එක ගත්තොත්, ගිය අවුරුද්දේ පළමු මාස 6ට සාපේක්ෂව රුපියල් මිලියන 650ක වැඩිවීමක් තිබෙනවා. රුපියල් මිලියන 320 ගණනක් තමයි කලින් තිබුණේ. නමුත්, එය මේ වනකොට රුපියල් මිලියන 650ක වර්ධනයක් ලබා ගෙන තිබෙනවා. ඊළඟට, Ceylon Petroleum Corporation එක ගත්තොත්, පළමු කාර්තුවේ රුපියල් බිලියන 18ක profit එකක් ලබා ගෙන තිබෙනවා.

මේ ආකාරයෙන් අපේ රාජ්‍ය ආයතන ක්‍රමයෙන් ලාභ ලබමින් පවතිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හේතුව නිසාම අපි දන්නවා, හැමදාම Budget එක ඉදිරිපත් කරනකොට වියදම වැඩියි, ආදායම අඩුයි කියලා. ඒ අතර තිබෙන පරතරය ගොඩක් වැඩියි. හැබැයි, පළමුවැනි මාස 6 ඇතුළත අපි ආදායම් සහ වියදම් පරතරය සියයට 32.3කින් අඩු කර ගන්න සමත් වෙලා තිබෙනවා. රාජ්‍ය වියදම අඩු කර ගන්නවා වාගේම ආදායම remarkable විධියට වැඩි කර ගැනීම හරහා අපට ඒ ආදායම් සහ වියදම් පරතරය අඩු කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පසුගිය දවස්වල ඉඳන් අපේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ගැනත් කථා බහට ලක් වෙනවා. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය අල්ලාගෙන දඟලනවා; ප්‍රධාන මාධ්‍යයත් අල්ලාගෙන දඟලනවා. අපි කියන්න කැමැතියි, පෞද්ගලිකවත් මූල්‍ය විනයක්, මූල්‍ය කළමනාකාරිත්වයක් සහ මූල්‍ය විනිවිදභාවයක් අපේ තිබෙන බව. ඒකේ දිගුවක් විධියට තමයි අපේ සියලුම සහෝදර මන්ත්‍රීවරු මේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වත්කම් සහ බැරකම් ප්‍රකාශ රාජ්‍ය නිලධාරිනුත් ඉදිරිපත් කළ යුතුයි. මම යෝජනා කරනවා,

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරපු විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒවා හරියට ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, ඒකේ නියම ප්‍රතිඵල නෙළා ගන්න නම් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ යුත්තේ සමාජ මාධ්‍යවල හෝ මාධ්‍ය ඉදිරියේ නොවෙයි. ඒවායේ ගැටලුවක් තිබෙනවා නම් අපි ඒක නීතිය ඉදිරියට අරගෙන යන්න ඕනෑ. මේ අවුරුද්දේ විතරක් නොවෙයි, මෙතෙක් උපයා ගත් වත්කම් සහ බැරකම් ප්‍රකාශවල ගැටලුවක් තිබෙනවා නම් නීතිය ඉදිරියට යන්න. අවුරුදු පතා ඉදිරිපත් කර තිබෙන වත්කම් සහ බැරකම් ප්‍රකාශ සන්සන්දනය කර බලන්න, කෙසේද ඒවා වැඩි වෙලා තිබෙන්නේ කියලා. ඒ පිළිබඳව ගැටලුවක් තිබෙනවා නම් නීතිය ඉදිරියට යන්න. නීතිය ඉදිරියට ගිය දවසට අපි මේ ගත්ත මූල්‍ය විනය, මූල්‍ය විනිවිදභාවය ඇත්තටම මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙනවා. මම ජනතාවගෙනුත්, මාධ්‍ය ආයතනවලිනුත් ඉල්ලා සිටිනවා, ඒ වෙනුවෙන් නීතිය ඉදිරියට යන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අප තුළ තබාගෙන යන මූල්‍ය විනය, මූල්‍ය කළමනාකාරිත්වය සහ මූල්‍ය විනිවිදභාවය පක්ෂයක් විධියටත් අපි ඒ ආකාරයටම පවත්වාගෙන යනවා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළ සිට පහළ දක්වාත් මූල්‍ය විනය, මූල්‍ය කළමනාකාරිත්වය සහ මූල්‍ය විනිවිදභාවය තබා ගත යුතුයි කියලා. අපි සියලු ප්‍රාදේශීය සභාවලින් ඒ මූල්‍ය විනය බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරු ඒ වෙනුවෙන් නිරන්තරයෙන් කැප වෙනවා. ඒ වාගේම, සියලු අමාත්‍යාංශ යටතේ තිබෙන දෙපාර්තමේන්තුවලිනුත් අපි ඒ මූල්‍ය විනය සහ මූල්‍ය විනිවිදභාවය බලාපොරොත්තු වෙනවා. ඒ නිසා තමයි අපි මාස්පතා අරගෙන එක එක Votesවල තිබෙන මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය සන්සන්දනය කරලා අඩු තැන්වලින් මොකක්ද කරන්නේ කියලා බලන්නේ.

ආණ්ඩුවේ පළමුවැනි මාස 6 ගත වූ තැන ජනාධිපතිතුමා විසින් සියලු අමාත්‍යාංශවල නිලධාරින් කැඳවූවා. මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය බලාපොරොත්තු වෙච්ච තත්ත්වයට නැති තැන්වල මුදල් අනෙක් තැන්වලට මාරු කරලා, අපි ඒ තුළින් මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. මේ ආකාරයෙන් අපි ඒ කටයුත්ත මූල්‍ය විනයක් සහිතව කරගෙන යනවා. එහි දිගුවක් විධියට තමයි අපි මේක දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාරණය කියන්නත් කනගාටුයි. පසුගිය දවසක මම, මගේ දිස්ත්‍රික්කයේ රැස්වීමකට යමින් සිටියදී අලුතින් පත්වෙලා ආපු OIC මහත්මයා මට කිව්වා, "සර්, මම ඊයේ හෙරොයින් ග්‍රෑම් 14ක් ඇල්ලුවා" කියලා. ඒ කථාව ගැන කියනකොට මට පසුගිය දවස්වල අල්ලපු හෙරොයින් සහ අයිස් ප්‍රමාණය ගැනත් කියන්න හිතුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ මම phone එක දිහා බලාගෙන ඒ ඉලක්කම් ටික කියාගෙන ගියා. පසුගිය සතිය වනවිට හෙරොයින් කිලෝග්‍රෑම් 928ක්, අයිස් මත් ද්‍රව්‍යය කිලෝග්‍රෑම් 1,396ක්, ගංජා කිලෝග්‍රෑම් 11,192ක් වශයෙන් මම list එක කියාගෙන ගියා. එහෙම කියාගෙන යනකොට තමයි මට click වුණේ මේ කිලෝග්‍රෑම්වලින් තමයි කියන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහෝ දෙනෙක් සහල් කිලෝග්‍රෑම් පහේ, දහයේ බෑග් තමයි ගෙදරට අරගෙන යන්නේ. ගණන් හදලා බැලුවාම ground එක පිරෙන්න තිටපු ඔක්කෝටම මාසයක් විතර යනකම් මේවා කන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අවුරුද්දේ -මීට අවුරුද්දකට කලින්- අපේ රටේ ජනතාව එකතුවෙලා පසුගිය පාලනය වෙනස් නොකළා නම් අපට අද බලන්න වෙන්නේ ඒක පුද්ගල ආදායම නොවෙයි. එහෙම නම් අපට බලන්න වෙන්නේ අයිස් ප්‍රමාණය සමස්ත ජනගහනයෙන් බෙදලා ඒකපුද්ගල අයිස් පරිභෝජනය සහ හෙරොයින් ප්‍රමාණය ජනගහනයෙන් බෙදලා ඒක පුද්ගල හෙරොයින් ප්‍රමාණය. එහෙම නම් කන් හැන්දෙන් නොවෙයි දෙන්න වෙන්නේ, අග්ගලා හදලා දෙන්න වෙන්නේ. එහෙව් රාජ්‍යයක් තමයි අපි වෙනස් කළේ.

විපක්ෂ නායකතුමා අපෙන් ඇහුවා, 2028 වර්ෂය වනවිට අපට මූල්‍ය ස්ථායීකරණයට යන්න පුළුවන් ද කියලා. ඔව්, අපට මූල්‍ය ඉලක්ක - fiscal targets - තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ගමන් කරනවා. Primary account එකේ percentage එකක් විධියට සියයට 2.3ක් තිබෙන්න ඕනෑ. ඒක ගත්තොත්, total Government revenue minus Government expenditure. ඒ කියන්නේ, අපි ගෙවන ණය පොලී සහ වාරික හැර, රජයේ වියදම් බෙදන්න ඕනෑ GDP එකෙන්; ඊට පස්සේ වැඩි කරන්න ඕනෑ සියයෙන්. එතකොට 2.3ක percentage එකක් තිබෙන්න ඕනෑ. අපි ඒක බලනවා; අපි ඒක මොනිටර් කරගෙන යනවා. Public debt to GDP ratio එක 2022 වර්ෂයේදී සියයට 128යි. අපි ඒක 2032 වර්ෂය විතර වෙනකොට සියයට 95කට අඩු කර ගන්න බලාපොරොත්තු වෙනවා. GFN - Gross Financing Need එක 2027 සිට 2032 දක්වා අපි සියයට 12කට, 13කට විතර අඩුවෙන් තියාගෙන යන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ ආකාරයෙන් අපි නිරන්තරයෙන්ම ඉලක්කම් එක්ක ගනුදෙනු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ විනිවිදභාවය තුළ තමයි අපි මේ රාජ්‍ය යන්ත්‍රණය, ස්ථායීකරණය හා ආර්ථික ස්ථායීකරණය කරන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඊයේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80වැනි සැසිවාරය ආමන්ත්‍රණය කළා. එහිදී එතුමා කළ ප්‍රකාශයක් උපුටා දක්වමින් මගේ කථාව අවසන් කරන්න කැමතියි. එම සැසියේදී එතුමා මෙසේ කියනවා:

"අප තබන පළමු පියවර අසීරු විය හැකිය. නමුත්, අප නිර්භීතව තබන පියවර නිවැරදි නම් ඒ පියවර පිටුපස තවත් පියවර දහස් ගණනක් අප සමඟ එයි කියා මා විශ්වාස කරනවා"

ඒ දේ මාත් විශ්වාස කරනවා, අපිත් විශ්වාස කරනවා, ලංකාවේ සමස්ත ජනතාවත් විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Ajith P. Perera, please. You have five minutes.

[අ.භා. 12.26]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තුවේ කටයුතු කෙරෙන්නේ ස්ථාවර නියෝග අනුව. ස්ථාවර නියෝග 76 (1) අනුව ඉතාම පැහැදිලියි, එකම කාරණයක් ගැන නියෝගයක් දුන්නාම ඒක එච්චරයි. ස්ථාවර නියෝග 76 (1) මටත් අදාළයි; මූලසුනේ ඉන්න ඔබතුමාටත් අදාළයි; මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාටත් අදාළයි; ගරු කථානායකතුමාටත් අදාළයි. ඒකේ වෙනසක් නැහැ. නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංගයක් දෙන්න බැහැයි කියලා ඒ ප්‍රතික්ෂේප කිරීම කළේ 2025 සැප්තැම්බර් මස

10වැනි දා. එතකොට කථානායකතුමා කථානායකතුමාගේ පැත්තෙන් විශ්වාස භංගය දීම ප්‍රතික්ෂේප කරමි කියලා හේතු කිව්වේ නැති වුණත්, තර්ක විතර්ක -reasoning- නැති වුණත් ඒක ප්‍රතික්ෂේප කළා. ඒක එච්චරයි.

දැන් අද දින එතුමා අර තමන්ගේ නියෝගයේ තිබුණු අඩුපාඩුකම් මකා ගන්න නැවත හේතු ප්‍රකාශ කරලා නැවත වරක් එය ප්‍රතික්ෂේප කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 76 (1) ස්ථාවර නියෝගය අනුව එහෙම කරන්න බැහැ. මම බැලුවා, කථානායකතුමාට ස්ථාවර නියෝග අනුව තව මොනවා හරි බලතලයක් තිබෙනවාද කියලා. ස්ථාවර නියෝග 139, 140, 141, 142හි තිබෙන කථානායකතුමාගේ සාමාන්‍ය බල අධිකාරය යටතේත් එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඒ වගන්ති අදාළ වෙන්නේ වෙනත් ස්ථාවර නියෝගයක විශේෂයෙන් සඳහන් කර නැති අවස්ථාවලයි. මම වර්තමාන ස්ථාවර නියෝග කෙටුම්පත් කරන්න දායක වෙච්ච කෙනෙක්. ඒ නිසා මට මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා එකම දේ දෙපාරක් කරන්න බැහැ. එක කරුණක් ගැන දෙපාරක් නියෝග දෙන්න බැහැ.

ඒ වාගේම අපි ඉල්ලා සිටියා, නීතිපතිතුමා මේ කාරණය පිළිබඳව දීපු නිර්දේශය අපට දෙන්න කියලා. පාර්ලිමේන්තුවේ ගරු මහ ලේකම්තුමියගේ ඉල්ලීම පරිදි සලකා බලා නීතිපතිතුමා 2025.0.20වැනි දා නිර්දේශයක් ලබා දෙනවා, කිසිදු නීතිමය බාධාවක් නැහැ, පවතින අපරාධ නඩු කටයුතුවලින් බාධාවක් නැහැ, මේ විශ්වාස භංගය ඉදිරියට ගෙන යන්න පුළුවන් කියලා. 2025.08.20 දිනැති ලිපියත් මම සභාගත කරනවා. ඒක කථානායකතුමාත් සභාගත කළා. මම නැවත වරක් එය **සභාගත*** කරනවා, වැඩිදුර පරිස්සමට.

ඉන් පසුව කථානායකතුමා විස්තරාත්මක වාර්තාවක් කැඳෙව්වා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ඇතුළු ලේකම් මණ්ඩලයෙන්. 2025.09.03 දිනැති එම වාර්තාවට ලේකම් මණ්ඩලයම අත්සන් කරලා තිබෙනවා. ඒ වාර්තාවේ කිසිම තැනක කියලා නැහැ, මේ විශ්වාස භංග යෝජනාව ප්‍රතික්ෂේප කරන්න කියලා. මීට කලින් නොකෙරුණාට මූලධර්ම අනුව එතුමා නිලයක් දරන කෙනෙක් නිසා හැකියාව තිබෙනවා, එයට බාධාවක් නැහැ කියන එකයි ඒ වාර්තාවේ කියන්නේ. මම ඒකත් **සභාගත*** කරනවා.

ඉන්පසුව පහුවැනි දා -2025.09.04වන දා- තව වාර්තාවක් නැවත කැඳවනවා. ඒ වාර්තාවේ, -ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා පුදුම වෙයි, සමහර විට ඔබතුමා දන්නේ නැතිව ඇති- නිර්දේශ දෙකක් තිබෙනවා. එහි options දෙකක් තිබෙනවා. පළමුවැනි එක තමයි දෝෂාරෝපණ යෝජනාවකට -Censure Motion එකකට- යන්න පුළුවන් කියන එක. දෙවැනි යෝජනාව විධියට කියනවා, කැමැති නම් තිබෙන ආකාරයෙන්ම විශ්වාස භංගය ඉදිරියට යන්න පුළුවන් කියලා. දෙක එකක්. දෙවැනි යෝජනාවේ තිබෙන්නේ මෙහෙමයි. I quote:

> "The Constitution of Sri Lanka provides provisions only for No-Confidence Motions against the Government,...

ඒක හරි නේ. එච්චරයි තිබෙන්නේ. වෙන කිසිවක් ගැන කියලා නැහැ.

> ...however, Sri Lanka has practised No-Confidence Motions against Individual Ministers of the Cabinet of Ministers, Speakers of Parliament and the Leader of Opposition in Parliament. As such, a No-Confidence Motion may be moved ...

ඒ කියන්නේ විශ්වාස භංග යෝජනාව "may be moved".

> ... in line with said precedence considering that the Deputy Minister is an Office bearer."

එතකොට මේ විද්වත්, උගත්, පළපුරුදු පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන හොඳ අවබෝධයක් තිබෙන ලේකම් මණ්ඩලය ගරු කථානායකතුමාට දෙන උපදෙස තමයි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරියට ගෙන යන්න පුළුවන් කියන එක. ප්‍රියානි විජේසේකර මැතිනියගේ පාර්ලිමේන්තු කාර්යය පටිපාටිය පිළිබඳ කවුරුත් පිළිගත්ත ග්‍රන්ථයේත් ඒ විධියටම කියනවා. ඒකේ සඳහන් වෙනවා, "විශ්වාස භංග යෝජනාවයි, දෝෂාරෝපණ යෝජනාවයි දෙකම අපේ අර්ථයෙන් එකයි; අපේ රටේ සංස්කෘතිය අනුව එකයි; අපේ රටේ භාවිතය අනුව එකයි, Censure Motion කිව්වත්, No-Confidence Motion කිව්වත් එකයි" කියලා. එහෙනම් කථානායකතුමා ලේකම් මණ්ඩලයෙන් මේ සම්බන්ධව උපදෙස් ගන්න ඕනෑ. මොකද, ලේකම් මණ්ඩලය නිර්දේශ කරලා තිබෙනවා, බාධාවක් නැහැ, කරන්න පුළුවන්, ඉස්සරහට යන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මොකද කරන්නේ? ගරු කථානායකතුමා වැරදි දෙකක් කරනවා. ස්ථාවර නියෝග 76 (1) අනුව එතුමාත් බැඳිලා ඉන්නවා, එකම කරුණක් පිළිබඳව නැවත නැවත කටයුතු කිරීමට බැහැයි කියන මූලධර්මයෙන්. එතුමා අද ඒක කඩ කරලා- මොකද, අපි කිව්වා නේ, "ඔබතුමා කටයුතු කරන්නේ ළමයෙක් වාගේ" කියලා. මම එදාත් කිව්වා. එදා මම කිව්වේ "childish" කියලා. ඒ කියන්නේ මීට කලින් කථානායකතුමෙකු නියෝගයක් දෙනකොට ගරු ගාම්භීර විධියට, සාරගර්භ විධියට ඒ පිළිබඳව වෙනත් රටවල අත්දැකීම්, නඩු තීන්දු, කථානායකවරුන්ගේ පූර්ව නියමයන් සියල්ල සලකා බලනවා. නීතිපතිවරයාගේ උපදෙස්, ලේකම් මණ්ඩලයේ උපදෙස් සලකා බලනවා. ඒ අය තමයි සම්ප්‍රදාය කියලා දෙන්නේ. කථානායකතුමා එහෙම කටයුතු නොකරපු නිසායි අපි කිව්වේ එතුමා childish කියලා; ළමයෙක් වාගේ කටයුතු කරනවා කියලා. අද ඒක එතුමා නැවත සනාථ කළා. එකම කරුණ ගැන නැවත නැවත කිව්වා. එක සැරයක් විභාගය ෆේල් වුණාම නැවත වරක් උත්තර පත්‍රයක් දීලා "මාව පාස් කරන්න" කියලා කියන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, පාර්ලිමේන්තු ඉතිහාසය. ආර්.එස්. පැල්පොල කථානායකතුමාට 1963.11.22වැනි දා විශ්වාස භංගයක් ගෙනාවා. ෂර්ලි කොරයා කථානායකතුමාට 1966.11.09 දින විශ්වාස භංගයක් ගෙනාවා. එම්.ඒ. බාකීර් මාකර් කථානායකතුමාට 1980.12.23වැනි දා විශ්වාස භංගයක් ගෙනාවා. එම්.එච්. මොහොමඩ් කථානායකතුමාට 1991.10.10වැනි දා විශ්වාස භංගයක් ගෙනාවා. එම්.එච්. මොහොමඩ් කථානායකතුමාට නැවත වරක් 1992.06.09වැනි දා විශ්වාස භංගයක් ගෙනාවා. මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමාට 2024.03.19වැනි දා -ගිය අවුරුද්දේ- විශ්වාස භංගයක් ගෙනාවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමාම ස්ථාවර නියෝග කඩ කරනවා නම්; කථානායකතුමාම ස්ථාවර නියෝග 76 (1) කඩ කරනවා නම්, කථානායකතුමාම නැති බලයක් ආරෝපණය කරනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට; මේ රටේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මහජන නියෝජිතයන්ට කථා කරන්න තිබෙන ඒ උත්තරීතර අවස්ථාව අහිමි කරනවා නම් ඊට වඩා අපරාධයක් නැහැ. මේක තමයි උත්තරීතර වාද මණ්ඩපය. යම් චෝදනාවක් පිළිබඳව, ඇමතිවරයෙක්, රාජ්‍ය ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්, ආණ්ඩුව, කථානායකවරයා, විපක්ෂ නායකවරයා, ජනාධිපතිවරයා, මේ කවුරු ගැන වුණත් පාර්ලිමේන්තුවට වගකියන, පාර්ලිමේන්තුවේ මුදලින් වැඩ කරන, තනතුරු දරන, පහසුකම් ගන්න ඒ අයගේ වගකීම පිළිබඳව සොයා බලන, පරීක්ෂා කරන ක්‍රියාදාමය තමයි විශ්වාස භංග යෝජනාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන කථානායකතුමා ගැන කනගාටුවෙන් කියන්න ඕනෑ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith P. Perera, your time is up.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාට කියන්නේ මේකයි. ඔය අසුනට තිබෙන ගෞරවය තිබෙනවා, කථානායකකමට තිබෙන ගෞරවය තිබෙනවා, මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තිබෙන ගෞරවය තිබෙනවා. හැබැයි ඔය මූලසුන දරන්නට එතුමාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය හැටියට කථානායකවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි තීරණයක් අරන් තිබෙනවා. අපි ඒක නිසි අවස්ථාවේදී ඉදිරිපත් කරනවා කියන කාරණය කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chaminda Lalith Kumara. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු චමින්ද ලලිත් කුමාර මහතා**
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය සඳහා වැදගත්කමක් ලබා දෙමින් වාහන ආනයනය පිළිබඳ කාරණා ගැන අපේ ගරු අමාත්‍යතුමාගෙන් පටන් ගෙන මේ වන තෙක් මේ ගරු සභාවේ කරපු කථාවලදී, කරපු සාකච්ඡාවේදී වැදගත් අදහස් කිහිපයකටම සවන් දෙන්න අපට අවස්ථාව ලැබුණා. රටක් හැටියට ගත්තාම, සංචාරක කර්මාන්තය පැත්තෙන් අපට විශාල විභවයක් තිබෙනවා, අපේ රට දියුණු කිරීමේදී, අපට විදේශ විනිමය ලබා ගැනීමේදී සහ ඩොලර් එකතු කර ගැනීමේදී. ඒ වාගේම, අපේ රට සතුව තිබෙන යහපත් ගුණාංග පිළිබඳවත් ලෝකයට කියාගන්න තිබෙන හොඳම අවස්ථාව තමයි, සංචාරක කර්මාන්තය.

මේ රජය පත් වුණාට පසුව සංවිධානාත්මකව හැම ආකාරයකින්ම ඒ සඳහා දෙන්න පුළුවන් දිරිගැන්වීම් ලබා දෙමින්, ප්‍රතිපාදන වෙන් කරමින්, ලෝකයට මේ රට පිළිබඳ හොඳ පණිවුඩයක් ලබා දෙමින්, සංචාරක කර්මාන්තය යම් ස්ථාවර මට්ටමක තබා ගන්නවා වාගේම ඉදිරියට ගෙන යන්නත් අවශ්‍ය සියලු කටයුතු කරන මොහොතක්, මේක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ ගරු සභාවේ ඒ පිළිබඳ සාකච්ඡාව දිග හැරෙන මේ වෙලාවේ ඒ ගැන අදහස් දක්වන්න මට යම් කාලයක් ලබා දීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා රටකට ස්වභාවයෙන්ම ලැබෙන දායාද තිබෙන බව. අපේ මාතෘභූමිය, පිහිටීම අනුව මුළු ලෝකයේම ආදරය දිනාගත්තු, ආකර්ෂණය දිනාගත්තු රටක්. නමුත්, ඒක එහෙම වටිනා තැනක් වුණාට ඉතිහාසය පුරා එහි වාසිය නෙළාගන්නට ලැබුණේ මේ රටේ ජනතාවගෙන් පවුල් කිහිපයකට විතරයි කිව්වොත් ඒක සංවාදයකට තුඩු දෙන කාරණාවක් නොවෙයි. මොකද, ඒක තමයි ඇත්ත.

හැබැයි, ඒ වාසිය ගම්වල සිටින අහිංසක ජනතාව දක්වා යා යුතුයි. මේ රටේ තිබෙන වටිනාකම ලෝකයට පෙන්වා තම ජීවිත ගොඩනගා ගන්න ජනතාවට තිබෙන මාර්ගයක් තමයි සංචාරක කර්මාන්තය. තේ පැළ සිටුවන කොට, කුරුඳු පැළ සිටුවන කොට, රබර් කිරි ටික අරගෙන ඒවා මඟින් නිෂ්පාදන සිදු කරලා හෝ නැතුව හෝ විදේශ විනිමය සොයන කොට ඒ සඳහා ගතවන කාලය වැඩි නිසායි මා එහෙම කියන්නේ. ඒක හොඳ නැහැ කියනවා නොවෙයි. හැබැයි, සංචාරක කර්මාන්තය ගත් විට, විදේශ සංචාරකයෙකු තම රටේ සිට අපේ රටට ආ ගමනේදී වියදම් කරන්න ගෙනෙන ඩොලර් ප්‍රමාණය උපයා ගැනීමේ පහසු මාර්ග තිබෙනවා. එසේ තිබියදීත් අප අර කියපු ක්‍රම කිහිපයට විතරයි හුරු වෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක කර්මාන්තය ගත්තාම, ඒකත් එක පන්තියකට, එක පිරිසකට විතරක් උරුම වෙච්ච දෙයක් බවට පත් වෙලායි තිබුණේ. ලොකු හෝටල්, ලොකු මන්දිර වැනි තැන්වලට සංචාරක කර්මාන්තය උරුම වෙච්ච සමාජයක් තමයි ඉතිහාසයේ තිබුණේ. හැබැයි, ග්‍රාමීය කර්මාන්ත බිහි කරනවා වාගේ ඉතිහාසයේ හිටපු පාලකයන් සංචාරක කර්මාන්තය ගම්වල ජනතාවටත් ළං කරලා දුන්නා නම්,

අපි හිතනවා අපේ ජන ජීවිතය මීට වඩා වෙනස් වෙන්න තිබුණා කියලා. අපි එහෙම කියන්නේ ඇයි? පසුගිය කාලයේ කිව්වා, කොරෝනා වසංගතය නිසා රටේ විදේශ සංචිත හිඟ වුණා, අපට අපනයන ආදායම් නැති වුණා කියලා. එදා ආනයන තත්ත්ව හිර කළා. ආනයනය කිරීමට ඉඩ තැබුවේත් නැහැ, එක පැත්තකින් විදේශ සංචිත ඉතුරු කර ගන්න අවශ්‍ය නිසා. මේ රටේ හිටපු පාලකයෝ එලෙස විවිධාකාරයෙන් මේ රටේ ජනතාව එක කුඩුවක සිර කරද්දී, අනෙක් පැත්තෙන් ජනතාවගේ ජීවිත එක්ක සෙල්ලම් කළා. මුහුදෙන් වට වුණු රටක ඒ ස්වාභාවික සම්පත්වල වාසිය තුළින් ජන ජීවිතය නඟා සිටුවන්න, රට ඉස්සරහට ගෙන යන්න ඉතිහාසයේ අවස්ථාව ලබා දුන්නේ නැහැ. මේ රට රැක ගන්න අවශ්‍ය අවස්ථාවල විහිළුකාර විදියට හැසිරුණු පාලකයන් හිටපු රටක අපට මෙහෙම හරි ජීවත් වෙන්න ලැබිලා තිබෙන එක සහනයක් කියලා හිතෙනවා. "යුද්ධය අවසන් කරපු අපිට කොරෝනා වසංගතය කජ්ජක්ද?" කියලා එදා ඇහුවා. පාස්කු ඉරුදින ප්‍රහාරය අද දේශපාලන ප්‍රහාරයක් හැටියට දිග හැරිලා තිබෙනවා. එක පැත්තකින්, 30 වසරක යුද්ධයක් තිබුණා. ඒවා ඉබේ සිදු වුණු දේවල් නොවෙයි; ඉතිහාසයේ නිර්මාණය වුණු දේවල්. එක පෙළැන්තියක, පවුල් කිහිපයක කටයුතු නිසා අපේ රටේ එදා දුක් විඳපු ජනතාව අදටත් දුක් විඳිනවා. හැබැයි, මේ රජය බිහි නොවන්නට ජනතාවගේ අනාගතය ගැන හිතන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රජය සියලු කර්මාන්තවල සියලු ආකාරයේ පිබිදීමක් ඇති කරමින් මේ රට පුනරුදයක් කරා ගෙන යන ගමන්ම සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙන යන්න දක්වන දායකත්වයත් අපි සෑම දිස්ත්‍රික්කයකින්ම දකිනවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ ආදරණීය නායක, ගරු විජිත හේරත් අමාත්‍යතුමා තමයි විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා හැටියට ඉන්නේ. ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට ඉන්නේ අපේ ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මැතිතුමායි. නියෝජ්‍ය අමාත්‍ය අපේ ගරු අරුන් හේමචන්ද්‍ර මැතිතුමා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ධුරයේ අද වැඩ බලනවා. මම ආඩම්බර වෙනවා, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයට නායකත්වය ලබා දෙන අපේ ගරු අමාත්‍යවරයා සංචාරක ක්ෂේත්‍රය භාරව ඉන්න එක ගැන.

ගම්පහ දිස්ත්‍රික්කයට අදාළව ගත්තත්, සංචාරක ක්ෂේත්‍රය පුබුදන්න අපට ගොඩක් දේවල් කරන්න තිබෙනවා. අපි පසුගිය පාලනයන්හි තිබුණු අඩු පාඩු ගැන කියන්න යන්නේ නැහැ. අඩුම තරමේ කොරෝනා වසංගතය වසන්තයක් කර ගන්න හැදූ පොහොට්ටුව ගැනවත් අපි අද කියන්න යන්නේ නැහැ, පොහොට්ටුවේ කවුරුවත් මේ වෙලාවේ විපක්ෂයේ ඉඳගෙන ඉන්නවා පෙනෙන්න නැති නිසා; බෙහෙතකටවත් හොයා ගන්න නැති නිසා. ඉතින්, පාළු ගෙයි වළං බිඳලා වැඩක් නැහැ. කොහොම වුණත්, රජය හැටියට අපට වගකීමක් තිබෙනවා, සියලු නිලධාරින්, සියලු දේශපාලන නායකයින්, සියලු සංවිධායකයින් පළාත් වශයෙන් පෙළගස්වා සංචාරක කර්මාන්තය ගමට අරගෙන යන්න. ඒ සඳහා අවශ්‍ය කටයුතු සියල්ල සංවිධානය වෙමින් තිබෙන අතරතුර තමයි මේ විවාදය පැවැත්වෙන්නේ. ඒ කරගෙන යන කටයුතු සම්බන්ධව අපට හැම පළාතකින්ම අසන්න ලැබෙනවා. ඒ සඳහා වැඩමුළු පවත්වනවා, වැඩසටහන් පවත්වනවා. එසේ කටයුතු කරමින් සංචාරක කර්මාන්තය ගමට ගෙන යන්න අවශ්‍ය පාර අද සකස් කරන කොට, ප්‍රවාහන ප්‍රශ්නය විසඳා ගත යුතුව තිබෙන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, ගම්වලට ඉඳලා හිටලා කරත්තවලින් සංචාරකයෙකු හෝ දෙදෙනෙකු ගමන් කරනවා පෙනුණාට, පවුල් පිටින් ඇවිල්ලා සිරි නරඹනවා පෙනුණාට, එවැනි විවිධාකාර අත්දැකීම් ගත්තාට, කරත්තවලින් රට පුරා යන්න සංචාරකයෝ එන්නේ නැහැ. ඔවුන්ට හොඳ වාහන ඕනෑ. ඔවුන්ට ඒ පහසුකම් ඕනෑ. තමන් නතර වන සංචාරක නිවස්නය කොතැනද, හෝටලය කොතැනද, එතැන තිබෙන පහසුකම් මොනවාද කියන ඒවා අතර තමන්ට ප්‍රවාහනය සඳහා තිබෙන පහසුකම්ද ඔවුන් බලනවා.

ඔවුන් ඒ හැම ආකාරයෙන්ම බලලා තමයි ලංකාවට එන්නේ. ඒ ආවාම, දෙනවා කියා තිබුණු පහසුකම් ටික නොතිබුණොත් මේ රට සම්බන්ධව හැදෙන කළු පැල්ලම ආයෙත් වහන්න හැකියාවක් නැහැ. මේ රටට කළු පැල්ලම් හැදුණා ඇති.

අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න ගුණසේන සහෝදරයා පැහැදිලි කළා, මේ දක්වා සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය කොච්චරද කියලා. එන හැම සංචාරකයෙකුටම මේ වාගේ ලස්සන රටක් තිබෙනවා, මේ වාගේ ලස්සන මිනිස්සු ඉන්නවා, එහි මේ වාගේ ලස්සන වැඩ පිළිවෙළක් තිබෙනවා කියලා කියන්න පුළුවන් විදියට මේ රට ලස්සන කරන්න මේ රජයට පැවරී තිබෙන වගකීම ඉෂ්ට කරමින්, කටයුතු කරමින් යන මොහොතක්, මේක. ඒ නිසා කිසිම ආකාරයකින් රට අඳුරු වෙන්න නොදී රජය අවශ්‍ය පහසුකම් සංවර්ධනය කරන්න ඕනෑ; යටිතල පහසුකම් සංවර්ධනය කරන්න ඕනෑ. ඒ කටයුතු කරන ගමන් සංචාරක කර්මාන්තය දියුණු කරන්න කරන කටයුතුවලදී පෞද්ගලික අංශයේ දායකත්වය ලබා දෙන ආකාරයත් අපි දකිනවා. විද්වතුන් හැටියට, ප්‍රායෝගික දැනුම තිබෙන, අත්දැකීම් තිබෙන අය හැටියට ගම් මට්ටමින් දැනුම, අද්දැකීම් බෙදා ගන්නා අවස්ථා අපිත් සංවේදීව අත්විඳලා තිබෙනවා. ගමට සංචාරක ව්‍යාපාරය අරගෙන යන්න ඕනෑ, ගමේ තරුණයාට, ගමේ ව්‍යාපාරිකයාට, වෙනත් ව්‍යාපාරවල හිටපු අයට මේ ස්වාභාවික සුන්දර පරිසරය තුළින් සංචාරක ක්ෂේත්‍රයෙන් මුදලක් උපයා ගන්න.

අපි විශ්වාස කරනවා, මේ රටට පැමිණෙන සංචාරකයන් ගමට අරගෙන ගිය තරමටයි ඔවුන් මේ රට පිළිබඳ විශ්වාසය සහ ආදරය ලෝකය වෙත අරගෙන යන්නේ කියලා. ඉතිහාසයේ මේ රට බංකොලොත් කරපු නායකයින්ගෙන් ඒවා බලාපොරොත්තු වෙනවා නම් ඉබ්බන්ගෙන් පිහාටු බලාපොරොත්තු වෙනවා වාගේ තමයි. ඒ අයගෙන් එවැන්නක් බලාපොරොත්තු වුණේ නැති නිසා තමයි අපි ඒ පැවැති පාලනය වෙනස් කළේ. මේ රටේ ජනතාව විතරක් නොවෙයි, මෙසේ රොද බැඳගෙන මේ රටට එන්න විදේශිකයන් පවා මේ රට වෙනස් වනකල් හිටියාද, මේ රටේ පැවැති පාලනය වෙනස් වනකල් හිටියාද කියලා අපට හිතෙනවා. එහෙම වෙන්න ඇති කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතිවාදය නැති රටක, බෝම්බ නැති රටක, ආගමික වශයෙන් වෙන්න පුළුවන්, ජාතික වශයෙන් වෙන්න පුළුවන් රණ්ඩු සරුවල් නැති සාමකාමී රටක, එකමුතුව සාමූහිකව ජීවත් වන මිනිසුන් වෙසෙන, සුන්දරත්වයත් එක්ක දිලෙන රටක සංචාරක කර්මාන්තයට ආපසු කොහෙත්ම අඩ තියන්නේ නැහැ, එයට බාධා වෙන්නේ නැහැ කියන විශ්වාසය අපට තිබෙනවා.

මෙම කර්මාන්තය ස්ථාවරව පවතිනවා වාගේම ගොඩ නැඟෙමින් ඉදිරියට යන ආර්ථිකයක් හිමි අපේ රට ගැන දැන් ලෝකය පුරා කථා වෙනවා. අපේ නායක අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ඉඳලා දෙන ආදර්ශයත් එක්ක ස්වේච්ඡාවෙන් කැප වන මේ මන්ත්‍රීවරු -මහජන නියෝජිතයන්- විතරක් නොවෙයි, මහා බලවේගයක් මේ රට පුරා ඉන්නවා. ඒ සියලු දෙනා පෙළගස්වා මේ රට ගොඩ නඟන්න යන ගමනේදී අපි විශ්වාස කරනවා සංචාරක කර්මාන්තය හරහා ගෙනෙන්න පුළුවන් සහන

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

ගමට, රටට ගෙනෙන්න හැකි වෙච් කියලා. සියලු ආකාරයේ සම්බන්ධතා පාවිච්චි කරලා, සම්පත්දායකයන් පාවිච්චි කරලා ඒ සඳහා දෙන්න පුළුවන් උපරිම දායකත්වය සපයන්න අපි කටයුතු කරනවා. පිටරට අය විතරක් නොවෙයි, අපේ රටේ පුරවැසියන් පවා දැකපු නැති ගම් බිම් තවත් තිබෙනවා. ඒ සඳහා උදාහරණ මා ජීවත් වන මීරිගම ප්‍රදේශයේත් ඕනෑ තරම් තිබෙනවා. අපි මේවා ගැන ලෝකයට කියමු; ලෝකයට පෙන්වමු. මනුස්සකම විතරක් නොවෙයි, අපේ රටේ ලස්සනත් පෙන්නලා, සංචාරක කර්මාන්තය දියුණු කරලා මෙවැනි රෙගුලාසි ගෙනැල්ලා, මේ ලැබිච්ච මහජන බලය; මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය යොදාගෙන අණ පනත්, නීති රීති වෙනස් කරලා සංචාරක කර්මාන්තය ඉහළට නංවන්න අවශ්‍ය කටයුතු කරමු. ප්‍රාදේශීය වශයෙනුත් සිටින හැමෝටම අපි ඒ සඳහා ආරාධනා කරමු. පාර්ලිමේන්තුවේ අද මේ කෙරෙන සාකච්ඡාව අතරතුර මේ විභවය කුමක්ද කියන එක මේ රටේ හැමෝටම පැහැදිලි කර දීලා මේ රට ඉදිරියට ගෙන යන්න එකතු වෙන්න කියලාත් ඒ හැමෝටම ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Kathiravelu Shanmugam Kugathasan. You have 15 minutes.

[பி.ப. 1.11]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டத்தின்கீழ் முன்வைக்கப் பட்டுள்ள ஒழுங்குவிதிகளின் திருத்தம் தொடர்பிலான எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன். 1969ஆம் ஆண்டின் 01ஆம் எண் கொண்ட இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டமானது, இலங்கையில் இறக்குமதி மற்றும் ஏற்றுமதிகளை ஒழுங்குபடுத்துவதற்கான சட்டக் கட்டமைப்பை வழங்குகின்றது. காலப்போக்கில், பொருளாதார முன்னுரிமைகள், வெளிநாட்டு நாணய நிலைமைகள், வணிகக் கொள்கை நோக்கங்கள் முதலியவற்றைப் பிரதிபலிக்கும் வகையில் இச்சட்டத்தில் திருத்தங்கள் மற்றும் ஒழுங்குவிதிகள் அறிமுகம் செய்யப்பட்டன.

2022ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு காலப்பகுதியில் நாட்டில் ஏற்பட்ட பொருளாதார நெருக்கடி காரணமாக வெளிநாட்டு நாணய மாற்றுப் பற்றாக்குறை ஏற்பட்டது. இதன் விளைவாக மோட்டார் வாகனங்களின் இறக்குமதியைத் தற்காலிகமாக இடைநிறுத்தும் வகையில் முன்னாள் குடியரசுத் தலைவர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் 2024 மே மாதம் 17ஆம் நாள் அன்று 2384/34ஆம் எண் கொண்ட அதி சிறப்பு அரசிதழை வெளியிட்டார். இவ்வரசிதழானது, இறக்குமதித் தடைக்காலம் 2025 ஏப்ரல் 30ஆம் திகதி வரை நடைமுறையில் இருக்கும் எனக் கூறுகின்றது. இதற்கமைய, பேருந்துகள், மகிழுந்துகள், விளையாட்டுப் பயன்பாட்டு வாகனங்கள், வான்கள், மின்சார வாகனங்கள் உள்ளிட்ட சிலவகை மோட்டார் வாகனங்களுக்குத் தற்காலிக இறக்குமதித் தடையும், 250cc மோட்டார் சைக்கிள், 750cc விளையாட்டுப் பயன்பாட்டு வாகனங்கள், நகர்வுக் கதவு வாகனங்கள் ஆகியவற்றுக்குச் சிறப்புக் கட்டுப்பாடுகளும் நடைமுறைக்கு வந்தன.

இப்பொழுது நாட்டின் பொருளாதாரம் மேம்பட்டுள்ள சூழலில், இந்த அரசானது, 2024.09.12 நாள் அன்று அமைச்சரவை வழங்கிய ஒப்புதலுக்கு அமைய, 2025 சனவரி 27ஆம் நாள் அன்று வெளியிடப்பட்ட சிறப்பு அரசிதழ் எண். 2421/04 மூலம் முன்னாள் குடியரசுத் தலைவர் ரணில் விக்கரமசிங்ஹ அவர்கள் விதித்த தடைகளை நீக்கி, புதிய கட்டுப்பாடுகளுடன் மோட்டார் வாகன இறக்குமதிக்கு அனுமதி அளித்துள்ளது. இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டத்தின்கீழ் திருத்தப்பட்ட வாகன இறக்குமதி விதிமுறைகள் அறிமுகப்படுத்தப்பட்டு உள்ளன. 2024 மே மாதம் வெளியிடப்பட்ட 2384/34 எண் கொண்ட அரசிதழுக்கு அமைய, வாகன இறக்குமதிகள் முற்றாகக் கட்டுப்படுத்தப்பட்டிருந்தது; அரசின் குறிப்பிட்ட அனுமதி வழியாக மட்டுமே இறக்குமதி செய்ய முடிந்தது.

2025 சனவரி மாதம் வெளியிடப்பட்ட 2421/04 எண் கொண்ட அரசிதழுக்கு அமைய, வாகனப் பதிவுகளுக்கான காலக்கெடு, தண்டப் பணம், ஒருவருக்கான வாகன எண்ணிக்கை வரம்பு முதலிய கட்டுப்பாடுகளுடன் வாகன இறக்குமதிக்கு மீண்டும் அனுமதி வழங்கப்பட்டுள்ளது. வாகனத்தைப் பதிவு செய்யும்பொழுது வரி, அடையாள எண் மற்றும் உறுதியுரை கட்டாயமாக்கப்பட்டுள்ளது. இச்சட்டத் திருத்தத்திற்கு அமைய பதிவு செய்யப்பட்ட வாகன விற்பனையாளர்கள் பல வாகனங்களையும், தனியாள் ஒருவர் ஆண்டுக்கு ஒரு வாகனத்தையும் மட்டுமே இறக்குமதி செய்ய முடியும் என்பதோடு, இறக்குமதி செய்யப்பட்டு 90 நாட்களுக்குள் பதிவு செய்வது கட்டாயமாக்கப்பட்டுள்ளது. இப்பதிவு தாமதமானால் வாகனப் பெறுமதி மற்றும் வழிச் செலவு ஆகிய மதிப்பின் 3% தொடக்கம் அதிகபட்சம் 45% வரையும் மாதத்திற்குத் தண்டப் பணம் அறவிடும் முறையும் அறிமுகப்படுத்தப்பட்டது. மேலும், அரசாங்க அலுவலர்கள், தூதுவர்கள், சிறப்பு அனுமதி வழிமுறைகள் மூலம் HS Code குறியீட்டு வாகனங்களை இறக்குமதி செய்ய முடியாது. விதி மீறல் ஏற்பட்டால், இறக்குமதி செய்யப்பட்ட வாகனங்கள் 90 நாட்களுக்குள் மீண்டும் ஏற்றுமதி செய்யப்பட வேண்டும். இதற்கு ஏற்படும் செலவை இறக்குமதியாளர்களே ஏற்க வேண்டும்.

இவ்விடயம் தொடர்பாக மேலும் சில திருத்தங்கள் 2025 மார்ச் 19ஆம் திகதியிடப்பட்ட 2488/07ஆம் இலக்கம் கொண்ட விசேட வர்த்தமானியில் வெளியிடப்பட்டன. இந்தத் திருத்த விதிமுறைகள் 2013ஆம் ஆண்டின் 2ஆம் இலக்க வாகன இறக்குமதி மற்றும் ஏற்றுமதி கட்டுப்பாட்டு விதிமுறைகளில் குறிப்பிட்ட விதிகளை மாற்றி அமைக்கின்றன. அதாவது, பதிவுச் சான்றிதழ், அதன் ஆங்கில மொழிபெயர்ப்பு மற்றும் தொடர்புடைய ஆவணங்களுடன் கடன் கடிதத்தை வழங்கிய உள்ளூர் வங்கி மற்றும் ஏற்றுமதி நாட்டில் உள்ள தொடர்புடைய வங்கி ஆகிய இரண்டின் முத்திரைகளையும் கொண்டிருக்க வேண்டும் என்பது முதன்மையான மாற்றமாகும்.

மேலும், இந்தத் திருத்தங்கள் ஏற்றுமதி ஆய்வுச் சான்றிதழ்களின் நம்பகத்தன்மையை உறுதி செய்வதற்கான கூடுதல் சரிபார்ப்பு நடவடிக்கைகளை நிறுவுகின்றன. தொடர்புடைய வங்கியால் ஆவணங்கள் நேரடியாக அனுப்பப்பட வேண்டும். அத்தோடு, அவற்றின் சட்டபூர்வமான தன்மை, நியமிக்கப்பட்ட ஆய்வு நிறுவனம் மூலம் இணைய வழியாக உறுதிப்படுத்தப்பட வேண்டும் என்பதோடு, நம்பகத்தன்மை சரிபார்க்கப்பட்டதைக் குறிக்கும் அதிகார ஒப்புதல் இப்பொழுது கட்டாயமாக்கப்பட்டுள்ளது.

மோட்டார் வாகன இறக்குமதி ஆவணங்களின் நம்பகத் தன்மையைச் சரிபார்ப்பதற்கான குறிப்பிட்ட விதிகளையும் இந்த நெறிமுறைகள் அறிமுகப்படுத்துகின்றன. முன்னைய விதிமுறைகளில் குறிப்பிடப்பட்டுள்ளவை உட்பட இந்த ஆவணங்கள் அனுமதிக்கப்படுவதற்கு முன்பு ஆராயப்படுவதை உறுதி செய்வது இலங்கைச் சுங்கத் துறையின் பணியாகும். இந்த விதிமுறைகளைச் செயற்படுத்துவதை எளிதாக்கும் பொருட்டாக ஏற்றுமதி மற்றும் இறக்குமதிக் கட்டுப்பாட்டுத் தலைவரானவர், சுங்கப் பணிப்பாளர் நாயகம் மற்றும் உரிமம் பெற்ற வங்கிகள் உட்பட தொடர்புடைய அதிகாரிகளுக்கு செயற்பாட்டு வழிமுறைகளை வழங்குவார்.

மோட்டார் வாகனங்களை அனுமதிப்பதற்கு முன்பு, இறக்குமதி ஆவணங்களின் நம்பகத் தன்மையை இணைய வழியாக சரிபார்க்க இலங்கை சுங்கத்துறை இப்போது கட்டாயப்படுத்தப்பட்டுள்ளது. உரிமம் பெற்ற வங்கிகளால் ஒப்புதல் அளிக்கப்பட்ட அனைத்து ஆவணங்களும் இணைய வழியாக சார்பார்ப்புக்கு உட்படுவதை இலங்கைச் சுங்கப் பணிப்பாளர் நாயகம் உறுதி செய்ய வேண்டும். இந்த நடவடிக்கை வணிக ஆவணங்களின் ஒருமைப்பாட்டை வலுப்படுத்துவதையும் சுங்க அனுமதியில் தாமதங்களைக் குறைப்பதையும் நோக்கமாகக் கொண்டுள்ளது.

பாரிஸ் நகரத்தைத் தலைமைப் பணிமனையாகக் கொண்டு இயங்கும் 'பீரோ வெரிட்டாஸ்' என்னும் நிறுவனமானது, அனைத்து நாடுகளிலிருந்தும் வாகன இறக்குமதிகளுக்குப் பொறுப்பான சரிபார்ப்பு நிறுவனமாக நியமிக்கப்பட்டுள்ளது. இந்நிறுவனமானது, அனைத்து நாடுகளிலிருந்தும் இறக்குமதி செய்யப்படும் வாகனங்களுக்கான ஆய்வுச் சான்றிதழ்களை வழங்க ஒப்புதல் அளிக்கின்றது. இது நாட்டின் வணிகக் கொள்கையில் ஒரு முதன்மையான மாற்றத்தைக் குறிக்கிறது. 'பீரோ வெரிட்டாஸ்' ஆய்வுச் சான்றிதழ்கள் இப்போது அனைத்து நாடுகளிலிருந்தும் வாகன இறக்குமதிகளுக்கு ஏற்றுக்கொள்ளப்படும். இந்த மாற்றம் இறக்குமதிச் செயன்முறையை எளிதாக்கும் அதிகாரத்துவத் தடைகளைக் குறைப்பதோடு, இறக்குமதியாளர்களுக்கான செலவுகளையும் குறைக்கும் என்று எதிர்பார்க்கப்படுகிறது.

'பீரோ வெரிட்டாஸ்' சான்றிதழ்களை ஏற்றுக்கொள்வது தகுதியான வாகனங்களின் நோக்கத்தை விரிவுபடுத்துகின்றது. மேலும், குறிப்பிட்ட நாடு சார்ந்த சான்றிதழ்களைச் சார்ந்திருப் பதைக் குறைக்கிறது. இந்த நெகிழ்வுத் தன்மையானது, பரந்த அளவிலான சந்தைகள் மற்றும் வழங்குநர்களுக்கான அணுகலை வழங்குவதன் மூலம் வணிகங்களுக்குப் பயனளிக்கும் என்று எதிர்பார்க்கப்படுகின்றது.

ஏற்றுமதியாளர்களைப் பொறுத்தவரையில், இணையவழியான ஆவணச் சரிபார்ப்புக்கு முதன்மை அளிப்பதானது, சுங்கச் செயல்முறைகளை விரைவுபடுத்தவும் திரும்பும் நேரத்தைக் குறைக்கவும் ஒட்டுமொத்த வணிகச் செயல்திறனை அதிகரிக்கவும் வாய்ப்புள்ளது. இந்த மாற்றங்கள் எண்ம மயமாக்கல் மற்றும் எல்லை தாண்டிய வணிகத்தில் வெளிப்படைத் தன்மையை நோக்கிய உலகளாவிய போக்குகளோடு ஒத்துப்போகின்றன. இந்த நெறிமுறைகள், வாகன இறக்குமதியாளர்கள் மற்றும் வாகன இறக்குமதிப் பரிவர்த்தனைகளில் ஈடுபட்டுள்ள வணிக வங்கிகளுக்குக் குறிப்பிட்ட வழிகாட்டுதல்களை வழங்குகின்றன.

2025.08.15ஆம் திகதியிட்ட 2449/60 எண் கொண்ட சிறப்பு அரசிதழில் வெளியிடப்பட்ட அண்மைய திருத்தமானது, 2025.09.12 அன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டது. இது 2020ஆம் ஆண்டின் 4ஆம் மற்றும் 2184/21ஆம் எண் கொண்ட சிறப்பு அரசிதழ் விதிமுறைகள் மற்றும் 2023ஆம் ஆண்டின் 2335/26 எண் கொண்ட அரசிதழ் விதிமுறைகள் முதலியவற்றில் குறிப்பிடப்பட்டுள்ள முன்னைய விதிமுறைகளையே பின்பற்றுகின்றது. இத்திருத்தமானது, 2025ஆம் ஆண்டின் 7ஆம் எண் கொண்ட மற்றும் 2024ஆம் ஆண்டின் 12ஆம் எண் கொண்ட ஒழுங்குவிதிமுறைகளின்படி 2025 யூன் 30ஆம் திகதி வரை இருந்த செல்லுபடிக் காலக்கெடுவை 2025 செப்ரெம்பர் 30ஆம் திகதிவரை நீடித்துள்ளது. இதுவே இந்தச் சட்டத் திருத்தத்தின் முதன்மையான கூறாகும். இது சுற்றுலா அமைச்சகத்தால் வழங்கப்பட்ட வாகன இறக்குமதி அனுமதியின்கீழ் மோட்டார் வாகனங்களின் சுங்க வெளியேற்ற அனுமதிக்கு மட்டுமே பொருந்தும் என்பதோடு, 2025 சனவரி 31ஆம் திகதியன்று அல்லது அதற்கு முன்னர் நிறுவப்பட்ட கடன் கடிதங்கள்மூலம் இறக்குமதி செய்யப்பட்ட மோட்டார் வாகனங்களுக்கு மட்டுமே பொருந்தும். இதற்கமைய, இறக்குமதி மற்றும் ஏற்றுமதிக் கட்டுப்பாட்டாளர் நாயகம், சுங்கம், வங்கிகள் மற்றும் பிற அதிகாரிகளுக்குச் செயற்பாட்டு வழிமுறைகளை வழங்கலாம்.

முன்னைய விதிமுறைகளுடன் ஒப்பிட்டுப் பார்ப்போமானால், 2020ஆம் ஆண்டின் 4ஆம் இலக்க 2184/21 எண் கொண்ட அரசிதழின் அட்டவணை I மற்றும் II ஆகியன, உணவுப் பொருட்கள், விவசாயப் பொருட்கள், தொழில்துறை மூலப்பொருட்கள், தொழிநுட்பக் கருவிகள், வாகனப் பாகங்கள், சுதை - cement -, சர்க்கரை, 'பாம் ஒயில்' முதலியவற்றை உள்ளடக்கிய இறக்குமதிகளில் பரந்த கட்டுப் பாடுகள் மற்றும் இடைநிறுத்தங்களை அறிமுகப்படுத்தியது. இது COVID-19 காலத்தில் வெளிநாட்டு நாணயமாற்றுப் பாதுகாப்பு மற்றும் பொருளாதார நிலைப்படுத்தலை முதன்மையான நோக்கமாகக் கொண்டது. பல பொருட்களுக்கு விதிக்கப்பட்ட கடன் வசதித் தேவைகள் 90-180 நாட்கள் மட்டுமே செல்லுபடியாகும். இந்த நெறிமுறைகள் ஏற்றுமதியாளர்கள், முதலீட்டுச் சபையின் திட்டங்கள் மற்றும் மறைமுக ஏற்றுமதியாளர்களுக்குச் சிக்கலான நிபந்தனைகளை விதித்தன. மேலும், பொருளாதார மீட்சிக்கான பரந்த இறக்குமதி இடைநிறுத்தம் மற்றும் கட்டுப்பாடுகள்மீது கவனஞ்செலுத்தின.

2023ஆம் ஆண்டின் யூன் மாதத்தில் வெளியிடப்பட்ட 2335/26 எண் கொண்ட அரசிதழானது, தேர்ந்தெடுக்கப்பட்ட பொருட்களுக்கு, குறிப்பாக உணவுப் பொருட்கள், நெகிழம் - பிளாஸ்டிக் - பொருட்கள், சுகாதாரப் பொருட்கள், மரப் பொருட்கள் மற்றும் காகிதப் பொருட்களுக்கான தற்காலிக இடைநிறுத்தப் பட்டியல்களைத் தொடர்ந்தது. 2023ஆம் ஆண்டின் ஒழுங்குவிதிமுறைகள் எண் 02இன் அட்டவணை Iஇலிருந்து பல பொருட்கள் நீக்கப்பட்டன. அத்தோடு, சில பகுதிகளில் கட்டுப்பாடுகள் தளர்த்தப்பட்டன. 2020ஆம் ஆண்டுடன் ஒப்பிடும்பொழுது இறக்குமதிகளின் படிப்படியான தாராளமயமாக்கலை இவ்விதிமுறைகள் பிரதிபலிக்கின்றன; உணர்திறன்வாய்ந்த பொருட்களுக்கான இடைக்காலத் தடைப் பட்டியல்களைப் பராமரிக்கும் அதேவேளையில், கட்டுப் பாடுகளைத் தேர்ந்தெடுத்துத் தளர்த்துகின்றன. 2025ஆம் ஆண்டின் 7ஆம் இலக்க ஒழுங்குவிதிகளை உள்ளடக்கிய 2449/60 எண் கொண்ட அரசிதழானது வாகன இறக்குமதியில் மட்டுமே கவனம் செலுத்துகின்றது.

இந்த விதிமுறைகளில் முன்னைய ஆண்டுகளைப் போலல்லாமல், தடைசெய்யப்பட்ட HS குறியீடுகளின் பரந்த

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

இடைநிறுத்தப் பட்டியல்கள் அல்லது அட்டவணைகள் எதுவும் இல்லை. அதற்குப் பதிலாக, செல்லுபடியாகும் கடன் கடிதங்களின்கீழ் ஏற்கெனவே நிதியளிக்கப்பட்ட வாகனங்களை விடுவிக்கக் காலநீடிப்பு வழங்குகின்றது. இது முன்னர் ஒப்புதல் வழங்கப்பட்ட பரிவர்த்தனைகளுக்கான இலக்கு வசதிகளை நோக்கிய முழுமையான தடைகளிலிருந்து விலகிச் செல்வதைப் பிரதிபலிப்பதோடு, வாகன அனுமதிகளுக்கான கால நீடிப்பு வழங்குவதனை மட்டுமே கவனத்தில் கொள்கின்றது. சுருங்கக் கூறின், 2020ஆம் ஆண்டின் ஏற்றுமதி இறக்குமதி ஒழுங்குவிதிகளின் இந்தத் திருத்தம், அவசரகால கட்டுப்பாட்டுக் கொள்கைகளைக் கொண்டனவாகக் காணப்படுகின்றன. 2023ஆம் ஆண்டின் ஏற்றுமதி இறக்குமதி ஒழுங்குவிதிகளின் திருத்தம், தேர்ந்தெடுக்கப்பட்ட கட்டுப்பாடுகளுடன் தாராள மயமாக்கலை நோக்கிய மாற்றத்தைக் கொண்டனவாகக் காணப்படுகின்றன. 2025ஆம் ஆண்டின் ஏற்றுமதி இறக்குமதி ஒழுங்குவிதிகளின் திருத்தம் நிருவாக மாற்றங்கள், சாதாரண வணிகக் கொள்கைக்குத் திரும்புவதைக் குறிக்கின்றன. எனினும், வாகன இறக்குமதிகளில் இன்னும் எச்சரிக்கையாக இருப்பதைக் காண முடிகின்றது. இது காலப்போக்கில் வெளிநாட்டு இருப்புகள் மற்றும் நிலைத்தன்மையை மேம்படுத்துவதைப் பிரதிபலிப்பதோடு, குறைந்த கட்டுப்பாடுகள்கொண்ட வணிக மேலாண்மையையும் செயற்படுத்துகின்றது.

2025ஆம் ஆண்டின் விதிமுறைகள் முன்னைய பரந்த அடிப்படையிலான கட்டுப்பாடுகளில் இருந்து குறிப்பிடத்தக்க விலகலைக் குறிக்கின்றது. விரிவான இடைநிறுத்தங்கள் மூலம் பெரிய பொருளாதார உறுதிப்படுத்தலை இலக்காகக் கொண்ட 2020 மற்றும் 2023ஆம் ஆண்டின் விதிமுறைகளுக்கு மாறாக, வரையறுக்கப்பட்ட அனுமதிகளின்கீழ் வாகன இறக்குமதி அனுமதிக்கான காலக்கெடுவை நீடிப்பதற்கான நிருவாக நடவடிக்கையாகவே இவை செயற்படுகின்றன. இந்தப் போக்கு, வணிக வசதி மற்றும் வெளிநாட்டு நாணய மாற்று மேலாண்மையைச் சமநிலைப்படுத்துவதில் குறிப்பிட்ட கவனம் செலுத்தி, நெருக்கடியால் இயக்கப்படும் பாதுகாப்பு வாதத்திலிருந்து கட்டுப்படுத்தப்பட்ட தாராள மயமாக்கலுக்குச் செல்லும் அரசாங்கத்தின் மாற்றத்தைக் கூட்டுகின்றது.

மேலும், நாங்கள் வாகன இறக்குமதி பற்றி கதைக்கின்ற வேளையிலே அரிசி இறக்குமதி பற்றியும் கவனம் செலுத்த வேண்டியவர்களாக இருக்கின்றோம். ஒரு காலத்தில் எமது நாடு அரிசியை ஏற்றுமதி செய்தது. தமிழ் இலக்கியங்களிலே ஈழத்து உணவுகள் இந்தியாவிலே தென் மாநிலத்திலுள்ள முஷிரி, தொண்டி, கொற்கை போன்ற துறைமுகங்கள் ஊடாக வந்ததாகக் குறிப்பிடப்பட்டுள்ளது. ஆனால், இப்பொழுது நாங்கள் அரிசியை இறக்குமதி செய்கின்றோம். அரிசி உற்பத்தியிலே தன்னிறைவைக் காண எங்களால் முடியும். இருந்தாலும், அதற்கான செயற்பாடுகள் போதுமானவையாக இல்லை.

திருகோணமலை மாவட்டத்லே 1985ஆம் ஆண்டுக்கு முன்பு செய்கை பண்ணப் பயன்படுத்தப்பட்ட 205 குளங்களும் 25 அணைக்கட்டுகளும் புனரமைக்கப்படாமல் இருக்கின்றன. இதுபற்றி நான் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலும் இந்த நாடாளுமன்றத்திலும் கூறியிருக்கின்றேன். இவற்றைப் புனரமைத்துப் பயன்படுத்தினால் ஒரு போகத்தில் 5 இலட்சம் மெற்றிக்தொன் அரியை உற்பத்தி செய்ய முடியும். இரண்டு போகத்தில் 10 இலட்சம் மெற்றிக்தொன் அரிசியை உற்பத்தி செய்ய முடியும். இதை ஏன் அரசு செய்யவில்லை, இதில் ஏன் கூடுதல் கவனம் செலுத்தவில்லையென்று தெரியவில்லை.

அதுமாத்திரமல்ல, திருகோணமலை மாவட்டத்திலே 1985ஆம் ஆண்டுக்கு முதல் மக்கள் விவசாயம் செய்த 118,710 ஏக்கர் நிலத்தை வனப் பாதுகாப்புத் திணைக்களமும் 111,619 ஏக்கர் நிலைத்தை வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களமும் 2,599 ஏக்கர் நிலத்தை தொல்பொருளியல் திணைக்களமும் பிடித்து வைத்திருப்பதோடு, 3,320 ஏக்கர் நிலத்தை பௌத்த பிக்குகளும் பிடித்து வைத்திருக்கிறார்கள். இவற்றை விடுவித்து நெற்செய்கைக்கு வழங்குவதன்மூலம் எமது நாட்டிலே அரிசியில் தன்னிறைவைக் காணலாம். அதற்கு அரசும் அமைச்சர்களும் அதிகாரிகளும் ஆவன செய்ய வேண்டுமென்று கேட்டு எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gayan Janaka. You have ten minutes.

[අ.භා.1.25]

**ගරු ගයාන් ජනක මහතා**
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා බලයට පත් වෙලා මේ මොහොත වෙනකොට අවුරුද්දක් ගත වෙලා තිබෙන බව ඔබ, අපි කවුරුත් දන්නවා. හරියටම ගත්තොත් අවුරුද්දයි, දින හතරයි. මීට කලින් කථා කරපු විපක්ෂයේ අය ඇහුවා, මේ කාලය ඇතුළත අපි ආණ්ඩුවක් -රජයක්- විධියට මොනවද කර තිබෙන්නේ කියලා. අපි කරලා තිබෙන දේවල් පිළිබඳව සම්පූර්ණ කථාවක් කරන්න වෙලාව මේක නොවුණත්, මේ දක්වා අපි කර තිබෙන්නේ මොනවද කියන එක පිළිබඳව ඉතාම කෙටියෙන් කරුණු කිහිපයක් ගෙන හැර දක්වන්න මම බලාපොරොත්තු වෙනවා.

අද උදේ පාන්දරම මගේ ඇස ගැටුණු පුවතක් තිබුණා. ඒ තමයි, 2025 ඔක්තෝබර් මාසයේදී ලෝකයේ සංචාරය කිරීමට හොඳම ස්ථානය ලෙස ලංකාව නම් කරගෙන තිබෙනවා කියන පුවත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙවුණු අවුරුද්දයි දින හතර ඇතුළත අපි නිදාගන්න යනකොටත්, උදේ ඇහැරෙනකොටත් අපට අහන්න දකින්න ලැබුණේ ඒ වාගේ පුවත් තමයි. ඒ නිසා ගෙවුණු හැම දිනයක් පාසාම අනාගතය පිළිබඳව අලුත් බලාපොරොත්තුවක් හදන්න පුළුවන්කම ලැබී තිබෙනවා. එවැනි තවත් කථාවකට අද ඔබ ඇහුම්කන් දෙන්න ඇති කියලා මම හිතනවා. ඒ තමයි, අනුර දිසානායක ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතා කරපු ඒ සුවිශේෂී, ඓතිහාසික කථාව. කුඩා රටක් වුණත් අපේ රට ලෝකයේ ඉහළින්ම ඔසවා තබන්න සමත් වෙච්ච ඓතිහාසික කථාවක් තමයි අද උදේ අපට අහන්න, දකින්න ලැබුණේ. යුද්ධය වෙනුවට සාමය ඇති කර, ලෝකයෙන් දරිද්‍රතාව තුරන් කර ගැනීම සඳහා වෙච්ච ස්ථිරසාර අධිෂ්ඨානය කෙරෙහි ලෝකයේ අවධානය යොමු කිරීම යන කරුණු කාරණා එතුමාගේ කථාව තුළ අන්තර්ගත වුණා. අපට තනිව ගමනක් නැහැ. අපට තිබෙන්නේ සාමූහික ගමනක්. අපි ඔක්කොම එකතු වෙලා අන්න ඒ ගමන යමු කියන පණිවුඩය දුන් අවස්ථාව තමයි අද උදේම අපට අහන්න ලැබුණේ. ඒ නිසා ගෙවෙන හැම දවසක්, මොහොතක් පාසාම අපේ රට පිළිබඳවත්, අපේ රටේ අනාගතය පිළිබඳවත් බලාපොරොත්තු තබාගන්න පුළුවන් වන විධියේ කරුණු කාරණා තමයි අපට අහන්න දකින්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කොහොමද? ඒ

නිකම්ම නිකම් වචනවලින් හැඟීම් ප්‍රකාශ කර ගැනීමකින් විතරක්ම නොවෙයි. වචනවලින් විතරක් විශ්වාසය ගොඩනහන්න බැහැ. වචනවලින් විතරක් අනාගතය පිළිබඳව විශ්වාසය හදාගන්න බැහැ. ඒකට භාවිතාව ඉතාම -අතිශය- වැදගත්. ඒ නිසා මේ ගෙවුණු අවුරුද්දක ඉතිහාසය ඇතුළත රජයක් ලෙස අපට පුළුවන්කම ලැබී තිබෙනවා, බිඳ වැටිච්ච රටක් ක්‍රමානුකූලව ශක්තිමත්ව, ස්ථාවරව ගොඩ නඟන්න.

ඒ විතරක් නොවෙයි. නීතියේ විධානය හා ආධිපත්‍යය තහවුරු කිරීම තුළින් මේ රට ඉස්සරහට අරගෙන යන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. තරාතිරම නොබලා හැමෝටම එක විධියට නීතිය ක්‍රියාත්මක වන රටක් නිර්මාණය කරගන්නත් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ඉඳලා පහත් බිම් ගොඩකිරීමේ මණ්ඩලයේ රියදුරු දක්වා හැමෝටම එක විධියට නීතිය ක්‍රියාත්මක වන රටක්, නීතියේ ආධිපත්‍යය තහවුරු කරපු රටක් මේ ගෙවුණු කාලය ඇතුළත ගොඩනහන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ අනුව නව දේශපාලන සංස්කෘතියක් ආරම්භ කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය අමතා ජනාධිපතිතුමා කරපු කථාවේත් මේ කාරණය තිබුණා. මහජන නියෝජිතයා කියන්නේ ජනතාව වෙනුවෙන් සේවය කරන කෙනෙක් මිස ජනතාවගේ බදු මුදල් අනිසි ලෙස පාවිච්චි කරන, වරප්‍රසාදයක් ලෙස පාවිච්චි කරන කෙනෙක් නොවෙයි කියන එක ජනාධිපතිතුමාට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සභාව අමතා පවා කියන්න පුළුවන්කම ලැබුණා. මොකද, ඒ ආදර්ශය අද අපේ රටෙන් දෙන්න පුළුවන්කම ලැබිලා තිබෙන නිසා.

ඒ විතරක් නොවෙයි. සංවිධානාත්මක අපරාධ මර්දනය, විෂ මත්ද්‍රව්‍ය ඇතුළු සියලුම ආකාරයේ මත්ද්‍රව්‍ය මේ රටින් මුලිනුපුටා දැමීමට කටයුතු කරන ආකාරය පිළිබඳව අපට බලාපොරොත්තු දල්වාගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම අපට ගෙවුණු අවුරුද්ද ගැන මහත් අභිමානයකින් යුතුව කථා කරන්න පුළුවන්කම තිබෙනවා. ඉතාම සුබවාදීව, බලාපොරොත්තු සහගතව අනාගතය දිහා බලන්න පුළුවන් වන විධියට අපි මේ රට පැති ගණනාවකින් ඉස්සරහට අරගෙන ඇවිත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා. 2025 වසරේ දෙවැනි කාර්තුවේදී සියයට 4.9ක් දක්වා ලංකාවේ ආර්ථික වර්ධන වේගයේ ධනාත්මක වර්ධනයක් අත්පත් කරගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. 2024 වසරේ දෙවැනි කාර්තුවේදී ඍණ සියයට 4.1ක් බවට පත්ව තිබුණු ආර්ථික වර්ධන වේගය තමයි අපට මේ අවුරුද්දේ ධන සියයට 4.9ක් දක්වා වර්ධනය කරගන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ. 2024 වසරේ ජනවාරි සිට ජූලි මස දක්වා රජයේ ආදායම රුපියල් බිලියන 2,156යි. 2025 වසරේ ජනවාරි මාසයේ සිට ජූලි මාසය දක්වා එය රුපියල් බිලියන 2,729ක් දක්වා වැඩිකරගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ අනුව ගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 573ක වැඩිවීමක් මේ කාලය ඇතුළත අපි අත්පත් කරගෙන තිබෙනවා.

අද ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව ඔවුන්ගේ ආදායම් ඉලක්ක ඉක්මවා ගොස් තිබෙනවා. 2025 වසරේ මුල් මාස අට තුළ විතරක් අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 11,600ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒක කලින් වසරේ මේ කාලයට සාපේක්ෂව සියයට 7.79ක වර්ධනයක්. මේ මොහොත වෙනකොට ලක්ෂ 16කට වඩා වැඩි සංචාරකයින් පිරිසක් අපේ රටට ඇවිත් තිබෙනවා. අපි මේ වසරේ සංචාරකයින් ලක්ෂ 30ක් ගෙන්වන්න බලාපොරොත්තුවෙන් කටයුතු කරන අතර, මේ මොහොත වෙනකොට අපට ලක්ෂ 16කට වැඩි සංචාරකයින් පිරිසක් ගෙන්වා ගන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපේ ඉලක්කය වන්නේ, සංචාරක ඉපැයීම් ඩොලර් බිලියන හතරක් දක්වා වැඩි කර ගැනීමයි. මේ මොහොත වෙනකොට ඩොලර් බිලියන 2.3කට වඩා වැඩි ආදායමක් සංචාරක ඉපැයීම් හරහා උත්පාදනය කරගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඊළඟට විදේශ ප්‍රේෂණ පැත්තෙන් බැලුවොත්, 2024 වසරේ මුල් මාස හත තුළ ඩොලර් බිලියන 3.7ක ආදායමක් උපයා තිබෙනවා. 2025 වසරේ අගෝස්තු මාසය වෙනකොට විදේශ ප්‍රේෂණවලින් ඩොලර් බිලියන 5.1කට වඩා වැඩි ආදායමක් අපේ රටට උපයා ගන්න සමත් වෙලා තිබෙනවා. 2024 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ඩොලර් මිලියන 307කුත්, 2025 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා ඩොලර් මිලියන 783කුත් ඍජු විදේශ ආයෝජන විධියට අපේ රටට ලැබිලා තිබෙනවා. ඒක සියයට 126ක වර්ධනයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ විදේශ සංචිත ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. අද අපේ විදේශ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන හය දක්වා වර්ධනය වෙලා තිබෙනවා. වර්ෂයක් ගෙවෙනකොට පොලී අනුපාත තනි ඉලක්කමකට, තනි අගයකට ගේන්නත් මේ රජයට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අද පොලී අනුපාතය සියයට 7.45ක අගයක් වෙනවා.

ඒ විතරක් නොවෙයි. පසුගිය වසර පුරාම ඩොලරය රුපියල් 300ක අගයකට ආසන්නව තබා ගන්න -රුපියල් 300ක සීමාවේ රඳවා ගන්න- මේ ආණ්ඩුවට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අර්බුදයට පත් වෙච්ච රටක්, එහෙම නැත්නම් ආර්ථිකයක් භාරගෙන වසරක් යනකොට අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා. අනාගත බලාපොරොත්තු වැඩි කර ගන්න පුළුවන් වන විධියට රටේ ආර්ථික දත්ත සුබදායී කරගෙන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කලින් කිව්වා වාගේ අපට අනාගතය දිහා බලන්න පුළුවන්කම තිබෙන්නේ වචනවලින්ම විතරක් නොවෙයි. ඒකට ශක්තිමත් ආර්ථික පදනමක් අවශ්‍යයි. අපි වසරක් ගතවනකොට ඒ ශක්තිමත් ආර්ථික පදනම මේ රටේ ගොඩනහලා තිබෙනවා. ඒ විශ්වාසය ගොඩනහන්න දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍යයි. ඉතිහාසයක් පුරා ඒ දේශපාලන ආදර්ශය දීපු, දේශපාලනයේ අලුත් වෙනස්කම් කරපු, නව දේශපාලන සංස්කෘතියක් ගොඩනහපු දේශපාලන ව්‍යාපාරයක් විධියට ඒ විශ්වාසය අපි ගොඩනහා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. සජිත් ප්‍රේමදාස මහත්මයා ඇහුවා, 2028දී මේ රටේ ණය ගෙවන්නේ කොහොමද කියලා. 2028දී ණය ගෙවන විධියට රට ගොඩනහන ක්‍රියාදාමය තමයි අපි වසරක් ඇතුළත මේ ආරම්භ කරලා තිබෙන්නේ. ඒ අනුව තමයි මේ රට ගත් ණය 2028දී ගෙවන්න පුළුවන් ශක්‍යතාව අපි ලබා ගනිමින් තිබෙන්නේ කියන කාරණයත් මේ අවස්ථාවේ මම මතක් කරනවා. මේ රටේ ජනතාවත් එක්ක එකතුවෙලා මේ රටේ අනාගතය ගොඩනහන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය ශක්තිය, ධෛර්යය අපට අනිවාර්යයෙන්ම තිබෙනවා කියන කාරණයත් ප්‍රකාශ කරමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම මෙතැනින් අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Namal Rajapaksa. You have eight minutes.

[අ.භා. 1.36]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ හැම දෙයක්ම ඉලක්ක පන්නලා කියලා. ඔව්, ඉලක්ක කෙසේ වෙතත් කන්ටේනර් නම් පන්නලා තිබෙනවා. තවම තිබෙන තැනක් හොයා ගන්නත් නැහැ. *[බාධා කිරීම්]* මොකක්ද? පන්නපු කෙනා හොයා ගත්තාම තිබෙන තැන හොයා ගන්න පුළුවන්. *[බාධා කිරීම්]* ඔව්, ඔව්. දැන් අපි තමයි වරායෙන් කන්ටේනර් පන්නන්නේ. මේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව, ඔබතුමන්ලාගේ ඇමති, ඔබතුමන්ලාගේ ජනාධිපති, ඔබතුමන්ලාගේ අගමැති. හැබැයි, අපි කන්ටේනර් පන්නනවා කියලායි කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින්, මේ ආණ්ඩුවෙන් වැඩක් තිබෙනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ කයිවාරු ගහපු ආණ්ඩු අතරින් වැඩිපුරම බොරු කියලා ජනතාව මුළාවට පත් කරපු ආණ්ඩුව බවට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව, කයිවාරු ආණ්ඩුවක් විතරක් නොවෙයි, කුඩු ආණ්ඩුවක් බවටත් පත් වේගෙන යනවා.

දැන් මොකක්ද කරන්නේ? තමන්ගේ වැරද්ද වහගන්න වෙන කෙනෙකුගේ පිට ඒ වැරද්ද පටවනවා. ඒක, පික්පොකට් න්‍යාය. පික්පොකට්කාරයා පික්පොකට් ගහලා පාරේ දුවනවා, "මෙන්න හොරෙක්" කියලා. අනේ ඉතින් බොහෝ පිරිස ඒ පසුපස දුවනවා. ඒ වාගේ ඔබතුමන්ලාත් මොකක්ද කරන්නේ? එක කාලයක් පික්පොකට් න්‍යාය, ඊට පස්සේ හොරා කියන්න පටන් ගත්තා. හැබැයි, මොකක්ද වුණේ? කාලයක් ගත වුණා. තමුන්නාන්සේලා දූෂණ මර්දන කමිටුවේ වාඩිවුණා. දූෂණ මර්දන කමිටුවේ අවුරුදු 5ක් හිටියා. දැන් ආණ්ඩුවක් අරගෙන ඉන්නවා. දැන් ජනාධිපතිවරයෙක් ඉන්නවා, අගමැතිවරියක් ඉන්නවා. රොකට් එකක් ගියා, ඒක වැටුණා, පැලවත්තට. දැන් කුඩු අල්ලනවා කියනවා. අල්ලන්න. අල්ලනවා විතරක් නොවෙයි, ඒවා පිටුපස ඉන්න අය ගැනත් හෙළි කරන්න. තමන්ගේ ආණ්ඩුවට මුවාවෙලා, රාජ්‍ය රැකවරණය ලබන මිනිස්සු ආරක්ෂා කරන්න ලැහැස්ති වෙන්න එපා. ආණ්ඩුවේ ආරක්ෂාව පතාගෙන කටයුතු කරන අයව ආරක්ෂා කරන්න ලැහැස්ති වෙන්න එපා. ඔබතුමන්ලා අද අපට ඇඟිල්ල දිගු කරයි. හැබැයි, ඔබතුමන්ලාගේ පැත්තට ඇඟිලි හතරක් දිගු වෙලා තිබෙනවා කියලා මතක තබාගන්න.

දැන් ජාත්‍යන්තර බුද්ධි අංශවලින් වාර්තා ලැබෙනවා. United Nations Office on Drugs and Crime - UNODC එකෙන් වාර්තා ලැබෙනවා. ඒ අය මොකක්ද කියන්නේ? ටෙහෙරාන්වලින් ආපු කන්ටේනර් දෙකක් වරායේ තිබෙනවා, ඒවායේ මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා තොරතුරක් ලැබිලා තිබෙන බව කියනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? Narcotics Control Unit එකත් එනවා. මම නොවෙයි මෙහෙම කියන්නේ. Sri Lanka Customs එකේ ප්‍රධානියා තමයි මේ කථාව කියන්නේ. Sri Lanka Customs' Narcotics Control Unit එක ගිහිල්ලා ඒ කන්ටේනර් check කරනවා. එහෙම check කරලා එළියට යැවූ කන්ටේනර් දෙකේත් මත්ද්‍රව්‍ය තිබෙනවා ලු. එතකොට check නොකර එළියට යැවූ කන්ටේනර් 332 මොනවාද තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, check නොකර එළියට යැවූ කන්ටේනර් 332 ගැන කථා කරපු අර්ච්චුනා මන්ත්‍රීතුමාව CID එකට ගෙනිච්චා. හැබැයි check කරලා, පසුකාලීනව මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා හොයා ගත් ඒවාට තමුන්නාන්සේලා ගත් පියවර මොකක්ද? *[බාධා කිරීම්]* හරි, හරි ඔහොම ඉන්න, පිටිපස්ස බලාගෙන ඉන්න. මොකද, පිටිපස්සෙන්ම තමයි යන්න වෙන්නේ. බලාගෙන ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා හිතාගෙන ඉන්නවා, මෙතුමන්ලාගේ අර පරණ ක්‍රමයටම මේ රටේ දේශපාලනය කරන්න පුළුවන් කියලා. ඒ කාලය ඉවරයි. ඒක දැන්වත් තමුන්නාන්සේලා තේරුම් ගන්න. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුව තියාගෙන, වරායෙන් පන්නන කන්ටේනර්වලට අපිට බණිනවා. මෙතුමන්ලාගේ වරාය නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම නම්, බුද්ධි අංශ වාර්තාවක් ඇවිල්ලා තිබෙද්දී ඇයි මේ කන්ටේනර් ටික අත්අඩංගුවට ගත්තේ නැත්තේ? මතක තබා ගන්න, ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා පිටුපස පේළිවල වාඩි වෙලා ඉන්න පාපිසි කෑලි. *[බාධා කිරීමක්]* හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉහළ තනතුරුවලට පත් කරපු අය ඉන්නවා, පාස්කු ඉරිදා ප්‍රහාරයේ බුද්ධි අංශ වාර්තා මහ හැරපු, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අය තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ බලවත් පුද්ගලයන් විධියට ඉහළ පුටුවල වාඩි වෙලා ඉන්නේ. ඒ අය අදත් මොකක්ද කරන්නේ? ඒ අය අදත් බුද්ධි අංශ වාර්තා මහ හරිනවා. බුද්ධි අංශ වාර්තා අනුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඇයි, ඒ? ඒ ගැන ඔබතුමන්ලා හොයන්න. ඒ ගැන ඔබතුමන්ලා හොයන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් මේ දේවල් ගැන ඔබතුමන්ලා කථා කරන නිසා මම මේ කාරණයත් කියන්න කැමතියි. දේශපාලනික වශයෙන් පසුගිය ආණ්ඩු එක්ක ඔබතුමන්ලාට ප්‍රශ්න තිබෙන්න ඇති. හැබැයි, "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක කළ කාලයේ මේ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්න පටන් ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව, 2023.12.17වැනි දා ඉඳලා මාස 8ක්; දවස් 236ක් ඇතුළත - ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වෙන්න මාස 8කට කලින්- හෙරොයින් සහ අයිස් අත්අඩංගුවට ගත්තා. මේ, ගොඩබිමේදී අත්අඩංගුවට ගත් ඒවා, මුහුදේදී නොවෙයි. ගොඩබිමේදී හෙරොයින් කිලෝග්‍රෑම් 423ක් සහ අයිස් කිලෝග්‍රෑම් 449ක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. මම කිව්වේ ගොඩබිමෙන් අත්අඩංගුවට ගත් ඒවා. *[බාධා කිරීමක්]* මුහුදේදී අත්අඩංගුවට ගත් ඒවා ගැනත් මම කියන්නම්. 2020 සිට 2024 දක්වා කාලය තුළ අත්අඩංගුවට ගත් හෙරොයින් සහ අයිස් ප්‍රමාණය සඳහන් ලේඛනය සහ "යුක්තිය" මෙහෙයුම ආරම්භ කළ දින සිට මේ දක්වා මත්ද්‍රව්‍ය වැටලීම්වල ප්‍රගතිය සඳහන් ලේඛනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2020 අවුරුද්දේදී නාවික හමුදාව විසින් මහ මුහුදේදී හෙරොයින් සහ අයිස් කිලෝග්‍රෑම් 1,500ක්, 2021දී කිලෝග්‍රෑම් 1,400 ගණනක්, 2022දී කිලෝග්‍රෑම් 1,490ක්, 2023දී කිලෝග්‍රෑම් 720ක් සහ 2024දී කිලෝග්‍රෑම් 900කට ආසන්න ප්‍රමාණයක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුව තිබෙන්නේ, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාල සීමාව තුළ නාවික හමුදාව ශක්තිමත් කරලා මහ මුහුදේදී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්න ඔබතුමන්ලා ගත් ක්‍රියාමාර්ග පිළිබඳවත් මේ රටේ ජනතාව දැනුවත් කරන්න.

පසුගිය දවස්වල දර්ශන සංජීව "ඩේලි මිරර්" පුවත් පතට වාර්තාවක් ලියනවා, "Sri Lanka Navy Struggles to meet modern maritime standards" කියලා. ඒ පුවත් පත් වාර්තාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මෙකේ පැහැදිලිවම සඳහන් වනවා, අපේ රටේ නාවික හමුදාව outdated කියලා. තාක්ෂණය - technology - upgrade කරන්න

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඕනෑ. ඒ වාගේම ඔබතුමන්ලා එකඟ වෙලා තිබෙනවා, 2030 වනකොට නාවික හමුදාව 40,000කට අඩු කරන්න. හැබැයි, ඒක ප්‍රායෝගික නැහැ, තාක්ෂණයත් එක්ක මේක බද්ධ වෙන්නේ නැත්නම්. ඒ එක්කම ඔබතුමන්ලා මොකක්ද කළේ? හිටපු නාවික හමුදාපතිවරයා හිරේ දැම්මා. අනෙක් පැත්තෙන් බුද්ධි අංශ නිලධාරින්ව හිරේ දමනවා. එහෙම කරලා ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා, නාවික හමුදාව මේ රටේ මුහුද ආරක්ෂා කරන්න පුළුවන් විධියට කටයුතු කරයි කියලා. ඒ අයට අවශ්‍ය තාක්ෂණික දැනුම දෙන්නේත් නැත්නම්, ඒ අයට අවශ්‍ය මිනිස් ශ්‍රමය දෙන්නේත් නැත්නම්, එතැනින් එහාට මහ මුහුද ආරක්ෂා කිරීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා කරුණාකරලා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. මේක නිකම් දේශපාලන වේදිකාවේ ප්‍රධාන මාතෘකාවක් කරලා අපට ඇඟිල්ල දිගු කරනවා. ඔබතුමන්ලා පාස්කු ඉරිදා ප්‍රහාරයටත් ඕකම නේ කළේ. පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ අය අතරේ ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තු අපේක්ෂකයෙකුගේ දරුවෝ දෙදෙනෙකු නේ හිටියේ. අන්තිමට ඔබතුමන්ලා මොකක්ද කළේ? ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ අපේක්ෂකයාගේ දරුවන් දෙදෙනා ගෝඨාභය දිනවන්න මරාගෙන මැරිලාය කියනවා. ඒ, ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ කෙනෙක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, you have two more minutes.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒකේ ප්‍රධාන වගකීම් පැහැර හැරපු එක කණ්ඩායමකට දඬුවම් ලැබුණා. මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයාට වන්දි ගෙවන්න සිද්ධ වුණා. හිටපු ආරක්ෂක ලේකම්, හිටපු පොලිස්පතිවරයා හිරේ ගියා. හැබැයි, හිරේ නොගිය, වගකීම් පැහැර හැරපු දෙදෙනාට මොකක්ද කළේ? වගකීම් පැහැර හැරපු දෙදෙනා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රධාන තනතුරුවලට පත් කළා, දේශපාලන වේදිකාවෙන් ගෙනැල්ලා. ඒ අයම තමයි අදත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු ලැබෙනකොට ඒවාට ක්‍රියාත්මක නොවන්නේ. පොලීසිය භාර ඇමතිවරයා විධියට ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න ඕනෑ.

Sri Lanka Customs' Narcotics Control Unit එක මේ කන්ටේනර් දෙක check කරලා යැව්වාය කියනවා. ඒ පිළිබඳව රජයේ ස්ථාවරය මොකක්ද? Check කරලා යැව්වා නම්, ඒවා check කරනකොට මේවායේ මත්ද්‍රව්‍ය තිබුණා කියලා ඔබතුමන්ලාට දැනගන්න ලැබුණේ නැද්ද? එහෙම දැන ගත්තා නම් කවුද මේ කන්ටේනර් දෙක එළියට දමන්න අවසර දුන්නේ? කන්ටේනර් 332 නම් එළියට දමපු එක පිළිබඳව වරාය භාර නියෝජ්‍ය ඇමතිවරයා වගකීම භාර ගත්තා. පොලීසියෙන් එතුමාගෙන් කට උත්තරයක්වත් ලියාගෙන නැහැ, ඇයි මේ කන්ටේනර් එළියට දැම්මේ කියලා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා පත් කළ කමිටු වාර්තාවේ පැහැදිලිවම සඳහන් වනවා, මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ පරීක්ෂණය ආරම්භ කළේත් නැහැ. පරීක්ෂණයක් කරන්න තියා අඩු ගාණේ ඒ වාර්තාව සම්පූර්ණයෙන් සභාගත කරලාත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කන්ටේනර් 332 තිබෙන තැන දන්නවා කියලා නියෝජ්‍ය ඇමතිවරයා කියනවා. දැන් ගිහිල්ලා අල්ලා ගන්න පුළුවන්. ඊළඟට, අර කන්ටේනර් දෙක සම්බන්ධයෙන් ඔබතුමන්ලා ක්‍රියාත්මක වුණේ කොහොමද? ඔබතුමන්ලාම කියනවා, තංගල්ලෙන් තව මත්ද්‍රව්‍ය අහු වුණා කියලා. පොලීසිය බුද්ධි අංශයක් නොවෙයි නේ. ඉස්පිරිතාලයට ගිහිල්ලා admit වෙච්ච කෙනෙකුගේ කට උත්තරයක් පදනම් කරගෙන ගිහිල්ලා නේ, ඒ raid එක කළේ.

නිකම් හරි ඒක බුද්ධි අංශ වාර්තාවකින් ආවා නම් ඒකත් යට ගහනවා. ඒ හින්දා, ඔබතුමන්ලා අපි එක්ක තිබෙන ඇරියස් එක වෙනම බේරා ගන්න. හැබැයි, අපි එක්ක තිබෙන ප්‍රශ්නයකට මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහ සංවිධානාත්මක අපරාධකරුවන්ට නිදහසේ හැසිරෙන්න ඉඩ දෙන්න එපා. මතක තියා ගන්න, ඔබතුමන්ලා අපට චෝදනා කරනකොට මේවායේ පිටුපස ඉන්න සැබෑ ත්‍රස්තවාදීන්, සැබෑ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඒවා අපේ පිට දාලා ඔවුන් ඒවායින් නිදහස් වෙන්න උත්සාහ කරන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන විනාඩිය මම ගන්නේ කාරණා දෙකක් මතක් කරන්නයි. ආනන්ද විජේපාල ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා පසුගිය කාලයේ හොඳ වැඩක් කළා. අතිගරු ජනාධිපතිතුමා පොලීසියේ අවුරුදු 10ක සේවා කාලයක් තිබුණු අයට උසස්වීම් ටික දුන්නා. ගරු ඇමතිතුමනි, හැබැයි ඒ අවස්ථාව STF එකට හම්බ වෙලා නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලනවා. මොකද, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අල්ලන්න, සංවිධානාත්මක අපරාධ මැඬලන්න මේ රටේ ඉදිරියට එන්නේ STF එකෙන්. ඒ හින්දා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඉදිරි කාල සීමාව තුළදී උතුරු පළාතට වර්ෂාපතනය පටන් ගන්නවා. ඒ හරහා දරුවන්ට විභාග ලිවීමේ ගැටලුවක් එනවා. පසුගිය කාලයේදීත් අපි මේ ගැන කථා කළා. හැබැයි, වැස්ස වැහැලා ගංවතුර ගැලුවාට පස්සේ තමයි ළමයි පන්තිවලට එක්කගෙන යන්න කටයුතු කරන්නේ. අපි monsoon එන බව දන්නවා. සාමාන්‍යයෙන් මේ කාලයේ උතුරට ඉතා අධික වර්ෂාවක් පතනය වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු අග්‍රාමාත්‍යතුමිය මේ අවස්ථාවේදී සභාවේ නැතත් ඒ ගැන දැන්ම අවධානය යොමු කරලා, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග ලියන දරුවන්ට ඒ විභාග ලියන්න අවස්ථාව හදලා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිවිටෙකත් හමුදා නිලධාරින් හෝ වෙනත් කිසිවෙක් පොලීසිය මඟින් අත්අඩංගුවට අරගෙන නැහැ. යම් අත්අඩංගුවට ගැනීමක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒ සියලු අත්අඩංගුවට ගැනීම් සිද්ධ වෙලා තිබෙන්නේ අධිකරණ නියෝග අනුව. ඒ හින්දා මම හිතන විධියට, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියපු එක ඇත්ත කථාවක් නොවෙයි, ඒක බොරු කථාවක්. හිටපු නාවික හමුදාපති බුද්ධි අංශයේ ඉන්නකොට කළ යම් ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් අනුව තමයි අත්අඩංගුවට පත් වුණේ.

හැම අවස්ථාවකදීම කන්ටේනර් සම්බන්ධයෙන් ලැබෙන හැම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම CID එක විමර්ශන සිද්ධ කරනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ඒ වාගේම මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් රජයට ඇඟිල්ල දිගු කරන්න උත්සාහ කළා. දැන් කවුරුත් දන්නවා, පොහොට්ටුවේ සම්පත් මනම්පේරි මන්ත්‍රීවරයා මේකට සම්බන්ධයි කියන එක. ඔහු දැන් අත්අඩංගුවේ ඉන්නේ. ඔහු හිටපු ඇමති ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ සම්බන්ධීකරණ ලේකම්වරයා. මත්ද්‍රව්‍යවලට සම්බන්ධතා තිබෙන අය ඕනෑ තරම් පොහොට්ටුවේ ඉන්නවා. ඒ අය අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඊට ඉහළ අය සම්බන්ධයෙනුත් විමර්ශන සිද්ධ වෙමින් පවතිනවා. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. ඒ හින්දා,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* ඔබතුමා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* අහගෙන ඉන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Namal Rajapaksa, let the Minister finish.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
පොඩ්ඩක් ඉන්න මම කථා කරනකම්. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කට්ටිය එළවලා දැම්මෙත් ඒ හින්දා. මේ රටේ මහ ජනතාව දන්නවා, මේ රටට කුඩු ගේන්නේ කවුද කියලා. හැම දෙයක් ගැනම විමර්ශන සිද්ධ වෙමින් පවතිනවා. අපි කියන්නේ, සම්පත් මනම්පේරි පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරයෙක් කියන එකයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
නැහැ, මන්ත්‍රීවරයෙක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
පොහොට්ටුවේ සංවිධායක. *[බාධා කිරීම්]* ජොන්ස්ටන් හිටපු ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා. *[බාධා කිරීම්]* ඒ අය කුඩු ගෙනැල්ලා තමන්ගේ ඇඟට එන ඒවා අනෙක් අයට දාන්න තමයි මේ උත්සාහ කරමින් ඉන්නේ. ඒ හින්දා මේවාට මේ රටේ ජනතාව කවුරුවත් රැවටෙන්නේ නැහැ. කවුරුත් දන්නවා, දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලන ආශීර්වාදය සහිතව පාතාලය පෝෂණය කරලා, පාතාලය පවත්වාගෙන ගිහිල්ලා, ඒක වර්ධනය කරලා, කුඩුත් ගෙනැල්ලා, මේ දෙක තුනම සම්බන්ධ කරලා, රටම විනාශ කරලා, රට ව්‍යසනයකට පත් කරලා, දරුවන්ගේ අනාගතය විනාශ කළේ කවුද කියලා. *[බාධා කිරීම්]* එහෙම තත්ත්වයක් ඇති කරලා රටේ මිනිස්සු පන්නා දැම්මාට පස්සේ පාර්ලිමේන්තු ඇවිල්ලා විපක්ෂයේ කාර්යභාරය ගැන මේ සභාවේ කථා කරනවා. විනාඩි 10ක්, 15ක් කථා කරලා දුවනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We are not going to have a debate on this. Hon. Namal Rajapaksa, you can have your time. You can have a minute.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Thank you, Hon. Deputy Speaker. දැන් ඔබතුමාගේ කාරණය පිළිබඳව පැහැදිලියි. *[බාධා කිරීමක්]* අනේ, ඇමතිතුමා කරුණාකරලා දැන් කෑ ගහන්නේ නැතුව අහගන්නකෝ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගන්නකෝ. ඔබතුමන්ලා පරීක්ෂණ කටයුතු කරන්න. *[බාධා කිරීමක්]* ඔව්, සම්පත් මනම්පේරි ඡන්දය ඉල්ලුවා. ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ හිටපු කෙනා ගැන හැංගුවා වාගේ අපි ඒක හංගන්නේ නැහැ. පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ වුණු කෙනා ජාතික ලැයිස්තුවේ හිටියා කියලා හැංගුවා වාගේ අපි හංගන්නේ නැහැ නේ. ඔබතුමන්ලා ඒ ගැන හොයන්න. ඒ වාගේම ඔහු මේකට සම්බන්ධයි නම් ඔහුට උපරිම දඬුවම දෙන්න. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මට ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් ඕනෑ, UNODC එකෙන් ආපු බුද්ධි අංශ වාර්තාවට ක්‍රියාත්මක නොවුයේ ඇයි කියලා. ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නකෝ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, we are not going for a debate on this. Please!

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ලැබුණු තොරතුරු අනුව Narcotics Control Unit එක ගිහිල්ලා ඒක පරීක්ෂා කළා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will call upon the next speaker.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒ සම්බන්ධයෙන් තමයි නැවත විමර්ශනයක් කරන්නේ. ඒක තමයි විමර්ශනය කරනවා කියලා අපි කියන්නේ. *[බාධා කිරීමක්]* ඒක තමයි, යම් සිද්ධියක් වුණාම විමර්ශනය කරන්නේ. ඔබතුමන්ලා වාගේ, සිද්ධියක් වුණාම ගිහිල්ලා කුඩු ලාන්සාව බදාගෙන- *[බාධා කිරීමක්]* අපි එහෙම කළේ නැහැ. අපි කළේ ඒක නොවෙයි. අපි කළේ ඒ පිළිබඳව විමර්ශනය කරන එක. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, I will call upon the next speaker.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
වැරැද්දක් වුණොත්, ඒ වැරැද්ද වෙනුවෙන් කටයුතු කරන්න අපි සූදානම්. එහෙම නැතුව එක එක්කෙනාගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න අපි සූදානම් නැහැ. නාමල් මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා වාගේ දේශපාලන පළිගැනීම් කරන්න අපි කටයුතු කරන්නේ නැහැ. අපි හැම වෙලාවේම මේ රටේ නීතියේ ආධිපත්‍යය තමයි හදන්නේ. මේ රටට යුක්තිය ගේන්න තමයි අපි කටයුතු කරන්නේ. *[බාධා කිරීමක්]* එහෙම නැතුව ඔබතුමන්ලා කියන කියන විධියට වැඩ කරන්න අපි සූදානම් නැහැ. මේ රටේ පොලීසියක් ඉන්නවා, බුද්ධි අංශයක් තිබෙනවා, බුද්ධි තොරතුරු තිබෙනවා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, we are not going for a debate on this. -*[Interruption]* We will get on with the next speaker. -*[Interruption]* Can we please get on with the Debate in hand?

The next speaker is Hon. Muhammad Faizal. You have ten minutes. Take it or leave it, please.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, can we now listen to this Hon. Member, please?

[පි.ව. 1.50]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

அஸ்ஸலாமு அலைக்கும்! ஆயුබෝවන්! வணக்கம்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இப்பொழுது எதிர்க்கட்சிப் பக்கம் அதிக coolஆக இருக்குமென்று நான் நினைக்கின்றேன். විපක්ෂය පැත්ත වැඩිපුර කූල් වෙලා වාගේ තිබෙනවා. මම හිතන විධියට, මේ හරියේ අයිස් වැඩිවෙලා ඇති. ඒ වාගේ තමයි පෙනෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Archchuna, let the Hon. Member complete his speech, please.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
හැබැයි, මෙතැන ආණ්ඩුව කරගෙන ඉන්නේ ඔක්කෝම දිනපු අය. ඔක්කෝම දිනපු අය තමයි ආණ්ඩුව කරගෙන ඉන්නේ. ගොඩක් කල් ආණ්ඩු කරපු අය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු ඡන්දයේදීත් පැරදිලා, ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා විපක්ෂය පැත්තේ ඉඳගෙන මෙතැන කෑ ගහනවා, සාමකාමීව රට හදන අපේ අයට. පුළුවන්ද, එහෙම කරන්න? *[බාධා කිරීමක්]* මම දැන් මගේ කථාව පටන් ගන්නවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let the Hon. Member finish. Otherwise, if we go into a debate in between, we will be wasting a lot of time.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, ஒரு நாட்டின் பொருளாதார வளர்ச்சிக்கு ஏற்றுமதியும் இறக்குமதியும் முக்கியமான - *[இடையீடு]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. -[*Interruption*]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Yes, Hon. Member, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, කරුණාකරලා කියන්න, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්නේ Standing Ordersවලට අනුවද, නැත්නම් පක්ෂයට අදාළවද? ඒ කොයි ආකාරයෙන්ද කියලා මට කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister had to reply to the question raised by Hon. Namal Rajapaksa. That is not a point of Order, Hon. Member. Let us get along with the Hon. Muhammad Faizal's speech.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
ஒரு நாட்டின் பொருளாதார வளர்ச்சிக்கு ஏற்றுமதியும் இறக்குமதியும் முக்கிய காரணிகளாக இருக்கின்றன. இந்த நாட்டின் ஏற்றுமதியில் - *[இடையீடு]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member on my right, can we maintain order, please?

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
இந்த நாட்டின் ஏற்றுமதித்துறையில் முக்கிய இடம் வகிக்கின்ற தைத்த ஆடையாக இருக்கலாம், இறப்பராக இருக்கலாம், தேயிலையாக இருக்கலாம், தென்னையாக இருக்கலாம், இவை அனைத்தும் பொருளாதார வளர்ச்சிக்குப் பங்களிப்புச் செய்யக் கூடியவை. எனினும், இவை அனைத்தையும் சென்ற அரசாங்கங்கள் நாசமாக்கி விட்டன.

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

உதாரணத்துக்கு, வடமேல் மாகாணத்திலுள்ள குருநாகலில் தெங்கு உற்பத்தி அதிகமாக இடம்பெற்றாலும், புத்தளம் மாவட்டத்தில் உற்பத்தி செய்யப்படுகின்ற தேங்காயே ஏற்றுமதிக்கு அதிகமாகப் பயன்படுத்தப்படுகின்றது. புத்தளம் மாவட்டத்தில் புத்தளம் தொகுதியை அண்டிய எல்லாப் பிரதேசங்களிலும் அதிகமான தென்னந்தோட்டங்கள் இருக்கின்றன. கடந்த அரசாங்க காலத்தில் பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தவர்களுக்கு posters அடித்துக் கொடுத்தவர்களுக்கும், அவர்களுக்கு வாகன வசதிகளைச் செய்து கொடுத்தவர்களுக்கும் குறித்த தென்னந்தோட் டங்களைக் குறைந்த தொகைக்குக் குத்தகைக்குக் கொடுத்து, அவற்றை நாசமாக்கியுள்ளதுடன், உற்பத்தியும் குறைவடைந்து இருக்கிறது. அவற்றை வாடகைக்கு எடுத்திருப்பவர்கள் தென்னை மரங்களுக்குப் பசளையிடுவதும் இல்லை; உற்பத்தியை அதிகரிப்பதற்கு நடவடிக்கை எடுப்பதுமில்லை. இதனால்தான் இன்று தேங்காய் விலை அதிகமாக இருக்கின்றது. தென்னை உற்பத்தியை 500,000 ஏக்கர்களுக்கு அதிகமான நிலத்தில் செய்வதற்கான ஏற்பாடுகளை எமது அரசாங்கம் செய்துள்ளது.

இந்த நாட்டு மக்களுக்கு எமது அரசாங்கம் வரவும் செலவும் சமமாக இருக்கின்ற வகையிலான வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்திருக்கின்றது. சென்ற காலங்களில் ஒவ்வோர் அரசாங்கத்தினாலும் வாசிக்கப்பட்ட வரவு செலவுத் திட்டங்களில் எல்லா நேரங்களிலும் துண்டுவிழும் நிலை காணப்பட்டுள்ளது. இன்று எமது அரசாங்கம் வரவு செலவுக் கிடையிலான இடைவெளியைக் குறைத்திருக்கின்றபடியால், அதில் துண்டுவிழாத நிலைப்பாடு காணப்படுகின்றது. அடுத்த வருடத்துக்கான வரவு செலவுத்திட்டத்தில் துண்டுவிழாமல் சிறந்ததொரு வரவு செலவுத்திட்டத்தை எமது அரசாங்கம் முன்வைக்க இருக்கின்றது.

இன்று நாட்டின் தேசிய வருமானங்கள் எந்தளவுக்கு முன்னேறியுள்ளது என்றால், 2025ஆம் ஆண்டின் முதல் 6 மாதங்களில் அது 2,321 மில்லியனாக ரூபாயாக இருக்கின்ற அதேநேரத்தில், 2024ஆம் ஆண்டில் முதல் ஆறு மாதங்களில் அது 1,864 மில்லியன் ரூபாயாகவே இருந்தது. அதேநேரம், 2025ஆம் ஆண்டின் முதல் ஏழு மாதங்களில் நாட்டின் மொத்த ஏற்றுமதி வருமானம் 9,992.53 மில்லியன் ரூபாய் அமெரிக்க டொலராக இருந்தது. 2024ஆம் ஆண்டின் இதே காலகட்டத்துடன் ஒப்பிடும்போது இது 7.79 வீத வளர்ச்சியாகவுள்ளது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த ஆண்டு சனவரி முதல் ஓகஸ்ட் 06ஆம் திகதி வரை இலங்கை சுங்கத் துறையால் சேகரிக்கப்பட்ட வருமானம் 1,271 மில்லியன் ரூபாயாகும். யூலை மாதத்தில் சேகரிக்கப்பட்ட 231 மில்லியன் ரூபாய் வருவாயால் இந்த வருமானம் மேலும் அதிகரித்துள்ளது. இது இதுவரையில் எந்தவோர் ஆண்டிலும் ஈட்டப்படாத அதிகபட்ச சுங்க வருமானமாகும். இந்த ஆண்டில் கடந்த 6 மாதங்களில் துறைமுகங்களில் இருந்துகூட ஈட்டப்பட்ட இலாபம் 24,418 மில்லியன் ரூபாய் ஆகும். கடந்த 2024ஆண்டு முழுவதும் துறைமுகச் செயற்பாடுகளிலிருந்து ஈட்டிய இலாபம் 14,691 மில்லியன் ரூபாயாகவே இருந்தது. இது முன்னைய ஆண்டைவிட 66% வளர்ச்சியாக இருக்கின்றது.

மத்திய வங்கியின் அறிக்கையின்படி, எமது நாடு இன்று அமெரிக்க டொலர் 6.2 மில்லியனைக் கையிருப்பில் வைத்திருக்கின்றது. அது மட்டுமல்லாமல், எமது அரசாங்கம் 2028இல் 15 மில்லியன் டொலர் சேகரிப்பை இலக்காகக் கொண்டுள்ளது. இதற்கான ஏற்பாடுகளாக நாம் முன்னெடுத்திருப்பது எமது நாட்டின் உள்நாட்டு உற்பத்தியை அதிகரிக்கச் செய்வதும், வெளிநாட்டிலிருந்து இங்கு முதலீடு செய்வதற்கு வரக்கூடியவர்களை அதிகப்படுத்துவதுமாகும். முன்னைய அரசாங்க காலங்களில் எமது நாட்டிலிருந்து அதிகமான முதலீட்டாளர்கள் வெளியேறிச் சென்று விட்டார்கள். எதிர்க்கட்சியினர் சென்ற தேர்தல் பிரசாரத்திற்கூட மேடைக்கு மேடை கூறினார்கள், எமது நாட்டுக்கு வெளிநாட்டு உதவி கிடைக்காது; முதலீட்டார்கள் வரமாட்டார்கள் என்று. ஆனால், இன்று எமது நாட்டுக்கு முதலீட்டார்கள் வருகை தருவதற்குப் போட்டி போட்டுக்கொண்டு இருக்கின்றார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த ஆண்டின் முதல் 7 மாதங்களில் 607 மில்லியன் அமெரிக்க டொலர் அந்நிய நேரடி முதலீடு பெறப்பட்டுள்ளது. இது கடந்த ஆண்டுகளைவிட அதிகமானதாகும்.

இன்னும் சொல்லப்போனால், எமது நாட்டில் சுற்றுலாத் துறையை மேம்படுத்துவதற்காக நாம் எடுத்துள்ள முயற்சிகளின் விளைவாக இந்த ஆண்டு செப்ரெம்பர் 17ஆம் திகதி நிலைவரப்படி 1,656,916 வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகள் இலங்கைக்கு வருகை தந்துள்ளார்கள். இந்த ஆண்டின் முதல் 8 மாதங்களில் மட்டும் சுற்றுலாத்துறை 2,290 மில்லியன் அமெரிக்க டொலர்களை வருமானமாக ஈட்டியுள்ளது. இது 2024ஆம் ஆண்டின் இதே காலகட்டத்துடன் ஒப்பிடும்போது 5.7 சதவீத வளர்ச்சியாக இருக்கிறது. இதுமட்டுமல்ல, எமது நாட்டில் இன்று வெளிநாட்டவர்களின் வருகை அதிகமாக இருக்கின்றபடியால் சுற்றுலாத் துறையை மேம்படுத்துவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன.

புத்தளம் மாவட்டத்தின் கற்பிட்டி பிரதேசம் என்பது ஒரு விசேடமான பிரதேசமாகும். அந்தக் கற்பிட்டிப் பிரதேசம் அதிகமான தீவினைக் கொண்டதாகக் காணப்படுகின்றது. சுற்றுலாத்துறைப் பிரதி அமைச்சர் அவர்கள் எமது மாவட்டத்துக்கு வருகைதந்த நேரம் அங்கு சுற்றுலாத் துறையை மேம்படுத்தும் வகையில் அங்குள்ள குறைபாடுகளை நிவர்த்தி செய்து தருவதற்கும் சுற்றுலாப் பயணிகளின் பாதுகாப்பை உறுதிப்படுத்துவதற்குமான எல்லா ஏற்பாடுகளையும் செய்து தருவதாகவும், சிறந்த போக்குவரத்து வசதிகளை ஏற்படுத்தித் தருவதாகவும் கூறியிருந்தார். மாலைதீவும்கூட அதிகமான தீவுகளைக்கொண்டுதான் அங்கு அதிகமான சுற்றுலாப் பயணிகளை ஈர்த்துக் கொண்டிருக்கின்றது. அந்த வகையில், இந்த வருடம் எமது நாட்டுக்கு 30 - 40 இலட்சத்துக்கும் அதிகமான சுற்றுலாப் பயணிகளைக் கொண்டுவருவதற்கான அனைத்து ஏற்பாடுகளும் செய்யப்பட்டுக்கொண்டு இருக்கின்றது.

முன்னைய அரசாங்கங்களில் இருந்தவர்கள் கற்பிட்டி பிரதேசத்தில் சுற்றுலாத்துறையை மேம்படுத்தினார்களோ, இல்லையோ, அங்கு போதைப்பொருள் வியாபாரத்தை மேம்படுத்தினார்கள். கடந்த திங்கட்கிழமை புத்தளம் - கற்பிட்டி பிரதேசத்துக்கு வருகைதந்த பொதுமக்கள் பாதுகாப்புப் பிரதி அமைச்சர், கற்பிட்டி வனாத்தவில்லு பகுதியில் போதைவஸ்து செயற்பாடுகளை இல்லாமல் செய்வது தொடர்பில் வடமேல் மாகாணத்தில் இருக்கும் பொலிஸ் அதிகாரிகளுடன் கலந்துரையாடியுள்ளார். மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபைக் கூட்டத்தொடரில் குறிப்பிட்டதைப்போல, இந்த நாட்டில் போதைவஸ்தை இல்லாதொழிப்பதற்கான சகல

ஏற்பாடுகளையும் நாங்கள் செய்வோம். அதன் அடிப்படையில், எமது புத்தளம் மாவட்டத்தில் போதைவஸ்துப் பாவனை, போதைவஸ்து வியாபாரம் என்பவற்றை இல்லாது ஒழிப்பதற்கான சகல ஏற்பாடுகளையும் செய்திருக்கிறோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Muhammad Faizal,your time is up. Please, wind up.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
தயவுசெய்து, ஒரு நிமிடம் தாருங்கள்!

மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபைக் கூட்டத்தொடரில் குறிப்பிட்டதுபோன்று, வறுமை ஒழிப்பு, போதைவஸ்தை இல்லாதொழித்தல், கல்வியை மேம்படுத்தல் போன்ற வேலைத்திட்டங்களை எமது அரசாங்கம் முன்னெடுத்து வருகின்றது. எதிர்காலத்தில் எமது நாட்டில் வறுமையை ஒழிப்பதற்கான வேலைத்திட்டங் களையும் அதிகமாகச் செயற்படுத்த உள்ளது. கல்வியை மேம்படுத்துவதற்காக மாணவர்களுக்கான கொடுப்பனவுகள், வறுமையை ஒழிப்பதற்காக வயோதிபர்களுக்கான கொடுப்பனவுகள், அரச ஊழியர்களுக்கான சம்பள உயர்வு போன்ற இன்னோரன்ன தேவையான வேலைத்திட்டங் களையும் எமது அரசாங்கம் செய்து வருகின்றது. *இன்ஷா அல்லாஹ்*! இனிவரும் காலங்களில் இந்த நாட்டிலுள்ள வறுமையையும் போதைவஸ்தையும் ஒழித்து, சிறந்த கல்வி அறிவுடைய மக்களைக் கொண்ட அமைதியான ஒரு நாடாக இந்த நாட்டை எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் உருவாக்க முடியுமெனக் கூறி விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Amila Prasad. You have five minutes.

[අ.භා. 2.01]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. සංචාරක ව්‍යාපාරයට වුවමනා කරන වාහනවල අවශ්‍යතාව තිබියදී ඒ අවශ්‍ය වාහන ප්‍රමාණය නොපැමිණීම පිළිබඳව තිබෙන technical ප්‍රශ්නයක් විසඳා ගන්න තමයි අද දවසේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මෙම රෙගුලාසි ඉදිරිපත් කර තිබෙන්නේ. සංචාරක ව්‍යාපාරය මේ තරම් ලාභ උපයනවා නම් ඇත්තටම මේ වාගේ ගැටලු ඇති වෙන්නේ ඇයි, ව්‍යාපාරිකයන් ඒ තුළ ආයෝජනය නොකරන්නේ ඇයි කියන එක පිළිබඳවත් සොයා බැලීමේ වගකීමක් ආණ්ඩුවට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම තවත් ප්‍රශ්න කිහිපයක් මතු කරන්න කැමැතියි. මේ ආණ්ඩුව බලයට ආපු වෙලාවේ මුලින්ම අධ්‍යාපන ඇමති ධුරය දරපු මනුස්සයා කිව්වේ පාසල්වලට දේශපාලකයන් ගෙන්වීම නවත්වනවා කියලායි. හැබැයි, අද ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයට නියෝජ්‍ය ඇමති කෙනෙක් ගිහිල්ලා උත්සවයක් පවත්වනවා. අර්ච්චුනා මන්ත්‍රීතුමා ඇහුවා වාගේ මේ නීතිය අදාළ වෙන්නේ විපක්ෂයට විතරද? ඒවා ආණ්ඩුවට අදාළ නැද්ද? දේශපාලනඥයන් කොහොමද එහෙම පාසල්වල උත්සවවලට යන්නේ? ඒක පැහැදිලි කරන්න ඕනෑ, අධ්‍යාපන අමාත්‍ය ධුරය දරන එක්කෙනා විසින්.

ඊළඟ කාරණය මේකයි. ඊයේ දවසේත් මේ වාගේම technical ප්‍රශ්න ගණනාවක් තිබෙන පනත් කෙටුම්පතක් ගෙනාවා. ළමයින්ට ශාරීරිකව දඬුවම් කරනවාට අපිත් විරුද්ධයි. එසේ දඬුවම් කිරීමට විරුද්ධ වනවාට අපිත් එකඟයි. හැබැයි, 2003 වසරේදී හයිටි රාජ්‍යයත් ඒ විධියේ පනතක් ගෙනැල්ලා ඒ රටේ අධ්‍යාපන පද්ධතිය, ළමයින් පිළිබඳව තිබුණු සංකල්පය සම්පූර්ණයෙන් බිඳ වැටිලා විශාල විනාශයක් සිද්ධ වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවේ ඉන්න 159දෙනාටම අපි කියනවා, technical ප්‍රශ්න එක්ක පනත් කෙටුම්පත් ගෙනෙන්න කලින් ලෝකයේ මේ වාගේ පනත් ගෙනැල්ලා සිද්ධ වෙලා තිබෙන විනාශයන් පිළිබඳව සොයා බලන්න කියලා.

අවභාවිතය කියන කාරණය ගත්තාම, අවමානය කියන කාරණය ගත්තාම අපේ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මතු කළ කාරණාව පිළිබඳවත් විශේෂයෙන් සැලකිලිමත් වෙන්න ඕනෑ. හේතුව NGOsවලින් එන සල්ලි අරගෙන ඇවිත් මේ වාගේ දේවල් කළාම, ලංකාවේ අධ්‍යාපන පද්ධතියට දැවැන්ත විනාශයක් වෙන්න ඉඩ තිබෙනවා. ගුරුවරුන් ඉන්නේත් චකිතයකින්. මේ වාගේ ප්‍රශ්න හරහා පාසල්වල ක්‍රියාකාරිත්වය පවත්වා ගෙන යන්න බැරිව යනවා. ඒවාට විසඳුම් සොයනවා වෙනුවට තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිය පවත්වා ගෙන යන්න ආණ්ඩුවේ ඇමතිවරු පාසල් උත්සවවලට යනවා; ඒ අතරම අපි එහෙම යනවාට විරෝධය පළ කරනවා.

ඇති වෙච්ච technical ප්‍රශ්න අස්සේම තවත් දෙයක් කරනවා. පසුගිය කාල සීමාව තුළ -මේ සති දෙක තුළ- පොලිස් ස්ථානාධිපතිවරුන් ගණනාවක් මාරු කර තිබෙනවා. පොලිස් නිලධාරීන් මාරු කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඒ පොලිස් ස්ථානාධිපතිවරුන් බහුතරයක් මාරු කර තිබෙන්නේ සාමාන්‍ය රාජකාරිවලටයි. පදවිය, මල්ලවි, නුවරඑළිය, කුට්ටිගල, කඩුවෙල, පිළියන්දල, වවුනියාව, බිබිල, ලුණුගම්වෙහෙර ආදි පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් ගණනාවක් සාමාන්‍ය රාජකාරිවලට මාරු කර තිබෙනවා. මේ පෙන්නුම් කරමින් තිබෙන්නේ තමන්ට අවනත නොවන පොලිස් ස්ථානාධිපතිවරුන්ට බලපෑම් කරන ආකාරයකුයි. "අපි කියන දේ නොකළොත් ඇති වෙන ඵලවිපාකය මේකයි" කියන එක අනෙක් අයට පෙන්නුම් කරනවා. තමන් අපේක්ෂා කරපු දේවල් කරගන්න බැරි වනකොට ආණ්ඩුව දැන් හෙමින් හෙමින් නීතිය නවත්වන්න දරන උත්සාහයක් හැටියට අපට එය පෙනෙනවා. එය රාජ්‍ය පද්ධතිය තුළ පමණක් නොවෙයි සිද්ධ වෙන්නේ. අවුරුදු 25ක් තිස්සේ පැවැති පොත් ප්‍රදර්ශනයට - book fair එකට - වැඩිම දායකත්වයක් සැපයූ "විදර්ශන පොත් ප්‍රකාශකයෝ" මෙවර අයින් වෙනවා. ඇයි? ඒ අයට අවශ්‍ය වර්ගඵලය දුන්නේ නැහැ. එසේ අවශ්‍ය වර්ගඵලය නොදුන්නේ ඇයි? ඔබට මතක නම්, ගිය අවුරුද්දේ ජනාධිපතිවරයා පත් වුණාට පසුව "ඉක්මනින් ඇවිදගෙන ගියා" කියලා කථාවක් ගියා, ඒ විදර්ශන පොත් ප්‍රකාශකයන්ගේ කුටිය ළඟින්. එසේ ගිය එක ගැන තමයි සමාජ මාධ්‍යවල පළ වුණේ. අන්න එයාට මෙවර අදාළ වර්ගඵලය දුන්නේ නැහැ. ඒ කියන්නේ රාජ්‍ය අංශයට පමණක් නොවෙයි, පෞද්ගලික අංශයට පවා බලපෑම් එල්ල වෙමින් පවතින බව තමයි මේකෙන් පෙන්නුම් කරමින් තිබෙන්නේ.

ඒ වාගේම මේ ආණ්ඩුව දිගින් දිගටම කියන දෙයක් තිබෙනවා. ඒ අය අපට හොරු කියනවා; "පල් හොරු ඉස්සරහා කථා කරන්න ඕනෑ මෙහෙමයි" කියනවා. මම බලාගෙන, ඊයේත් එහෙම කිව්වා. තමන්ගේ වැරැදි වහගන්න තවදුරටත් අපට හොරු කියනවා. දැන් අවුරුද්දක කාල සීමාවක් ගත වෙලා ඉවරයි. මේ

[ගරු අමිල ප්‍රසාද් මහතා]

රටේ මුදල් හොරකම් කිරීම පිළිබඳව මේ රජය මේ අවුරුද්දක කාල සීමාව තුළ විගණන පරීක්ෂණයක් කරලා ප්‍රතිඵලයක් ගත්තාද? ජනාධිපතිතුමා ඊයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට ගිහිල්ලා කථා කරද්දී වැදගත් වාක්‍යයක් කිව්වා, "දූෂණයට එරෙහි සටන භයානකයි. දූෂණයට එරෙහි සටන නොකර සිටීම ඊට වඩා භයානකයි" කියලා. ඇත්ත. හැබැයි, දූෂණය කියන කාරණාව එන්නේ රාජ්‍ය බදු මුදල් පැහැර ගැනීම නිසා පමණක් නොවෙයි. මන්ත්‍රීවරුන්ට විපක්ෂයේ ඉඳලාත් සල්ලි හොයන්න ක්‍රම ඕනෑ තරම් ප්‍රමාණයක් තිබෙනවා. මම මේ ආණ්ඩුවට අභියෝගයක් කරන්න කැමැතියි. මේ 159දෙනා තමයි මේ රටේ සුජාත දේශපාලන ව්‍යාපාරය. අපි නම් හොරු; වල් පැළ. මොකද, අපට නොකියන දෙයක් නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Amila Prasad, you have only one more minute.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
Okay, Sir.

අපට දිගින් දිගටම චෝදනා එල්ල කරන මේ ආණ්ඩුවට මම අභියෝගයක් කරන්න කැමැතියි. පසුගිය සැප්තැම්බර් 21වැනි දා ඉඳලා මේ සැප්තැම්බර් 21වැනි දා වනකල් ඔබේ ඔය බැංකු ගිණුම් ටිකට ආපු සල්ලි, වියදම් කරපු සල්ලි පිළිබඳව bank statements අරගෙන ලංකාවේ මිනිසුන්ට බලන්න, පුළුවන් නම් සමාජගත කරන්න කියලා මම කියනවා. ඔබතුමන්ලාගේ 159දෙනාටම කරන අභියෝගයක්, මේක. Technical ප්‍රශ්න තිබෙන්න පුළුවන්, වත්කම් බැරකම් ප්‍රකාශවල. ඒකේ ප්‍රශ්නයක් නැහැ. අදාළ මුදල දමලා නැති වෙන්න පුළුවන්. හැබැයි, බැංකුවලට සල්ලි ආපු ඒවා සහ සහ ගිය ඒවා පෙන්නලා මේ ආණ්ඩුවේ සුජාතභාවය රටේ මිනිසුන්ට හෙළි කරන්න අවස්ථාවක් දෙනවා. මේක අභියෝගයක්. මම ජනාධිපතිතුමාගේ කථාවටම තව කෑල්ලක් එකතු කළොත්: "යමක් සැබවීමට ඇති ආශාව යනු බියයි. බිය යනු නරක දෙයක් වන අතර, එය නුසුදුසු දෙයකි. නිර්භීත වන්න. ඉතිරි සියල්ල ස්වාභාවිකව සිද්ධ වෙයි".

නිර්භීත වෙන්න, ඔය මන්ත්‍රීවරුන් 159දෙනා. තමන්ගේ අවුරුද්දක bank statements ලංකාවේ මිනිසුන්ට පෙන්වන්න. එතැනින් පසුව සියල්ල ස්වාභාවිකව සිදු වෙයි කියලා මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. T.K. Jayasundara. You have ten minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, raise your point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 91 (g) යටතේ මෙහෙම කියලා තිබෙනවා. It states, I quote:

> "If any offensive or disorderly words are used, whether by a Member who is speaking or by a Member who is present, the Speaker shall bring him to order and direct that such reference be expunged from the Hansard;"

ඊයේ මට "යකා" කියලා බැන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතකොට ඔබතුමා ඒක expunge කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That had been removed and I have also ordered that to be expunged from the Hansard, Hon. Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එතුමා මට එහෙම බණින කොට ඔබතුමා just asked for expunging only, but මම කාටහරි බැන්නොත් ඒ වෙලාවට ඒක ලොකු ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He had withdrawn that word. I listened to it. So, there is no point in raising that. Shall we move on to the next speaker? The Hon. T.K. Jayasundara. Your time starts now. You have ten minutes.

[අ.භා. 2.07]

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සිංහල භාෂාවේ කථාවක් තිබෙනවා, මීයෙක් ඇවිල්ලා බීලා, බීලා, බීලා අනෙක් අයට challenge කරපු. මෙතැන දැන් පොඩ්ඩකට කලින් මන්ත්‍රීවරයෙක් ඒ කථාවේ මීයා බීලා, බීලා ඇවිල්ලා challenge කළා වාගේ මේ රටේ මෙච්චර සුජාත ව්‍යාපාරයකට challenge කළා, අපේ තිබෙන බැංකු ගිණුම් ටික එළියට දාන්න කියලා. මට පෙනෙන්නේ ඒකත් අර මීයාගේ කථාව වාගේ කියලායි. මේ රටේ සියලුම ජරා වැඩ කරපු දේශපාලන ව්‍යාපාරයක ඉඳලා ඇවිත් දැන් අපට කියනවා, අපේ ගිණුම් ටික එළියට දාන්න කියලා. අප කියන්නේ මේකයි. අපේ ගිණුම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ පිළිබඳව පැමිණිලි කිරීමට යන්න පුළුවන් ආයතන තිබෙනවා: පොලිසිය තිබෙනවා; Bribery Commission එක තිබෙනවා. ඒවාට ගිහිල්ලා පැමිණිලි කරන්න. අපි ලැහැස්තියි ඕනෑම වෙලාවක ඒවා ඉදිරිපත් කරන්න. එහෙම නැතුව මෙතැන ඇවිල්ලා කෑ ගැහුවාට එහෙම කරන්න බැහැ. නීත්‍යනුකූලව වැඩ කරන්න. ඒකට පෞරුෂයක් නැත්නම් අපි මොකක්ද කරන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප අද මේ කරන්නේ, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ආපු, 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 12 දරන රෙගුලාසිය, එහි "2025 ජූනි මස 30 දක්වා" යන්න අවලංගු කර "2025 සැප්තැම්බර් මස 30 දක්වා"

යන්න ආදේශ කිරීම පිළිබඳ සාකච්ඡාවක්. අපේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ -දශක ගණනාවක් තිස්සේ- මේ සමාජය බිඳ වට්ටපු එකේ ප්‍රතිඵලයක් විධියට ආපු සිදුවීමක් ගැන තමයි අප මේ කථා කරන්නේ. ඒ නිසා අපට දැන් කථා කරන්න වෙලා තිබෙන්නේ මේ වාගේ තාක්ෂණික කාරණාවකට වඩා එහා ගිය දැවැන්ත දේශපාලන ගමනක් ගැනයි; සිද්ධ වුණු දේශපාලන පෙරළියක් ගැනයි.

අප කථා කරන මේ මොහොත වන විට අප බලයට ඇවිල්ලා අවුරුද්දයි. ඒ අවුරුද්ද ඇතුළත අපේ සමාජය ආපු තැන කොතැනද, තිබුණු තැන මොකක් ද යන්න පිළිබඳ සාකච්ඡාවක් මේ සමාජයේ තිබෙනවා. ඒකත් එක්ක අපට කෙටියෙන්ම කියන්න තිබෙන්නේ මේකයි. වසරක් ඇතුළත අපි අපේ ආර්ථික දර්ශකවල ඉතා ඉහළ කැපී පෙනෙන වර්ධනයක් පෙන්වා තිබෙනවා. 2024 දෙවන කාර්තුවේ සියයට 4.1ක් ලෙස තිබුණු ආර්ථික වර්ධන වේගය 2025 දෙවන කාර්තුවේ සියයට 4.9 දක්වා වැඩි වෙලා තිබෙනවා. අපේ ඩොලර් සංචිතය ඩොලර් බිලියන 6.2 දක්වා වැඩි වෙලා තිබෙනවා. එහි ඉලක්කය ඩොලර් බිලියන 7ක් දක්වා වේගයෙන් ගමන් කරමින් තිබෙනවා. අපේ දර්ශක හැම පැත්තෙන්ම ඉහළ මට්ටමක තිබෙනවා. ඇත්තටම අපි පසුගිය අවුරුද්ද ගත කළේ කුමක් සඳහාද? අපි පසුගිය අවුරුද්ද සැලකුවා, මේ රට ස්ථාවර කිරීමේ අවුරුද්ද හැටියට. එය පළමුවැන්නයි. අපි එය සැලකුවා, මේ රටේ ජනතාවගේ විශ්වාසය දිනා ගැනීමේ වසර හැටියට. ඒ, දෙවැන්නයි. අපි එය සැලකුවා, ජාත්‍යන්තරය දිනා ගැනීමේ වසර හැටියට. ඇත්තටම අපි බලයට ඇවිත් අවුරුද්දකට පස්සේ බලනකොට පෙනෙනවා, අප මේ රටේ ආර්ථිකය ස්ථාවර කර තිබෙනවා කියලා. විපක්ෂයේ අය ඡන්දයට කලින් කිව්වේ ඩොලර් එක රුපියල් 400 දක්වා ඉහළ යයි කියලායි. එහෙම කියපු අයට දැන් මේ තත්ත්වය දරා ගන්න බැරි වෙලා තිබෙන්නේ.

අප කෙරෙහි ජනතාවගේ විශ්වාසය දවසින් දවස වැඩි වෙනවා. අපි හොරු අල්ලන්නේ නැහැ කියලා තමයි විවේචනය තිබුණේ. දැන් ක්‍රමක්‍රමයෙන් නීතිය ක්‍රියාත්මක වෙනකොට විපක්ෂයේ සමහරු කලබල වෙනවා. ජාත්‍යන්තර ව්‍යාපාර, වෙනත් රටවල් අපව ගෙන්වනවා; අපත් එක්ක සාකච්ඡා කරනවා; ආයෝජකයෝ එනවා. සමහර අයට දැන් ඒවා දරා ගන්න බැහැ.

අපි අපේ ජයග්‍රහණය මැන බලන්නේ සතුරාගේ දෝෂාරෝපණයෙන් තමයි. මොකද, සතුරා කලබල වෙනවා නම් අපේ ජයග්‍රාහී බව අපට පෙනෙනවා. මිතුරා කියන දෙයට වඩා එය වැදගත්. මෙච්චර කල් මේ රට දූෂණය කරපු, විනාශ කරපු අය අපට බණිනවා කියන්නේ, දෝෂාරෝපණය කරනවා කියන්නේ අපේ ගමන සාර්ථකයි කියන එකයි. විපක්ෂයේ මේ ඉදිරි පෙළ අසුන්වල ඉන්න අය අපට බණිනකොට ඇත්තටම අපට සතුටක් දැනෙනවා, 'එහෙම නම් මෙච්චර කල් ගිය ගමන අපි වෙනස් කරලා තිබෙනවා' කියලා. අප ඉදිරි ගමන යන්නේ ඊළඟ අවුරුද්ද - ඒ නව වසර- මේ රටේ ආර්ථිකය පුබුදන වසරක් හැටියට; ආර්ථිකයේ නව පිම්මක් පනින වසරක් හැටියට සලකායි.

විශේෂයෙන්ම ඊයේ දවස ඇතුළත අපේ ජනාධිපති සහෝදරයාට එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේදී කථා කරන්න අවස්ථාව ලැබීමත් ඇත්තටම විශේෂ අවස්ථාවක්. ජනාධිපතිතුමාගේ කථාව තුළින් මේ රටට, ලෝකයට ආදර්ශයක් දීලා තිබෙනවා. ඒ කථාව ඇතුළේ මේ රටේ විතරක් නොවෙයි, ජාත්‍යන්තරය හා බැඳුණු දැවැන්ත ප්‍රශ්න ගැන කථා කරලා තිබෙනවා. ඇත්තටම දුප්පත්කමට එරෙහි සටන පිළිබඳව ජනාධිපතිතුමාගේ කථාවේදී කියැවුණා. ඒ කථාව අපි කවුරුත් පිළිගන්නවා. ඒ කථාව ලෝකයම පිළිගන්නවා. එතුමා මෙහෙම කියනවා.

"ලෝකයේ අති බහුතරයක් රටවල් සියවස් ගණනක් තිස්සේ අත්විඳින නොනවතින සහ අතිශය වේදනාබර අරගළය ලෙස දුප්පත්කම හඳුන්වා දෙන්න පුළුවන්කම තිබෙනවා. එය විවිධ මුහුණුවරින් එන බිහිසුණු සතුරෙක් වන අතර, අප මේ සමුළුවේ රැස්ව සිටින මොහොතේත් මාද ඇතුළුව මේ සෑම නියෝජිතයෙකුගේම රටවල අඩු වැඩි වශයෙන් සැලකිය යුතු දරුවන් පිරිසක් කුසගින්නේ සිටිනවා."

එතුමා ලෝකයේම තිබෙන ප්‍රශ්නයක් ගැන කථා කරනවා. ඒක අපේ රටටත් පොදුයි, වෙන රටවලටත් පොදුයි. අපේ රටේ දුප්පත්කම නැති කිරීමේ ව්‍යාපාරය ඇතුළේ අපි වේගයෙන් වැඩ කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා අපි කෘෂිකර්ම ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය හා සංචාරක ක්ෂේත්‍රය කියන හැම ක්ෂේත්‍රයකම විශාල ජයග්‍රහණ ලබන්න අවශ්‍ය යටිතල පහසුකම් ඔක්කොම හදලා තිබෙනවා. අපි මේ සංඛ්‍යාලේඛන නොවෙයි කියන්නේ. ඔබතුමන්ලා බලන්න, අපේ ප්‍රදේශවලට යන හැම පාරක් අයිනේම excavator එකක් දාලා ඇළ වේලි සුද්ද කරලා, ඇළ වේලි හදලා, ගොවියා කුඹුරට බස්සවන්න, ගොවියාගේ ප්‍රශ්න විසඳා දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළකට අපි ගිහිල්ලා තිබෙනවා. මේ කන්නයේ ගොවීන් විශාල වශයෙන් කුඹුරු ගොවිතැන් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා අපි දකින විධියට ඇත්තටම මහ පොළොවේ කෘෂි කර්මාන්තයට අදාළ පහසුකම් හැදිලා තිබෙනවා.

ඒ වාගේම ජනාධිපතිතුමාගේ කථාවේදී කියැවුණා අපි දැක්කා, මේ පාතාලය පිළිබඳ ප්‍රශ්නය, මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය, දූෂණය පිළිබඳ ප්‍රශ්නය ගැන. ඒ ඔක්කොම මේ සමාජය ආපස්සට හරවන්න හේතු වෙච්ච කාරණා. මම ඊයේ බැලුවා, 2019දී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්තාවක්. මහාචාර්ය සමන් අබේසිංහ මහත්මයා තමයි ඒක ලියලා තිබෙන්නේ. මේ වාර්තාව අනුව වාසනාවකටද, අවාසනාවකටද දන්නේ නැහැ හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාත් ඒ කමිටුවේ ඉඳලා තිබෙනවා. මම හිතනවා, මේ වාර්තාව නිවැරදියි කියලා. මොකද, කුඩු ගැන මත්ද්‍රව්‍ය ගැන එතුමාට හොඳ අවබෝධයකුත් තිබෙන නිසා. මෙහි වාර්තාව 2019දී දෙන්නේ, 2018 වර්ෂය දක්වා වූ තොරතුරුවලින් තමයි. මෙහි තිබෙනවා, "බහුලවම භාවිත වන මත්ද්‍රව්‍ය ගංජා වන අතර, වයස අවුරුදු 14ට වැඩි ජනගහනයෙන් සියයට 1.9ක් ගංජා පාවිච්චි කරනවා" කියලා. ඒ වාගේ තොරතුරු තිබෙනවා. වයස අවුරුදු 14ට වැඩි ජගහනයෙන් සියයට 0.6යි හෙරොයින් පාවිච්චි කරලා තිබෙන්නේ. මත්ද්‍රව්‍ය භාවිතයේ ඉහළ ව්‍යාප්තියක් තිබෙන්නේ, බස්නාහිර පළාතේ හා කොළඹ දිස්ත්‍රික්කයේ. 2018 වසරේ අත්අඩංගුවට අරගෙන තිබෙන වැඩිම හෙරොයින් ප්‍රමාණය කිලෝග්‍රෑම් 739යි. හැබැයි, ඊට පස්සේ මොකක්ද වෙන්නේ? 2018න් පස්සේ අයිස් පිළිබඳ සිදුවීම් 257යි. හැබැයි, ඒක 2021 වෙනකොට සිදුවීම් 13,000ක් දක්වා වැඩි වෙනවා. කවුද ඒ කාලයේ රට පාලනය කළේ? එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඇතුළු ඔක්කොම එකතු වෙලා තමයි එදා රට පාලනය කළේ. ඒ සිදුවීම් ප්‍රමාණය 257 සිට 13,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ විධියට ඇවිල්ලා දැන් 2024, 2025 වෙනකොට කන්ටේනර්වලින් අයිස් ගෙනෙන තත්ත්වයට මේගොල්ලෝ රට පත් කරලා තිබෙනවා. දැන් අපට තමයි ඒවා අහු වෙන්නේ. ඒගොල්ලන්ගේ වැඩ පිළිවෙළ අපට තමයි නීතිය හමුවට ගෙන්වන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මට මේ කථාවේදි කියන්න ඕනෑ වෙලා තිබෙනවා, පාතාලය, ඒකත් එක්ක බැඳුණු මත්ද්‍රව්‍ය, ඒකත් එක්ක බැඳුණු දූෂණය අපේ රටේ වර්ධනය වුණේ කොහොමද කියලා.

අපට මතකයි, 1977ට කලින් අපේ රටේ "චොප්පෙ" කෙනෙක්, "මරු සිරා" කෙනෙක් ගැන විතරයි කථා කළේ. ඒ, 70

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

දශකයේ මුල හරියේ. හැබැයි, ඊට පස්සේ අපට මතකයි, ජේ.ආර්. ජයවර්ධනගේ පාලනය ඇතුළේ "ගෝනවල සුනිල්" කෙනෙක් ගැන කථා කරනවා. "ගෝනවල සුනිල්" රාජ්‍ය පාලනයේ හිටියා. ඊට පස්සේ ආයෙත් ආර්. ප්‍රේමදාස-සොත්ති උපාලි යුගයක් තිබුණා. ඒ කාලයේ ප්‍රේමදාස ජනාධිපතිවරයා රට පාලනය කරනකොට, "සොත්ති උපාලි" ගැන කියැවෙනවා. ඊට පස්සේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ඉන්න කාලයේ "බැද්දේගාන සංජීව" ගැන කියනවා. මේ තමයි පාතාලය සහ පාලකයන්ගේ සම්බන්ධකම. ඊට පස්සේ එනවා, කුරහන් සාටක යුගය. කුරහන් සාටක යුගයේ අප්පච්චි ඉන්න කාලයේ මේ රටේ පාතාලය එක්ක සම්බන්ධ වෙච්ච හැටි කථා කරනවා. ඊට පස්සේ එනවා, බේබිගේ යුගය. ඒ බේබිත් එක්ක ඒවා සම්බන්ධ වුණේ කොහොමද? මේක සම්පූර්ණ ඉතිහාස කථාවක්. ඊට පස්සේ, මේ සාටක යුගය ඇතුළේ තව විශේෂ වැඩක් කළා. ඒක තමයි දේශපාලනයට කරපු ලොකුම හානිය. ඒ මේකයි. අපේ රටේ පක්ෂ කියලා දෙයක් තිබුණා. ඒ පක්ෂවලට මධ්‍යම කාරක සභා තිබුණා, දිස්ත්‍රික් සංවිධාන තිබුණා, දිස්ත්‍රික් සංවිධායකයෝ හිටියා, ආසන සංවිධායකයෝ හිටියා. හැබැයි, ඒ සාටක යුගයේදී දිස්ත්‍රික් සංවිධායකයන්ගේ බලය අයින් කරලා, ආසන සංවිධායකයන්ගේ බලය අයින් කරලා, කෙළින්ම වලව්වයි, ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවයි සම්බන්ධ කර ගත්තා.

එක එක බලකා හැදුවා. Blue බලකා හැදුවා. ඒ බලකාවලට ගැට ගැහුවා ගමේ ඉන්න මන්ත්‍රීවරයා. ඊට පස්සේ අර සංවිධාන යන්ත්‍රණ බිඳ දැම්මා. දිස්ත්‍රික් සංවිධානත් ඉවරයි, ආසන සංවිධානත් ඉවරයි. ඒ නායකයෝ, තමන්ට අභියෝගයක් වෙයි කියලා හිතෙන ආසන සංවිධායකයෝ, දිස්ත්‍රික් නායකයෝ කපලා දැම්මා. දේශපාලන පක්ෂ කියන ඒවා විකෘති කළා. දැන් විපක්ෂ නායකතුමා, අනෙක් පක්ෂවල නායකයෝ කථා කරනවා, බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන. හැම වෙලාවේම මොර දෙනවා එළියට ගිහිල්ලා බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන. මොන බහු පක්ෂද? ඒ පක්ෂ යන්ත්‍රණ විනාශ කළේ, ඔන්න ඔය බලකා ටිකයි, ඔය සාටක යුගයයි, ඔය කණ්ඩායමයි එකතු වෙලා තමයි. ඒ විනාශයේ ප්‍රතිඵල නිසා අද පක්ෂ නොවෙයි තිබෙන්නේ; කල්ලි කණ්ඩායම් තිබෙන්නේ. අබල දුබල විපක්ෂයක් තිබෙන්නේ, කැබලි කැබලිව තිබෙන්නේ. ඒ නිසා මේක සරල නැහැ. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කළේ, ඔන්න ඔය කණ්ඩායම.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙන්න මේ දූෂිත දේශපාලනයත්, දූප්පත්කමේ වර්ධනයත්, රට ණය වීමේ වර්ධනයත් සමානුපාතිකයි. අර මම කලින් කියපු කාරණයට සමානුපාතිකයි මේ ටික. අපි ඒ යුගය වෙනස් කරලා මේ රට අනෙක් පැත්ත හැරෙව්වා. මේ රටේ ජනතාව අරගළ කරලා, මේ රටේ ජනතාව පසුගිය ඡන්දයේදී අපට බලය දීලා නව පාලනයක් හදලා වෙනස් කළේ ඒ යුගය. දැන් තිබෙන්නේ නව යුගයක්. ඒ යුගයේදී පරණ සංස්කෘතියේ ඉන්න කට්ටිය දැන් කලබල වෙලා. ඉතින් ඒ නිසා මෙතැනට ඇවිල්ලා විවේචනය කරන්නේ නැත්නම් ඒක පුදුමයක් තමයි. ඒක අනිවාර්යය දෙයක්, අහම්බයක් නොවෙයි. මේ අපේ ඉස්සරහා විපක්ෂයේ ඉඳගෙන අපට බණින ඒවා, කියන ඒවා අනිවාර්යයක්. ඇයි? නව සංස්කෘතියට ගැළපෙන්නේ නැහැ ඒගොල්ලන්. ඒ අය අලුත් තත්ත්වයට ගැළපෙන්නේ නැහැ. ඒ අය නිතරම ඉන්නේ වෛරයකින්, ජනතාව එක්ක වෛරයකින්. ඇයි? ජනතාව අප බලයට පත් කළ එක ගැන වෛරයකින් වැඩ කරන්නේ. ඒ වෛරය පෙනෙනවා මෙතැනදී. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙනවා ලොකු වගකීමක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, can you please wind up now?

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ජාත්‍යන්තරය දිනා ගත්ත මේ වෙලාව, අපේ රට නව පිබිදීමක් ගන්න හදන වෙලාව. ඒ නිසා අපට විපක්ෂයේ බයිලා වැඩක් නැහැ. මේ රටේ ජනතාව අප සමඟ ඉන්නවාය කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ravi Karunanayake. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.18]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳව විවාද කරන මේ මොහොතේ මටත් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට තාවකාලික උත්තරයක් සපයන එක තමයි කරන්නේ. නමුත් මෙවැනි දේවලට වඩා ප්‍රතිපත්තිය තුළින්ම මේවා වෙලා ඉවර වුණා නම් වඩා යෝග්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී පෙන්වා දෙනවා. නමුත් ආණ්ඩුවක් වශයෙන් මීට වඩා දරුණු තීන්දු ගන්න අවශ්‍යයි. දැන් කාර් හය හත්අටදාහක් විතර තවම හම්බන්තොට හිර වෙලා තිබෙනවා. එහෙම වෙන්නේ හරියාකාර බදු තීන්දුවක් හරි cross-border LCs ඇරීමෙන් තිබෙන ප්‍රශ්නයට නිසි ආකාර පිළිතුරක් ලැබී නැති නිසායි. ඒ නිසා මේ අවස්ථාව නැවත ඇති නොවන විධියකට අපි ප්‍රතිපත්ති ඇති කරන්න අවශ්‍යයි. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ගන්න පුළුවන් මෙවැනි තීන්දු ඉතාම කල් අරගෙන නොගැනීම නිසා තමයි මේ ප්‍රශ්නයට විසඳුමක් නොලැබෙන්නේ කියන එක තමයි හුඟක්දෙනාගේ මතය. ඉතින් අපි ඒක නිවැරදි කරන්න අවශ්‍යයි.

රථ වාහන සම්බන්ධයෙන් තීන්දු ගැනීම තුළ අපට පෙනෙනවා, පොදු ප්‍රවාහනයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා

තිබෙන බව. මා දැනුවත් කළා ඒ සංගම්වල අය. 2023දී සියයට 45ක්ව තිබුණු පොදු ප්‍රවාහනය අද සියයට 37.5කට අඩු වෙලා තිබෙනවා. එතකොට ත්‍රීවීලර් එදා සියයට 6ක් විතර පාවිච්චි වුණා. ඒක අද සියයට 5කට විතර අඩු වෙලා තිබෙනවා. දුම්රිය භාවිතය සියයට 7යි. ඒකෙන් වෙලා තිබෙන්නේ, කාර් සහ බයික් ප්‍රමාණය වැඩි වෙලා තිබෙන එක. පොදු ප්‍රවාහනයේ ප්‍රමාණය අඩු වෙනකොට, ඉන්ධන ආනයනය කිරීමේ මිල වැඩි වෙන්න පටන් ගන්නවා. ඒකත් අපි මේ අවස්ථාවේදී බලන්න අවශ්‍යයි. කාර් ආනයනය කිරීම බදු ප්‍රතිපත්ති අනුවම නොවෙයි කළ යුත්තේ. සාමාන්‍යයෙන් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය කොයි ආකාරයටද සංවර්ධනය කරන්නේ, එහි අතුරු ප්‍රතිඵලයක් වශයෙන් කාර් ගෙනාවා නම් හොඳයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. දැන් මේ කියන විධියට 2022දී බස් රථ 18,000ක් තිබිලා තිබෙනවා. අද ඒක 13,000කට අඩු වෙලා තිබෙනවා. SLCTB එකේ බස් රථ 4,500ක් තිබුණු එක අද 3,100කට අඩු වෙලා තිබෙනවා. ඉතින්, මේ පොදු ප්‍රවාහන සේවය කොයි ආකාරයෙන්ද වැඩිදියුණු කරන්න අවශ්‍ය වන්නේ?

අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සහ අපි ඔක්කෝම එකට වැඩ කරන කාලයේ LRT එක ගෙනෙන්න හදපු අවස්ථාවක් උදා වුණා. අන්තිමට මොකක්ද වුණේ? ඒකට යම් විධියකින් බාධා ඇති කිරීම නිසා, ඒකට විරෝධතා ඇති කිරීම නිසා එය කරන්නට බැරි වුණා. අද බංග්ලාදේශය ඒක කරගෙන යනවා. ලංකාව උඩ බලාගෙන ඉන්නවා, මොනවාද වෙන්නේ කියලා. මේ ව්‍යාපෘතිය ආවා නම් අපේ තෙල් ප්‍රමාණය අඩු වෙනවා. පොදු ප්‍රවාහන සේවාව මීට වඩා වැඩිදියුණු වෙනවා. ඒ තුළින් රටත් සංවර්ධනය වෙලා, රට ඉදිරියට ගමන් කරන තත්ත්වයක් තමයි ඇති වන්නේ. කාර් ප්‍රමාණය එනවා වාගේම තව අවුරුදු එකහමාරකින් තෙල් - පෙට්‍රල්, ඩීසල් - මේ රටට ආනයනය කරන ප්‍රමාණයත් ඒ නිසාම වැඩි වෙන්න පටන් ගන්නවා. ඒක හොඳද?

ඒ වාගේම පුනර්ජනනීය බලශක්තිය ගැනත් මම කියන්න ඕනෑ. බලශක්ති ඇමතිතුමා සභාවේ ඉන්න නිසා මම නැවත කියනවා, පුනර්ජනනීය බලශක්තිය අවශ්‍යයි කියන එක. මොකද, අපි IMF එකට කථා කළාම, World Bank එකට කථා කළාම, ඔවුන් කියන්නේ මෙය රජයේ ප්‍රතිපත්තියක් කියලායි. මේ අවස්ථාවේදී අපි අනවශ්‍ය ලෙස ඉන්ධන ආනයනය කරන්නේ නැතුව අපට ස්වභාව ධර්මයෙන් ලැබෙන දේ අපි බලශක්තිය සඳහා පාවිච්චි කරන්න ඕනෑ කියන එක නැවත මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපේ ඇමතිවරු දැන් හරි මාර්ගයට එනවා කියා මට පෙනෙනවා. එදා අපට බැණලා, කැගහපු අයට දැන් තේරිලා තිබෙනවා, ගයන්තලා අපි ආණ්ඩු කරපු අවස්ථාවේදී ඒ තුළ කටයුතු කළ ආකාරය කොයි තරම් අමාරුද කියන එක. මොකද, විපක්ෂයේ සිටියදී තිබෙන සුන්දරත්වය නොවෙයි, ආණ්ඩු පක්ෂයට ආවාම තිබෙන්නේ. බිමල් රත්නායක දුම්රිය ස්ථානවලට ගිහිල්ලා කියනවා, 'වැඩ කරන්නේ නැත්නම් කරුණාකරලා යන්න' කියලා. මම හිතන විධියට ඒ ස්ථාවරය හරි. මොකද, වැඩ කරන්න අවශ්‍යයි; කැප වෙලා වැඩ කරන්න අවශ්‍යයි. ඉතින්, ඒ නිර්භීත තීන්දුව ගන්න එකට මේ අවස්ථාවේ ප්‍රශංසා කරන්න අවශ්‍යයි කියලා මම හිතනවා. වැඩ කරන එකද, නැද්ද කියන එක නොවෙයි, එහි ඵලදායීතාවක් ඇති වන ආකාරයට කටයුතු කරන එක තමයි වැදගත්. මොකද, මොනවා වුණත් අපේ සම්පූර්ණ ආදායමින් රුපියල් බිලියන 1.6ක් සහ පෙන්ෂන් එකට 1.8ක්, ඒ කියන්නේ, ට්‍රිලියන 1.8ක් රජයේ සේවය වෙනුවෙන් වැය වෙනවා. ඒක ඉතාම ලොකු ප්‍රමාණයක්. ඒකෙන් ඵලදායීතාවක් ලැබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම තමයි නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියනවා, 'අපට ගෙවන්න බැහැ. සාධාරණ ගණනක්..,'- නමුත් රජයේ සේවයට එහෙම කියලා පෞද්ගලික අංශයට ජනවාරි මාසයේ ඉඳලා 9,000ක් කෙළින්ම වැඩි කරනවා. මේවා දරා ගන්න පුළුවන්ද? හැබැයි, හිතන ආකාරය හොඳයි කියලා කියන්න ඕනෑ.

අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා සඳහන් කළ කාරණයක් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මේක තමයි වැදගත්ම දේ. "Government to step back from running businesses, focus on facilitation." අපි මේක එදා කිව්වාම උඩ පැනලා කිව්වා, එහෙම කරන්න බැහැ කියලා. 'මෙන්න රජය පෞද්ගලීකරණය කරනවා' කියලා එදා කිව්වා. නමුත් දැන් තේරෙනවා, ඵලදායීතාව ගන්න පුළුවන් වන්නේ රජයත්, පෞද්ගලික අංශයත් දෙකම හවුල් කරගෙන කියලා. ඉතින් මම ඒ රෝගය අනෙක් ඇමතිවරුන්ටත් බෝ වේවා! කියා ප්‍රාර්ථනා කරනවා. මොකද, ඒ තුළින් අපට ඒ අවශ්‍යතාව; ඵලදායීතාව ඇති කරගන්න පුළුවන්. මොකද, ඒ තුළින් පාරිභෝගිකයාට තමයි අන්තිමට එහි වාසිය ලැබෙන්න අවශ්‍ය වන්නේ.

මීට අවුරුදු 15, 20කට ඉස්සෙල්ලා අපේ ටෙලිකොම් එක යම් වාණිජකරණයක් කළා. එදා telephone එකක් ගන්න මාසයක් නැත්නම් අවුරුද්දක් විතර ඉන්න ඕනෑ. නමුත් අද එක තත්පරයක් ඉන්න ඕනෑ නැහැ. අද එදාට වඩා මිලත් අඩු වෙලා තිබෙනවා. මම හිතන විධියට මෙහෙම තමයි රටක් ඉදිරියට ගෙනයන්න අවශ්‍ය වන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, කාර් ආනයනය කරනකොට අපි බලන්න ඕනෑ, ඒ ක්ෂේත්‍රය මොකක්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක කර්මාන්තය දෙස බලන්න. ඒ වෙනුවෙන් මේ අවස්ථාවේදී අපි අලුත් vehicles ගෙනෙන්න අවශ්‍යයි. මොකද, මීට අවුරුදු 15, 20කට ඉස්සර තිබුණු රථවාහන තමයි තවම එම කර්මාන්තය සඳහා පාවිච්චි කරන්නේ. ඒවායින් සංචාරක කර්මාන්තය දියුණු කරන්න බැහැ. සංචාරක කර්මාන්තය upmarket කරන්න අවශ්‍ය නම්, අපට අලුත් රථ වාහන අවශ්‍යයි. නමුත් අද තිබෙන තත්ත්වය අනුව, අද තිබෙන බදු ප්‍රමාණය අනුව ඒක ලෙහෙසි නැහැ. ඉතින්, ප්‍රවාහනය පැත්තෙන් ගත්තොත්, අපේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න නැවත අලුතෙන් හිතලා අලුත් වැඩපිළිවෙළක් ඇති කිරීම අවශ්‍යයි. අපි Committee on Public Finance එකේදී මේ පිළිබඳව සාකච්ඡාවට ගත් අවස්ථාවේදී මට පෙනී ගියා මේ සංගම් ඉතාම අමාරුවෙන් තමයි කටයුතු කරන්නේ කියලා. මොකද, එදා ලක්ෂ 70ට තිබුණු වාහනය අද ලක්ෂ 270කට වැඩි වෙලා තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් අලුත් වැඩපිළිවෙළක් අවශ්‍යයි.එක පැත්තකින් කියනවා, මේ කර්මාන්තය ලක්ෂ 26 සිට ලක්ෂ 50කට ගෙනියන්න ඕනෑ කියලා 2030 වෙනකොට. එහෙම ගෙනියන්න නම්, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඇති කර දීම අවශ්‍යයි. ඒක තමයි කරන්න පුළුවන් එකම දේ.

ඉතින්, අපි එදා මෙතැන ප්‍රශ්න කළාම සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කිව්වා, සීනි කර්මාන්තය දුවන්න බැහැ. අපි රජය වශයෙන් දුවනවා කියලා. අද තේරුම් අරගෙන තිබෙනවා, එහි තිබෙන ලොකුම ප්‍රශ්නය මොකක්ද කියලා. ඒ නිසා තමයි මේ වාගේ, "Government to step back from running businesses, focus on facilitation" කියලා කියන්නේ. ඒකට තමයි රජයක් තිබෙන්නේ, ප්‍රතිපත්ති ඇති කරන්න. රජයකට බැහැ, බිස්නස් කරන්න. කරපු හැම අවස්ථාවේදීම පාඩු ලබලා තිබෙනවා මිසක් ලාභ ලබලා නැහැ. පාරිභෝගිකයාට හොඳ වාසියක් ලැබෙන්නේ ව්‍යවසායකත්වය ඇති කිරීමෙන්. ඒ ව්‍යවසායකත්වය ඇති කරන්න හැකි වෙන්නේ රජයත්, පෞද්ගලික අංශයත් දෙකම ඒකාබද්ධව වැඩ කිරීම තුළයි.

[ගරු රවී කරුණානායක මහතා]

අද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළව ඉදිරිපත් කර තිබෙන ගැසට් එකෙන් මේ අවස්ථාවේදී රජය ගන්නා තීන්දු තුළ මොනවාද සිද්ධ වෙන්නේ කියාත් අප බලන්න ඕනෑ. බලන්න, HSBC බැංකුව. එය අවුරුදු ගණනාවක්, මම හිතන විධියට අවුරුදු 135ක් වාගේ කාලයක් මේ රටේ තිබිලා අද ඒක retail bankingවලින් සමුගන්නවා. ඒ retail banking, Nations Trust Bank එක ගන්නවා. Nations Trust Bank එක, ඒක අරගෙන ඉදිරියට යන එක අපි අගය කරනවා. නමුත්, ඒගොල්ලන්ට අවශ්‍ය සල්ලි හදන එක විතරක් මෙහේ ඇවිල්ලා කරන්න HSBC එකට ඉඩ දෙන්න හොඳ නැහැ කියන එකත් මම රජයට කියන්න කැමැතියි. ඉංග්‍රීසියෙන් එයට කියනවා cherry-picking කියලා. ඒගොල්ලන්ට අවශ්‍ය සල්ලි හදන එක විතරක් මෙහේ ඇවිල්ලා කරන එක නොවෙයි තිබෙන්නේ. ඒගොල්ලන් මෙහේ ඇවිල්ලා Treasury Bonds, Treasury Billsවලට එකතු වෙවී. මේ රටට සල්ලි ගෙනෙන්න හදාවී. නමුත්, මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්න ඉඩ තියන්නේ නැති එක තමයි තිබෙන්නේ. ඉතින්, තමන්ගේ රට දියුණු කරන්න අවස්ථාවක් මේ HSBC එකෙන් ලැබෙන්නේ නැත්නම්, ඒගොල්ලන්ට මේ වාගේ අවස්ථා ලබාගැනීමේ හැකියාව මීට වඩා අමාරු කරන්න අවශ්‍යයි. නැත්නම් වෙන්නේ ඒගොල්ලන් ඇවිල්ලා අවශ්‍යතාව අනුව කටයුතු කිරීම. රටේ සංවර්ධනයට නොවෙයි ඒගොල්ලන් දායකත්වය දෙන්නේ.

මේ අවස්ථාව මම නැවත උපයෝගී කරගන්නවා, මේ කාරණා පිළිබඳව සඳහන් කරන්න. අපි පුළුවන් තරම් අපනයනය කරන්න අවශ්‍ය වන්නේ ඇයි කියලා අපට දැන් තේරෙනවා. අපේ ණයබරතාව ඉතාම අධික මට්ටමක තිබෙනවා. මේ අධික මට්ටම 2028 අප්‍රේල් මාසයේ සිට ගෙවන්න පටන්ගන්න තිබෙනවා. අද වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 3,000ක් විතර - බිලියන 3.5ක් විතර - ගෙවන්න තිබෙනවා. 2028 වෙනකොට ඩොලර් බිලියන 6.7ක් විතර ගෙවන්න තිබෙනවා. ඒ නිසා අපි අපනයනය කරලා ඒකෙන් සංචිත ලබාගෙන ඒ සංචිත තුළින් තමයි අපේ ණය ගෙවන්න අවශ්‍ය වන්නේ. එහෙම නම්, ණය ගෙවන්න තිබෙන අවස්ථාව ඇති කරන්න හොඳම, උපරිම අවස්ථාව තමයි අපි ඕනෑ දෙයක් අපනයනය කරන්න පුළුවන් ක්ෂේත්‍ර ඇති කරන එක. අපනයනය කිරීම සම්බන්ධව රජයේ තීන්දු ගැනීම ඉතාම තියුණු වෙන්න අවශ්‍යයි. අපට කන්ටේනරයක් clear කරන්න සුමානයක් යනවා නම්, ඒකට approval එක ගන්න තව සුමානයක් යනවා නම්, රජයේ වැඩකටයුතුවලටම සුමාන 2, 3ක් යනවා නම් මෙන්න මෙතැන තමයි අපේ තරගකාරී තත්ත්වය නැති වන්නේ. අපනයනකරුවන් බලාගෙන සිටිනවා, මෙහාට අමුද්‍රව්‍ය ගෙනැල්ලා තමන්ගේ නිෂ්පාදනයන් කරලා, ඒවා අපනයනය කරලා මාසයකින් සල්ලි ටික ලබාගන්න. දැන් මේ තත්ත්වය පෙනෙනවා, අගෝස්තු මාසයේ. ඉදිරිපත් කර තිබෙන දත්ත අනුව, එක් පැත්තකින් අපේ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.6කට වැඩි වෙනවා. නමුත්, ඒ තුළ අපේ ඇඟලුම් කර්මාන්තය සියයට 6කින් විතර අඩුවෙලා තිබුණා. මේකට හේතුව තමයි ඩොනල්ඩ් ට්‍රම්ප් එක්ක තිබෙන තීරු බදු ප්‍රශ්නය, අඩුවෙලා තිබෙන එකේ ප්‍රතිවිපාකය. ඉතින්, මේ සම්බන්ධයෙන් අපි ඉදිරියට කටයුතු කරන්න අවශ්‍යයි. මොකද, බිලියන 5ක් විතර හොයන මේ කර්මාන්තය වැඩිදියුණු කරන්න අවශ්‍යයි. එක් පැත්තකින් ඇමෙරිකාව තීරු බදු පැනවීමේදී ඉන්දියාවට සියයට 50ක් වෙනකොට, අපට සියයට 30ක් දී තිබෙනවා. නමුත්, ඒක අපට තෘප්තිමත් මදි. අපි මේක තව වැඩිදියුණු කරන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව මිනිත්තු 5ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මිනිත්තු දෙකයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැබැයි, ඔබතුමිය මූලාසනයේ සිටිද්දී අපට ලෙහෙසියි. මොකද, විපක්ෂයටත් ඉතා සාධාරණව සලකන්න අවශ්‍ය නිසා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව මිනිත්තු දෙකයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින්, මේ අවස්ථාවේ අපි එංගලන්තය එක්ක අපේ වෙළෙඳ ගිවිසුම ඇති කරලා නිදහස් වෙළෙඳ කලාප තුළින් පුළුවන් තරම් අපනයනය කරන්න අවශ්‍යයි. එක් පැත්තකින් දොර වහනකොට අනෙක් පැත්තෙන් අපි අලුත් markets ටික බලාගන්න ඕනෑ. මේක තමයි free trade agreementsවල තිබෙන වටිනාකම. දැන් මේ ඇඟලුම් කර්මාන්තය තුළ තිබෙන සියයට 6.6ක අඩුවීම ඉතාම භයානක තත්ත්වයක්. මේක අපි පුළුවන් තරම් ඉක්මනට හදාගන්න අවශ්‍යයි. නැත්නම් අපට ඉදිරියට ලොකු ප්‍රතිවිපාකයක් ඇති වෙනවා.

ඊළඟට අපි BOI එක ගැන බලමු. මම මේ අපනයනය පැත්ත පෙන්වන්න හදන්නේ. මොකද, අපනයනය අත්‍යවශ්‍ය දෙයක්. මම හිතන විධියට, මේ ආයතනය 2023/2024 වාර්ෂික ගිණුම් තවම දීලා නැහැ. මේක තමයි ඒ ආයතනය තුළ තිබෙන දක්ෂතාව. මොකද, ඒගොල්ලන්ට 2023/2024ට අදාළව පාර්ලිමේන්තුවට ගිණුම් දෙන්න බැරි නම් ඒක ප්‍රශ්නයක් වෙනවා. අපනයන කරන ස්වරූපය අපි පුළුවන් තරම් ලෙහෙසි කරන්න අවශ්‍යයි. මම දන්නවා එය ලෙහෙසි කාර්යභාරයක් නොවෙයි කියන එක. එතැන හොඳ සභාපති කෙනෙක් ඉන්නවා, මා සමඟ එකම පන්තියේ හිටපු අර්ජුන හේරත් මැතිතුමා. නමුත්, ඒ තුළ රජයේ සිටින ඒ වැඩ කරන කට්ටිය මීට වැඩිය පෞද්ගලික අංශය දෙස බලා වැඩ කරන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම තව මිනිත්තුවයි ගන්නේ.

මීට පෙර අපේ කම්කරු ඇමති සහ වැඩබලන මුදල් ඇමතිතුමා කථා කරන අවස්ථාවේදී මම ඉල්ලුවා, කරුණාකර කියන්න කියලා SMEsවලට සාධාරණ පොලී අනුපාතයක් දෙන්න පුළුවන් වන්නේ කොහොමද කියලා. ඒ වාගේම,

අපනයනකරුවන්ට ලබා දී තිබෙන Simplified Value Added Tax - SVAT - එක ලබන මස 01වැනි දා සිට අහෝසි වෙනවා. අපනයනකරුවන්ට දවස් 45කින් මේක ලබා දෙන්න පුළුවන් තත්ත්වයක් අපි ඇති කරන්නේ කොහොමද? මොකද, අපනයනකරුවන්ට බියක් තිබෙනවා, මේක ලැබෙන්නේ නැහැයි කියලා. ලැබෙන්නේ නැති වුණාම ඒගොල්ලන්ට cash flow problem එකක් ඇති වෙනවා. ඒ නිසා ඒගොල්ලන්ගේ අපනයන කටයුතුවලට ලොකු බාධාවක් ඇති වෙනවා. මගේ කථාවට කාලය හරස් වෙලා තිබෙන නිසා මම එක දෙයයි ඉල්ලන්නේ.

දැන් IMF එකේ මූල්‍ය ප්‍රතිසංස්කරණවලට අනුව Port City එකේ ආයෝජනය කරන්න බදු නිදහස් කිරීම් ලබා ගන්න පුළුවන්. මේක අපි සටන් කරලා, කෑ ගහලා ලබාගෙන තිබෙන හොඳ දෙයක්. නමුත්, මේක Port City එකෙන් අනෙක් පැතිවලටත් ගෙනැල්ලා, ඒ කියන්නේ නිදහස් වෙළෙඳ කලාපවලටත් ගෙනැල්ලා පුළුවන් තරම් අපනයන දිරිමත් කරන්න කටයුතු කරන එක තමයි අත්‍යවශ්‍ය වන්නේ. අපේ ආර්ථිකය ගැන කථා කරනකොට අපි ඒක වර්ණ ගන්වන්න ඕනෑ නැහැ. අපට අවශ්‍ය වන්නේ ආර්ථිකය පාට කිරීම නොවෙයි. පක්ෂ පාට භේදයකින් තොරව අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න අපි හැම දෙනාම වැඩ කරන්න ඕනෑය කියලා තමයි මම මතක් කරන්නේ. අපි මෙවැනි ප්‍රතිපත්ති පුළුවන් තරම් ඉක්මනින් ගෙනැල්ලා, මේ දේවල් දිරිමත් කරලා කටයුතු කරන්න ඕනෑය කියන එක මම මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් වැදගත් සාකච්ඡාවක් සිද්ධ වන මේ මොහොතේ මා කැමැතියි, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ - UN General Assembly එකේ - 80වැනි සැසිවාරය අමතා ගරු ජනාධිපතිතුමා කළ කථාවේ අවස්ථා කිහිපයක් උපුටා දක්වමින් මගේ කථාවට ප්‍රවේශ වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රට පිළිබඳව පසුගිය කාලපරිච්ඡේදය පුරා අඳුරු චිත්‍රයක් තමයි ලෝකය හමුවේ මවලා තිබුණේ. මා හිතන විධියට, ඒ අඳුරේ ප්‍රතිඵල තමයි මෑත කාලීනව අපි විඳිමින් සිටින්නේ. එම නිසා තමයි ජනාධිපතිතුමා මේ සැසිවාරය අමතමින් අපේ සංචාරක කර්මාන්තය සම්බන්ධවත්, අපි රටක් විධියට ඉදිරියට යෑම සම්බන්ධවත්, අපේ රට පිළිබඳ චිත්‍රය ලෝකය හමුවේ නැවත වර්ණ ගැන්වීමක් සිදු කළේ. ඒ නිසා තමයි මගේ කථාව ආරම්භ කිරීම සඳහා ඒ කථාවෙන් මා අවස්ථා කිහිපයක් උපුටා දක්වන්නේ. එතුමා කියනවා, "නැති බැරිකම, දුප්පත්කම නිසා අධ්‍යාපන අයිතිය උල්ලංඝනය වන ලක්ෂ සංඛ්‍යාත දරුවන් ලොව පුරා සිටිනවා. අධ්‍යාපනය සඳහා කරන ආයෝජනය ලෝකයේ ප්‍රගතිය උදෙසා කරන ආයෝජනයක් ලෙස අපි සලකනවා" කියලා. ඒක අපේ රටේ අනාගත දැක්ම පිළිබඳව එතුමාගේ දැක්ම සහ පැහැදිලි කිරීම. ඒ වාගේම එතුමා කියනවා, "මේ අසිරිමත් ග්‍රහලෝකය අස්ථාවරත්වයටත්, ව්‍යාකුලත්වයටත් පත් වන නවතම ගැටලුවක් ලෙස මත්ද්‍රව්‍ය සමඟ බැඳුණු සංවිධානාත්මක අපරාධ කල්ලි හඳුනා ගන්නට පුළුවන්කම තිබෙනවා. මේ උවදුර පිටුදැකීමේ ලෝක න්‍යාය පත්‍රය සක්‍රිය කිරීමට මා ඔබට ගෞරවයෙන් ආරාධනා කරනවා. දූෂණයට එරෙහි සටන භයානකයි. නමුත්, දූෂණයට එරෙහිව සටන් නොකිරීම ඊටත් වඩා භයානකයි. දූෂණයට එරෙහි සටන සෑම රටකම සංස්කෘතියේ කොටසක් බවට පත් විය යුතුයි" කියලා. එතුමාගේ ඒ කථාව මා කලින් කිව්ව විධියට අපේ රට පිළිබඳව වූ අඳුරු කළ චිත්‍රය වර්ණ ගන්වන අවස්ථාවක්. ඒ වාගේම ජනාධිපතිතුමා කියනවා, "මහජන නියෝජිතයන් යනු, මහජනතාව වෙනුවෙන් සේවය කරන්නන් මිස, අනිසි වරප්‍රසාද ලබන්නන් නොවන බවට අපි ආදර්ශයක් ලබා දී තිබෙනවා" කියලා. අපේ ආණ්ඩුවේ භාවිතාව පිළිබඳව ලෝකය හමුවේ එතුමා එසේ පැහැදිලි කරනවා. ඒ වාගේම, " 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' මල්ඵල ගැන්වීම සඳහා දූෂණයෙන් තොර සදාචාරාත්මක පාලනය, දුප්පත්කම තුරන් කිරීම, ඩිජිටල්කරණය සහ පිරිසිදු රටක් යන ප්‍රධාන අංශ කෙරෙහි අපි අවධානය යොමු කර තිබෙනවා" කියන එකත් එතුමා පැහැදිලි කර සිටියා. අපේ රටේ දියුණුව පිළිබඳව, සංවර්ධනය පිළිබඳව, අපි ආණ්ඩුවක් විධියට සැලසුම් කරලා ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ අරගෙන යන මේ ගමන පිළිබඳවත් එතුමා ලෝකය හමුවේ පැහැදිලි කළා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ කථාවේදී ඉතා ප්‍රබල තවත් අදහසක් මතු කෙරෙනවා. මීට පෙරත් අපේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් මේ අදහස උපුටා දැක්වූවා. නමුත් ඒක ගැටලුවක් නැහැ; මා නැවතත් එම අදහස උපුටා දක්වන්නම්. "අප තබන පළමු පියවර අසීරු විය හැකියි. නමුත්, අපි නිර්භීතව තබන පියවර නිවැරදි නම් එම පියවර පිටුපස තව පියවර දහස් ගණනක් අප සමඟ එයි" මේ තමයි එතුමාගේ කථාව ඇතුළේ තිබුණු සාරාර්ථයන්.

සමස්තයක් විධියට ගත්තොත්, ලාංකීය දේශය ඇතුළේ ශිෂ්ටසම්පන්න මානව සමාජයක් ගොඩනඟන්නේ කොහොමද, දුප්පත්කමට හා දූෂණයට එරෙහිව හඬක් නඟන්නේ කොහොමද, ලෝක සාමය හා යුධ විරෝධය ගොඩනඟන්නේ කොහොමද, පලස්තීන නිදහස පිළිබඳව අවධානය යොමු කරන්නේ කොහොමද, රටක් විධියට මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහි සටන ඉදිරියට ගෙන යන ආකාරය, අධ්‍යාපනය හා සෞඛ්‍ය තුළ ඇති වටිනාකම, ආත්මාර්ථකාමීත්වය වෙනුවට පරාර්ථකාමීත්වය ආදේශ කිරීමේ වැදගත්කම පිළිබඳව UN General Assembly එකේදී අපේ ජනාධිපතිතුමා පැහැදිලි කළා.

මා මේ ප්‍රවේශය ගත්තේ මේ නිසායි. අප අද දවසේ සාකච්ඡාවට ලක් කරන්නේ සංචාරක ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් ඇති කිරීමට අත්‍යවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ කුඩා ප්‍රමාණයේ බස් රථ 250ක් හා වෑන් රථ 750ක් ගෙන ඒම සඳහා අති විශේෂ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි කීපයක් පිළිබඳවයි. අපි සංචාරක කර්මාන්තයෙන් රටක් විධියට ඉදිරියට යාමට අවශ්‍ය යහපත් පියවරක්, ප්‍රබල පියවරක් මෙතැනදී අරගෙන තිබෙනවා.

දැනට ක්‍රියාත්මක වන සංචාරක ක්ෂේත්‍ර ගත්තොත්, සංස්කෘතික හා උරුම සංචාරක කර්මාන්තය, ස්වාභාවික හා වනජීවී සංචාරක කර්මාන්තය, වෙරළබඩ සංචාරක ව්‍යාපාරය, ක්‍රීඩා හා සුවතා සංචාරක කර්මාන්තය, ආගමික හා වන්දනා සංචාරක කර්මාන්තය, සූපවේදී සංචාරක කර්මාන්තය ආදී වශයෙන් සඳහන් කරන්න පුළුවන්. සංචාරක කර්මාන්තයට අදාළ විවිධ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති අවුරුදු ගණනාවක් තිස්සේ අපි ක්‍රියාවට නඟනවා. ආණ්ඩුවක් විධියට -රජයක් විධියට- අපි මේ සංචාරක ව්‍යාපාරය නවතම හැරවුම් ලක්ෂ්‍ය ඔස්සේ ගමන් කරවමින් මේ රටේ ජාතික ආර්ථිකය නඟාසිටුවීමට උත්සාහ කරන මොහොතකයි ඉන්නේ. ඒ නිසා රටක් විධියට සතුටු වෙන්න පුළුවන් අවස්ථාවක අපි ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

විශේෂයෙන් අපි උත්සාහ කරනවා, පරිසර සංචාරක ව්‍යාපාරය - ecotourism - කියන සංචාරක කර්මාන්තයට සම්බන්ධ නවතම ක්‍රමවේද හඳුන්වා දෙන්න. මේක යම් ප්‍රමාණයකින් අපේ රටේත්, ලෝකයේත් භාවිත වන ක්‍රමවේදයක්. වැඩිපුර අවධානයක් යොමු කරනකොට අපට පැහැදිලි වෙනවා, ලංකාවේ පිහිටීම, ලංකාවේ භූගෝලීය පරිසරය, ස්වාභාවික තත්ත්ව සලකා බලනකොට පරිසර සංචාරක ව්‍යාපාරය කියන්නේ අපට වඩාත් හොඳින් උපයෝගී කර ගන්න පුළුවන් සංචාරක ව්‍යාපාරයක් බව. කෘෂි සංචාරක ව්‍යාපාරය - agritourism - ගත්තත් ඒ වාගෙයි. මෙන්න මේ වාගේ නවතම ක්‍රමවේද සංචාරක කර්මාන්තයට එකතු කරනකොට කුඩා ප්‍රමාණයේ වෑන් රථ 750කුත්, කුඩා බස් රථ 250කුත් ගෙන ඒම සඳහා වන රෙගුලාසි කීපය පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාව වඩා වැදගත් වෙනවා. මොකද, අපේ රට භෞමික විවිධත්වයෙන් අනූන රටක්. ඒ නිසා සංචාරක ගමනාන්ත වෙත ගමන් කරන්න නම් සංචරණය සඳහා අවශ්‍ය පහසුකම් තිබිය යුතු වෙනවා. සංචාරකයන් මේ රටට ආවාම ecotourism වාගේ ක්ෂේත්‍රවලට කඳු, ගිරි ශිඛර, වන දුර්ග, ජල දුර්ග ආදී ප්‍රදේශවල ගමන් කිරීමට හැකි වන ආකාරයේ සංචරණයට සුදුසු වාහන පහසුකම්, මාර්ග පහසුකම්, මිලදී ගැනීමේ පහසුකම්, ආහාර පහසුකම් මේ ආදී සියල්ල සම්පාදනය කළ යුතු වෙනවා. ඒ නිසා කර්මාන්තයක් විධියට, ව්‍යාපාරයක් විධියට සංචාරක කර්මාන්තයේ තිබෙන ව්‍යවසායකත්ව ලක්ෂණ වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරනකොට මෙන්න මේ පහසුකම් සැලසීමේදී මෙවැනි තීන්දු තීරණ අපිට ගන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපි අද තබන මේ පියවරෙන් බලාපොරොත්තු වන්නේ මේ රට සංචාරක ක්ෂේත්‍රයෙන් ඉහළ තැනකට ගෙන එන්නයි. මොකද, ආර්ථිකමය වශයෙන් බිඳ වැටිලා තිබුණු රටක් භාර අරගෙන මේ යන ගමනේදී මේ රට ඉක්මනින් දියුණු කිරීම සඳහා ගත හැකි හොඳ සංවර්ධන පියවරක් විධියට අපි මේ සංචාරක ව්‍යාපාරය හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරයෙන් මේ රට ඉස්සරහට ගෙනයන්නයි අපි මේ සැලසුම් සකස් කරමින්, ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගනිමින් කටයුතු කරමින් සිටින්නේ. ඒ සම්බන්ධයෙන් තමයි අපි අද මේ අදහස් ප්‍රකාශ කළේ. ඒ සඳහා අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.42]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සංචාරක කර්මාන්තය ගැන සාකච්ඡා වන නිසා මා පළමුව මේ කාරණය කියන්නට ඕනෑ. මම 2025.05.30වැනි දා අපේ විෂය භාර ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කළා, ප්‍රශ්න කිහිපයක්. අදටත් ඒවාට උත්තර නැහැ කියන කාරණය මම නැවත මතක් කරන්නට ඕනෑ. මොකද, මේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු එහෙන් මෙහෙන් කථා කරනවා. මම ඒ ගැන බොහොම කනගාටු වෙනවා. සංචාරක කර්මාන්තය කියන්නේ, ඉතාම පුළුල් විෂයක්. ඒ වාගේම, ගෝලීය තරගකාරී ක්ෂේත්‍රයක්. මේක ගැන මතුපිටින් බලලා කථා කරනවා. නමුත් මෙහි ව්‍යුහාත්මක වෙනස්කම් සිද්ධ වෙන්නට ඕනෑ. ඒ කිසිම දෙයක් අද සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් සිද්ධ වෙන්නේ නැහැ. මම අහපු ප්‍රශ්න අතර තිබෙන එක ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මේක. විදේශ කටයුතු ඇමතිතුමා තමයි, සංචාරක ඇමතිතුමා වශයෙනුත් කටයුතු කරන්නේ. ඒ නිසා මම හිතන්නේ එතුමාට වෙලාවක් නැහැ, ඒ වෙනුවෙන් නිසි උපාය මාර්ගික වැඩ පිළිවෙළක් ගැන හිතන්නවත්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කාරණයත් මම කියන්නම්. ජනාධිපතිතුමා බලයට පත් වෙලා වසරක් සම්පූර්ණ වුණා. මට හිතාගන්නත් බැහැ, එසේ වසරක් සම්පූර්ණ වීම සම්බන්ධයෙන් කිසිම උත්සවයක්වත්, මොකුත් පැවැත්වූවේ නැහැ. ඒක එහෙම වුණේ ඇයි කියලා හොඳට හොයලා බැලුවොත්, මේ ගත වූ අවුරුද්ද තුළ ලංකාවේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය දියුණු වෙලාද? දැන් මට කියන්න එපා, මම තමයි මේ ආණ්ඩුව ගේන්න මහන්සි වුණේ කියලා. ඒකට මහන්සි වෙච්ච මිනිස්සු, විශේෂයෙන්ම ලංකාවේ දුප්පත් මිනිස්සු, නිර්ධන පාන්තිකයන් විප්ලවීය තීරණයක් අරගෙන තමයි මේ වාගේ අයට ආණ්ඩුවක් දුන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එවැනි අයට ජනතාව ආණ්ඩුව භාර දෙනකොට තිබුණු අන්න ඒ බලාපොරොත්තුවට සාපේක්ෂවයි අපි මේ කථා කරන්නේ. අපි ආර්ථික ප්‍රගතියක් ගැන කථා කළා. එහෙන් මෙහෙන් ඒ ගැන සඳහන් වෙනවා. ඒ ආර්ථික ප්‍රගතියට අදාළ දත්ත මම කියන්න යන්නේ නැහැ. ඒ දත්ත වැඩකුත් නැහැ. මොකද, ඒ දත්ත හරියට විග්‍රහ කළොත් ඇත්තටම ඒකේ තිබෙන්නේත් ලොකු හිස් බවක්.

දැන් අපි ගමින් ගමට යනවා. මමත් දැන් ලංකාව පුරා යනවා. දුප්පත් මනුස්සයා තවත් දුප්පත් වෙලා. ඒ මනුස්සයාට බදු පිට බදු ගහලා තමයි දැන් ජනාධිපතිතුමා ආඩම්බරයෙන් කථා කරන ඉලක්කය ඉක්මවා ගියපු ආදායම අරගෙන තිබෙන්නේ. මේ අවුරුද්දේ ආර්ථික ප්‍රගතියක් කොහේද ලබාගෙන තිබෙන්නේ? ඒ ආර්ථික ප්‍රගතිය ලබා ගන්න මොනවාද කරපු දේවල්? ඇත්තටම මම මේක කුහක අර්ථයෙන් කියනවා නොවෙයි. කිසිම උපාය මාර්ගික නිශ්චිත වැඩ පිළිවෙළක් කරලා නැහැ. ඒ වාගේම, සාමාජීය පැත්තෙන් ගත්තොත්, අද සමාජය ඉතාම දැඩි පීඩනයකින් ඉන්නේ ආර්ථික පීඩනයට අමතරව. මේ සමාජ පීඩනය එන්නට හේතුව මෙයයි. විශේෂයෙන්ම රජයේ මේ මර්දනකාරී ප්‍රවේශය තුළ මේ ජනතාව පීඩනයෙන් හෙම්බත් වෙලා බලාගෙන ඉන්නවා, මොකක්ද මේ කරන්නේ කියලා. ව්‍යවස්ථාපිත බලය භාවිත කිරීම කියන එක ගත්තොත්, නිකම් තිබෙන ආයතන පාවිච්චි කරලා තමයි මේක කරන්නේ. විශේෂයෙන්ම මේ රටේ තිබුණු කීර්තිමත් අධිකරණ පද්ධතිය මේ වෙනුවෙන් භාවිත කරනවා. ඔබතුමන්ලාට පේනවා ඇති, දැන් විනිසුරුවරුන් මාරු කරන ආකාරය. පොලීසියේ ඉන්න නිලධාරින් එහෙට දානවා, මෙහෙට දානවා.

දැන් මේ කුඩු කන්ටේනර් හුටපටය ගනිමු. ඒ කුඩු කන්ටේනර් ගැන කථා කරනකොට එතුමන්ලාට අමතක වෙලා තමන් ඉන්නේ ආණ්ඩුවේ කියලා. ඒක උත්කර්ෂවත්ව සමරන්න හදනවා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? වෙනදාටත් වැඩිය සමාජයේ කුඩු අහු වෙනවා. සමාජ යථාර්ථයට පිටින් ගිහිල්ලා, ලස්සන වචන කථා කරන එක මම හිතන විධියට සාධාරණ නැහැ. අහිංසක මිනිසුන් මේ ආණ්ඩුව කෙරෙහි තැබූ බලාපොරොත්තු ඉටු කරන්න. මම තැබූ බලාපොරොත්තුව නොවෙයි. මම බලාපොරොත්තුවක් තැබුවේ නැහැ. නමුත් මේ ආණ්ඩුව ගැන බලාපොරොත්තුවක් තැබූ මිනිසුන් ගැන හිතන්න ඕනෑ.

ඊළඟට, සංස්කෘතික විනාශය ගනිමු. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ රටේ දිගින් දිගටම සිදු වන සංස්කෘතික විනාශය ගැන බලන්න. ඒ විනාශය කෙතරම් දුරට බලවත්ව තිබෙනවාද කියනවා නම්, දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධනයක් ගෙනෙනවා. අපේ රටේ දීර්ඝ කාලයක සිට

තිබෙන්නේ දාරක ස්නේහය මත ගොඩනැඟුණු සමාජයක්. දෙමාපියන් දරුවන්ට තරවටු කරන්නේ, ගුරුවරුන් දරුවන්ට තරවටු කරන්නේ, දරුවන්ගේ විනය පවත්වාගෙන යෑමට උත්සාහ කරන්නේ, අපේ සභ්‍යත්වය මත ඉඳගෙන. අපිත් ගුටි කාලා, දඬුවම් ලබලා, නිවැරදි වුණු, නිදහස් අධ්‍යාපනය ලැබූ දරුවෝ. මේක හරියට මහා විනාශයක් වාගේ තමයි කථා කළේ. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා කිව්වා වාගේ NGO නඩයකින් කියපු මොකක් හෝ අනුව පනතක් ගෙනැල්ලා, තමන්ට තුනෙන් දෙකේ බලය තිබෙනවා කියලා සම්මත කරන්න හදනවා. ගුරුවරුන් සහ ගුරුවරියන් අපේ අම්මලා, තාත්තලා වාගේ. ඒගොල්ලන් අපරාධකාරයෝද? මෙවැනි අපරාධ නීති ගෙනෙන්නේ ඒගොල්ලන් අපරාධකාරයෝද? එතකොට ඉස්කෝලයක් කරගෙන යන්න පුළුවන්ද? ළමයෙක් විනයගරුකව හසුරුවන්නට පුළුවන් වෙයිද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එක උදාහරණයක් විතරක් කියන්නම්, මේ විනාශයේ තරම පෙන්වන්නට පමණක්.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පතේ 4. (4) උපවගන්තිය යටතේ නිදර්ශන වගයක් දක්වා තිබෙනවා. එහි (ඇ) යටතේ මෙසේ සඳහන් වනවා:

> "ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු වන "ඒ" විසින් "බී" නමැති ළමයකු තවත් ළමයකුගේ දෙයක් සොරකම් කර ඇති ලෙස විශ්වාස කර "බී" පාසල් රැස්වීම් වේදිකාවට කැඳවා පාසල් ශිෂ්‍ය සමූහය ඉදිරිපිට දී "බී" සොරකු ලෙස ප්‍රකාශ කරමින් "බී" ට අවමන් කරයි. "ඒ" විසින් ශාරීරික දඬුවම් කිරීමේ වරද සිදුකර ඇත."

මෙහි තිබෙනවා,"...ශාරීරික දඬුවම් කිරීමේ වරද කර ඇත." කියලා. මෙහෙම සමාජයක්ද අපට තිබෙන්නේ? දැන් ඔබේ රජය විසින් එහෙම සමාජයක් ඇති කරලාද? මේ ආණ්ඩුව විසින් ඇති කරලා තිබෙන්නේ ඒ වාගේ සමාජයක්ද?

ඊයේ ගුරුවරු සමාජ මාධ්‍යවල දාලා තිබෙනවා මම දැක්කා, "දැන් ඉල්ලා අස් වන කාලය ඇවිල්ලා" කියලා. මොකක්ද හේතුව? මේ පනත අනුව ඒ අයව උසාවි ගෙනිහිල්ලා හිරේ දාන්න පුළුවන්. දැන් ළමයෙකුගේ ඇඳුම පැලඳුම, කොණ්ඩය ගැන කථා කළොත් මේ පනතට අනුව හිරේ. මෙන්න මේ ගැටලුව අද ප්‍රබල විධියට තිබෙනවා. අපේ සභ්‍යත්වය තුළ තිබෙන අපේ ආගමික බලපෑමට, ඒ විශ්වාසයන්ට එරෙහිව කටයුතු කරමින්, පිටින් කාරණා ගෙනැල්ලා ඔබ්බවන්න හදනවා. ඒ ගැන බොහොම කනගාටුයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි ඔක්කෝම මේ රටේ අහිංසක මිනිසුන් ගෙවපු බදු මුදල්වලින් ඉගෙන ගත්ත අය. ඔබතුමියත් ඇතුළුව අපි ඔක්කෝම මේ තත්ත්වයට ආවේ මේ රටේ අහිංසක මිනිසුන් අල ගෙඩියට, ලූනු ගෙඩියට ගෙවපු බදු මුදල්වලින් ඉගෙන ගෙන. අපව මේ තැනට ගෙනෙන්න රුපියල් මිලියන ගණනක් බදු මුදල් ආයෝජනය කරලා තිබෙනවා. අපට සානුකම්පාවක් නැද්ද ඒ අහිංසක, දුප්පත් මිනිසුන් ගැන?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අද කියන්න තිබෙන වැදගත්ම කාරණය මෙයයි. මට මේ ආණ්ඩුවට කියන්න තිබෙන්නේ ඔබගේ ආණ්ඩුව ඔබට අයිතිද කියලා හොඳට හෘදය සාක්ෂියට එකඟව කල්පනා කරලා බලන්න කියන එකයි. ඔබ මේ කරන දේවල් ගැන පොඩ්ඩක් වාඩි වෙලා කල්පනා කරන්න, මේ ඔබ අද කරන්නේ කාගේ කොන්ත්‍රාත්තුවක්ද කියලා. මේ රටේ නිර්ධන පන්තිය බලාපොරොත්තුවක් තැබූ ඔබ ඉෂ්ට කරන්නේ ඒ නිර්ධන පන්තියේ අපේක්ෂාවද, ඒ දුප්පත් මිනිසුන්ගේ අපේක්ෂාවද කියලා කල්පනා කරලා බලන්න. ඒක, එකක්.

දෙවනුව, ගෝලීය වශයෙන්, භූ දේශපාලනික වශයෙන් ඔබ කාගේ කොන්ත්‍රාත්තුවද ඉටු කරන්නේ? මම කනගාටු වනවා, ගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80වන සැසිවාරයේදී කළ කථාව ගැන. ඒ කරපු කථාවේ අන්තර්ගතය අරගෙන බලන්න. ඒ අන්තර්ගතය තුළ කොහේද තිබෙන්නේ, ශ්‍රේෂ්ඨ සභ්‍යත්වයක බිහි වූ මේ රටේ ඒ පෞරුෂය ගැන, අපට යන්නට තිබෙන ඒ ගමනේ විභවතාව ගැන? ඒ ගැන කොහේද තිබෙන්නේ? අපි බොහොම ළාමක විධියට මේගොල්ලන් ඉස්සරහට ගිහිල්ලා දෙකට නැමිලා කථා කරනවා. ඒ කථාවේ අන්තර්ගතය ගැන බලන්න. ඒ නිසා මම ආරාධනා කර සිටිනවා මේ ආණ්ඩුවට කල්පනා කර බලන්න කියලා. මෙවැනි අතකොළුවක් වුණු ආණ්ඩුවක් ඉතිහාසයේවත් බිහි වෙලා නැහැ. ඔවුනුත් දන්නේ නැහැ. ඔවුන් කවුරු වෙනුවෙන්ද වැඩ කරන්නේ කියලා. අපේ ආර්ථිකය ගොඩනඟනවා යැයි කිව්වාට, අපි ගොඩනඟන්නේ අපේ ආර්ථිකය නොවෙයි. අපි පිට රට ආර්ථිකයන් ගොඩනඟන්නට මේ රටේ දුප්පත් මිනිහාගේ අන්තිම සතයත් හූරා ගෙන කාලා, වෙලාවට පොලිය ගෙව්ව පලියට මේ රට ගොඩ යන්නේ නැහැ. මේ රටේ අහිංසක මිනිස්සු බලාපොරොත්තු වුණු යම් අපේක්ෂාවක් තිබුණා නම්, ඒක ඉෂ්ට කරන්න ඕනෑ නම් තමන්ට තිබෙන්නට ඕනෑ තමන් කරන මේ ආණ්ඩුව ගැන,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩියක් දෙන්න.

මෙන්න මේ ස්වයං පාපෝච්චාරණය කරන්න මොහොතක් ඔබ ගන්න. ඔබ මේ රටේ මිනිස්සුන්ගේ ධනයෙන්, බදු මුදලින්, නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන මෙතැනට ආපු මිනිස්සු නම්, තමන්ට හදවතක් තිබෙනවා නම්, සහකම්පනයක් තිබෙනවා නම් කල්පනා කරලා බලන්න ඔබ මේ දැන් කරගෙන යන වැඩේ හරිද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කියන්න තිබෙන්නේ එපමණයි. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.52]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දිනයේ සංචාරක කර්මාන්තය ඉලක්ක කරගෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ශක්තිමත් කිරීම සඳහා කෙරෙන විවාදය ඇතුළේ ඒ ගැන කථා කරන්නට පෙර යම් අදහස් කිහිපයක් මේ ගරු සභාව ඉදිරියේ තබන්න ඕනෑය කියා මට හිතෙනවා. ඇත්තටම ජාතික ජන බලවේගයේ අපි මොකක්ද මේ කරමින් ඉන්නේ කියන එක විපක්ෂයට තේරුම් ගන්න බැරි බවක් නොවෙයි මේ හඟවමින් ඉන්නේ. මොකද, අද විපක්ෂයට තවමත් තමන්ගේ හෘදය සාක්ෂියේ හඬට සවන්දීමට බැරි බව තමයි මේ දසවන පාර්ලිමේන්තුව ඇතුළේ ගෙවී ගිය කාල පරිච්ඡේදයේ අපිට පෙන්නුම් කරමින් තිබුණේ. මොකද, ජාතික ජන බලවේගය විධියට අපි හොඳටම ඉතිහාසයේ පාඩම් උකහා ගෙන වර්තමානය ජයග්‍රහණය දක්වා මෙහෙයවීම අපේ වගකීම බව මනාව තේරුම්

[ගරු දේවානන්ද සුරවීර මහතා]

අරගෙන ඉන්න පක්ෂයක්. ඒ වාගේම දැක්මක්, අරමුණක් සහිතව යන ගමනක්. ඒ නිසා අපි ඒ වර්තමානය ජයග්‍රහණය කරා මෙහෙයවන එක බොහොම හොඳට කරමින් ඉන්නවා, ඉතිහාසයේ පාඩම් උකහා ගනිමින්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි හොඳාකාරවම දන්නවා, අපිට ලැබුණේ; ජාතික ජන බලවේගය ආණ්ඩුවට ලැබුණේ මොන වාගේ රටක්ද කියන එක. අපිට ලැබුණේ බංකොලොත් රාජ්‍යයක්. ණය බරින් ගොඩ එන්න බැරි රාජ්‍යයක්. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ උත්තරීතර සභාවේ ඒ වරප්‍රසාදවලට යට වෙලා මේ රටේ මත්කුඩු, මත්ද්‍රව්‍ය ඒ වාගේම අපරාධ රාජ්‍යයක් ගොඩනඟන්න උත්සාහ කළේ රාජපක්ෂවරු. මතක තියා ගන්න. මේ රට අපරාධ රාජ්‍යයක් බවට පත් කළේ රාජපක්ෂවරු. මිද්දෙනියේ කජ්ජලා නිර්මාණය කළේ රාජපක්ෂවරු. කෙහෙල්බද්දර පද්මෙලා නිර්මාණය කළේ රාජපක්ෂවරු. බැකෝ සමන්ලා ගොඩනැඟුවේ රාජපක්ෂවරුන්ගේ දේශපාලනය. මේ රට කුඩු ඇතුළු මත්ද්‍රව්‍යවලින්, ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට හසු වෙච්ච රාජ්‍යයක් බවට පත් කළේ රාජපක්ෂවරු. එහෙම රාජ්‍යයක් තමයි තිබුණේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දැන් මීට පෙර කථා කළ මන්ත්‍රීවරයා අධ්‍යාපනය ගැන කියමින් කිඹුල් කඳුළු හෙළුවා. අද පාසලට මත්ද්‍රව්‍ය ගිහිල්ලා. අද පාසල්වල ළමයින් මත්ද්‍රව්‍ය බෙදා හරින්න උපයෝගී කරගන්නවා. කොළඹ දිස්ත්‍රික්කයේ එවැනි පාසල් ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපි මේ වෙනස් කරන්න යන්නේ එසේ මෙසේ රාජ්‍යයක් නොවෙයි. බංකොලොත් වෙච්ච රාජ්‍යයක් මේ වෙනස් කරන්න යන්නේ. ඒ ගමන යනකොට ඒක දරාගන්න බැරි විපක්ෂය විවිධ මතවාද, මඩ, අවලාද නඟමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මිනිස් ජීවිතවලට වටිනාකමක් නැති සමාජයක් මෙගොල්ලන් හැදුවේ. කල්පනා කරලා බලන්න. ඒ වාගේම නීතිය බිඳ වැටුණු රාජ්‍යයක් නිර්මාණය කරලා තිබුණේ. අපි බලයට ඇවිත් මේ වසර ඇතුළත, ගෙවී ගිය වසර ඇතුළත මොනවාද කරලා තිබෙන්නේ? උදේත් කථා කළ ජාතික ජන බලවේගයේ අපේ මන්ත්‍රීවරු, නියෝජ්‍ය ඇමතිවරු, ඇමතිවරු මේක සංඛ්‍යාලේඛන ඇතුළේ ඔප්පු කළා. අපි රාජ්‍ය ආදායම වැඩි කරලා තිබෙනවා. මත්ද්‍රව්‍ය උවදුර නැති කිරීමට, අපරාධ රාජ්‍යය ශිෂ්ට රාජ්‍යයක් බවට පත් කිරීමට අපි දැවැන්ත වැඩකටයුත්තක් කරමින් ඉන්නවා. එහෙම නැහැ කියලා කිසිම කෙනෙකුට කටක් ඇරලා කියන්න බැහැ, මෙතැන මොන බයිලා ගැහුවත්. අපේ විදේශ සංචිත වැඩි වෙලා තිබෙනවා. සමාජ සුබසාධන කටයුතු වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සමාජ සුබසාධනය මෙගොල්ලන්ට අමතකයි.

රාජ්‍ය සේවකයාගේ අවම මූලික වැටුප තිබුණේ රුපියල් 24,250ට. අපි ඇවිත් ඒක රුපියල් 40,000ක් කරලා තිබෙනවා. ඒක අපරාධයක්ද? ඒ වාගේම රුපියල් 3,000කින් විශ්‍රාම වැටුප වැඩි කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ අවම මූලික වැටුප රුපියල් 21,000 සිට රුපියල් 27,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ආපදා ණය මුදල වැඩි කරලා තිබෙනවා. පහ වසර ශිෂ්‍යත්ව ශිෂ්‍යාධාර මුදල රුපියල් 1,500 දක්වා වැඩි කරලා තිබෙනවා. මහපොළ ශිෂ්‍යත්ව දීමනාව වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම පාසල් ලිපිද්‍රව්‍ය, පොත් පත් මිලදී ගැනීමට රුපියල් 6,000ක දීමනාවක් ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අස්වැසුම සහනාධාරය ලබා දීම, වකුගඩු රෝගීන්ගේ දීමනාව ලබා දීම ඇතුළු විවිධ සුබසාධන වැඩකටයුතු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක අපරාධයක්ද? අපරාධ රාජ්‍යයක්, බංකොලොත් රාජ්‍යයක්, වට්ටපු රාජ්‍යයක් ජාතික ජන බලවේගය විධියට අපි අද හොඳ තැනකට ගෙනැවිත් තිබෙනවා. ඒ විතරද?

අද ලෝකයේ ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදී දර්ශකයේ ස්ථාන 15කින් අපි ඉදිරියට ඇවිත් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමිය දන්නවා, පසුගිය දවසක ලෝක බැංකුව වැටුණු රටවල් අතරින් ශීඝ්‍රයෙන් නැඟී එන රටක් විධියට ශ්‍රී ලංකාව හැඳින්වූ බව. ඒ නිසා අද ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තුව ඇතුළේ විශේෂයෙන් විපක්ෂය තමන්ගේ තර්ක ටික ඉතිහාසයේ ඉදිරිපත් කළා වාගේ ඉදිරිපත් කරනවා. ඉතිහාසයේ ප්‍රබන්ධ කථා, වෙන වෙන මැජික් සංදර්ශන, විස්මය ජනක කථා තිබුණා නේ. අපි පොඩි කාලයේ හැරී පෝටර්ගේ කථා, සුරංගනා කථා, මිථ්‍යා කථා බැලුවා නේ. මිථ්‍යා කථා, ප්‍රබන්ධ ඇතුළේ තමයි මෙගොල්ලන් කාලයක් තිස්සේ ජනතාව රැවැට්ටුවේ. 1956 සිට මේ අය ප්‍රබන්ධ ගෙනාවා. පසුගිය කාලයේත් ප්‍රබන්ධ ගෙනාවා. ඒ ප්‍රබන්ධවලට මිනිස්සු රැවටුණා. අපි පොඩි කාලයේ ප්‍රබන්ධ කථාවලට හරි කැමැතියි. ඒවා විනෝදජනකයි. හැරී පෝටර්ගේ ප්‍රබන්ධ කථාවලට මාර හැඟීමක් එනවා; විස්මයක් එනවා. ඇලඩින්ගේ පුදුම පහන කථාව අපට විස්මයජනකයි. අපි ඒවා බැලුවා; ඇහුවා. හැබැයි, අපි ලොකු වෙනකොට; වැඩිහිටියෝ වෙනකොට මේවා නිකම්ම නිකම් අද්භූතජනක, විස්මයජනක දෙයක් කියලා අපට දැනෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
විපක්ෂය ඒක තමයි කරමින් හිටියේ. හැබැයි, මීට වසරකට පෙර සැප්තැම්බර් 21වැනි දා ජනතාව ඒ ප්‍රබන්ධවලට රැවටෙන්නේ නැහැ කියන එක ඔප්පු කරලා තමයි අනුර දිසානායක සහෝදරයා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කරන්නේ. අපේ රටේ ජනාධිපතිවරයා බවට අනුර දිසානායක සහෝදරයා පත් කරන්නේ ඒ නිසායි. දැන් මෙගොල්ලන් මොකක්ද කරමින් ඉන්නේ? දැන් මෙගොල්ලන් මේ පාර්ලිමේන්තුව -වෙන තැනක් නැහැ නේ. ජනතාව නැහැ.- විජ්ජා පෙන්වන වේදිකාවක්, නාට්‍ය පෙන්වන තැනක් බවට, සෙප්පඩ විජ්ජා පෙන්වන තැනක් බවට පත් කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අපි සම්බන්ධයෙන් විවිධ ප්‍රබන්ධ ගොඩ නඟනවා. ප්‍රශ්නයක් නැහැ. මේ කතන්දරේ දන්නෝ දන්නවා.

මට තව විනාඩියක් දෙන්න, කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

කුහකකම් නැති, අපරාධකාරයින් නොවන, තක්කඩින් නොවන, බැඳුම්කර වංචාකරුවන් නොවන, ඇන්ටිජන් හොරුන් නොවන අය දන්නවා, මේ රටට වෙන්නේ මොකක්ද කියලා. අපේ සහෝදර මන්ත්‍රීවරුන් කිව්වා වාගේම මම කථාව අවසන් කරනවා, අපේ ගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසි වාරයට ගිහිල්ලා රට නියෝජනය කරමින් කළ කථාවේ කොටසක් උපුටා දක්වමින්. සමහරුන් කුහකකම ඇතුළේයි ඒ කථාව විවේචනය කළේ. කරන්න පුළුවන් හොඳම කථාව එතුමා කළා. එතුමා ලෝකය අද මුහුණ දෙන අභියෝග පිළිබඳව කථා කළා; ලෝකයක් විධියට, රටක් විධියට අප කොතැනටද යන්න ඕනෑ කියන එක ගැන කථා කළා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඉක්මනින් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ ගරු ජනාධිපතිතුමා එම සැසිය අමතමින් ප්‍රකාශ කළා, "අවසාන වශයෙන්, මට මගේ රට ගැන අපේක්ෂාවේ සිහිනයක් තිබෙනවා. ඔබට ඔබේ රටවල් ගැන අපේක්ෂාවේ සිහින තිබෙනවා. මගේ රටේ ජනතාවට සතුටින් පිරුණු, පොහොසත් ජීවිතයක් උරුම කර දීම මගේ ඒකායන සිහිනය වෙනවා. ඔබේ රටවල ජනතාවටත් එවැනිම ජීවිත උරුම කර දීම ඔබේ සිහිනය බව මා විශ්වාස කරනවා. ඒ සියලු සිහින වෙනුවෙන් අප යා යුත්තේ එකිනෙකා පරයා යන ගමනක් වෙනුවට එකිනෙකා අත්වැල් බැඳගත් ගමනක් බව අප විශ්වාස කරනවා.

'නිරෝගී ධරණීතලයක සාමය, ගෞරවය සහ සමානාත්මතාවය වෙනුවෙන් කැප වෙමු!' යනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආදර්ශ පාඨයේ සඳහන්ව තිබෙනවා. ඒ ලෝකය සැබැවට 'පිළිසකර කරන්නන්' වෙමු කියා මා ඔබට ගෞරවයෙන් ආරාධනා කරනවා" යනුවෙන්. එය තමයි අපේ ප්‍රාර්ථනාව. ජාතික ජන බලවේගයේ ප්‍රාර්ථනාව තමයි ඒ කිව්වේ.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.03]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට විනාඩි 11ක් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවුරුද්දක් ගිහිල්ලාත් මේ ආණ්ඩුව කරපු වැඩ ගැන කියාගන්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ජනාධිපතිතුමාගේ කථාවේ කෑල්ලක් අල්ලා ගෙන ඒක ගැන තමයි අද බණ දෙසන්නේ. ඔව්, ජනාධිපතිතුමා කිව්වා, "දූෂණයට විරුද්ධව සටන් කරන එක භයානකයි. සටන් නොකර සිටීම ඊට වඩා භයානකයි" කියලා. ඒ ප්‍රකාශය අපි අගයනවා. දූෂණයට විරුද්ධව සටන් කරන්න ඕනෑ. හැබැයි, පව කෝටියක් කෙළලායි ඉන්නේ මේ අවුරුද්දේම. පව කෝටියක්! පසුගිය දවසක ජනාධිපතිතුමා කිව්වා, ඩොලර් බිලියනයක ආයෝජන ආවා කියලා. කොහේටද ආවේ? මොකටද ආවේ? කියන්න බැහැ නේ. අද තිබෙන වාර්තා අනුව මේ අවුරුද්ද තුළ මහ බැංකු සංචිතය වැඩි වෙලා තිබෙන්නේ, ඩොලර් බිලියන දශම එකකින්; ඒ කියන්නේ, ඩොලර් මිලියන 100කින්. ජූලි මාසය තුළ අපනයනයෙන් ලැබුණේ, ඩොලර් බිලියන 1.3යි. අපනයනය අඩු වෙලා. ආනයනය 1.9යි. වෙළෙඳ ශේෂය ඩොලර් බිලියන දශම හයයි; එනම් ඩොලර් මිලියන 600යි.

දැන් සංචාරක කර්මාන්තය ගැන පම්පෝරි දොඩවනවා. ජනවාරි මාසයේ ඉඳලා අගෝස්තු මාසය වනකල් සංචාරක කර්මාන්තයට ඩොලර් බිලියන 2.3යි ඇවිල්ලා තිබෙන්නේ. ගිය අවුරුද්දට සාපේක්ෂව ඩොලර් බිලියන දශම එකයි වැඩි වෙලා තිබෙන්නේ. ආතල් කෝටියක් දෙනවා, මේගොල්ලන්. කයිය ගහන්න නම් හරි දක්ෂයි. ගිය අවුරුද්දේ සියයට 5.4කට තිබ්බ ආර්ථික වර්ධන වේගය දැන් සියයට 4.9ට වට්ටගෙනයි තිබෙන්නේ. ඕනෑ නම් තොරතුරු දෙන්නම්. මෙන්න, අහගන්න. මේ ගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, සහල් මිල පාලනය කරනවා කියලා. කෝ, කළාද? පෙට්‍රල් සහ ඩීසල් සඳහා අය කරන බදු ඉවත් කර මිල පහත දමනවා කිව්වා. කෝ, කළාද? විදුලි බිල සියයට 30කින් වහාම අඩු කරනවා කිව්වා. අවුරුද්දක් ගිහිල්ලාත් කෝ, කළාද? සාධාරණ මිලකට බිත්තර සහ කුකුළු මස් ලබා දීම සඳහා සත්ත්ව ආහාර ඇතුළු අනෙකුත් නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා බදු සහන දෙනවා කිව්වා. ඒක ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටු අංක 120 යටතේයි තිබෙන්නේ. කෝ, කළාද? කළාද? කට අරින්න බැහැ. අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම කරනවා කිව්වා. එසේ සඳහන්ව තිබෙන්නේ, පිටු අංක 113 යටතේ. කෝ, කළාද? දේශීයව නිෂ්පාදනය කරන කිරි, බිත්තර ඇතුළු අත්‍යවශ්‍ය ආහාර, ළදරු කිරි, ඖෂධ, පාසල් පොත් හා උපකරණ, සහරා, පුස්තකාල සේවා - මේ ආදී වශයෙන් ගොඩක් දේවල් ගැන කියලා - පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වැට් බද්ද සියයට බින්දුවට ගේනවා කිව්වා. එසේ සඳහන්ව තිබෙන්නේ පිටු අංක 103 යටතේයි. ගෙදර තිබෙන ඔබතුමන්ලාගේ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශය අරගෙන පොඩ්ඩක් පෙරළා බලන්න. ඒ කියපු මොකවත් කරගන්න බැරි වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, රාජ්‍ය සේවාව ලබා ගැනීම සඳහා රජය සමඟ කටයුතු කිරීමට සෑම පුරවැසියෙකුටම නිශ්චිත ඩිජිටල් හඳුනා ගැනීමේ ඒකකයක් - unique digital identification framework එකක් - ගේනවා කිව්වා. කළාද? තව ගොඩක් දේවල් කියා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගු දෙපාර්තමේන්තුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට 3,000ක් බඳවා ගන්නවා කිව්වා. පිටු අංක 72හි එසේ සඳහන්ව තිබෙනවා. කෝ, කළාද? කරලා නැහැ. Manpower අංශයේ සේවකයන්ගේ ඡන්ද ගන්න, ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටු අංක 72හි දැම්මා, manpower සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාව සහ සාධාරණ වැටුප් සහතික කරනවා කියලා. අවුරුද්දක් ගිහිල්ලාත්, එය කළාද? විධිමත් ක්‍රමවේදයක් යටතේ රැකියා විරහිත උපාධිධාරින්ට රැකියා දෙනවා කිව්වා. ගුරු වෘත්තියට 20,000ක් බඳවා ගන්නවා කිව්වා. කෝ, කීයක් බඳවා ගත්තාද? උත්තර දෙන්න බැහැ නේ. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත උපාධිධාරින් 3,000ක් සහ STEM නොවන උපාධිධාරින් 9,000ක් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට බඳවා ගන්නවා කිව්වා. පුළුවන් නම් කියන්න, කී දෙනෙක් බඳවාගෙන තිබෙනවාද කියලා? ඊළඟට, රටේ සියලුම අංශවල ශ්‍රමිකයින්ට අදාළ වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් හඳුනවා කිව්වා. එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 68හි සඳහන්ව තිබෙනවා. කෝ, එය හදලා තිබෙනවාද? සියලු ශ්‍රමිකයන් ආවරණය වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදලක් හඳනවා කිව්වා. එය පිටු අංක 71හි සඳහන්ව තිබෙනවා. කෝ? ඒවාට උත්තර දෙන්න බැහැ. තවත් තිබෙනවා. පාස්කු ඉරුදින ප්‍රහාරයට සම්බන්ධ අය අවුරුද්දක් ඇතුළත අල්ලනවා කිව්වා නේ. කෝ, කළාද? දැන්, ඒ ගැන කථා නැහැ. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත අහෝසි කරනවා කිව්වා නේ. කෝ, කළාද? නැහැ. මර්දනයට පාවිච්චි කරන්නේ එයයි.

ඊළඟට කිව්වා, ප්‍රකාශනයේ නිදහසට බාධා වන වගන්ති ඉවත් කොට 2024 අංක 9 දරන Online Safety Act එක අහෝසි

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කරනවා කියලා. ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටු අංක 60හි ඒ බව සඳහන්ව තිබෙනවා. "කරනවා, කරනවා" කිව්වාට තවම කළාද? ඒ ගැන කථාවක් නැහැ. පුද්ගලයන් සඳහා බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 24ක් කරනවා කිව්වා; ඇන්දුවා. නමුත්, ලක්ෂ 18 සීමාවටයි ගෙනැල්ලා තිබෙන්නේ. කල් තබා ඇති පළාත් සභා මැතිවරණය කඩිනමින් පවත්වනවා කිව්වා. පිටු අංක 230හි එසේ සඳහන්ව තිබෙනවා. ආණ්ඩුව ඇවිල්ලා අවුරුද්දයි. තවම පළාත් සභා පිහිටුවීම ගැන කථාවක්වත් නැහැ. පළාත් සභා මැතිවරණය කල් දමපු එක වෙනම කථාවක්. හැබැයි, ඒක පවත්වන්න ආණ්ඩුවට වුවමනාවක්වත් නැහැ. ඊළඟට කිව්වා, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව කඩිනමින් ඉවත් කරනවා කියලා. එය පිටු අංක 16හි සඳහන්ව තිබෙනවා. කෝ, කළාද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිල දී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම් ලබා දෙනවා කිව්වා. එය, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 31හි සඳහන්ව තිබෙනවා. එහෙමයි තරුණයන්ට සිහින මාළිගා හැදුවේ. ඊළඟට, ක්‍රීඩා පනත සංශෝධනය කරනවා කිව්වා; සෑම පාසලකටම අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ පහසුකම් විෂමතාවකින් තොරව රජය මැදිහත්වී ලබා දෙනවා කිව්වා. පිටු අංක 34හි ඒ බව සඳහන්ව තිබෙනවා. නමුත්, ඒ ආකාරයට කටයුතු කළේ නැහැ.

ඒ වාගේම, මේ රටේ මුස්ලිම් ජනතාවගේ ඡන්දය සියයට 70ක් විතර ගන්න ඒගොල්ලනුත් ඇන්දුවා. විපක්ෂයේ සිටියදී පලස්තීන සහයෝගිතා පදනම හදාගෙන, ඒකේ සභාපති ධුරය ද දැරුවා. හැබැයි, අද පලස්තීනයේ ගාසා තීරයේ මිනිස් ඝාතන විශාල වශයෙන් සිද්ධ වුණත් ඒක ගැන කථාවක් නැහැ. මම ඡායාරූපයක් පෙන්වන්නම්. මෙන්න, ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපතිවරයා වන නිමල් බණ්ඩාර මහත්මයා ඊශ්‍රායල පාර්ලිමේන්තුවේ, ඊශ්‍රායල-ශ්‍රී ලංකා මිත්‍රත්ව පාර්ලිමේන්තු සංසදයක් පිහිටුවනවා. ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසියට ගිහිල්ලා අඬනවා.

නමුත්, යටින් සිදු වෙන්නේ මේවා. අරුගම්බේ, ඊශ්‍රායලයේ තෝතැන්නක් කරලා තිබෙනවා; ශ්‍රී ලාංකිකයින්ට යන්න බැරි restaurants දමන්න ඉඩ දීලා තිබෙනවා. මේ ඇන්දිලි ටික, මේ පච කෝටිය නිසා තමයි දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවුරුද්දේ සන්දර්ශනයක් දමන්න බැරි වුණේ. මේවායෙන් භාගයක් හරි කරලා තිබුණා නම් බලාගන්න තිබුණා, පවත්වන සන්දර්ශනයේ හැටි. නේද? ගම්වල, හන්දිවල three-wheeler park වලට අද යන්න බැහැ. ඒ ඇයි? පච කෙළලා තිබෙන්නේ. බලයට ගෙනාපු කට්ටියට තමයි ඉස්සෙල්ලාම ෂොට් එක දීලා තිබෙන්නේ. කැනඩාව, එක්සත් රාජධානිය, පෘතුගාලය, ඕස්ට්‍රේලියාව ආදි රටවල් ඇමෙරිකානු බලපෑමට යටත් නොවී පලස්තීනය රාජ්‍යයක් විදියට පිළිගන්න කොට, අද මේ ආණ්ඩුවේ දෙබිඩි, දෙමුහුන්, බොරු කියන, පච කෙළින ප්‍රතිපත්තිය එළියට ඇවිල්ලා තිබෙනවා. අපි ඒ කාරණය පැහැදිලිවම කියන්න ඕනෑ.

ඔබතුමන්ලාට අවුරුදු 5කට බලය දීලා තිබෙනවා. දැන්, අවුරුද්දක් ඉවරයි. අපි කියන්නේ නැහැ, ආණ්ඩුව වට්ටන්න ඕනෑ කියලා. අඩුම ගණනේ ඊළඟ අවුරුද්දේවත් මේවාට උත්තර දෙන්න බලාගෙන වැඩ ටික කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අද මේ ගෞරවනීය සභාවේදී අපේ රටේ ආර්ථිකයේ, අනාගතයට ජීවය දෙන ඉතාම වැදගත් යෝජනාවක් පිළිබඳව අපි සාකච්ඡා කරනවා. මේ ගත් තීරණයෙන් අපි ලෝකයට පෙන්නුම් කරනවා, අපේ රට ආර්ථික ස්ථාවරත්වය කරා ගමන් කරමින් තිබෙන බව සහ රටේ සුන්දරත්වය සොයා පැමිණෙන සංචාරකයන්ට විශ්වාසවන්ත ගමනාන්තයක් අපට උදා කර දිය හැකි බව.

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ සකස් කරන ලද, 2025 අංක 7 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම පිළිබඳව තමයි අද අපේ සාකච්ඡාව සිදු වන්නේ.

ඒ අතරේ විපක්ෂයේ මන්ත්‍රීවරු සුපුරුදු පරිදිම අදාළ මාතෘකාවෙන් පිට පැනලා කටයුතු කරනවා. අපි දන්නේ නැහැ ඒ මොකක් නිසාද කියලා. "අබ කෑ මිනිහාගේ මොළේ දනවා" වාගේ අයිස් අල්ලන අල්ලන ප්‍රමාණයක් ගානේ, ඒ අල්ලන ප්‍රමාණය වැඩි වන වාරයක් ගානේ නළියන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා; පාර්ලිමේන්තුවේ දඟලන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුව ස්ථාවර නියෝග අනුව පවත්වාගෙන යන එකට කරන බාධා වැඩි වෙමින් තිබෙනවා. එච්චරයි අපට දකින්න තිබෙන්නේ.

නැවතත් මම අදාළ මාතෘකාවට මම යොමු වෙන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ව්‍යාපාරය කියන්නේ, අපේ ආර්ථිකයේ හදවත බඳු දෙයක්. පසුගිය කාලයේ අපි රටක් හැටියට විශාල අභියෝගවලට මුහුණ දුන්නා. ඒ වාගේම, දැවැන්ත ආර්ථික ප්‍රපාතයකට ඇද දමපු රටක් තිබුණේ. ඒ අභියෝග ජය ගන්න වෙර දරන කණ්ඩායමක -ආණ්ඩුවක- ගෞරවනීය ධෛර්යවන්ත සාමාජිකයෝ අපි. අපට හෘදය සාක්ෂියක් තිබෙනවා. අපි මේවා අධ්‍යයනය කර තිබෙනවා. ඒ මේවා ගැන අපි උනන්දු වනවා. අපි අප්‍රතිහත ධෛර්යයෙන් පැවැති තත්ත්වය වෙනස් කිරීමට මැදිහත් වනවා.

ඊයේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 80වන සැසිවාරය අමතා මුළු ලෝකයටම කථා කළා. එතුමා කළ කථාවෙන් උපුටා ගැනීම් කිහිපයක් මම ඉදිරිපත් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ රටේ ගෞරවය රැකීම පිළිබඳව ජනාධිපතිවරයා ජාත්‍යන්තරය ඉස්සරහ මෙහෙම කියනවා.

"පසුගිය ඓතිහාසික මැතිවරණයේදී ශ්‍රී ලාංකික ජනතාව සියවස් ගණනක් දුටු සිහිනයක් වෙනුවෙන් තීන්දුවක් ගත් බව ඔබට සිහිපත් කරනවා. එයින් බිහි වූ ව්‍යවස්ථාදායකය විවිධත්වයකින් සහ විචිත්‍රත්වයකින් යුක්ත වුණා."

ඒක මේ පාර්ලිමේන්තුව දිහා බැලුවාම අපට පෙනෙනවා.

"එක අතකින් රටේ සමස්ත ජනතාව ආණ්ඩුව පිළිබඳව දැවැන්ත විශ්වාසයක් තැබුවා."

අදත් ඒ ජනතාව එහෙම ම තමයි, පාර්ලිමේන්තුවේ විපක්ෂය කොච්චර නළියමින් දැඟලුවත්.

"තවත් අතකින් දෘශ්‍යාබාධිත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ද ඇතුළුව කාන්තා සහ සෙසු ජාතීන්ගේ නියෝජනයේ ඓතිහාසික ඉහළ යැමක් නිර්මාණය කළා."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මතකයි, විපක්ෂයේ මන්ත්‍රීවරු දෘශ්‍යාබාධිත මන්ත්‍රී සහෝදරයාට කොයි තරම් අපහාස කළාද කියලා. ඒවා තේරුම් ගන්න බැරි වුණා, ඒ මොහොතේ. අද ජාත්‍යන්තරය පිළිගන්නා දේවල් අපි මීට අවුරුද්දකට කලින් කරද්දී මේ අයට ඒවා තේරුම් ගන්න බැරි වුණා. ඒ නිසා ටිකක් නැවතිලා බලාගෙන ඉන්න. තවම අවුරුද්දයි ගියේ. බලය ලැබුණේ අවුරුදු 5කට. අවුරුදු 5කදී කරන්න තිබෙන ඒවා දවසින් දෙකෙන්, අවුරුද්දෙන් බලාපොරොත්තු වෙන්න එපා. එහෙම කරන්න තිබුණා හොඳට හදලා තිබුණු රටක් නම්. මේ රට ප්‍රපාතයට ඇද දමා තිබෙන, අයිස් කඳු ගොඩ ගහලා තිබෙන, පාතාලය පුරවලා තිබෙන, පාතාලය විසින් දිනෙන් දින ඝාතන කරන මහා පාපකාරී අපරාධ රටක්. ඒකයි අපි මේ වෙනස් කරන්නේ.

පුලම්පිටියේ අමරෙලා, පාතාල නායකයෝ තමන්ගේ ආරක්ෂකයෝ හැටියට තියාගෙන හිටියා. ඒ වාගේම හික්කඩුවේ සභාපති හැටියට හිටපු මනෝජ් මෙන්ඩිස්ගේ -මට හරියට නම මතක නැහැ- මරණයේ අවසන් කටයුතු දවසේ උඩින් මල් දැම්මා, වොපර්වලින්. එහෙම කරපු අය අද කථා කරනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ හොඳ නරක. "අබ කාපු මිනිහාගේ මොළය දනවා" කියලා පැරණි කියමනක් තිබෙනවා නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක තමයි මේ සිදු වෙන්නේ.

ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා කියනවා, "පාර්ලිමේන්තුව තුළ පෙන්නුම් කෙරෙන මෙම විවිධත්වය මඟින් ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය තුළ ජනවාර්ගික විවිධත්වය සහතික කෙරෙනවා වාගේම, සියලු පුරවැසියන්ට සමාන අයිතිවාසිකම් සහ අවස්ථා ලබා දීම සඳහා අප තුළ ඇති කැපවීම නැවත බලගන්වනු ලැබුවා" කියලාත්.

අවුරුදු 30කට වැඩි කාලයක් යුද්ධයකට මේ රට ඇදගෙන ගියා, මේ අවුරුදු 76 තුළ හිටපු පාලකයෝ. එවන් රටක් නැවත ගොඩ ගන්න, ජාතික සමගිය හදන්න පුළුවන් පාර්ලිමේන්තුවක් අපි හැදුවා. ජාති භේදයකින් තොරව මේ මහ පොළොවේ සිටින හැම පුරවැසියෙකුම එකතු කරගෙන ශ්‍රී ලංකාවේ ගොඩ නඟපු පළමුවෙනි රජය මේක; ආණ්ඩුව මේක. ඒකට අපහාස කරලා වචනවලින් බිඳ දමන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම ජනාධිපතිතුමාගේ ප්‍රකාශය අවසන් කරලා ඉන්නම්.

“සියලු පුරවැසියන්ට සමාන අයිතිවාසිකම් සහ අවස්ථා ලබාදීම සඳහා අප තුළ ඇති කැපවීම නැවත බලගන්වනු ලැබුවා. ඒ වාගේම, මහජන නියෝජිතයන් යනු මහජනතාව වෙනුවෙන් සේවය කරන්නන් මිස, අනිසි වරප්‍රසාද ලබන්නන් නොවන බවට අපි ආදර්ශයක් ලබා දී තිබෙනවා.”

ජනාධිපතිවරයකුට ලෝකය ඉස්සරට, ජාත්‍යන්තරය ඉස්සරහට ගිහින් භය නැතිව එහෙම කියන්න පුළුවන්කම තිබෙන්නේ කොහොමද? ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා, පහළ ඉන්න මන්ත්‍රීවරයා දක්වා විශ්වාසයක් තිබෙන නායකත්වය නිසා. එහෙම විශ්වාසයක් ගොඩ නඟපු නායකත්වයක්, මේ. අපි ඒ නායකත්වය තුළ එක පෙළට ඉඳගෙන වැඩ කරන දේශපාලන ව්‍යාපාරයක්. එහෙම නැතිව ජාත්‍යන්තරය ඉස්සරහට ගිහින් මෙහෙම කියන්න පුළුවන්ද? ඒවා බොරු නොවෙයි. එවැනි දැවැන්ත ධෛර්යයක්, ශක්තියක් අරගෙන දීපු ජනතාවගේ බලය තමයි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ඉස්සරහා අද කියැවෙන්නේ. ඒක අපි තේරුම් ගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමා තව ප්‍රකාශයක් කරනවා.

“2025 ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදී දර්ශකය තුළ අපේ රට ස්ථාන 15කින් ඉදිරියට පැමිණ තිබීම මේ කෙටි කාලය තුළ ලැබූ සැලකිය යුතු ජයග්‍රහණයක් වෙනවා.”

මහා මණ්ඩලය ඉස්සරහා බොරු කියන්න පුළුවන්ද? ඔබතුමන්ලා පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා දිගට හරහට බොරු කියනවා. ඔබතුමන්ලා හිතනවාද රාජ්‍ය නායකයෙක් එහෙම බොරු කියනවා කියලා? වරෙක කියනවා ජනාධිපතිවරයාගේ කථාව කොපි කර කර මේ සභාවේ කියනවා කියලා. ඔව්, කියනවා. එතුමා මේ රට වෙනුවෙන් කළ කථාව, එතුමා මේ රට වෙනුවෙන් පෙනී සිටීම, ජාත්‍යන්තරය ඉස්සරහා අපේ රට ඔසවා තැබීම ගැන අපි කියනවා. එහෙම ඔසවා තැබුවොත් තමයි අද අපි මේ කථා කරන මාතෘකාවට අදාළව සංචාරකයෝ දැවැන්ත වටිනාකමක් සහිත ගමනාන්තයක් දක්වා එන්නේ. එහි ප්‍රමුඛ ස්ථානයකට පැමිණීමේ සිහිනය වෙත පියනඟන්නට අපි කැපවීමෙන් උත්සාහ කරනවා කියලා එතුමා සඳහන් කරනවා.

අපට තව සිහිනයක් තිබෙනවා. මෙතැනින් අපි නතර කරන්නේ නැහැ. ජනාධිපතිවරයාත්, අපේ රටේ සියලු බලවේගත්, මහජනතාවත් එකතු කරගෙන මේ රට ඉහළට ඔසවා තබන එක අපි කරනවා. බල්ලන් කොයි තරම් උඩුබුරුලෑවත් අපි මේ ගමන යන බව කියමින්, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.18]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි මඟින් සංචාරක ව්‍යාපාරයට බලපාන කරුණු සම්බන්ධව සමාලෝචනය කරන අවස්ථාවේ කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය මේ වර්ෂයේ යම්කිසි ප්‍රගතියක් ලබාගෙන තිබෙන එක අපි පිළිගන්නවා. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු සංචාරකයන්ගේ පැමිණීම ගැන විශේෂයෙන් කථා කරනවා. එතුමන්ලාගේ අවුරුද්දක වැඩසටහන යටතේ ඒ සියලු දේවල් සිද්ධ වුණා කියන එක තමයි එතුමන්ලා හුවා දක්වන්න උත්සාහ කළේ. නමුත් මම හිතන විධියට, සංචාරක ව්‍යාපාරයේ මේ දියුණුව හුදෙක් ඔබතුමන්ලාගේ ක්‍රියාදාමය නිසා නොවෙයි, පසුගිය අවුරුදු 10ක කාල සීමාව තුළ සිටම එහි ක්‍රමික දියුණුවක් තිබුණා. නමුත් අපේ රටේ අවාසනාවට කොවිඩ් වසංගතය නිසාත්, පාස්කු ප්‍රහාරය නිසාත් පසුගිය කාල සීමාව තුළ සංචාරක ව්‍යාපාරයට යම්කිසි බලපෑමක් ඇති වුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කාල සීමාවේදී තමයි සංචාරකයන්ගේ පැමිණීමේ යම්කිසි අඩුවක් අපට දකින්න තිබුණේ. පසුගිය අවුරුදු තුනක කාලය තුළ පැවති ආණ්ඩු තුළින් ගත්තා වූ පියවර, ඒ වාගේම විවිධ ක්‍රම නිසා තමයි මේ සංචාරක ව්‍යාපාරය අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. සංචාරක ව්‍යාපරය ගැන කථා කරනකොට, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ආණ්ඩුවේ අවධානය යොමු කළ යුතු තවත් නොයෙකුත් ආකාරයේ කරුණු කාරණා රාශියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සංචාරක ක්ෂේත්‍රය ගැන කථා කරනකොට හෝටල් ක්ෂේත්‍රය ඉතාම වැදගත්. මම කථා කරන්නේ තරු 5 පන්තියේ, එහෙම නැත්නම් තරු පන්තියේ හෝටල් ගැන විතරක් නොවෙයි. සංචාරක ව්‍යාපාරය බෙහෙවින්ම ප්‍රචලිත වෙලා තිබෙන්නේ වෙරළ ආශ්‍රිතව. හික්කඩුව ප්‍රදේශයේ, නැඟෙනහිර කලාපයේ ත්‍රිකුණාමලය, අපි නියෝජනය කරන කිතුල්ගල ප්‍රදේශය සහ පින්නවල වාගේ ප්‍රදේශවල සාමාන්‍ය ප්‍රමාණයේ හෝටල් තමයි සංචාරක ව්‍යාපාරය සඳහා දායකත්වය දරන්නේ. සංචාරක ව්‍යාපාරයට දායකත්වය දරන හෝටල් හිමියෝ අද වෙනකොට නොයෙකුත් ආකාරයේ අපහසුතාවට පත් වෙලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලයේ කොවිඩ් වසංගතයත්, පාස්කු ප්‍රහාරයත් එක්ක සිදු වුණු සංචාරක ව්‍යාපාරයේ කඩා වැටීම නිසා සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ හෝටල් පවත්වාගෙන යන්න ඒ අය ණය ගත්තා. පසුගිය ආණ්ඩුවත්, ඒ වාගේම මේ ආණ්ඩුවත් කිව්වා ඒ අයගේ ණයවලට යම්කිසි සහනයක් සලසා දෙනවා කියලා. නමුත් ඒ සම්බන්ධයෙන් යම් කිසි විසඳුමක් ලබා ගන්න අද වෙනකල් ඒ හෝටල් හිමියන්ට අවස්ථාව ලැබී නැහැ කියන එක මම කියන්න ඕනෑ. ඒ තුළ එම හෝටල් හිමියන් අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම හෝටල් හිමියන්ට, ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධව සිටින විවිධ අයට දැන් තිබෙන බදු ක්‍රමය තුළ මුහුණ පාන්නට සිදු වෙලා තිබෙන තත්ත්වය ගැන අපි දන්නවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව පසුගිය කාල සීමාව තුළ බදු අඩු කරනවා, බදු නැති කරනවා, බදු සංශෝධනය කරනවා කියලා නොයෙකුත් ආකාරයේ පොරොන්දු දුන්නා. නමුත් මේ වෙනකල් බදු අඩු කරන්නවත්, සංශෝධනය කරන්නවත් කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

සංචාරක හෝටල් අයිතිකරුවන්ට තිබෙන ප්‍රශ්න මොනවාද කියලාත් අපි දන්නවා. විශේෂයෙන්ම විදුලි බිල ගත්තොත්, මෙතුමන්ලා ඒ සම්බන්ධයෙන් මොකක්ද කිව්වේ? අනිවාර්යයෙන්ම විදුලි බිල අඩු කරලා සහයෝගය ලබා දෙනවා කිව්වා. අපි දන්නවා, ඊයේ පෙරේදා විදුලි බිල තවත් සියයට 6කින් වැඩි කළ බව. දැන් තවත් වැඩි කරන්න උත්සාහ දරනවා. මේ තුළ ඔවුන්ට විදුලි බිල ගෙවාගන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ වාගේම ඔවුන්ට නොයෙකුත් ආකාරයේ වියදම් තිබෙනවා. හැම පැත්තෙන්ම වියදම් තිබෙනවා. VAT එක තිබෙනවා, විදුලි බිල ගත්තත් එහෙමයි; වතුර බිල ගත්තත් එහෙමයි. ඒ වාගේම තමන්ට අදාළ නගර සභාවට, එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාවට බදු මුදල් ගෙවන්නත් සිද්ධවෙලා තිබෙනවා. ඒ වාගේම ආදායම් බදු ගෙවන්නත් සිද්ධවෙලා තිබෙනවා. ඒ වාගේම VAT එක ගෙවන්නත් වෙනවා. අද හෝටල් හිමියාට ඒ සියලුම දේවල් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන වකවානුවක් තමයි මේ වෙලාවේ ගතකරන්න සිදුවෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන් තවත් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ ආණ්ඩුව සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ කියලා කථා කරනවා, දියුණු කරපු එක ගැන කියනවා. ඒ වාගේම අපි කරපු වැඩ නිසා තමයි මේ දේවල් වැඩිවෙලා තිබෙන්නේ කියලා කියනවා. නමුත් ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය, විශේෂයෙන්ම සංචාරක ඇමතිතුමා ඇතුළු මේ ආණ්ඩුවේ අවධානය යොමු කරලා හෝටල් හිමියන් නඟා සිටුවන්න, ඒ අයට තිබෙන ගැටලු සම්බන්ධයෙන් සොයා බලා වැඩ කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි අපට කරන්න තිබෙන්නේ.

තව කාරණා කිහිපයක් පිළිබඳව කථා කරන්න තිබුණත්, මම තව එක කාරණයක් විතරක් කියලා කථාව නතර කරන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයන් තිබෙනවා. මොකද, ඒ ප්‍රදේශයේ තිබෙන්නේත් අර හෝටල් හිමියන්ට තිබෙන ප්‍රශ්නමයි.

අපි දන්නවා, ලංකාවේ දිය මත කරන බෝට්ටු ක්‍රීඩාව ඒ කියන්නේ, water rafting කිරීම සඳහා එකම එක ස්ථානයයි තිබෙන්නේ කියලා. කිතුල්ගල තමයි සංචාරකයින් අතර ඒ සඳහා ඉතාම ප්‍රචලිත ස්ථානය. ඒකට සම්බන්ධ වෙලා සිටින අය ස්වෝත්සාහයෙන් කටයුතු කරනවා. එම නිසා ඒක දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. ඊට සම්බන්ධ තරුණ තරුණියෝ විශාල පිරිසක් ඉන්නවා. ඉතින්, කරුණාකරලා ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනිඳු සමන් හෙන්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.24]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු ජනාධිපතිතුමා ඊයේ කරපු ප්‍රකාශයේ යම් කාරණයක් මේ සභා ගැබ ඇතුළේත් මතු වී පෙනෙන අවස්ථාවක් අපි අද දවසේ දැක්කා. ජනාධිපතිතුමා ප්‍රකාශ කළා, "අපට අපරාධ සමඟ ගැටෙන්න අමාරුයි, හැබැයි මේ අපරාධ රාජ්‍යය ඇතුළේ අපි අපරාධවලට එරෙහිව කටයුතු කරන්න ඕනෑ. ඒක හරිම අමාරු කාර්යයක්. ඒ වාගේම, අපරාධවලට එරෙහිව කටයුතු නොකර සිටීම ඊට වැඩිය භයානකයි, ඊට වැඩිය අමාරුයි" කියලා. සුදු රෙදි අස්සේ, රතු සාටක අස්සේ තිබුණු අපරාධ ඉතිහාසයේ ඉඳලාම මේ රටේ තිබුණු විධිය අපි දැක්කා. අපේ රටේ ජනතාව කාලයක් එම දේශපාලන ක්‍රියාවලිය ඇතුළේ ඒ අපරාධ අත්වින්දා. අපේ රටේ තරුණයින්ට නිදහසේ ක්‍රීඩා කරන්න බැරි වුණු, තරුණයින්ට නිදහසේ ක්‍රීඩාවට යොමු වෙන්න බැරි වුණු, ක්‍රීඩා කරන එක අපරාධයක් බවට පත් වුණු රාජ්‍යයක් තමයි මේ රට තුළ තිබුණේ. ඒ වාගේම මත්ද්‍රව්‍ය, වංචා, දූෂණ, හොරකම වගේ දේවල් ඒ පාර රාජ්‍ය ඇතුළේ පවත්වාගෙන ගිය තත්ත්වයක් තමයි තිබුණේ. දැන් අපට පෙනෙනවා, ඒ රාජ්‍ය ක්‍රියාවලිය බිඳ වැටුණාට පස්සේ ඒ අපරාධකාරයෝ නැවත, නැවත වංගු ගසමින් ඒ දේශපාලන සාටකවලට මුවාවෙලා නැවත එළියට එන්න හදනවා. අද දවසේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒ හඬ තමයි ආවේ. අපි දැක්කා, තංගල්ල ප්‍රදේශයේ එක දිගට මත්ද්‍රව්‍ය වැටළීම් කරනවා. ගොඩබිමදී සොයාගත් වැඩිම මත්ද්‍රව්‍ය කිලෝ ප්‍රමාණය මෙවර තංගල්ල ප්‍රදේශය ආශ්‍රිතව සොයා ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කවදාවත් දැකලා නැහැ, ලංකාව ඇතුළේ අයිස් මත්ද්‍රව්‍යය නිෂ්පාදනය කරනවා, ඒ වාගේම මත්ද්‍රව්‍ය නිෂ්පාදනාගාර පවත්වාගෙන යනවා. මේ රටේ ජනතාවට අවශ්‍ය කරන ආර්ථික පහසුකම් දෙන්න, ඒවාට අදාළ කරන මැදිහත් වීම කරන්න තමයි අපට කථා කරන්න සිද්ධ වුණේ. හැබැයි, ඒවා සිදු කරන අස්සේ මේ තිබෙන දේශපාලන ක්‍රියාවලියට පරණ දේශපාලනය අත පෙවූ හැම තැනකම, සාටක දේශපාලනය අත පෙවූ හැම තැනකම භීෂණ රාජ්‍යයන් නිර්මාණය වෙලා තිබෙනවා අපට පෙනෙනවා. අයිස් කියන මත්ද්‍රව්‍යය නිකම් ආවේ නැහැ. එක දිගට අයිස් කිලෝ ගණන් හසුවෙද්දී, එසේ හසුවන හැම කෙනෙක් පිටුපසම දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා අපි දැක්කා. ඉතිහාසයේ ඉඳලාම ඒක සිද්ධ වුණා.

ඒ වාගේම පසුගිය කාලයේ ජනාධිපතිවරයෙක් ගිහිල්ලා මත්ද්‍රව්‍ය චෝදනාවකට ලක් වුණු නායකයෙක් බදාගන්නවා අපි දැක්කා. නාකොටික් එකෙන් ඒ මන්ත්‍රීවරයාගේ නිවසට ගිහිල්ලා පරීක්ෂා කරලා, මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා තහවුරු කළාට පස්සේ, එසේ මත්ද්‍රව්‍යවලට චෝදනා ලැබූ කෙනාට ආරක්ෂාව දුන් ජනාධිපතිවරු හිටපු රටක්, මේක. එවැනි දේශපාලනයක් ක්‍රියාත්මක වුණු රටක්, මේක. තමන්ගේ දරුවා මත්ද්‍රව්‍යවලට යොමු වීම නිසා අපේ රටේ අම්මලා, තාත්තලා දහස් ගණන් දුක් විඳිනවා. ඒ වාගේම තමන්ගේ දරුවා මත්ද්‍රව්‍යවලට යොමුවෙයි කියලා අපේ රටේ ජනතාව බයෙන් ඉන්නවා. උදේ ඉස්කෝලෙට යවන පොඩි ළමයා නැවත ගෙදර එනකල් මේ රටේ අම්මා, තාත්තා හුල්ලමින් ඉන්නේ. ඒ අම්මාගේ, තාත්තාගේ කඳුළුත් එක්ක තමයි ඔය සාටක සාකච්ඡාව එන්නේ. ඒ වාගේම මේ රටේ ජනතාවගේ ජීවිත, මේ රටේ ජනතාවගේ දේපළ ඒ විධියට නාස්ති කරන්න ඉඩ දෙන්න අපට බැහැ. එම නිසා අපි මත්ද්‍රව්‍යවලට එරෙහිව දැවැන්ත සටනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපේ ජනාධිපතිතුමා කාලයකට පෙර කිව්වා, "මේ සටන නිකම් ක්‍රියාත්මක කරන්න බැහැ. අපි දන්නවා, මේක ඇතුළේ දේශපාලනඥයෝ ඉන්නවා" කියලා. වංචාව, දූෂණය, නාස්තිය පිරුණු රටේ, ඒ වංචාව, දූෂණය, නාස්තිය පවත්වාගෙන යන්න එක පැත්තකින් දේශපාලන අධිකාරිය කටයුතු කරමින් ඉන්නවා. අනෙක් පැත්තෙන් ගත්තාම, ඒ දේශපාලනඥයන් පිටුපස සැඟවුණු ව්‍යාපාරික ජාලයක් ඉන්නවා. අතලොස්සක් වන ව්‍යාපාරික පිරිසක් මේ ක්‍රියාවලිය ඇතුළේ ඉන්නවා. ඒ වාගේම එම දේශපාලනඥයන් එක්ක එකතුව දූෂණයට, වංචාවට උඩගෙඩි දෙමින් කටයුතු කරන රාජ්‍ය නිලධාරින් අතලොස්සකුත් ඉන්නවා. මේ සියල්ලගෙන් එකතු වුණු රාජ්‍යයක් තමයි තිබුණේ. එම කටයුතු තවම ක්‍රියාත්මක වෙනවා; ඒ තුළ තිබෙන යම් යම් දේවල් තවම ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒකේ හිටපු ගෝඩ්ෆාදර්ස්ලා තමයි මෙතැනට ඇවිල්ලා කථා කරන්නේ, මත්ද්‍රව්‍ය ආවේ කොහොමද; මත්ද්‍රව්‍ය තිබෙන්නේ කොහොමද; ඒවා අල්ලන්නේ කොහොමද කියලා. ඒ ක්‍රියාවලිය සිදු කරපු ගෝඩ්ෆාදර්ස්ලා තමයි එම සාකච්ඡා සිදු කරන්නේ. අපිට ලජ්ජයි. ඒ සාටකවලට මුවා වෙලා මේ රට අයිස්ලන්තයක් බවට පරිවර්තනය කර තිබෙනවා.

2029 අයිස්ලන්තයේ කුමාරයාට අපි කියන්න ඕනෑ, ඔබ 2029දී මේ රට හදන්න හිටියා නම් ඔබට හදන්න වෙන්නේ සොම්බි රටක් බව. අයිස් ගහලා, පැත්ත වැටී සිටින ජනතාවගෙන් යුත් සොම්බි රටක් බිහි වෙන්න තිබුණු එක තමයි අද වනවිට ජාතියේ වාසනාවට වෙනස් වෙලා තිබෙන්නේ, දේශපාලනයේ වෙනස්වීමත් එක්ක. අපි කවදාවත් හිතුවේ නැහැ, මේගොල්ලන් මේ ලංකාව ඇතුළේ අයිස් මත්ද්‍රව්‍යය නිෂ්පාදනය කරනවා කියලා. අපි කවදාවත් හිතුවේ නැහැ, කන්ටේනර් ගණන් මේ රටට අයිස් මත්ද්‍රව්‍යය ගෙනෙනවා කියලා. අද මේවා ගැන තොරතුරු එළියට එනවා. ඒ ගොල්ලන් බලාපොරොත්තු වුණේ මොකක්ද? මේ රටේ තරුණයන්ට මත්ද්‍රව්‍ය පොවා, හිතන්න බැරි විධියට මත්ද්‍රව්‍යවලට යොමු වුණු දුබලයන් බවට රටේ තරුණ ප්‍රජාව පරිවර්තනය කරලා ඒගොල්ලන්ගේ මජර දේශපාලන සංස්කෘතිය ඉස්සරහට ගෙනයන්න තමයි ඒගොල්ලන් වැඩ කළේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, දැන් ඒ සංස්කෘතිය අවසන් කර තිබෙනවා.

මේගොල්ලන් ඒ දවස්වල කිව්වා, පොලිස් ස්ථාන 184න්, 182කම ඉන්නේ තමන් පත් කරපු ස්ථානාධිපතිවරුන් කියලා. එහෙම විවෘතව කියපු රටක් මේක. පොලිස්පතිවරයා කියනවා, දේශපාලනඥයා තමයි මේ පත් කිරීම් කරන්නේ කියලා. එහෙම රටක තමයි අපි මේ ක්‍රියාවලිය කරගෙන යන්නේ. ඔබ දැක්කා, මේ රටේ හිටපු පොලිස්පති කවුද කියලා. වංචා, දූෂණවලින් පිරුණු පොලිස්පතිවරයෙක් හිටපු රටක්, මේක. එම පොලිස්පති හිරේට දමන්න ආණ්ඩුව ක්‍රියාත්මක වුණා.

එම නිසා මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වැරැදිවලට මුවා වෙලා, චෝදනාවලට ලක් වෙලා සිටින මේ දේශපාලනඥයන්ට අපි ඉතා ඕනෑකමින් කියනවා, තවදුරටත් ජනතාවට මේ බොරුව කරගෙන යන්න ඔබට අපි ඉඩ දෙන්නේ නැති බව. මහ රජ්ජුරුවන්ටත් අපි ඒක කියනවා. 2029 අයිස්ලන්තයේ සිහින කුමාරයාටත් අපි ඒක කියනවා. ඒ වාගේම වැඩබලන මහ රජවරුත් දැන් එළියට ඇවිත් තිබෙනවා. ඒගොල්ලන්ටත් අපි කියනවා, ඔයගොල්ලන්ගේ දේශපාලනය ඉවරයි, ඒ දේශපාලනය නැවත මේ රටේ කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියලා.

අපි මේ රටේ තරුණයන්ගේ ජීවිත ගලවා ගන්න ඕනෑ. අපේ රටේ අම්මලා- තාත්තලා දුක් විඳිනවා, මේ මත්ද්‍රව්‍යවලට දරුවන් ඇබ්බැහිවීම නිසා. ඒ ඇස්වලට එන කඳුළුවලට පැවැති දේශපාලනය වග කියන්න ඕනෑ. අන්න ඒකට එරෙහිව මහජනතාව විධියට අපි පෙළ ගැසෙන්න ඕනෑ; මහජනතාව විධියට අපි එකතු වෙන්න ඕනෑ; මහජනතාව විධියට අපි වැඩ

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

කරන්න ඕනෑ. මේ රටේ මේ තිබෙන භීෂණය නැති කරන්න නම්, මහජන පවුරක් හදන්න ඕනෑ. දේශපාලනඥයෝත් ඒ ජන පවුර තුළ ඉන්න ඕනෑ. අපි රාජ්‍ය සේවකයන්ටත් ආරාධනා කරනවා, ඔබත් මේ ජන පවුර තුළට එකතු වෙන්න කියලා. මේ රටේ සිටින දහසක් ව්‍යාපාරික ප්‍රජාවටත් අපි ආරාධනා කරනවා, මේ ආර්ථිකය ගොඩනගන ක්‍රියාවලිය තුළ වංචාව, දූෂණය පරදවන මේ ජන පවුරට ඔබත් එකතු වෙන්න කියලා. මේ රටේ සමස්ත මහජනතාවට අපි කියනවා, සාටක දේශපාලනයට වැසී තිබුණු මේ රටේ නරුම සංස්කෘතිය නැති කරන්න ඔබ එකතු වෙන්න කියලා. ජනතා බලයෙන් තමයි අපට මේක පරද්දන්න පුළුවන් වන්නේ. ජනතා බලයෙන් තමයි මේ තිබෙන දූෂිත දේශපාලනය අතු ගා දමන්න පුළුවන් වන්නේ. ඒ සඳහා අපි පෙරමුණ ගන්න ඕනෑ. මොකද, එදා වාගේම අදත් ඒ කටහඬින්; ඒ සද්දෙන් මේ තිබෙන දූෂණය, වංචාව, නාස්තිය යට කරගෙන යන සංස්කෘතියක් තමයි අපට දකින්න තිබෙන්නේ. නමුත් නැවතත් මේ රට අයිස්ලන්තයක් බවට පරිවර්තනය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ රට සොම්බි රටක් බවට පරිවර්තනය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. මේ රටේ සිටින අම්මලා තාත්තලාගේ ඇස්වල තිබෙන කඳුළු පිස දමන්න අපි කටයුතු කරනවා. අපි ඒකට තමයි දේශපාලනයට ආවේ. අපේ දේශපාලන ව්‍යාපාරයේ සිටින හැමෝම ඒ වෙනුවෙන් තමයි සද්භාවයෙන් වැඩ කරන්නේ. ඒක නිසා වංචාව, දූෂණය, නාස්තිය පිරුණු රටක ඒවා නැති කිරීම සඳහා මහජන පවුරක් හදන්න අපි පෙළ ගැහෙනවා. ඒ සඳහා වැඩ කරනවා; මහන්සි වෙනවා. ඒ මහන්සි වීම තුළ, එකට අරගළ කර මේ කියන දේශපාලනය පරාජය කරන්න ඔබේ දායකත්වය දෙන්න කියලා සමස්ත රටේ ජනතාවට අපි ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට ඉතාම කෙටි කාලයක් තමයි ලැබී තිබෙන්නේ. හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමාගේ වේලාව මට ලබා දීම ගැන.

අනිල් ජයන්ත මැතිතුමා අද කථා කරනකොට, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එතුමන්ලාගේ ආර්ථික වැඩ පිළිවෙළ ගැන කථා කළා. එතුමා කියපු දේ මම අහගෙන හිටියා. එතුමා මූලික කරුණු තුනක් ගැන කිව්වා. සියයට 70ක්ව තිබුණු මේ රටේ උද්ධමනය ඒගොල්ලන්ගේ ආණ්ඩුව යටතේ සියයට 0 සිට සියයට 0.1ත් අතරට ගෙනාවා කිව්වා. ඇත්තවශයෙන්ම අනිල් ජයන්ත මැතිතුමා හොඳටම දන්නවා, එතුමන්ලා රජය භාර ගන්නකොටත් උද්ධමනය ඍණ 0.5ක් බව. එතකොට උද්ධමනය සියයට 70 සිට බින්දුවට ගෙනාපු එක මේ ආණ්ඩුවෙන් කරපු දෙයක් නොවෙයි, ඒක කලින් ආණ්ඩුව කරපු දෙයක්.

(14th Start)

මම ඒක පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ. ඒ, පළමුවැනි කරුණ. දෙවැනි කරුණ මෙයයි. එතුමා කිව්වා, මේ ආර්ථිකය බිඳ වට්ටපු රටක් කියලා. "බිඳ වට්ටපු" කියන වචන එතුමන්ලා හැම වෙලාවේම පාවිච්චි කරනවා. මේ ආර්ථිකය බිඳ වැටෙන්න ප්‍රධානම හේතුවක් තමයි, රටට අවශ්‍ය කරන ආර්ථික ව්‍යුහාත්මක වෙනස්කම්, ආර්ථික ප්‍රතිසංස්කරණ -reforms- කරන්න ඔබතුමන්ලාගේ ideology එක ඒ කාලයේ ඉඩ නොදීම. එම නිසා අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරන්න බැරි වුණා. ඒක එක හේතුවක් මේ ආර්ථිකය බිඳ වැටෙන්න. එක ඇඟිල්ලක් අපේ පැත්තට දික් කරනකොට ඇඟිලි තුනක්, හතරක් තමන්ගේ පැත්තටත් දික් වෙනවා කියන එක මතක තියාගන්නම ඕනෑ.

ඊට පස්සේ කිව්වා, ආර්ථික වර්ධනය සියයට 3.5ක් බලාපොරොත්තු වුණා, ප්‍රතිඵලය විධියට සියයට 4.8ක්, 4.9ක් වාගේ තැනකට එන්න පුළුවන් වෙයි කියලා. අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් පැමිණි වෙලාවේ අපි ඔවුන්ගෙන් විමසුවා, බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා. ඔවුන් අපට කිව්වේ, සියයට 3.1යි කියලා. ආණ්ඩුවේම පිරිසක් සියයට 3.1ක් කියනවා, තවත් පිරිසක් 4.9ක් කියනවා. ඇත්තවශයෙන්ම ආර්ථික වර්ධන වේගය කීයක් වෙයිද කියලා අපට හිතාගන්න බැහැ. නමුත් නාමික ආර්ථිකය වැඩි වෙන්න එක හේතුවක් තමයි බදු. බලන්න, taxes minus subsidiesවල කොච්චර ලොකු ප්‍රමාණයක් තිබෙනවාද කියලා. බදු ගහලා, ගහලා නාමික ආර්ථිකය වර්ධනය වෙලා තිබෙනවා. ඇත්තවශයෙන්ම ගරු ඇමතිතුමාම කිව්වා, වාහන ආනයනය කරලා මේ අවුරුද්දටම රුපියල් බිලියන 450ක් තමයි බලාපොරොත්තු වුණේ, නමුත් අද වෙනකොට රුපියල් බිලියන 470ක් එකතු කරගෙන තිබෙනවා කියලා. Taxes එකතු කරලා, gross value added ක්‍රමයට ආර්ථිකය ගණන් හදනකොට විශාල ගණනක් එනවා. හැබැයි එතුමා නොකියපු ප්‍රධානම දේ මොකක්ද? හරි, මේ ඔක්කෝම හොඳයි කියමු. කිසි අවුලක් නැහැ. ආර්ථික ස්ථායීතාව තිබෙනවා. ඒ ස්ථායීතාව කලින් ආණ්ඩුව කරගෙන ආවා. ඔබතුමන්ලාත් ඒක අරගෙන යනවා. හැබැයි, ඔබතුමන්ලා කථා නොකරපු දේ මෙයයි. අපි දැක්කා විපක්ෂ නායකතුමාගේ කථාවේදී කිව්වා, සාර්ව ආර්ථිකය ගැන විතරක් නොවෙයි, ශුද්ධ ආර්ථිකය ගැනත් කථා කරන්න කියලා. ගෘහ ආර්ථිකය පිළිබඳවත්, සාමාන්‍ය පුරවැසියා පිළිබඳවත් කථා කරන්න ඕනෑ.

CEPA කියන්නේ poverty analysis සම්බන්ධව ලංකාවේ තිබෙන ප්‍රධාන ආයතනය. එහි මහාචාර්ය එච්.එම්. ගුණතිලකගේ study එකේ පෙන්වා තිබෙනවා, 2024 දෙසැම්බර් කරපු survey එකෙන් පෙන්වනවා කියලා, ලංකාවේ දරිද්‍රතාව සියයට 45ත්, 52ත් අතර වෙනවා කියලා. එම තොරතුරු ඇතුළත් ලේඛනයක් මේ අවස්ථාවේදී මම **table*** කරනවා.

එහෙම නම් එක පැත්තකින් ස්ථායීතාව තියා ගන්නකොට දරිද්‍රතාව අඩු කර ගැනීම පිළිබඳව මේ අවුරුද්ද තිස්සේ ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ කියන එක අපට අහන්නම සිදු වෙනවා. මම අහගෙන එතුමා කියනවා, අස්වැසුම කියන්නේ dole එකක් විතරයි, කොහොමද ඒකෙන් දරිද්‍රතාව නැති කරන්නේ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දරිද්‍රතාව නැති කරන්න නම් අපේ රටේ ආර්ථිකය වර්ධනය කර ගන්න ඕනෑ. අපි නිදහස ලබා අවුරුදු 100ක් ගතවෙනකොට අපට පුළුවන් නම් high income කියන threshold එකට එන්න, medium income කියන threshold එක පහු කරන්න, අපට හැම අවුරුද්දේම සියයට 9ක මූර්ත ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්න වෙනවා. ඒක කරන්නේ කොහොමද කියන එක තමයි දැන්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙන ගැටලුව. ඒකට මොකක්ද කරන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ? පෞද්ගලික ආයෝජන කොහෙන්ද එන්නේ? අද ලෝක බැංකුවේ නියෝජිතයන් ඇවිල්ලා තිබුණා, අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් හම්බ වෙන්න. ඔවුන් කිව්වේත් අපට කරන්න තිබෙන එකම දේ විධියට පෞද්ගලික ආයෝජන මේ රටට ගෙනෙන්න ඕනෑ, එහෙම නැතුව රජයට වියදම් කරන්න හැකියාවක් නැහැ, fiscal space එකක් නැහැ කියලා. ඒ වාගේ අවස්ථාවලදී තමයි අපට අහන්න වෙන්නේ, එහෙම නම් මේ සම්මත කරපු විදුලිබල පනත නැවතත් ආපස්සට ගෙන යන්න හදන්නේ ඇයි කියලා. දැන් කරන්න උත්සාහ කළේ පෞද්ගලික ආයෝජනය විදුලිබල ක්ෂේත්‍රයේ තිබෙන assetsවලටත් අරගෙන එන්න. දැන් ආණ්ඩුව කියනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ අයිතිය සියයට 100ක් ආණ්ඩුව තියාගන්නවා කියලා. මම විදුලිබල ඇමතිතුමාගෙන් අහනවා, ඇයි දෙවියනේ, එහෙම නම් මේකට මෙච්චර මහන්සි වෙන්නේ කියලා. කලින් Act එක ගෙනාවේ private investment තිබෙන assetsවලට - generating assetsවලට, transmission assetsවලට, distribution assetsවලට - ගෙනෙන්න. මේවාට, පොඩ්ඩක්වත් private investmentවලට ඉඩ දෙන්නේ නැත්නම් ඇයි මේ ගහ මරා ගන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් එක්ක? මේක ඒ විධියට ම තියාගෙන හිටියා නම් ඉවරයි නේ.

IMF එකේ නියෝජිතයන් ආ වෙලාවේ ලංකා විදුලිබල මණ්ඩලයේ කට්ටිය අපිව හම්බ වෙන්න ආවා. එතැනදී "සහස්දනව්" විදුලි බලාගාරය සම්බන්ධයෙන් මහා ලොකුවට කථා වෙච්ච දෙයක් තමයි, රුපියල් 20.11ටද කොහේද unit එකක් ගන්නවා කියපු එක. ඒකට මම හිතන විධියට, ගරු ජනාධිපතිතුමාත් ගිහිල්ලා ඊයේ පෙරේදා මුල්ගලත් තිබ්බා. ඔවුන්ගෙන් කෙළින්ම ප්‍රශ්නය ඇහුවා, 2028දී මේක විවෘත කරන කොට මේකේ unit එකක් කොච්චර මිලක් වෙනවාද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒගොල්ලන් දීපු උත්තරය තමයි, unit එකක් රුපියල් 20.11ක් නොවෙයි, රුපියල් 72.13ක් කියන එක. හැබැයි, LNG ගෙනැල්ලා ඒක කර ගත්තොත්, ඊට වඩා අඩුවෙන් කර ගන්න පුළුවන් වෙයි කිව්වා. හැබැයි, LNG ගෙනෙන විධියක් කිසිවිටෙකත් පෙනෙන්නටවත් නැහැ. සොබාදනව් විදුලි බලාගාරයත් එහෙමයි. මොකද, පෞද්ගලික ආයෝජනත් නැහැ, ආණ්ඩුවෙන් මේවාට වියදම් කරන්නත් ඕනෑ, හැබැයි සල්ලිත් නැහැ. රුපියල් 72ක් දීලා unit එකක් ගත්තාම, විදුලි බිල අඩු කරන්නේ කොහොමද? විදුලි බිල අඩු කරන්න නම්, cost reflective praxis එක නිසා cost එක අඩු කරන්න ඕනෑ. මේ යන විධියට cost එක අඩු කරන්න බැහැ. මේ යන විධියට මේ ක්ෂේත්‍රය වර්ධනය කරන්න බැහැ. හැබැයි කලින් ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න ස්ථායීතාව පවත්වාගෙන යනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, අද මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි ගැන විවාද කරන නිසා. දැන් මේ අය හාල් ආනයනය කරන්නත් උත්සාහ කරනවා. හාල් ආනයනය කරන අතරවාරයේ ටෙන්ඩර් දැන්වීමක් දාලා තිබෙනවා අපි දැක්කා, "ජාතික සමුපකාර තොග වෙළඳ සංස්ථාව සතු වී තොග සහල් බවට පත් කර ගැනීම සඳහා ජාතික තරගකාරීත්ව ලංසු කැඳවීම" කියලා. මම ඒ ටෙන්ඩර් දැන්වීම සඳහන් ලේඛනය **සභාගත*** කරනවා.

අපට පෙනෙන විධියට මේ දැන්වීම කාට හෝ ටෙන්ඩරය දෙන්න හදපු දැන්වීමක්. මොකද, මෙහි තිබෙන conditions සාමාන්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණයේ සහල් මෝල් හිමියන්ට සම්පූර්ණ කරන්න බැහැ. මෙහි එක කොන්දේසියක් විධියට රුපියල් මිලියන 4ක bid security එකක් දාලා තිබෙනවා. කොහොමද, රුපියල් මිලියන 4ක bid security එකක් දමන්නේ? ඒ කියන්නේ Paddy Marketing Board එකේ තිබෙන මුළු තොගයම සතොස අරගෙන, ඊට පස්සේ සතොසෙන් තව කෙනෙක් අරගෙන සතොසට වී තොගය කොටලා දුන්නාම, ලංකා සතොස කියන තුන්වැනි ආයතනයකින් විකුණන්න හදනවා නම්, මාස දෙකක් ඇතුළත මේ වී කොටන්න නම් එක දවසකට වී කිලෝ ලක්ෂ 8ක් mill කරන්න ඕනෑ. ලක්ෂ 8ක් mill කරන්න කාටවත් facility එකක් නැහැ. එහෙම facility එකක් නැත්නම්, රුපියල් මිලියන 4ක bid security එකක් ගන්න අවශ්‍යතාවක් නැහැ. මේ ගැන සොයා බලනකොට අපට පෙනෙනවා, මේක කාගේ හෝ පැත්තකට තල්ලු කිරීමේ අවශ්‍යතාවක් කාට හෝ තිබෙනවාද කියලා. ඔබතුමන්ලා කවුරුත් දන්නවා ඇති, අපි ඒ කාලයේ "ශක්ති සහල්" කියලා ව්‍යාපෘතියක් කළා. වී කිලෝවකින් අවම වශයෙන් සියයට 65ක් හාල් ගන්න ඕනෑ. දැන් මේ දැන්වීමෙන් මොකක්ද කියන්නේ? මේකෙන් කියන්නේ සියයට 63ක් හාල් දෙන්න කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

සියයට 63ක් හාල් දෙන්න කිව්වාම, සියයට 2ක් නිකම්ම කාගේ පොකට් එකටද යන්නේ? ඒ කියන්නේ හාල් කිලෝවක් රුපියල් 200 ගණනේ ගත්තොත්, මේ සියයට 63 මෝලෙන් ගන්න රුපියල් මිලියන 200ක් යනවා. අපි කරන්න ඕනෑ හාල් පිටරටින් ගෙනෙන එක නොවෙයි. ඇත්තවශයෙන්ම ආනයන හා අපනයන කරන්න ඕනෑ. ඔබතුමන්ලා කිව්වා, හාල් ඇටයක්වත් පිටරටින් ගෙනෙන්නේ නැහැ කියලා. අන්න, කිරි සම්බා කිලෝවක මිල රුපියල් 300 ගණනකට ඉහළ ගිහිල්ලා. දැන් කියනවා, අපි රටින් හාල් ගෙන්වලා දෙන්නම් කියලා. ඒ ගැන කථා කරන්න නොවෙයි, ඔබතුමන්ලා මෙතැනට ආවේ. ඔබතුමන්ලා කිව්වේ, හාල් පිටරටින් ගේන්නේ නැහැ, මේ රටේ නිෂ්පාදනය කරනවා කියලා. ඒ විතරක් නොවෙයි. නිෂ්පාදනය කරපු වී ටිකත් දැන් තමන්ගේ පුද්ගලයින්ට දීලා, mill කරලා සියයට 63ක ප්‍රමාණයක් අරගෙන, යම් කිසි ප්‍රමාණයක් ඒගොල්ලන්ගේ බැංකු ගිණුම්වලට දමා ගන්නා වැඩ පිළිවෙළක් වෙනවා වාගේ තමයි අපට පෙනෙන්නේ.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 3.40]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටක සංවර්ධනය මිනුම් කරන සාධක වන මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය සහ භෞතික ජීවන දර්ශක අනාථභාවයට පත් කරමින්, ලෝක නායකයින්ගේ හා ලෝකයේ පිළිගත් ප්‍රගතිශීලි ජාත්‍යන්තර ආයතනවල අවඥාවට, පිළිකුලට හා ප්‍රතික්ෂේප කිරීමට ලක් කළ රටක් තමයි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා අපට භාර දුන්නේ කියන එක විශේෂයෙන්ම මම මේ වෙලාවේදී මතක් කරන්න ඕනෑ. ඒ වාගේම සිහිමුර්ජා කරපු මිනිස්සුන්ගෙන් සැදුම්ලත් රටක් තමයි, ඔබ අපට උරුම කරලා දුන්නේ. ඒ නිසා ඒක කිසිවිටෙක අමතක කරන්න උත්සාහ කරන්න එපා. තව වසර දෙකක් මේ රට මේ විධියට තිබුණා නම්, මේ විධියට ගියා නම්, ලෝකයේ ප්‍රබලතම මත්ද්‍රව්‍යවලින් පරිපූර්ණ, බල අපරාධවලින් ගහන වෙච්ච, රටේ අනාගත පරපුර හා වැඩිහිටි ජනතාව සිහි විකල්ව පාරවල් දිගේ නන්නත්තාරව ඇවිදින තත්ත්වයක් උදා වෙන්න තමයි අවකාශ සැලසිලා තිබුණේ. ඒක මතක තබා ගන්න.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා කියනවා, ඔබතුමන්ලාගේ කාලයේ සංවර්ධනය වෙලා තිබුණා, දැන් මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ, අපි මැදිහත් වෙලා, අපේ ideology එක වැරදි විධියට භාවිත කළ නිසාය කියලා. නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා තේරුම් ගන්න. අපි දේශපාලන බලය ලබා ගන්න ඉස්සර වෙලාත්, බලය ලබා ගත්තාට පස්සේත් අපේ එකම පරමාර්ථය තිබුණේ, අපේ සිහිනය තිබුණේ, මේ පුංචි කොදෙව්ව මෙන්න මේ තත්ත්වයට පත් කරන්න ඕනෑය කියන එක. අපේ අපේක්ෂාව තිබුණේ, පොහොසත් රටක ලස්සන ජීවිතයක් හැමෝටම ලබා දෙන්න ඕනෑය කියන එකයි, ගරු මන්ත්‍රීතුමනි. අපට වෙනත් බලාපොරොත්තු තිබුණේ නැහැ. ඒ නිසා ඉතිහාසයේ පළමුවැනි වතාවට ශ්‍රී ලාංකීය ජනතාව එක මිටකට ගොනු කරමින් ජාතික සමඟිය තහවුරු කරපු විශිෂ්ට මැතිවරණ ජයග්‍රහණයක් ඔවුන් අපට ලබා දුන්නා. අන්ධකාරය වෙනුවට ආලෝකය තෝරා ගත්ත ජනතාව අපට ලබා දුන් ඒ සුවිශේෂී ජනවරම තහවුරු කරමින් තමයි අපි ඔවුන්ට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ලබා දෙන්න ඇපකැප වී ඉන්නේ. අපි ඒක යථාර්ථයක් බවට පත් කරනවා. ඒ සම්බන්ධයෙන් කිසිදු සැක සංකාවක් තියා ගන්න එපා කියලා මම ඔබතුමාට කියනවා.

විනාශ කරපු, බිඳ වට්ටපු රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය යළි ඉහළට ඔසවා තබා ආර්ථිකය යළි ස්ථායීකරණයට පත් කරන්න නම්, එහි කොඳු නාරටිය වෙච්ච අපේ රටේ දේශීය ව්‍යාපාරිකයාට, ආයෝජකයාට අපි අනිවාර්යයෙන්ම ප්‍රාණ වායුව ලබා දෙන්න ඕනෑ; ප්‍රාණ වායුව පිඹින්න ඕනෑ. පසුගිය වකවානුව පුරාම ඔවුන්ගේ කොඳු කඩලා, අතපය කඩලා අනාථභාවයට පත් කරලා තිබුණේ. ව්‍යාපාර බිඳ වැටිලා, දේපළ මූල්‍ය ආයතනවලට වාගේම එක එක පුද්ගලයන්ට සින්න වෙලා තිබුණේ. 260,000ක් පමණ ව්‍යාපාර බිඳ වැටිලා තිබුණේ. අන්න ඒ අයට ජීවය දෙන්න තමයි අපි ජනතාවාදී ආණ්ඩුවක් විධියට විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබුවේ. ඒ අය උනන්දු කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි අපි මේ ශක්තිය ඔවුන්ට ලබා දුන්නේ. ඒකේ දිගුවක් විධියට තමයි වැඩබලන මුදල් අමාත්‍යවරයා විසින් සංචාරක ක්ෂේත්‍රයේ වේගවත් සංවර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් අද දින මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ ඉදිරිපත් කරන ලද රෙගුලාසි ඔවුන්ට ශක්තියක් ලබා දීම සඳහා පාදක වෙනවාය කියන කාරණය මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. එතුමා විසින් ජනතාවාදී ආණ්ඩුවේ ආරම්භක ගමන් මඟ හා එහි සුවිශේෂී ක්‍රියා කලාපය කරුණු කාරණා සහිතව, සාධක ඇතුව පැහැදිලි කළාය කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම අපේ මන්ත්‍රීවරු, නියෝජ්‍ය ඇමතිවරු සහ අමාත්‍යවරු මේ පිළිබඳව ඉතා මැනවින් කරුණු අවබෝධ කරලා දුන්නාය කියලා අපි විශ්වාස කරනවා. මේ මහජන නියෝජිතයන් හැම කෙනෙකුම ඉදිරිපත් කළ කරුණු පිළිබඳව ඇත්තට වැටහීමක් තිබෙනවා නම්, ඒ පිළිබඳව සාධනීය විධියට කල්පනා කරනවා නම්, විපක්ෂයේ කිසිම කෙනෙකුට මේ සම්බන්ධයෙන් නරක විධියේ චිත්‍රයක් හදා ගන්න පුළුවන්කමක් නැහැ. එහෙම කරනවා නම් ඒක දේශපාලන කුහකකමක් කියලා අපි විශ්වාස කරනවා.

ආණ්ඩුව කරන්න පටන් ගත්තාට පස්සේ මේ දක්වාම අපි විශාල මැදිහත් වීමක් කරලා හැම අංශයක්ම පෝෂණය කරලා තිබෙනවා, අද වනවිට සතුටු විය හැකි ආකාරයට. ඒ අනුව, රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප අපි වැඩි කරලා තිබෙනවා, රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා. විශ්‍රාම වැටුප රුපියල් 3,000කිනුත්, පෞද්ගලික අංශයේ අවම මූලික වැටුප රුපියල් 21,000 සිට රුපියල් 27,000 දක්වාත් වැඩි කරලා තිබෙනවා. රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ආපදා ණය මුදල රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය ඉතාම ඉහළට ඔසවා තබන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ සුදුසුකම් ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ ශිෂ්‍යාධාර මුදල වැඩි කරලා තිබෙනවා, රුපියල් 750 සිට රුපියල් 1,500 දක්වා. මහපොළ ශිෂ්‍යාධාර මුදල වැඩි කරලා තිබෙනවා, රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා. ඒ වාගේම පෙර පාසල් දරුවන්ගේ දෛනික ආහාර දීමනාව වැඩි කරලා තිබෙනවා, රුපියල් 60 සිට රුපියල් 100 දක්වා. පාසල් දරුවන්ට පොත් හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට රුපියල් 6,000ක දීමනාවක් ලබා දීලා තිබෙනවා. දහම් පාසල් ගුරු දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා අපි වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම පෙර පාසල් ගුරුවරුන්ගේ මාසික දීමනාව රුපියල් 1,000කින් වැඩි කරලා තිබෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැළී සිටින වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය රුපියල් 15,000 සිට රුපියල් 25,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ධීවර ක්ෂේත්‍රයේ යෙදෙන සියලු යාත්‍රාවලට අපි ඉන්ධන සහනාධාරය ලබා දීලා තිබෙනවා. මෙන්න මේ විධියට දැවැන්ත පරිවර්තනයක් අපි සමාජය පුරා මුදා හැරලා තිබෙනවා. ඒ වාගේම සමාජ සුබසාධනය සඳහා ලබා දෙන අස්වැසුම සහනාධාරය රුපියල් 8,500 සිට රුපියල් 10,000 දක්වාත්, රුපියල් 10,000 සිට රුපියල් 17,500 දක්වාත් වැඩි කරලා තිබෙනවා. එමෙන්ම වකුගඩු රෝගීන්ට සහ ආබාධිත පුද්ගලයන්ට ලබා දෙන මාසික දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වාත්, වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වාත් වැඩි කරලා තිබෙනවා. මෙන්න මේ ආකාරයේ ජනතාවාදී වැඩකටයුතු රාශියක් අපි, අපේ පැත්තෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා අපට භාර දුන් මේ රටේ හිටපු අහිංසක ජනතාව දිරිමත් කරන්න, ඒ මිනිස්සු ඒ අගාධයෙන් මුදා ගන්න අපි, අපේ පැත්තෙන් වැඩකටයුතු කරලා තිබෙනවා කියන එක විශේෂයෙන්ම මේ මොහොතේදී මා ප්‍රකාශ කරන්න ඕනෑ.

ඇත්තටම, අවුරුදු 24ක පාර්ලිමේන්තු අත්දැකීම් තිබෙන මන්ත්‍රීවරයෙක් විධියට මම මේ වකවානුව පුරාම බලාගෙන හිටියා. ඇත්තටම, මොන වාගේ විපක්ෂයක්ද අපි අපේක්ෂා කළේ? අපි අපේක්ෂා කළේ අපේ අඩුපාඩුකම් පෙන්වා දීලා, අපව දිරිමත් කරලා, සහයෝගය දීලා, අපිව ඉදිරියට ගෙනියන්න පුළුවන් බුද්ධිමත්, උගත් අයගෙන් පිරි සාධනීය විවේචන ඉදිරිපත් කරන ශක්තිමත් විපක්ෂයක්. නමුත්, බොහොම කනගාටුදායකයි. අපි කල්පනා කරලා බැලුවොත්, විශේෂයෙන්ම දේශපාලන ඉතිහාසය ගත්තාම ආදර්ශවත් භාවිතයක් මේ වත්මන් විපක්ෂය තුළින් අපට දැක ගන්න ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම විපක්ෂ නායකවරයාගේ ඉඳලා ඒ අනුගාමිකයන් දක්වා තත්ත්වය එයයි. කිහිපදෙනෙක් ඉන්නවා, යම් යම් ආකාරයේ සාධනීය කරුණු

ඉදිරිපත් කරන. ඒකත් හරියට අපට තෝරා ගන්න බැහැ. මොකද, ඒ තරමම බොහොම අහඹු තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ විපක්ෂ නායකතුමාගේ සිහිනය කවදාවත් සැබෑ වෙන්නේ නැහැ කියලා. පව්. අපි කියනවා, එතුමාට තිබෙන්නේ දේශපාලන අන්ධභාවයක්, දේශපාලන උන්මාදයක්, කුහකකමක් කියන එක. වෙන මොකක්වත් නොවෙයි. එතුමා හැමදාම කථා බහ කරන්නේ කිසිම වැදගැම්මකට නැති, කාලය කා දමන වහසි බස් විතරයි කියන එක මා විශේෂයෙන් මේ මොහොතේදී ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා එතුමාගේ ජනාධිපති සිහිනය කවදාවත් ඉෂ්ට වෙන්නේ නැහැයි කියන එක මම එතුමාට ප්‍රකාශ කරනවා. අද හම්බන්තොට දිස්ත්‍රික්කය පුරාම එතුමා ආරම්භ කරපු විවිධාකාර ව්‍යාපෘති තිබෙනවා. මිනිස්සු බලාගෙන ඉන්නවා; අනාථ වෙලා ඉන්නවා. ඒ නිවාස ව්‍යාපෘති, පාලම් ව්‍යාපෘති බිඳ වැටිලා, විනාශ වෙලා කෝටි - ප්‍රකෝටි ගණන් මුදල් කාබාසිනියා කරලා තිබෙනවා. මිනිස්සු බලාගෙන ඉන්නවා, එතුමා හම්බවෙලා ඒවාට සාධාරණයක් ඉෂ්ට වෙයි කියන බලාපොරොත්තුවෙන්. මම හිතන හැටියට එතුමාට අද හම්බන්තොට දිස්ත්‍රික්කයට යන්න බැරි වෙලා තිබෙන්නේත් එතුමාට යුක්තිය ඉෂ්ට කරන්න මිනිස්සු බලාගෙන ඉන්න නිසායි.

ඒ වාගේම මම මේ මොහොතේදී විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය උවදුර ගැනත් පැහැදිලි කරන්න ඕනෑ. මේ වනකොට මත්ද්‍රව්‍ය උවදුර රට පුරාම දැවැන්ත ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට සම්බන්ධ වෙච්ච බොහෝ මහත්වරු, නෝනලා ඉදිරියේදී ඒ මෙහෙයුම්වලින් හෙළිදරව් වෙන බව. ඒ නිසා අපි ඉතාම සන්සුන්ව, අවදියෙන් ඒ දෙස බලාගෙන ඉන්නවා. මේ මෙහෙයුම් කරන කිසිම කෙනෙකුට අපි, අපේ පැත්තෙන් අබමල් රේණුකවත් බලපෑමක් කරන්නේ නැහැ. Godfathersලා, ඔවුන්ගේ දරුවෝ, අනුගාමිකයෝ සියල්ලම හෙළිදරව් කර ගන්න අවශ්‍ය නිදහස අපි ඔවුන්ට දීලා තිබෙනවා. ඒ නිසා කලබල වෙන්න එපා, සීරුවෙන් මේ ප්‍රතිඵල දිහා බලාගෙන ඉන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. නාමල් බේබි පාර්ලිමේන්තුවට එනවා. පාර්ලිමේන්තු සභා ගර්භයට ඇවිල්ලා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඊට උත්තර දෙන්න ඉස්සෙල්ලා එතුමා නැඟිටලා යනවා. මේක තමයි, ඒගොල්ලන්ගේ පිළිවෙත. ඒ නිසා අපි මේ අවස්ථාවේදී ඔබෙන් ඉල්ලීමක් කරනවා. නාමල් මන්ත්‍රීතුමා මේ වෙනකොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට එන්නේ නැහැ. එතුමාගේ ගෝලයාත් එහෙමයි. එතුමා එන්නේත් නැහැ. සම්බන්ධීකරණ කමිටු කිසිවකට එන්නේ නැහැ. මේ සභාවට ඇවිල්ලා පොර ටෝක් දීලා, වහසි බස් දොඩලා, පව ගහලා, අවලාද කියලා මෙතැනින් පිටවෙලා යනවා. ඒ නිසා ඒගොල්ලන්ටත් නිසි උත්තර ජනතාවගෙන් ලැබෙයි කියන විශ්වාසය අපට තිබෙන බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.52]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් මෙතුමන්ලා මේ රටේ මේ ගෙවුණු අවුරුද්ද ගැන මොන කථා කිව්වත්, ඉතාම කනගාටුයි කියන්න, ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ, අපේ රටේ තිබුණු ප්‍රධාන බහුජාතික බැංකුවක් වන, අවුරුදු 100කට වඩා කාලයක් මේ රටේ කටයුතු කරපු HSBC බැංකුව අද මේ රට අත්හැර දමා යන්න තීන්දු කර තිබෙනවා. දේශීය සමාගමකට විකුණා අද මේ රට අත්හැර දමා යන්න තීන්දු කර තිබෙනවා, HSBC බැංකුව. දැන් මෙතුමන්ලා මොන කථා කිව්වත්, අද අපේ රටේ ආයෝජනය පිළිබඳව, මේ රටේ ව්‍යාපාර කිරීම පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. අපට අන්තිමට ඉතිරි වෙලා තිබෙන්නේ තව එක බැංකුවයි. ඒ, Standard Chartered Bank එක. Standard Chartered බැංකුවත් මේ වෙනකොට මේ රටින් ඉවත් වීමට කටයුතු කරමින් සිටිනවා. අපට ජාත්‍යන්තර බැංකු දෙකක් තිබුණා. වැඩි කාලයක් යන්නේ නැතිව ඒ බැංකු දෙකම මේ රටට අහිමි වෙලා තිබෙනවා.

කුඩු, පාතාලය ගැන කරීකයින් විශාල ප්‍රමාණයක් මේ ගරු සභාවේ කථා කළා. ඔබ දන්නවා, UNODC -United Nations Office on Drugs and Crime- ගැන. එතකොට UNODC එක විසින් අර කන්ටේනර් පිළිබඳව warning එකක් දීලා තිබුණා, මේවා අත්අඩංගුවට ගන්න, මේවායේ තිබෙන්නේ මත්ද්‍රව්‍ය කියලා. හැබැයි, මේ කන්ටේනර් දෙක මොකක් හෝ බලපෑමක් මත වරායෙන් අයින් වුණා. වරායෙන් මොන පරීක්ෂණයක් කළත් නැතත්, ඒක අහු වුණෙත් නැහැ, ඒවා නතර වුණෙත් නැහැ, වරායෙන් පිටට ගියා. එතකොට කල්පනා කරන්න, මැතිතුමනි, මේ කන්ටේනර් දෙකේ මෙහෙම නම්, අර කිසිම සෝදිසියක් නැතිව කන්ටේනර් 323ක් ගිය ඒවායේ මොනවා තිබෙන්න පුළුවන්ද? එක් පැත්තකින් මත්ද්‍රව්‍ය වෙන්න පුළුවන්. නැත්නම් අපේ අර මන්ත්‍රීතුමා කියනවා වාගේ ඒවායේ තුවක්කු, පිස්තෝල, බෝම්බ තිබෙන්න පුළුවන්. මෙන්න මේ වාගේ කථා කියනවා. අද තමුන්නාන්සේලා කියන්නේ මොකක්ද? තමුන්නාන්සේලා වෙන මොකවත් නොවෙයි කියන්නේ, පසුගිය කාලය ගැන කියමින් ඇඟිලි දිගු කරනවා අරයාට, මෙයාට, සාටකයට, "මෙන්න මේ අය තමයි පාතාලය මෙහෙයවූයේ, මේ අයගේ කණ්ඩායම තමයි මත්ද්‍රව්‍ය මෙහෙයවූයේ" කියලා. ඔබ දන්නවාද, දැන් අවුරුද්දක් ගත වෙලා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට. තවම වෙන වෙන අයට අත දිගු කරන්නේ නැතිව, ඇඟිලි දිගු කරන්නේ නැතිව දැන් ඔබ ඔබේ වැඩේ පටන්ගන්න. පාතාලයට, මත්ද්‍රව්‍යවලට සම්බන්ධ කවුරු හෝ දේශපාලනඥයෙක් ඉන්නවා නම් ඒ කවුද කියලා කියන්න. ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරන්න.

අර මිද්දෙනියේ කන්ටේනර් දෙකක් අහුවුණාම, දකුණේ දේශපාලනඥයින් මේකට සම්බන්ධයි කියලා පරීක්ෂණවලදී අහුවුණා කිව්වා. දැන් voice-cut එකේ තිබෙනවා දකුණේ දේශපාලනඥයෝ කියලා, මාධ්‍ය සාකච්ඡාවල තිබෙනවා. එතකොට කෝ, කවුද දකුණේ දේශපාලනඥයා? ඒ කවුද කියලා මේ රටට නීතිය ක්‍රියාත්මක කරලා පෙන්වන්න. නැත්නම් නිකම් ඔය මාධ්‍ය සාකච්ඡාවල, දේශපාලන වේදිකාවල එහෙම කියලා

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

වැඩක් නැහැ. දකුණේ දේශපාලනඥයෝ සම්බන්ධ නම්; එක් කෙනෙක් හෝ දෙදෙනෙක් හෝ පවුලක් හෝ සම්බන්ධ නම්, ඒ කවුද කියන එක ඉතා පැහැදිලිවම කියන්න, මේ රටේ ජනතාවට. ඒ අයට නීතිය ක්‍රියාත්මක කරන්න. අද නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. නමුත් මාධ්‍ය සාකච්ඡාවේදී, දකුණේ දේශපාලනඥයෝ පාතාලයට සම්බන්ධයි, පසුගිය කාලයේ දේශපාලනඥයෝ තමයි පාතාලය හැදුවේ කියා කියනවා. එහෙම කිව්වාට මේ රටේ ජනතාව බලාගෙන ඉන්නේ, අවුරුද්දකට කලින් තමුන්නාන්සේලාට බලය ලබා දුන්නේ මේවා අවසන් කර මේ අයව නීතිය හමුවට ගෙන එන්නයි. ඒ නිසා, කරුණාකර තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් කටයුතු කරන්න. දැන් ඒවා ප්‍රශ්න කරනකොට තමුන්නාන්සේලා අහනවා, කැමැත්තෙන් ගත්තා නම්, කැමැත්තෙන් දුන්නා නම් ඔබට පාන් ද කියලා. ඔබට පාන් ද? නැහැ නේ. කිසිම කථාවක් නැහැ. කවුද කියලා අදාළ නැහැ. ඒ ඕනෑම කෙනෙකුට නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ ගැන අහනකොට ඒක දුන්නේ කැමැත්තෙන් නම් "ඔයාට පාන් ද" කියලා අහන එක නොවෙයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණේ. දැන් පානුත් නැහැ. දැන් මේ රටේ ජනතාවට "පාන්" කියාගන්නත් බැහැ. මේ රටේ ජනතාව ඔබතුමන්ලා බලයට පත් කර තිබෙන්නේ ලොකු බලාපොරොත්තුවක් ඇතිවයි. හැබැයි, මේ අවුරුද්දක තරම් කෙටි කාලය තුළ ජනතාවගේ ඒ බලාපොරොත්තු සුන්වෙලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා කියපු ඒ දේවල් ටික කරන්න දැන්වත් පටන් ගන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. අද විවාදය පැවැත්වෙන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි සම්බන්ධවයි. විශේෂයෙන්ම වාහන සම්බන්ධ ප්‍රශ්නයක් එක්ක තමයි මේක තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහිදී අපි පිළිගන්නා දෙයක් තිබෙනවා. ඒ තමයි, විශේෂයෙන්ම ලෝකයේ අලුතින් වාහන විවිධාකාරයෙන් නිර්මාණය වෙනවා. මීට අවුරුදු ගණනාවකට කලින් අපි දැනගෙන සිටියේ ඩීසල් සහ පෙට්‍රල් වාහන ගැන විතරයි. ඊටපස්සේ hybrid වාහන ආවා. දැන් සම්පූර්ණයෙන්ම EV vehicle- වාහන එනවා. ඒවායේ mix ඒවා එනවා. විවිධ තත්ත්වයන් යටතේ අලුත් වාහන අපේ රටට එනකොට, ඊට ගැළපෙන රෙගු සහ අනෙකුත් යාවත්කාලීනවීම් අපට සිදු කරන්න වෙනවා. අපි හිතනවා, ඒ සම්බන්ධයෙන් අපේ දෙපාර්තමේන්තුවේ, අපේ නිලධාරීන්ගේ පැත්තෙන් වැඩිපුර උනන්දුවෙන් කටයුතු කළ යුතුයි කියලා. මොකද, ඒ හැම දෙයකම පීඩනය එක පැත්තකින් රටේ ආර්ථිකයට එනවා. ඊට අමතරව මේවා ආනයනය කරන පුද්ගලයන්ටත් ඒ පීඩනය එනවා. සමාගම්වලටත් එනවා; පුද්ගලයන්ටත් එනවා. පුද්ගලයෝ ගත්තාම, සමහර වෘත්තිකයන් ඉන්නවා, ඔවුන්ට ඇත්තටම වරායේ ප්‍රමාද ගාස්තු ගෙවමින් ඉන්න විශාල මුදලක් නැහැ. ඒ වාගේම, මේ සියල්ලේම අවසාන ප්‍රතිවිපාකය වරායට එනවා. ඒක සිද්ධ වෙන්නේ වරායේ වාහන විශාල ප්‍රමාණයක් එකතු වීමත් එක්ක. ඒක කාගේවත් පෞද්ගලික වැරැද්දක් ලෙස අපි දකින්නේ නැහැ. නමුත්, ලෝකය තාක්ෂණික වශයෙන්, වාහන වාගේ දේවල් දවසින් වෙනස් වෙන්නේ නැහැ. ඕවා සියල්ලම අවුරුදු ගණන් test කරන දේවල්. ඒවා කරනකොට අපි හිතනවා, ඒවාත් එක්ක ටිකක් උනන්දුවෙන් සම්බන්ධ වීම අත්‍යවශ්‍යයි කියලා.

කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ලංකාවේ තිබුණු බැංකුවක් ඔවුන්ගේ ශාඛාව අපේ රටින් ඉවත් කරගෙන යනවා කියලා. මම ඒ පිළිබඳව අද උදේ වැඩබලන මුදල් ඇමතිවරයා සමඟ සාකච්ඡා කළා. අවශ්‍ය වුණොත් මේ සම්බන්ධයෙන් එතුමා පිළිතුරු ලබා දෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ළඟදී Standard & Poor's හා Moody's සහ Fitch Ratings කියන ලෝකයේ තිබෙන ප්‍රධාන ආර්ථිකයන් ratings කරන ආයතනවලින් ලංකාව ඉහළ ශ්‍රේණියකට ගෙන ආ බව ඔබතුමියත් දන්නවා. ඒ වාගේම ඔබතුමිය දන්නවා, 2024දී අපි ආණ්ඩුව ගන්නකොට ලංකාවේ කොටස් වෙළෙඳ පොළේ කොටස් තිබුණේ දසදහස් ගණනක් බව. දැන් ඒක විසිඑක්දහසට ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම, ලංකාවේ වැඩිම export growth එක මේ කාලයේ තිබෙන බවත් ඔබතුමිය දන්නවා. අපනයන වැඩිපුර තිබෙනවා. ඒ වාගේම, විදේශගත ශ්‍රී ලාංකිකයන් ලංකාවට සල්ලි එවන ප්‍රමාණයේත් වැඩිවීමක් තිබෙනවා. සංචාරක ආදායම් වැඩිම ප්‍රමාණයක් තිබෙනවා. Foreign Direct Investment, ඒක හරි වැදගත්. අපි මෙහෙම හිතමු. පිට රට ඉන්න ලංකාවේ අය කොහොමත් ලංකාවට මුදල් ටිකක් එවන්න ඕනෑ නේ. ලංකාව කොයි තරම් බංකොලොත් වෙලා තිබුණත් සමහර විට ඔවුන් මුදල් ටිකක් එවනවා නේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා අපේ රට පාලනය කරපු කාලයේත් මිනිසුන් මුදල් ටිකක් එව්වා නේ. නමුත්, Foreign Direct Investment කියන ඒවා එහෙම එන්නේ නැහැ. ඒවා එන්නේ ආර්ථිකයක් සෞඛ්‍ය සම්පන්න නම් විතරමයි. ඒවාත් අවුරුද්දක් ඇතුළත ඩොලර් බිලියනයක් විවිධ සෘජු විදේශ ආයෝජන ලෙස ඇවිල්ලා තිබෙන බව අපි පෙන්නුවා. ඒ නිසා අපට පේනවා, ලංකාවේ ආර්ථිකය පිළිබඳව අන්තර්ජාතික ආයතනවල ratings වැඩි කර තිබෙනවා; ශ්‍රේණිගත කිරීම් ඉහළ දාලා තිබෙනවා කියලා.

ඒ වාගේම, ලංකාවේ විදේශ වෙළෙඳාම පැත්තෙන් ගත්තොත් ඒවාත් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ලංකාවේ ආර්ථිකය පැත්තෙන් ගත්තත්, දේශීය ආර්ථිකය ගත්තත් අපි වැඩිම බදු ආදායමක් අරගෙන තිබෙනවා. ඒ, අලුතින් බදු ගහලා නොවෙයි. තිබුණු බදු ටික අපි හරියට එකතු කරගෙන ගියා. ඔය බදුම තමයි අපට කලිනුත් තිබුණේ. ඇත්තටම අපි PAYE tax එක ටිකක් අඩු කළා. ඔබතුමිය දන්නවා, 2024 සැප්තැම්බර් 21වන දා අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපති වෙනකොට PAYE tax එක ගෙවන්න slab එක පටන් ගත්තේ රුපියල් ලක්ෂයෙන්. රුපියල් ලක්ෂ 4 දක්වා යන විට මට මතක විධියට සියයට 18ක් දක්වා තිබුණා. ඊට අඩු මුදල් පරාසයන් තුළ සියයට 06, සියයට 12 වශයෙන් තමයි ගියේ. අපි දැන් රුපියල් ලක්ෂ එකහමාරෙන් තමයි tax පටන් ගන්නේ. රුපියල් ලක්ෂ එකහමාරේ සිට ලක්ෂ 4 වෙනකම් tax එක අඩුයි කියලා ඔබතුමියත් දන්නවා.

මට මතක හැටියට, අප PAYE tax එක අඩු කිරීම නිසා රජය රුපියල් බිලියන 60ක විතර බදු ආදායමක් අහිමි කරගෙන තිබියදීත් තමයි අපි සමස්ත බදු ආදායම වැඩි කරගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ලංකාවේ ආර්ථිකය ඉස්සරහට යනවා. එය හරි පැහැදිලියි. ඒ ගැන කිසිම සැකයක් නැහැ. හැබැයි, එහෙම තිබියදීත් මෙහෙන් යන්න හදනවා කියන ආයතනයක් ගැන කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා. ලෝකයේ විවිධ සමාගම් තම සමාගම්වල උපාය මාර්ග අනුව දියුණු වෙන්න පුළුවන්; වැටෙන්න පුළුවන්. තමන්ගේ සමාගමේ අකාර්යක්ෂමතා නිසා වැටෙන්නත් පුළුවන්. ලෝකයේ පෞද්ගලික ආයතන කොච්චර නම් බිඳ වැටෙනවාද කියලා ඔබතුමිය දන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවෙන් පිටව යනවා. කමක් නැහැ, එතුමාට වැඩ ඇති. මොකද හැංගිලා බලන්නේ, හර්ෂණ මන්ත්‍රීතුමා? ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා,- *[බාධා කිරීමක්]* ඔබතුමා අර දකුණේ දේශපාලනඥයාගේ නම කියලා නැත්තේ මා හිතන විධියට ඔබතුමාට මොකක් හරි ඥාතිකමක් තිබෙන නිසා වෙන්න ඇති. *[බාධා කිරීමක්]* හරි, හරි. හර්ෂණ මන්ත්‍රීතුමා, ඔබතුමා ඔබතුමාගේ වැඩ කර ගන්න.

ව්‍යාපාරයක් වැටෙන එක, බැංකුවක ශාඛාවක් ගලවාගෙන යන එක අනිවාර්යය වශයෙන් ලංකාවේ ආර්ථිකයේ ප්‍රශ්නයක් නිසා වන්නේ නැහැ. එහෙම නම් ඇමෙරිකාවේ companies කොච්චර නම් බංකොලොත් වෙනවාද? ජපානයේ companies කොච්චර නම් බංකොලොත් වෙනවාද? චීනය තමයි ලෝකයේ ලොකුම ආර්ථිකය තිබෙන රට. ඒ රටේත් ආයතන බිඳ වැටෙනවා. මොකද, පෞද්ගලික අංශය වුණත් perfect නැහැ නේ. ඒ මන්ත්‍රීතුමා කියපු බැංකුවත් ඔවුන්ගේ වෙච්ච සැලැස්මක් අනුවයි යන්නේ. ඒ අය අතින් අල්ලා නවත්වන්න අපට බැහැ. වික්ටර් රත්නායක මැතිතුමාගේ ඒ වාගේ සිංදුවකුත් තිබෙනවා නේ. මා හිතන විධියට, ඒ ආයතනයේ අය හදිසියේ ගත් තීන්දුවකුත් නොවෙයි ඔය. හොයලා බැලුවොත්, මීට මාස ගණනකට කලින්, අවුරුද්දකට, දෙකකට කලින් වෙන්න පුළුවන්, ඒ බැංකුව ඔය decision එක ගන්න ඇත්තේ. ඒගොල්ලෝ, උදේ හිතලා හවසට බැංකුව අකුළාගෙන යන්නේ නැහැ නේ. අපි හිතනවා, තවත් ඕනෑ තරම් අන්තර්ජාතික බැංකු ලංකාවේ ව්‍යාපාර කටයුතු වෙනුවෙන් එයි කියලා. මොකද, ලංකාව පැහැදිලිවම ආර්ථික වර්ධනයක් අත් කර ගනිමින් ඉන්නවා.

ආර්ථිකය සම්බන්ධව ගත්තොත්, අපි සතුටු වෙනවා, අපට මේ රට ලැබුණු විධිය අනුව අපි අද රටක් වශයෙන් ගිහිල්ලා තිබෙන දුර ගැන. ඉදිරි අය වැය විවාදයේදී අපි බලාපොරොත්තු වෙනවා, අපේ ප්‍රතිපත්තිය සහ අප මොනවාද කරලා තිබෙන්නේ කියන එක ගැන කියන්න. බොහෝ රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා කලින් වසරවලට වඩා විශාල වශයෙන් ලාභ ලබා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තවත් කරුණක් කියන්න කැමැතියි. අපි පිළිගන්නවා, විපක්ෂයේ නායකයන්ට තමන් කැමැති දෙයක් අහන්න ඕනෑ තරම් අවස්ථාව තිබෙන බව. නමුත්, මට පොඩි සැකයක් ඇති වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතුමන්ලාට අයිතියක් තිබෙනවා, ඕනෑ දෙයක් ගැන අහන්න හෝ නොඅහන්න. නමුත්, හැම දෙයක් ගැනම ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න අහන විපක්ෂයේ ප්‍රධාන නායකයෝ ඇයි මේ කුඩු සහ අයිස් ගැන 27 (2) යටතේ ප්‍රශ්න අහන්නේ නැත්තේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා නේ, මෙතැනදී වැඩිපුරත් ප්‍රශ්න අහන බව. ගරු කථානායකතුමා එක්ක රණ්ඩු වෙවීත් ප්‍රශ්න අහනවා. හැබැයි, තවම කුඩු ගැන, අයිස් ගැන ප්‍රශ්න කළේ නැහැ.

මේ කාලය තුළ අත්අඩංගුවට ගැනීම් සිදු වෙනවා. ඒවා නිකම් සන්දර්ශන නොවෙයි. අප කරපු වැඩවලට මාධ්‍ය සන්දර්ශන තිබ්බා නම් අපි බොලිවුඩ් එක hire කරන්න ඕනෑ. අපි මාධ්‍ය සන්දර්ශන කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අප කරන දේවලින් සියයට එකක්වත් කියන්නේ නැතිවයි මේ ඉන්නේ. අපට එහෙම කියන්න මානසික රෝගයක් නැහැ. අපට වෙලාවකුත් නැහැ media showsවලට යන්න. මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා, එතුමන්ලා මේ කුඩු, අයිස් ගැන ප්‍රශ්න අහන්නේ නැත්තේ ඇයි කියලා. අපට ඇත්තටම බරපතළ සැකයක් තිබෙනවා, දැන් ඒ දේවල් කොහේද නැත්තේ කියලා. අපට ඇත්තටම හය හිතෙනවා, තංගල්ල ඇතුළු ඒ ප්‍රදේශවලින් කුඩු අහුවෙන විධියත් එක්ක බැලුවාම. ඉතින්, විපක්ෂයේ නායකයන් මීට වඩා උනන්දු වෙන්න එපායැ, මේ ගැන. මොකද, ඒ කුඩු ගහන්නේ ආණ්ඩු පක්ෂයට සම්බන්ධ අයද? නැහැ. ලංකාවේ පොඩි ළමයි ඒවාට අහු වෙන්නේ. අපට සැකයක් තිබෙනවා, ඒ ගැනත් ප්‍රශ්න අහන්නේ නැත්තේ ඇයි කියලා. සාමාන්‍යයෙන් අමතක වෙලාද දන්නේ නැහැ; ලියන්න කල් යනවාද දන්නේත් නැහැ. එහෙම වෙන්නත් බැහැ. මොකද, පිටු දෙකතුන පිරෙන්න ප්‍රශ්න අහනවා නේ.

ආණ්ඩුව විධියට අපි කියන එකයි, කරන එකයි දෙකම එකක් විධියටයි කරගෙන යන්නේ. මෙතුමන්ලා උපරිම උත්සාහයක් ගන්නවා, අපි ජනතාව රවට්ටලා බලය ගත්තා කියලා කියන්න. අද අපි අතින් අල්ලන්න පුළුවන් දේවල් කොච්චර නම් කරලා තිබෙනවාද? ඒවා මාධ්‍ය සන්දර්ශනද? ඉන්දුනීසියාවට ගිහිල්ලා පුද්ගලයන් අල්ලා ගෙන ආවේ මාධ්‍යද? මිද්දෙනියේ, තංගල්ලේ, සීනිමෝදර, අරහේ මෙහේ මත්ද්‍රව්‍ය අල්ලන්නේ මාධ්‍යද? ඒ සමහර තොරතුරුවල -social mediaවල- තිබෙනවා මම දැක්කා, පොදුජන පෙරමුණේ හිටපු ප්‍රධාන ඇමතිවරයෙකුගේ සම්බන්ධීකරණ ලේකම් කෙනෙකු ගැනත්. ඒ, අර මිද්දෙනියේ පොදුජන පෙරමුණෙන් ඡන්දය ඉල්ලපු කෙනා; මනම්පේරි. මාත් දන්නා තරමින් ඒක ඇත්ත. දවල් එකහමාරට ඇවිල්ලා හරි කමක් නැහැ, නාමල් රාජපක්ෂ මහත්මයා ඒකට උත්තර දෙනවා නම් හොඳයි. මොකද, අපේ කථාවල් පවත්වන වෙලාවට එතුමා එන්නේ නැහැ නේ. එතුමා දවල් එකහමාරට ඇවිල්ලා හරි ඒ ගැන කියන්න ඕනෑ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

එතුමා ඒකට උත්තරයක් දුන්නා. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ වුණේ ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ මන්ත්‍රී කෙනෙක් කියලා කිව්වා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, කාරණය මේකයි. *[බාධා කිරීමක්]* ඔබතුමාට ස්තුතියි. දැන් කියන්න ඕනෑ, ඒ සම්බන්ධීකරණ ලේකම්- *[බාධා කිරීමක්]* ඒ ඇයි කියලා- *[බාධා කිරීමක්]* අපි තමුන්නාන්සේලාට මේකත් කියන්න කැමැතියි. දැන් තමුන්නාන්සේලා කුඩු කාලා ඉන්නේ; කුඩු කාලා ඉන්නේ. මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේක කියන්නේ කරුණාවෙන්. මම හිතන විධියට, ඔබතුමා එච්චර නම කැත කරගෙන නැහැ. ඔය කුඩු කන්න එපා. ඔබතුමා ස්වාධීන මන්ත්‍රීවරයෙකු විධියට ඉස්සරහට යන්න. ඒක ඔබතුමාගේ අයිතිය. මම වගකීමෙන් අහන්නේ, ඒ සම්බන්ධීකරණ ලේකම්ගේ සම්බන්ධය මොකක්ද කියලා පොදුජන පෙරමුණ කියන්නේ නැත්තේ ඇයි කියලායි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඇයි ඔබතුමන්ලා කියන්නේ නැත්තේ, පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කෙනා ගැන?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒවා හොයනවා නේ. *[බාධා කිරීමක්]* හරි, හරි, හරි. ඔය ඇති. ඔය වාගේ දේවල් ගොඩක් කියලා තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* පව් ඔබතුමා! *[බාධා කිරීමක්]* ඔබතුමා පව්, මන්ත්‍රීතුමා! මට කියන්න තිබෙන්නේ මේකයි. කවදා හරි වෙච්ච මොනවා හරි දෙයක් අල්ලාගෙනයි ඔය කථා කරන්නේ.

අපේ රටේ දැන් කිසිම මාධ්‍ය සන්දර්ශනයක් නැහැ. ආර්ථිකය හදලා තිබෙනවා. ඒක මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි. පාතාලය මර්දනය කරනවා කියන එක මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි. අපේ ජනාධිපතිවරයා -අනුර සහෝදරයා- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සැසිවාරය ආමන්ත්‍රණය කරද්දීත් මොකක්ද කිව්වේ? එතුමා කිව්වේ මේ දූෂිතභාවයට එරෙහිව අනිවාර්යයෙන්ම සටන් කරනවා කියන එකයි; ඒ දූෂිතයන්ට විරුද්ධව සටන් කරනවා කියන එකයි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සැසිවාරයට ගිහිල්ලා ලංකාවේ මොන ජනාධිපතිද කිව්වේ, දූෂිතයන්ට විරුද්ධව සටන් කරනවා කියලා? ලංකාවේ මොන ජනාධිපතිද කිව්වේ, රටේ ජාතික සමගිය ගැන මෙහෙම කටයුතු කරනවා කියලා? ලංකාවේ මොන ජනාධිපතිද කිව්වේ, මේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වැඩි වෙලා තිබෙනවා, ආබාධිත අය; දෘෂ්‍යාබාධිත අය පාර්ලිමේන්තුව නියෝජනය කරනවා කියලා? අපි කරන දේ කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප බොරුවක් කරනවා නම් අපට ලෝකය හමුවට ගිහිල්ලා බොරු කියන්න බැහැ. විපක්ෂයේ එතුමන්ලාට තිබෙන මාධ්‍ය ශක්තිය පාවිච්චි කරලා බොරු ගොතන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවංකවම අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය ලියාගෙන තිබෙන්නේ ජනතාවට පමණක් නොව අපටමයි. එය ඉටු කරන්නයි හදන්නේ අපි. විපක්ෂයේ මෙතුමන්ලා අපට ඒක අමුතුවෙන් පෙන්වා දෙන්න ඕනෑ නැහැ. පෙන්වා දුන්නාට වැරැද්දකුත් නැහැ. මම කියන්න කැමැතියි, ආණ්ඩුවක් විධියට අපි ආර්ථිකය ගොඩනඟන එකත්, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන එකත් කරන බව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, ලංකාව මෑතකදී Democracy Index එකේ ස්ථාන ගණනකින් ඉහළට ගිය බව. ඒ, 2024 අවුරුද්දේ. 2024 මාස 9ක් තිබුණේ දුර්දාන්ත පාලනයක්. එහෙම තියෙද්දීත් තමයි අපේ රට ඉස්සරහට ගිහිල්ලා තිබෙන්නේ. 2025 වර්ෂයේ දත්ත අරගෙන බලන්න, අපි Democracy Index එකේ කොච්චර ඉහළට යනවාද කියලා. Rule of Law Index එකේ යන්තම් 2කිනුයි ඉස්සරහට ගිහිල්ලා තිබෙන්නේ. තව ඉස්සරහට යයි. මොකද, 2024 අවුරුද්දේ මාස 9ක් ඒකට තිබෙනවා. එහෙම නම්, උගුරට හොරා බෙහෙත් බොන්න හදන්න එපා. අප කරන දේවල් ගැන ඔය ගොඩක් මන්ත්‍රීතුමන්ලා දන්නවා. ඇත්ත කාරණය ඒකයි. අපි අවංකව වැඩ කරනවා. ආර්ථිකය ගොඩනඟලා තිබෙන වෙලාවක, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා තිබෙන වෙලාවක මෙතුමන්ලා හොරු රකින්න වැලේ වැල් නැති සටන් පාඨයක් ඉදිරියට අරගෙන තිබෙනවා. ඒ මොකක්ද? ඒ තමයි, "ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය" කියන එක. කොහේද ඒකාධිපතිත්වයක් තිබෙන්නේ? මේ පාර්ලිමේන්තුවට පක්ෂ 12ක මන්ත්‍රීතුමන්ලා ඇවිත් ඉන්නවා. ජාතික ජන බලවේගය ඇතුළේත් පක්ෂ ගණනාවක්, සංවිධාන ගණනාවක් තිබෙනවා. අපි සාධාරණව ඡන්ද පවත්වා තිබෙනවා. සාධාරණව පළාත් පාලන ආයතන පිහිටුවා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, ඉදිරි අය වැයෙන් උතුරු, නැගෙනහිරද ඇතුළුව අපට බලය ඇති නැති සියලු ප්‍රාදේශීය සභාවලට යම්කිසි වාහන ප්‍රමාණයක් දෙනවා කියලා. නමුත්, විපක්ෂයේ මෙතුමන්ලා එදා එහෙමද වැඩ කළේ? මෙතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදයේ අකුරක්වත් practise කරනවාද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට කියන්න තිබෙන්නේ මෙයයි. අපි කරපු දේවල් තමයි රට ඉස්සරහා තිබෙන්නේ, වැඩි ප්‍රමාණයක්. තව ගොඩක් දේවල් කරන්න තිබෙනවා. අපට අවුරුදු 5කටයි බලය දීලා තිබෙන්නේ. ඒ නිසා මේක Twenty20 match එකක් වාගේ කරන්න අවශ්‍යතාවක් නැහැ. අපි ජනවරම ඉටු කරමින් තිබෙන්නේ. ජනවරමට අදාළ දේවල් ඉටු කරද්දී එය ඇත්ත ලෙස සලකා ඒකත් එක්ක එකට හිටගන්න කියා තමයි අපි රටේ ජනතාවගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ.

මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 4.12]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்குப் பேச ஒதுக்கப்பட்ட 5 நிமிடங்கள் 3 நிமிடங்களாக மாறியிருக்கிறது. எனவே, எனக்கு மேலதிகமாக இரண்டு நிமிடங்களை வழங்குமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டு இருக்கின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டுச்) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் பற்றிய விடயத்திலே சுற்றுலாத் துறைக்கான சில சலுகைகளை வழங்க அரசு எதிர்பார்க் கின்றது. நிச்சயமாக இந்த நாட்டினுடைய வருமானத்தை மேம்படுத்துவதிலே சுற்றுலாத்துறை மிகக் கூடுதலான பங்களிப்பைச் செய்கின்றது. எனவே, அந்தத் துறைக்குத் தேவையான விடயங்களைச் செய்து கொடுக்கவேண்டிய தேவை இருக்கின்றது. இருந்தாலும், இந்த நாட்டிலே இருக்கின்ற பெரும்பெரும் கோடீஸ்வரர்கள் மேலும் தங்களுடைய பொருளாதாரத்தை மேம்படுத்துவதற்கான ஒரு துறையாக சுற்றுலாத்துறை காணப்படுகின்றதே தவிர, அந்தத் துறையால் இந்த நாட்டினுடைய சாதாரண மக்களுக்கு எந்தவிதமான நன்மையும் பயக்கக்கூடிய வகையிலே இதன் கீழுள்ள hotel உரிமையாளர்களோ அல்லது இந்தத் துறையிலே தடம்பதித்துக்கொண்டு இருக்கின்ற அரச மற்றும் அரச சார்பற்ற நிறுவனங்களோ பங்களிப்புச் செய்வதென்பது மிகக் குறைந்தளவில்தான் இருக்கின்றது. இலங்கையிலே hotel schools இருந்தாலும்கூட, அந்தத் துறையில் தொழில் புரிபவர்களுக்கான ஊதியங்களைப் பெற்றுக்கொடுக்கின்ற நிலைமை இல்லை. பலரும் இந்தத் துறையிலே குறிப்பிட்டளவு தங்களுடைய கற்கைநெறியை மேற்கொண்டு வெளிநாடுகளுக்குச் செல்லுகின்ற சந்தர்ப்பங்களை நாங்கள் பார்க்கின்றோம்.

இந்த நாட்டிலே சுற்றுலாத் துறைக்குப் பிரசித்திபெற்ற பல இடங்கள் இருக்கின்றன. அந்த இடங்களை மேலும் ஒழுங்குபடுத்தி அந்தப் பிரதேசத்தில் இருக்கின்ற காணிச் சொந்தக்காரர்களுக்கு மானிய அடிப்படையிலே அல்லது அந்தச் சூழலிலே இருக்கின்ற வளங்களைப் பயன்படுத் தக்கூடிய அளவிலே சலுகைகளை வழங்க அரசு நடவடிக்கை எடுக்க வேண்டும் என்று இச்சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்வதோடு, வெறுமனே பொருளாதாரத்தில் முன்னேற் றமடைந்து சொத்துக்களைக் குவிக்கின்றவர்களுக்கு மாத்திரம் சலுகைகளோ அல்லது வரப்பிரசாதங்களோ சென்றடையக் கூடாது என்கின்ற விடயத்தையும் தொட்டுச் செல்கின்றேன்.

குறிப்பாக, எங்களுடைய அறுகம்பை, பாசிக்குடா போன்ற பிரதேசங்களிலே இருக்கின்ற உணவகங்களுக்குக்கூட இறால், நண்டு போன்றவற்றை அந்தப் பிராந்தியத்திலேயே உற்பத்தி செய்து மிகக் கூடுதலான விலைக்குக் கொடுப்பதற்கான சந்தர்ப்பங்கள் இருக்கின்றன. அதற்கு ஏற்ற வகையிலே இலங்கையினுடைய வளங்கள் காணப்படுகின்றன. அத்துடன், அந்த வளங்களைப் பயன்படுத்துவதற்கு மிகப் பொருத்தமான மீனவ சமூகத்தினர் மற்றும் விவசாயிகள் அங்கே காணப்படுகின்றார்கள். அவர்களை ஊக்கப்படுத்துகின்ற நல்ல விடயங்களை இந்த அரசாங்கம் எதிர்வருகின்ற காலங்களிலே செய்ய வேண்டும்.

ஏற்றுமதித் துறையைப் பொறுத்தவரையில், கூடுதலான பழ வகைகளை இலங்கையிலிருந்து ஏற்றுமதி செய்யலாம். எங்களுடைய பிரதேசங்களில் சாதாரணமாக இருக்கின்ற star fruit என்று சொல்லப்படுகின்ற காமிரம் பழம் மிகவும் பெறுமதியான விலைக்கு வெளிநாடுகளிலே கொள்வனவு செய்யப்படுகின்றது. அதேபோன்று, கறுத்தக்கொழும்பான் மாம்பழமும் நல்ல விலைக்கு விற்பனை செய்யப்படுகின்றது. எனவே, இவ்வகையான பழ வகைகளை உற்பத்தி செய்வதற்கு இந்த நாட்டிலே பாரிய வளங்கள் -காடுகள்- இருக்கின்றன.

சாதாரண மக்களுடைய காணிகளை பல்வேறு தேவைகளுக்காக பறிமுதல் செய்கின்ற விடயத்தைத்தான் அரசாங்கம் செய்துகொண்டு இருக்கின்றதே தவிர, யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுடைய காணிகளை விடுவிப்பதற்கோ, பயிர்ச்செய்கைக்குக்கூட செல்ல முடியாத நிலையில் இருக்கின்ற காணிகளைக்கூட விவசாயத் தேவைகளுக்குக் கொடுப்பதற்கோ முடியாத நிலை காணப்படுகின்றது. இந்தக் காணிகள் தமிழ் பேசுகின்ற முஸ்லிம், தமிழ் மக்களின் காணிகளாக இருக்கின்றன. தங்களுடைய காணிகளை விடுவித்து, அவற்றை வாழ்வாதாரத்துக்குப் பயன்படுத்துவதற்கு அல்லது அவற்றில் வீடுவாசல்களைக் கட்டுவதற்கு உதவுவார்கள் என்ற அடிப்படையில்தான் அம்மக்கள் இந்த அரசாங்கத்துக்கு வாக்களித்தார்கள் என்ற விடயத்தைக் கூறிக்கொள்கின்றேன்.

கடந்த வாரம் பாடசாலை மட்டத்திலான தேசிய கபடி விளையாட்டுப் போட்டி நிந்தவூரில் நடைபெற்றது. நிந்தவூரை மையப்படுத்தி அந்த விளையாட்டு நிகழ்வு நடைபெற்றதையிட்டு நாங்கள் பெருமைப்படுகின்றோம். அந்த நிகழ்விலே, கிழக்கு மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்தி நிந்தவூரினுடைய இரண்டு பாடசாலைகள் பங்குபற்றின. அதிலே 17 வயதுக்கு உட்பட்டவர்களுக்கான போட்டியில் நிந்தவூர் அல்-மதீனா மகா வித்தியாலயமும், 20 வயதுக்கு உட்பட்டவர்களுக்கான போட்டியில் அலிகார் தேசிய பாடசாலையும் வெற்றி வாய்ப்பைப் பெற்று தங்கப் பதக்கங்களை வென்றிருந்தன. ஏன் நான் இதைக் கூறுகின்றேன் என்றால், பயிற்றுவிப்பதற்கான ஆசிரியர் களைத் தவிர, இந்த மாணவர்களுக்கு விளையாடுவதற்கான உள்ளக மைதானங்களோ அல்லது வேறு எந்தவிதமான உட்கட்டமைப்பு வசதிகளோ இல்லாத சந்தர்ப்பத்திலும் அவர்கள் போட்டிகளில் பங்குபற்றி வெற்றியீட்டி இருக்கின் றார்கள் என்பதைத் தெரியப்படுத்தத்தான். எனவே, வெற்றியீட்டிய மாணவர்களுக்கும் பாடசாலைக்கும் இதற்குப் பின்னால் நின்று உழைத்தவர்களுக்கும் இச்சந்தர்ப்பத்தில் நான் நன்றி கூறிக்கொள்கின்றேன். இந்த மாணவர்கள் தேசிய மட்ட ரீதியில் மட்டுமல்ல, சர்வதேச ரீதியிலும் மிகத் திறமையாக விளையாடிக்கொண்டு இருக்கின்றார்கள். எதிர்காலத்தில் அவர்களை இன்னும் ஊக்குவிப்பதற்கான வசதி வாய்ப்புக்களை இந்த அரசு கட்டாயம் செய்து கொடுக்க வேண்டும். விளையாட்டுத்துறை அமைச்சாக இருந்தாலும் சரி, கல்வி அமைச்சாக இருந்தாலும் சரி, இந்த மாணவர்களுடைய தேவைகளைப் பூர்த்திசெய்ய வேண்டுமென்று இச்சந்தர்ப் பத்திலே நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
இந்த விளையாட்டுப் போட்டிகள் எங்கு நடைபெற்றதென்ற கேள்வியை நீங்கள் எல்லோரும் கேட்கலாம். தனியார் ஒருவருக்குச் சொந்தமான இடத்தில்தான் இது நடந்தேறியது. அவர் ஒரு முன்னாள் பாராளுமன்ற உறுப்பினராவார். கடந்த இருபது வருடங்களாக விளையாட்டுப் போட்டிகள் நடைபெற்றுக்கொண்டு இருந்தாலும், -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.17]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி ( கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

எதிர்க்கட்சியைச் சேர்ந்த பலர் எமது அரசாங்கத்தை விமர்சிக்கும் நோக்கில் பல்வேறு குற்றச்சாட்டுக்களை முன்வைத்துப் பேசினார்கள். நாங்கள் அவர்களிடம், "தேசிய மக்கள் சக்தி ஆட்சியமைப்பதற்கு முதல் நீங்கள் என்ன கூறினீர்கள்?" எனக் கேட்கின்றோம். தேசிய மக்கள் சக்தி ஆட்சிக்கு வந்தால், இந்த நாட்டில் டொலரின் பெறுமதி அதிகரிக்கும், எரிபொருள் தட்டுப்பாடு ஏற்படும், மின்சாரம் தடைப்படும் எனப் பல வதந்திகளைப் பரப்பினீர்கள். ஆனால், இன்று அவ்வாறு எதுவும் நடைபெறவில்லை. நாங்கள் இந்த ஓராண்டில் இந்த நாட்டின் பொருளாதாரத்தை ஸ்திரமான நிலையில் பேணிப் பாதுகாத்து வருகின்றோம். எமது அரசாங்கம் வாகன இறக்குமதிக்கு அனுமதி வழங்கியபோது பலர் கூறினார்கள், நாட்டில் டொலரின் பெறுமதி அதிகரிக்கும் என்று. ஆனால், இந்த நாட்டில் டொலரின் பெறுமதியானது பொருளாதார ரீதியில் ஸ்திரமான நிலையில் பேணிப் பாதுகாக்கப்பட்டு வருகின்றது என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று எமது நாட்டிலுள்ள சனாதிபதி மாளிகைகளைக்கூட, மாண்புமிகு சனாதிபதி அவர்கள் சுற்றுலாத்துறைக்கு வழங்கியிருக்கிறார். ஏனெனில், சுற்றுலாத்துறையை முன்னேற்றுவதன் ஊடாக நாட்டு மக்களைப் பொருளாதார ரீதியாகப் பலப்படுத்த முடியும் என்ற திடமான நம்பிக்கை எமது அரசாங்கத்துக்கு இருக்கின்றது. நாங்கள் அந்த இலக்கை நோக்கி நகர்ந்துகொண்டு இருக்கின்றோம். இந்த ஆண்டில் அதிகளவான வெளிநாட்டு சுற்றுலாப் பயணிகள் இலங்கைக்கு வருகைதந்து இருக்கிறார்கள். வட மாகாணத்தைப் பொறுத்தவரை, அங்கு சுற்றுலாப் பயணிகளின் வருகை குறைவாகவே இருக்கின்றது. அதற்குக் காரணம், யுத்தம் முடிந்து 16 ஆண்டுகளாகியும் அந்தப் பிரதேசங்களில் இருக்கின்ற சுற்றுலா மையங்களை இனங்கண்டு அவற்றை அபிவிருத்தி செய்யாமையே ஆகும். எங்களுடைய சனாதிபதி அவர்கள் வட மாகாணத்துக்கு வந்தபோது, அங்கு அதிகமான பிரதேசங்களை சுற்றுலா வலயங்களாக அடையாளம் கண்டிருப்பதாகக் கூறியிருந்தார். அந்த வகையில், தற்பொழுது அவற்றை அபிவிருத்தி செய்வதற்கான பூர்வாங்க நடவடிக்கைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. உதாரணத்துக்கு, பூநகரியில் இருக்கும் கௌதாரிமுனை பிரதேசத்தை சுற்றுலா வலயமாக மாற்றுவதற்கு 200 ஏக்கர் காணியை நாங்கள் இனங்கண்டு இருக்கின்றோம். இன்று முதலீடு செய்வதற்குப் புலம்பெயர் தேசங்களிலுள்ள எங்களுடைய உறவுகள் அந்தப் பிரதேசத்தை நோக்கி வருகின்றார்கள். அவர்கள் புலம்பெயர் தேசங்களிலிருந்து இங்கு வருவதற்குக் காரணம், அவர்களுக்கு எமது நாட்டின்மீது நம்பிக்கை ஏற்பட்டு இருப்பதுதான். அதாவது, இப்போது எமது நாடு ஜனநாயக ரீதியில் முன்னேறி வருகின்றது. எல்லோரையும் மதிக்கக்கூடிய ஒரு சமுதாயத்தை நாங்கள் உருவாக்கி வருகின்றோம். அது மாத்திரமன்றி, பாதுகாப்பான சூழலையும் உருவாக்கி இருக்கின்றோம். இவற்றின் நிமித்தமாக புலம்பெயர் தேசங்களிலுள்ள உறவுகள் இங்கு முதலீடு செய்வதற்கு வருகின்றார்கள்.

உதாரணத்துக்கு, புலம்பெயர்ந்து அவுஸ்திரேலியாவில் வாழ்கின்ற தமிழ் மருத்துவர் ஒருவர் பண்ணை பிரதேசத்தில் சுற்றுலாத்துறை சார்ந்து முதலீடு செய்திருக்கிறார். அதேநேரம், அவர் குளிரூட்டப்பட்ட அதிசொகுசு கப்பல் சேவையை நெடுந்தீவுக்கு மேற்கொள்வதற்கும் தீர்மானித்து இருக்கிறார். அதற்கான உத்தரவாதத்தையும் அவர் எங்களுக்குத் தந்திருக்கிறார். எமது நாடு முன்னேறிக்கொண்டு வருகின்றது. இதனை எவராலும் தடுக்க முடியாது. இங்கு எதிர்க்கட்சியில் இருப்பவர்கள் குறிப்பாக வட பகுதியிலிருந்து வந்திருப்பவர்கள் எமது அரசாங்கத்தை விமர்சனம் செய்கிறார்கள். அதன்மூலம் எமது அரசாங்கத்தை ஒரு கணமேனும் பின்நோக்கி நகர்த்த முடியாது. மாறாக, முன்னேறிக்கொண்டே போகும். நாங்கள் தூரநோக்குடனேயே செயற்படுகின்றோம் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நாட்டின் சனாதிபதி அவர்கள் வட பகுதிக்கு விஜயம் செய்தபோது, தெங்கு உற்பத்தி அலகொன்றை ஆரம்பித்து வைத்தார். நாங்கள் வட பகுதியில் தெங்கு முக்கோண வலயமொன்றை அடையாளப்படுத்தி இருக்கின்றோம். அது மாத்திரமன்றி, இந்த ஆண்டு 16,000 ஏக்கரில் தெங்குச் செய்கையைச் செய்வதற்கும் தீர்மானித்து இருக்கின்றோம். அதன் அடிப்படையில், அங்குள்ள இளைஞர்களுக்கு இலவசமாக தென்னம்பிள்ளைகளை விநியோகிக்கின்றோம்; உரமானியம் கொடுக்கின்றோம்; ஓர் ஏக்கருக்கு 30,000 ரூபாய் வீதம் கொடுக்கின்றோம். ஏன் இவ்வாறு செய்கின்றோம் என்றால், அந்தப் பிரதேசத்தில் தெங்கு உற்பத்தியை அதிகரித்து, அது சார்ந்த உற்பத்திப் பொருட்களை ஏற்றுமதி செய்வதன் ஊடாக இந்த நாட்டின் பொருளாதாரத்தை முன்னேற்ற முடியும் என்ற திடமான நம்பிக்கை எங்களுக்கு இருப்பதனால்தான். அதற்காக, இன்று வைத்த தென்னம்பிள்ளை நாளை காய்த்துவிடும் என்று நாங்கள் கூறவில்லை. பொருளாதார முன்னேற்றம் என்பது நீண்ட தூர பயணத்தில் ஏற்படும் ஒரு விளைவாகும். உலக தர நிர்ணயங்களின் அடிப்படையில், அதிவேகமாக முன்னேறி வரும் நாடுகளின் பட்டியலில் எமது நாடும் இன்று உள்ளடக்கப்பட்டுள்ளது. இதனூடாக நாங்கள் மக்களுக்கு ஒன்றைக் கூற விரும்புகின்றோம். எதிர்க்கட்சியில் இருப்பவர்கள் அரசாங்கத்தை எவ்வளவுதான் விமர்சனம் செய்தாலும், எமது நாட்டின் முன்னேற்றத்தை எவராலும் தடுக்க முடியாது.

ஒரு சிலர் அதிகாரங்களைத் துஷ்பிரயோகம் செய்யும் விதமாக சட்டத்தை மீறும் செயற்பாடுகளை வீதிகளில் மேற்கொள்கிறார்கள். அதன்மூலம் அவர்கள் பழைய அரசியல் கலாசாரத்தைக் கொண்டுவர நினைக்கிறார்களோ தெரியவில்லை. இல்லாவிட்டால், ஐஸ்லாந்தில் சுகாதார அமைச்சராக வரமுடியும் என்ற எண்ணத்தில் அவ்வாறு செயற்படுகிறார்களோ தெரியவில்லை. சட்டத்தை மீறினால் விதிக்கப்படுகின்ற fineஐக் கட்டித்தான் நாங்களும் அதிலிருந்து விடுபடுகின்றோம். சிலநேரம், மருந்துகளைக் குடிக்காமல் விடுவதனால் எதேச்சையாகக் கருத்துகளைத் தெரிவிக்கிறார்களோ தெரியாது. அவ்வாறு கருத்துகளைத் தெரிவித்துவிட்டு, பிறகு மன்னிப்புக் கேட்கிறார்கள். எங்களைப் பொறுத்தவரை, சட்டத்தின்முன் எல்லோரும் சமம்! அவர்கள் பழைய அரசியல் கலாசாரத்தை உருவாக்க எத்தனிக்கிறார்கள். அதை விடுத்து, மக்கள் நேயமிக்க இந்த அரசாங்கத்துடன் கைகோர்த்துப் பயணிக்கும்படி நாங்கள் அவர்களுக்குக் கூறுகின்றோம். சட்டத்தை மீறினால் தண்டனை உறுதி என்பது இன்று நிரூபிக்கப்பட்டுள்ளது. எனவே, எமது நாட்டின் முன்னேற்றத்துக்கு எவரும் இடையூறாக இருக்க வேண்டாமென

ஆணித்தரமாகக் கூறுகின்றோம். குறிப்பாக, எமது அரசாங்கம் ஜனநாயக ரீதியாகத் தமிழ் மக்களை அன்போடு அரவணைக்கின்றது என்பதை வட பகுதியிலிருந்து இங்கு வந்திருப்பவர்களுக்குக் கூறுகின்றோம்.

எனவே, பழைய அரசியல் கலாசாரத்தை ஏற்படுத்த முனைகின்றவர்களுடன் ஒட்டி உறவாடாமல், இந்த ஜனநாயக ஆட்சியைப் பலப்படுத்துவதற்கு ஆதரவளிக்குமாறு வட பகுதியில் இருந்து வந்துள்ள பாராளுமன்ற உறுப்பினர்களிடம் தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன். தயவுசெய்து, உங்களுடைய அரசியல் நிகழ்ச்சிநிரலை விட்டு விடுங்கள்! தற்பொழுது நாட்டில் நல்லதோர் அரசாங்கம் அமைந் திருக்கிறது. எனவே, இந்த அரசாங்கத்துடன் இணைந்து, நாட்டை முன்னேற்றும் விதமாகச் செயற்படும்படி தாழ்மையுடன் கேட்டுக் கொள்கின்றேன். அரசியல் ரீதியாக விமர்சித்து, இந்த அரசாங்கத்தை எப்படியாவது கவிழ்த்துவிட வேண்டுமென்ற எண்ணத்துடன்தான் அவர்கள் இருக்கிறார்கள். உண்மையின் பக்கம் மக்கள் நிற்பார்கள் என்ற திடமான நம்பிக்கை எமக்கு இருக்கிறது. எமது நாடு முன்னேற்றப் பாதையில் செல்வதை எவராலும் தடுக்க முடியாது. எமது நாட்டின் வட பகுதியில் அதிகளவானோர் முதலீடு செய்வதற்கு நினைக்கிறார்கள். அதனால் வட பகுதியிலிருந்து வந்துள்ள பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் ஒன்றுசேர்ந்து நாட்டை முன்னேற்றுவதற்கு தேசிய மக்கள் சக்திக்கு ஒத்துழைப்புக் கொடுங்கள்! பழைய அரசியல் கலாசாரத்துக்குள் போவதற்கு முயற்சிக்காதீர்கள்! பழைய அரசியல்வாதிகள் மீண்டும் வருவதற்கு இடமளிக்காதீர்கள் என தாழ்மையாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චන්දන තෙන්කෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 07ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.24]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන වාහන ආනයනය කිරීමට අදාළව 1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ ඒ පිළිබඳ විවාදයට සම්බන්ධ වන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

ඇත්තටම මේ මොහොත වන විට අපේ රටේ සංචාරක කර්මාන්තය තුළින් ඉතාම වේගවත් පිම්මක් පනිමින්, වේගවත් වර්ධනයකට අදාළ පදනම අපි දමා ගනිමින් සිටිනවා. මෙම වසරේ අපි සංචාරකයන් ලක්ෂ 30ක් ගෙන්වා ගැනීමේ ඉලක්කය අනුව කටයුතු කරමින් සංචාරක ක්ෂේත්‍රය හරහා බිලියන 5ක ආදායමක් ලබා ගන්නට සැලසුම් කර තිබෙනවා. ඇත්තටම පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වසරේ සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කරනවා. 2024 වර්ෂයේ ජනවාරි මාසයට සාපේක්ෂව, සියයට 21ක වර්ධනයකුත්, පෙබරවාරි මාසයට සාපේක්ෂව සියයට 10ක වර්ධනයකුත්, මාර්තු මාසයට සාපේක්ෂව සියයට 10ක වර්ධනයකුත්, අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 17ක වර්ධනයකුත්, මැයි මාසයට සාපෙක්ෂව සියයට 18ක වර්ධනයකුත්, ජූනි මාසයට සාපෙක්ෂව සියයට 21ක වර්ධනයක් හා අගෝස්තු මාසයට සාපේක්ෂව සියයට 20ක වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. ඉදිරියේ දී ඒ පිම්මට ගැළපෙන විදියට අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය නවීකරණය කරන්න අපි විශාල සැලසුමක් යොදමින් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ගෝලීය ප්‍රවණතා හඳුනා ගනිමින් අපේ රටේ ස්වාභාවික පරිසරයත්, අපේ රටේ සංස්කෘතියත්, අපේ රටේ ඓතිහාසික වටිනාකම් ඇති ස්ථානත් පාවිච්චි කරලා සංචාරක ව්‍යාපාරය වර්ධනය කරන්න ආණ්ඩුව විදියට; රජය විදියට විශාල වෙහෙසක් ගනිමින් ඉන්නවා.

අපේ රටේ දැනට තිබෙන සංචාරක ව්‍යාපාරය වෙරළ පදනම් කරගෙන වර්ධනය වුණු සංචාරක ව්‍යාපාරයක්. අපේ ඉදිරි ඉලක්කය ඇතුළේ සංචාරකයන් රට මැදට ගෙනැල්ලා, අලුත් ගමනාන්ත සංචාරකයන්ට හඳුන්වා දීලා, අපේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න විශේෂ සැලැස්මක් අපි හදලා තිබෙනවා. ඒ තුළින් ප්‍රජාව මූලික කර ගත්, පරිසරය මූලික කර ගත්, අලුත් සංචාරක කර්මාන්තයක් දක්වා අපේ සංචාරක කර්මාන්තය විතැන් කරන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ සඳහා අපි වයඹ පළාත වාගේ අලුත් කලාප හඳුනාගෙන තිබෙනවා. අනුරාධපුරය වාගේ දිස්ත්‍රික්කවල තිබෙන සංචාරක ගමනාන්ත දියුණු කරන්න රජය මැදිහත් වෙලා තිබෙනවා. ඇත්තටම වයඹ පළාත ගත්තොත්, එය සංචාරක කර්මාන්තය සඳහා විශාල තෝතැන්නක්. අප ඒ බව හඳුනාගෙන තිබෙනවා. එක පැත්තකින් හලාවත, කල්පිටිය, පුත්තලම වෙරළ තීරය තිබෙනවා. අනෙක් පැත්තෙන්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය, යාපහුව, කුරුණෑගල හා පඬුවස්නුවර කියලා ප්‍රධාන රාජධානි හතරක් තිබෙනවා. ඒ වාගේම අපේ කෘෂි කර්මාන්තයත් එක්ක බැඳුණු අභ්‍යන්තර ජලාශ පදනම් කර ගත්ත සංචාරක කර්මාන්තයක් අපට ගොඩනඟන්න පුළුවන්. ඊට ගැළපෙන, සුදුසු ස්ථාන විශේෂයෙන්ම වයඹ පළාතේ තිබෙනවා. උදාහරණයක් විදියට ගල්ගමුව ප්‍රදේශය ගත්තොත්, විශාල ජලාශ තිබෙනවා. අතරගල්ල, අඹකොළවැව, පාලුකඩවල, මහ සියඹලන්ගමුව හා රාජාංගනය වාගේ සුන්දර ජලාශ තිබෙනවා. ඒ වාගේම අපි කවුරුත් දන්නවා, ලංකාවේ ටෙලි නාට්‍ය සහ සිනමා පට ගණනාවක දර්ශන රූගත කළ, ඓතිහාසික කථාවලට පදනම් වුණු මනරම් කඳු පන්ති පාමුල කඳුරු වැව කියන ජලාශයත් තිබෙන බව. එය ඉතාම මනරම් ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය ආසන්නයේ - දැනටත් ඇඹුල්ගම ප්‍රදේශයේ - ක්‍රියාත්මක වෙනවා, උල්පතේ වත්ත යෝගා සංචාරක නිකේතනය. ඒ වාගේ තවත් ව්‍යාපාරිකයන්ට අවස්ථාවක් තිබෙනවා, අලුත් සංචාරක කලාපවල ආයෝජනය කරන්න. ඉදිරි වසර කිහිපය තුළ සංචාරක ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයකුත්, එවැනි ප්‍රදේශවල සංචාරක ක්ෂේත්‍රයට අදාළව ව්‍යාපාරිකයින් ආයෝජන සිදු කරාවි කියලාත් අපි බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම සංචාරක ක්ෂේත්‍රයට තිබෙන බාධාවක් තමයි, රට ඇතුළේ තිබෙන ග්‍රාමීය ප්‍රදේශවලට යද්දී ඊට අදාළ මාර්ග පද්ධති හා යටිතල පහසුකම් පසුගිය ආණ්ඩුව කාලයේ සංවර්ධනය වෙලා නැති එක. අපි දන්නවා, ගල්ගමුවේ නිල්ලක්ගම බෝධි සරය කියන්නේ ඉතා කලාත්මක ගල් කැටයම් තිබෙන බෝධි සරයක් බව. හැබැයි, 1895දී එච්.සී.පී. බෙල් මහත්තයා නිල්ලක්ගමට ගිය පාරේම තමයි, 1954දී පරණවිතාන මහත්තයා එහි නවීකරණ කටයුතු සඳහා නැත්නම් සංරක්ෂණ කටයුතු සඳහා ගිය පාරේම තමයි තවමත් මිනිස්සු නිල්ලක්ගමට යන්නේ. තවමත් ඒ පාර හැදිලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාත්තලා, පුතාලා, බාප්පලා මේ රට පාලනය කරද්දී, ගල්ගමුවේ තාත්තලා, පුතාලාත් මේ පාර්ලිමේන්තුව අවුරුදු ගණනක් නියෝජනය කළා. හැබැයි, ඒ අය සංචාරක කර්මාන්තයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කරන්න සමත් වෙලා නැහැ. අපි වර්තමාන ආණ්ඩුව විදියට යාපහුව, හත්ථිකුච්චිය, රිදීවෙහෙර වැනි පුදබිම් වාගේම අපේ අභ්‍යන්තර ජලාශ පද්ධතිය භාවිත කරමින් සංචාරක ව්‍යාපාරය ගොඩනඟන්නත් සැලසුම් කරලා තිබෙනවා. ඇත්තටම

[ගරු චන්දන තෙන්නකෝන් මහතා]

හුදෙකලාවෙන් රටක සංචාරක ව්‍යාපාරය මේ විධියට ගොඩනැඟෙන්නේ නැහැ. 2021 අවුරුද්ද තමයි අපේ රටේ සංචාරක ව්‍යාපාරය පහළටම වැටුණු අවුරුද්ද. හැබැයි, අපි ක්‍රමයෙන් මේ ක්ෂේත්‍රය ඉස්සරහට අරගෙන යනවා, අපේ රටේ ආර්ථික සංවර්ධනයත් එක්ක, ආර්ථික ස්ථායීතාවත් එක්ක.

ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වූ බොහෝදෙනා අපේ රටේ ආර්ථික ස්ථායීතාව සම්බන්ධයෙන් කරුණු ගණනාවක් ඉදිරිපත් කළා. ඒ ආර්ථික ස්ථාවරත්වය ඇතුළේ අපේ රට ඉදිරියේදී ගොඩනැඟෙනවා. ඒ ඇතුළේ අපේ රටේ සංචාරක කර්මාන්තය විශාල පංගුවක් නියෝජනය කරයි කියන විශ්වාසය අපට තිබෙනවා. ඇත්තටම අපි ආර්ථිකය ස්ථායී කිරීම ඇතුළේ අපේ රටේ ජනතාවට සුබසාධනය දෙන්නත්, ජන ජීවිත නඟාසිටුවන්නත් වැඩසටහන් ගණනාවක් කරලා තිබෙනවා. අපි රාජ්‍ය සේවකයන්ගේ රුපියල් 24,500ට තිබුණු අවම මූලික වැටුප රුපියල් 40,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ජනාධිපතිතුමා කියලා තිබෙනවා ඉදිරි අය වැයෙනුත් රාජ්‍ය සේවකයන්ට නැවත වැටුප් වැඩිවීමක් දෙනවා කියලා. ඒ වාගේම විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 3,000කින් වැඩි කළා. පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 7,000කින් වැඩි කළා. වැඩිහිටි දීමනාව රුපියල් 2,000කින් වැඩි කළා. රුපියල් 7,500ට තිබුණු ආබාධිත දීමනාව රුපියල් 10,000ක් කළා. රුපියල් 7,500ට තිබුණු වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව රුපියල් 10,000ක් කළා. එවැනි විශාල සහන ප්‍රමාණයක් ඒ පැත්තෙන් දෙන අතර, තෙල් මිලත් සැලකිය යුතු ලෙස පහළ දමා ජන ජීවිත ගෙන යන්න අවශ්‍ය සුබසාධන කටයුතු කරන ගමන්, ආර්ථිකය ස්ථාවර කරන ගමන්, මේ රටේ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරන්න අදාළ වැඩසටහන් ගණනාවකුත් අපි මේ රටේ ක්‍රියාත්මක කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය 21වන දා වෙද්දි අපේ ආණ්ඩුවට වසරක් ගත වෙලා තිබෙනවා. ආර්ථිකය තුළ මේ කරන විශාල වර්ධනය ඇතුළේ අපේ රටේ ජනතාවට ඉතාම හොඳ අනාගතයක්, අපි කියපු විධියට පොහොසත් රටේ ලස්සන ජීවිත උදා කරන්න අවශ්‍ය වැඩසටහන් අපි ක්‍රියාත්මක කරමින් යනවා. ඇත්තටම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව ඇතුළතදීත්, පිටතදීත් වැඩ කරන විධියෙන් අර පසුගිය කාලයේ ගෙනාපුවා නිකම් පාච්චි කරලා ඇවිල්ලාද කියලාත් අපට හිතෙනවා. ඔවුන් ජනාධිපති වෙන්න හීන දකිනවා. උපජනාධිපතිලා වෙන්න හීන දකිනවා. ඒ අයට අමුතු විධියේ හැසිරීම්, කථා තිබෙන්නේ. යම් මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේදී කියලා ගියා, අපේ මන්ත්‍රීවරුන් 159දෙනාගේම බැංකු ගිණුම් විස්තර දෙන්න කියලා. ඒ අය පදනමක් නැති විවේචන කරමින් විපක්ෂයේ කල් ගෙවනවා. අපි විපක්ෂයට කියනවා, අප ගැන, ජාතික ජන බලවේගය ගැන විශ්වාසය තියලා ජනතාව මේ රට භාර දීලා තිබෙන බව. අපි ඒ අලුත් පරිවර්තනයට අදාළ අමාරු පියවර දැන් තබා තිබෙනවා. එම නිසා ඒ ජනතාව අප සමඟ පියවර දහස් ගණනක් ඉදිරියට අත්වැල් බැඳ ගනියි කියන විශ්වාසය තබමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බී. ආරියවංශ මහතා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන හා අපනයන ගැන වාගේම සංචාරක කර්මාන්තය ගැනත්, වාහන ආනයනය ගැනත් අද විශාල වශයෙන් කථා වුණා. රටක් ආර්ථික වර්ධනයක් ලබන්න නම් අපනයන දියුණු කළ යුතුයි. අපට මතකයි, එදා රණසිංහ ප්‍රේමදාස මහතා ඇඟලුම් කර්මාන්තශාලා 200 ව්‍යාපෘතිය ග්‍රාමීය මට්ටමට ගෙනැල්ලා ඇඟලුම් අපනයනය තුළින් අපේ රටට විශාල වාසි රැසක් අත්කර දුන් බව. එතුමා ඒ කාලය තුළ අපනයන භෝග වශයෙන් කුරුඳු, ගම්මිරිස් ඇතුළු සියලුම සුළු අපනයන භෝග වගා කිරීම සඳහා ආධාර දීලා, උදව් කරලා ග්‍රාමීය ගොවියා විශාල වශයෙන් ශක්තිමත් කරන වැඩසටහනක් සකස් කළා. එදා තේ, රබර්, පොල් තමයි ප්‍රධාන ආර්ථික භෝග හැටියට තිබුණේ. ඒ කියන්නේ, අපනයන භෝග වශයෙන්. ඊට පසුව ගම්මිරිස්, කුරුඳු, කරාබු, කරුංකා ඇතුළු සුළු අපනයන භෝග අපනයනය කරලා අපේ රටට විශාල වශයෙන් ඩොලර් ආදායමක් ලබා ගැනීමට හැකි වුණා.

අපේ රටේ පැඟිරි කර්මාන්තය පසුගිය කාලයේ හොඳ ආදායමක් ලැබූ කර්මාන්තයක් බවට පත් වෙලා තිබුණා. නිසරු පොළොවේ පවා පැඟිරි වගා කිරීමට හැකියාව තිබුණා. මොකද, එය දැඩි නියඟයකට වුණත් ඔරොත්තු දෙන ශාකයක්. මේ වෙනකොට පැඟිරි කර්මාන්තය කඩා වැටිලා තිබෙන්නේ. ඒ කාලයේ හදපු බොයිලේරු දැන් වසා දමා තිබෙන්නේ. යම් අවස්ථාවක පැඟිරි මිල අඩු වුණා. ඒ අවස්ථාවේදී චීනය වාගේ රටවලින් ආදේශක වශයෙන් පැඟිරි අපේ රටට ගෙනාවා. ඒ තුළ අපේ රටේ පැඟිරි කර්මාන්තය විනාශ වෙලා ගියා. පැඟිරි කිලෝවක මිල රුපියල් 2,000ට, රුපියල් 2,500ට අඩු වෙනකොට ගොවියා එම කර්මාන්තයෙන් අයින් වුණා. නමුත් යම් ගොවීන් පිරිසක් තවම මේ කර්මාන්තය රැකගෙන ඉන්නවා. විශාල ඉඩම් ප්‍රමාණයක මේ වගාව කර තිබෙනවා. විශේෂයෙන්ම ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනාමුර අවට ප්‍රදේශය, මාතර දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රදේශය, කොලොන්න වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක ගොවීන් තමයි ඒ වගා කටයුතුවල නියැළුණේ. ඊට පසුව එක අවස්ථාවක පැඟිරි තෙල් කිලෝවක් රුපියල් 12,000කට අළෙවි වෙනකොට මොනරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව කියන ප්‍රදේශයේ ගොවීනුත් මේ වගාව පටන් ගත්තා. නමුත් දැනට අවුරුදු 5ක පමණ ඉඳලා මේ වගාවෙන් ගොවීන් අයින් වෙලා තිබෙන්නේ. ඉතින්, දැන් පැඟිරි වගාව විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ මේ ගරු සභාවට යෝජනා කරනවා, අපට අපනයන ආදායමක් ලබා ගැනීමට හැකි පැඟිරි වගාව කරගෙන යෑම සඳහා ගොවීන් දිරිමත් කරන්න කියලා. මේ වෙනකොට පැඟිරි තෙල් කිලෝවක මිල රුපියල් 9,000ක් දක්වා නැවත ඉහළ ගිහින් තිබෙනවා. පසුගිය කාලයේ මේ වගාව කරගෙන යෑමට ගොවීන්ට ආධාර දුන්නා. ඒ අනුව පැඟිරි පැළ මිලදීගන්න, සිටුවන්න මුදල් ආධාර ලබා දුන්නා. නැවත ඒ වාගේ ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කරලා හෝ පැඟිරි කර්මාන්තය දියුණු කරන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය කාලයේ මේ සභාවේදී කරුංකා සම්බන්ධවත් කථා කළා. අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ වෙනකොට කරුංකා ප්‍රතිඅපනයනය නවත්වා තිබීම ගැන. කරුංකා ප්‍රතිඅපනයනය නැවැත්වීම තුළ මේ වන විට කරුංකා කිලෝවක මිල රුපියල් 680 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. මේ වන විට කරුංකා අපනයනකරුවන්ට කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඒ සඳහා අවසර ලබා දීමේ ප්‍රමාදයක් ඇති

වෙලා තිබෙනවා. එක අපනයනකරුවෙකුට කන්ටේනර් දෙකකට approval එකක් දුන්නාට පස්සේ නැවත ඒ approval එක ගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශයට යෑම තුළ ප්‍රමාදයක් සිදුවනවා. එම නිසා තමන්ගේ කරුංකා ටික අළෙවි කර ගැනීමට නොහැකිව කරුංකා ව්‍යාපාරිකයින් වාගේම ගොවිනුත් අසරණ වෙලා තිබෙනවා, . කරුංකා කියන්නේ අපට ලොකු විදේශ විනිමයක් ලැබෙන වගාවක්. පසුගිය කාලය තුළ ඉන්දුනීසියාව වැනි රටවලින් ගෙනැල්ලා ප්‍රතිඅපනයනය කිරීම තුළ කරුංකා මිල පහළ වැටිලා තිබෙනවා. නමුත් අද වන විට ඒ තත්ත්වය නතර කරලා තිබෙනවා. අපි ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ප්‍රතිඅපනයනය කිරීම නතර කළා වාගේම අපනයනය කිරීමේදී අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම් සපයා දුන්නොත් යම් මට්ටමකට මේ කර්මාන්තය දියුණු කර ගන්න අවස්ථාව ලැබෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දීප්ති වාසලගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.38]

**ගරු දීප්ති වාසලගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි අනුමත කිරීම සඳහා වූ විවාදයට කරුණු දැක්වීමට පෙර මම කැමතියි, අද මේ සභාව තුළ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මතු කරපු කාරණා කිහිපයක් මතක් කරන්න. 2019දී කැලණි ගඟෙන් නයෙක් අල්ලාගෙන ප්ලාස්ටික් බෝතලයක දමාගෙන ඇවිල්ලා මුවලින්ද නාගරාජයා වැඩියා කියලා මේ රටේ පුංචි දරුවාගේ සිට වැඩිමහල් පුද්ගලයා දක්වා මුළුමහත් රටක්, මුළුමහත් ජාතියක් රැවටීමට ලක් කළ මාධ්‍ය නාළිකාවක හිමිකරුවෙකුට අපේ රටේ දරුවන්ගේ විනය ගැන කථා කරන්න අයිතියක් තිබෙනවාද කියලා මම මේ සභාවෙන් අහනවා. ඒ වාගේම හිටපු ජනාධිපතිවරයෙක් මේ සභාව තුළදී කිව්වා, රට බංකොලොත් වෙලා, 2048 වෙනකම් කිසිම සංවර්ධන ව්‍යාපෘතියක් මේ රට තුළ කරන්න බැහැ කියලා. ඒකත් අපට හොඳට මතකයි. ඒ වාගේම එක්තරා මන්ත්‍රීවරයෙක් ඊශ්‍රායල - පලස්තීන ගැටුම මුල් කරගෙන අපේ රටේ මුස්ලිම් ජාතිකයන් තුළ ජාතිවාදය ඇවිස්සීමට කරුණු පෙළ ගස්වනවාත් මම දැක්කා. තවත් මන්ත්‍රීවරයෙක් අපෙන් ඇහුවා, ත්‍රිරෝද රථ රියදුරන් අතරට, සාමාන්‍ය ජනතාව අතරට ඔබතුමියලාට යන්න බැහැ නේද කියලා. මේ ගරු සභාව තුළ ඉන්න ජාතික ජන බලවේගයේ මැති ඇමතිවරු සියලුදෙනාම කිසිම ආරක්ෂකයෙක් නැතුව තමන්ගේ වැඩකටයුතු කර ගැනීම සඳහා මහ පාරේ තනිව ගමන් කරනවා. අපට මහජනතාවගෙන් කිසිම ප්‍රතිවිරෝධයක් එන්නේ නැහැ. ඔවුන් බොහොම ප්‍රසාදයෙන් අපට කථා කරනවා, අපි බලාපොරොත්තු වුණු දේශපාලන සංස්කෘතිය තමයි, මහජන නියෝජිතයා සහ පුරවැසියා අතර වෙනසක් නොතිබිය යුතුයි කියන එක. විපක්ෂයේ මන්ත්‍රීවරු කියන තරම් දේවල් අපට මහ මඟදී සිද්ධ වෙන්නේ නැහැ.

ඒ වාගේම මම මතක් කරන්න කැමතියි, අද මේ වාගේ රෙගුලාසි ගැන අපට කථා කරන්න වෙන්නේ ඇයි කියන එක පිළිබඳව. අපේ රටේ හොරකම, වංචාව, දූෂණය සහ වැරදි ආර්ථික කළමනාකරණය නිසා 2020 වර්ෂයේදී අපේ රට පතුලටම වැටුණා; බංකොලොත්භාවයටම පත් වුණා. ඒ වෙනුවෙන් අපේ රටේ දේශපාලන අධිකාරිය තීරණයක් ගත්තා, පිට රටින් වාහන ආනයනය කිරීම සීමා කිරීමට. ඒ අවස්ථාවේදී අපේ රටට විදේශ විනිමය ගලා ගෙන එන සංචාරක කර්මාන්තයට ප්‍රබල පහරක් එල්ල වුණා. ඒ නිසා 2024දී නැවත තීරණය කළා, සංචාරකයන් ප්‍රවාහනය සඳහා වාහන 1,000ක් ආනයනය කිරීමට අදාළව පනවා තිබූ සීමා ලිහිල් කරන්න. විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ අවලාද නඟනකොට 2024දී ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පිහිටුවමින් අපට පුළුවන් වුණා, 2024 දෙසැම්බර් මාසය සහ 2025 ජනවාරි මාසය වනවිට වාහන ආනයනය සඳහා තිබුණු සීමා ඉවත් කරන්න. ඒ කියන්නේ, පනවා තිබූ සීමා ඉවත් කරන්න අපට පුළුවන් වුණා.

සංචාරක කර්මාන්තය සඳහා වාහන ගෙන්වීම පිළිබඳව තමයි අද මේ රෙගුලාසි යටතේ කථා කරන්නේ. මේ රෙගුලාසියේ තිබුණා, සංචාරක කර්මාන්තය සඳහා වාහන ගෙන්වීමේදී ලබා දෙන පහසුකම 2025 ජූනි 30වැනිදා අවසන් වන බව. නමුත්, තාක්ෂණික දෝෂ මත වාහන නිදහස් කර ගැනීමේ බාධාවක් තිබුණු නිසා එම දිනය 2025 සැප්තැම්බර් 30වන දා වන තෙක් දීර්ඝ කිරීම සඳහා තමයි මේ විවාදය ආරම්භ කරන්නේ. විපක්ෂයට නොපෙණුනාට මෙතැන ඉන්න ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු සියලුදෙනාම කරුණු පැහැදිලි කළා, අපේ රට ඉක්මනින් ආර්ථික ස්ථායීකරණයට පත් වෙනවා කියලා. ඒක අපි විතරක් කියන දෙයක් නොවෙයි. ආර්ථික විශ්ලේෂකයන් පවා කියනවා, අපේ රට ශීඝ්‍රයෙන් ආර්ථික ස්ථායීකරණයට ළඟා වෙනවාය කියලා.

ඊළඟට, අද අපිට චෝදනාවක් කළා, ජනාධිපතිතුමා කරපු කථාවේ පාඨ කියනවා කියලා. මම විපක්ෂයටත් ආරාධනා කරනවා, එතුමාගේ ඒ කථාවට හොඳින් සවන් දෙන්න කියලා. එතුමාගේ කථාව ඇහුවාම මට මහත් ආඩම්බරයක් ඇති වෙනවා. මම හිතන විදියට ඒක තමයි, ලංකා ඉතිහාසය තුළ ජනාධිපතිවරයෙක්, රාජ්‍ය නායකයෙක් අපේ රටේ මිනිසුන් ගැන සහකම්පනයක් ඇතුව කථා කරපු පළමුවැනි අවස්ථාව. ඒ අවස්ථාවේදී ජනාධිපතිතුමා අපේ රටේ දරුවන්ගේ කුසගින්න ගැන වාගේම අධ්‍යාපනය ගැන මතක් කළා. ඒ ගැන අපි බෙහෙවින්ම ආඩම්බර වෙන්න ඕනෑ. අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහෝ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. අපි ශිෂ්‍යාධාර වැඩි කරලා තිබෙනවා. මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරලා තිබෙනවා. අපේ රටේ දුප්පත් දරුවන්ට අධ්‍යාපනය සඳහා පොත් පත් මිලදී ගැනීමට රුපියල් 6,000ක දීමනාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම 2023 සහ 2024 වර්ෂයේදී දිස්ත්‍රික් මට්ටමින් උසස් පෙළ විභාගයේදී කුසලතා දැක්වූ දරුවන්ගෙන් එක දිස්ත්‍රික්කයකින් දරුවන් 60 බැගින් දිස්ත්‍රික්ක 25න්ම තෝරාගෙන ඔවුන්ට ජනාධිපති අරමුදලෙන් රුපියල් ලක්ෂය බැගින් ප්‍රදානය කර තිබෙනවා. ජනාධිපති අරමුදල මේ රටේ දේශපාලන අවශ්‍යතාව අනුව අවභාවිත කරපු විදිය අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව ගත් මේ තීරණය ඉතා වැදගත් තීරණයක්. 2023 සහ 2024 වර්ෂයේදී උසස් පෙළ විභාගයෙන් කුසලතා දැක්වූ දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් ලක්ෂය බැගින් ප්‍රදානය කළා. අපි ඒ ගැන ආඩම්බර වෙන්න ඕනෑ.

මෙතැන ඉන්න ජාතික ජන බලවේගයේ මැතිඇමතිවරු 159දෙනාම ජනාධිපතිතුමා සමඟ එක්ව මේ රටේ දරිද්‍රතාව තුරන් කරමින්, මේ රට සංවර්ධනය කිරීමේ මාවතට ඇද දමන්න බොහොම වගකීමෙන් අත්වැල් බැඳගෙන මේ රටේ පුරවැසියන් සමඟ ඉදිරි ගමනක යනවා. ඒ වාගේම අපේ රටේ දුක් විඳින ජනතාවට අපි පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උරුම කර දෙනවා කියන එකත් බොහොම වගකීමෙන් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට විනාඩි 7ක් තිබෙනවාය කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙන්නේ.

[பி.ப. 4.45]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன்.

2024ஆம் ஆண்டு சனவரி மாதம் ஏற்பட்ட வெள்ள அனர்த்தம் காரணமாக நாட்டிலுள்ள பல பிரதேச செயலாளர் பிரிவுகள் பாதிக்கப்பட்டன. அவற்றில் அம்பாறை மாவட்டத்திலுள்ள பொத்துவில், லகுகலை, அக்கரைப்பற்று, அட்டாளைச்சேனை போன்ற பிரதேச செயலாளர் பிரிவுகள் தொடர்பில் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் 1,669 குடும்பங்களும், லகுகலை பிரதேச செயலாளர் பிரிவில் 1,650 குடும்பங்களும் இதனால் பாதிக்கப்பட்டு இருக்கின்றன. இந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் பாதிக்கப்பட்ட மக்களுக்கு அம்பாறை மாவட்ட அரசாங்க அதிபரின் அனுமதியுடன் நிவாரணப் பொருட்கள் வழங்கப்பட்டன. குறிப்பாக, பொத்துவில் A. K. Rauff Traders மூலமாக 2,145,300 ரூபாய் பெறுமதியான நிவாரணப் பொருட்களும், அல்-மாயிதாஸ் மூலமாக 1,670,850 ரூபாய் பெறுமதியான நிவாரணப் பொருட்களும், லகுகலை பிரதேச செயலாளர் பிரிவில் Pottuvil Budget Food City மூலமாக 3,165,600 ரூபாய் பெறுமதியான நிவாரணப் பொருட்களும் பிரதேச செயலாளரின் அனுமதியுடன் வழங்கப்பட்டன. எனினும், இவற்றுக்கான கொடுப்பனவுகள் குறித்த கடை உரிமையாளர்களுக்கு இன்றுவரை வழங்கப்படவில்லை. கிட்டத்தட்ட இரண்டு வருடங்களாகியும் இந்தக் கொடுப்பனவுகள் கிடைக்காமையால் கடை உரிமையாளர்கள் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள். எனவே, இந்தக் கொடுப்பனவை விரைவாக வழங்குவதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

2024.10.25 அன்று எமது பிரதேசத்தில் ஏற்பட்ட மினி சூறாவளி காரணமாக 14 மீனவர்கள் பாதிக்கப்பட்டதுடன், அவர்களுடைய மீன்பிடி உபகரணங்களும் முற்றாகச் சேதமடைந்தன. இன்று வரை அவர்களுக்கு எந்த விதமான நஷ்டஈடும் வழங்கப்படவில்லை. எனவே, பாரூக், றிஹான், ஸுபைர், மீரா முகைதீன், கையூம், நாகூர்பிச்சை, தாஸீம், சேகுத்தம்பி, தௌபீக், நிஸார், முஹம்மது லெப்பை, மனாப், ஏ.சீ. மீரா முகைதீன், எம்.எச்.ஏ. றவுப் ஆகிய மீனவர்களுக்கு விரைவாக அதற்குரிய நஷ்டஈட்டை வழங்குவதற்கு மீன்பிடி அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த வேளையில் கேட்டுக் கொள்கின்றேன்.

எமது பிரதேச செயலகப் பிரிவிலுள்ள பல கிராம சேவையாளர் பிரிவுகளில் குடிநீருக்குப் பாரிய தட்டுப்பாடு நிலவுகின்றது. நீர் வழங்கல் வடிகாலமைப்புச் சபையால் வரட்சிக் காலங்களில் இந்தக் கிராம சேவையாளர் பிரிவுகளுக்கு குடிநீரை வழங்க முடியாமல் இருக்கின்றது. இதனைக் கருத்திற்கொண்டு பிரதேச செயலகத்தில் இருக்கின்ற இரண்டு உழவு இயந்திர 'பவுசர்'கள் மூலமாகவோ அல்லது பாரிய ஒரு 'பவுசர்' மூலமாகவோ இந்தக் கிராம சேவையாளர் பிரிவுகளுக்குக் குடிநீரை வழங்குவதற்கான நிதி ஒதுக்கீடுகளை அம்பாறை அரசாங்க அதிபர் மூலமாக மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனவும், இந்தக் குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்கு 'கெடஓயா' திட்டத்தை அவசரமாக ஆரம்பிக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன்.

பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள அறுகம்பை பிரதேசம் உல்லாசப் பிரயாணத்துறைக்குப் பெயர்போன ஓர் இடமாகக் காணப்படுகின்றது. பல மாடிக் கட்டிடங்களைக் கொண்டிருக்கின்ற இந்தப் பிரதேசத்தில் திடீரென தீ விபத்து ஏற்படும்போது, அதனை அணைப்பதற்காக அக்கரைப்பற்று மற்றும் கல்முனை மாநகர சபைகளிடமிருந்தே fire brigade சேவையைப் பெறவேண்டி இருக்கின்றது. எனவே, நாட்டுக்கு வருமானத்தை ஈட்டித்தருகின்ற அறுகம்பை பிரதேசத்தின் நன்மை கருதி, அப்பிரதேசத்துக்கென ஒரு தீயணைப்பு இயந்திரத்தையும் beach cleaning machineஐயும் வழங்குவதற்கு அரசு நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எமது பிரதேசத்திலுள்ள பாடசாலைகள் பல்வேறு குறைபாடுகளுடன் காணப்படுகின்றன. பொத்துவில் மத்திய கல்லூரிக்கு தேசிய பாடசாலைக்குரிய ஆளணி உருவாக்கம் இன்னும் செய்து கொடுக்கப்படாமை காரணமாக ஒரு KKSஐக் கூட இடமாற்றம் செய்ய முடியாதுள்ளது. இந்நிலையில், பொத்துவிலைச் சேர்ந்த ஜனுல் சிபாயா என்ற ஊழியர் அட்டாளைச்சேனை தேசிய பாடசாலையில் கடமை புரிந்துகொண்டு இருக்கின்றார். இந்த அவலங்களை நீக்குவதற்காக விரைவாக அந்தப் பாடசாலைக்குரிய ஆளணியை உருவாக்கிக் கொடுக்குமாறும் அங்கு காணப்படுகின்ற வளப் பற்றாக்குறையை நிவர்த்தி செய்து கொடுக்குமாறும் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய பிரதேசத்திலுள்ள அஸ்-ஸாதிக் வித்தியாலயம், தாருல் பலாஹ் முஸ்லிம் வித்தியாலயம், அல்-இர்பான் மகளிர் கல்லூரி, அல்-கலாம் மகா வித்தியாலயம் ஆகியவற்றிலுள்ள இடப் பற்றாக்குறையைத் தீர்ப்பதற்கு மூன்று மாடிக் கட்டிடங்களை வழங்குவதற்கு இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், பாடசாலைகளில் வேலைகளை இலகுபடுத்தும் முகமாக அனைத்து பாடசாலைகளுக்கும் photocopy machines வழங்கப்பட வேண்டுமெனவும் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப் படுகின்ற பழங்களுக்குரிய வரியைக் குறைப்பதன்மூலம் வறுமைக் கோட்டுக்குகீழ் வாழும் மக்களுக்கும் அப் பழங்களைச் சாப்பிடக்கூடிய சந்தர்ப்பம் கிடைக்கும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்று முன்தினம் மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் சபையில் பலஸ்தீனை தனி நாடாக அங்கீகரிப்பதற்கு தனது ஆதரவைத் தெரிவிப்பதாகக் கூறினார். அதற்காக அவருக்கு இலங்கை வாழ் முஸ்லிம்கள் சார்பாக எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அம்பாறை மாவட்டத்திலுள்ள பொத்துவில் பிரதேச கால்நடை வைத்திய அதிகாரி அலுவலகத்துக்கு வாகனம் ஒன்று வழங்கப்பட்டு இருக்கின்றது. அந்த அலுவலகத்துக்கு உரிய சாரதியை வேறோர் அதிகாரி பயன்படுத்துவதனால், குறித்த வைத்தியர் தன்னுடைய சொந்த motorcycleஐப் பயன்படுத்தித்தான் அலுவலகக் கடமைகளைச் செய்து வருகின்றார். கிழக்கு மாகாண சபை விவசாய அமைச்சின் செயலாளர் அவர்கள் விரைவாக அதற்குரிய சாரதியை நியமித்து, குறித்த வைத்தியர் அந்த வாகனத்தைப் பயன்படுத்துவதற்கு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கடந்த 23ஆம் திகதி இலங்கையில் சர்வதேச சைகைமொழி தினத்தைக் கொண்டாடிய அனைவருக்கும் இந்தச் சபையில் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். எமது பிரதேச செயலகத்தில் குறித்த நிகழ்வைத் தலைமைதாங்கி நடாத்திய சி.எம். பௌசி முகைதீன் அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இறுதியாக, மேற்குறித்த விடயங்களை விரைவாக மேற் கொள்வதற்கு இந்தச் சபை ஆவன செய்ய வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். வஸ்ஸலாம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

[අ.භා. 4.51]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පාර්ලිමේන්තුවේ විවාදයට ගැනෙන 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන රෙගුලාසි පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මේ විවාදය පුරාම විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු මේ රටේ ඇති වෙච්ච ආර්ථික අර්බුදය, ඒ අර්බුදයට හේතු වුණු සැබෑ මූලයන් වසන් කිරීමට සැලකිය යුතු උත්සාහයක් දැරූ බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව බලයට එන්නටත් ප්‍රථම මේ රෙගුලාසි පනවා තිබුණා. නමුත්, එය දීර්ඝ කරන්න සිදු වුණා, මේ රටේ ඇති වෙච්ච ආර්ථික අර්බුදයත් එක්ක, විශේෂයෙන් සෑම ක්ෂේත්‍රයකම ඇති වුණු බිඳ වැටීම්වලින් පසුව සංචාරක ක්ෂේත්‍රයේත් ඇති වෙච්ච මහා බිඳ වැටීම් යම්කිසි ආකාරයකට හෝ පාලනය කර ගැනීමට අත්‍යවශ්‍ය වාහන කිහිපයක් ආනයනය කිරීමට අවශ්‍ය ඒ පහසුකම් සැලසීම සඳහා.

අපේ රටේ ආර්ථිකය පිළිබඳව අවධානය යොමු කරනකොට සංචාරක කර්මාන්තය කියන්නේ ඉතා වැදගත් ක්ෂේත්‍රයක්. 2018දී තමයි සංචාරකයින් වැඩිම ප්‍රමාණයක් අපේ රටට ආවේ. එය, ලක්ෂ 25කට ආසන්න ප්‍රමාණයක්. ඒ හරහා අපේ රටට ඩොලර් බිලියන 4.4ක පමණ ආදායමක් උපයා ගන්න පුළුවන් වුණා. නමුත්, එය 2018 වර්ෂයෙන් පස්සේ දිගින් දිගටම කඩාගෙන වැටුණු නිසා සංචාරක ක්ෂේත්‍රයෙන් ලබා ගන්නට තිබුණු ආදායම සම්පූර්ණයෙන්ම වාගේ අපට අහිමි වෙලා ගියා.

මේ තත්ත්වය යටතේ ජාතික ජන බලවේගය රජය සංචාරක ක්ෂේත්‍රයේ නව පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා සැලසුම් සකස් කළා. ඒ සැලසුම් අනුව අපි බලාපොරොත්තු වුණා, මේ වසරේදී ලක්ෂ 25ක, ලක්ෂ 30ක සංචාරකයන් ප්‍රමාණයක් අපේ රටට කැඳවා ගෙන එන්නට. 2030 වසර වනකොට මිලියන 4ක සංචාරකයින් ප්‍රමාණයක් අපේ රටට කැඳවාගෙන ඇවිල්ලා, ඒ ඔස්සේ අපේ රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීම තමයි අපේ අරමුණ වෙන්නේ. මේ ඔස්සේ අපි කටයුතු කරගෙන යනකොට විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් අදහස් දක්වමින් කිව්වා, ආර්ථිකය බිඳ වට්ටපු එක ගැන අපට කථා කරන්න එපා කියලා. එතුමන්ලා කිව්වා, මේ ආර්ථිකය බිඳ වැටුණා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, පසුගිය දශක ගණනාවක් පුරා මාරුවෙන් මාරුවට මේ රටේ පාලන බලය හෙබවූ දේශපාලන පක්ෂ මේ ආර්ථිකය මේ තත්ත්වයට බිඳ වැට්ටවීමට අනිවාර්යයෙන්ම වග කිව යුතු බව. විශේෂයෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. 2022 වර්ෂයේදී රට බංකොලොත් වුණේ අපට විදේශ ණය ගෙවා ගන්න බැරි වුණු නිසායි. ඒ වන විට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 38කට, 40කට ආසන්න ප්‍රමාණයක් ගෙවා ගන්න බැරි තත්ත්වයකට අපි පත් වුණා. අපි දන්නවා, අපට ද්විපාර්ශ්වීය ණය, බහුපාර්ශ්වීය ණය තිබුණු බව. ඒ ඔක්කොටමත් වඩා අපි ඉතාම බරපතළ අර්බුදයකට පත් වුණේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ඔස්සේ ලබා ගත් ණය නිසායි. කවුද මේ ණය වැඩි ප්‍රමාණයක් ගත්තේ?

මේගොල්ලන් තට්ටු මාරු ක්‍රමයට දේශපාලනය කරලා, 2015දී මේ දෙගොල්ලන්ම එකතු වෙලා ආණ්ඩුවක් පිහිටෙව්වා. ඒ දෙගොල්ලන්ම එකතු වෙලා පිහිටවපු ආණ්ඩුවෙන් තමයි, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් බිලියන 12.5ක ISBs ගත්තේ. 2007දී තමයි අපේ රට ISBs ගන්න පටන් ගත්තේ. අපි සම්පූර්ණයෙන්ම අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 15යි. ඒ ඩොලර් බිලියන 15න් ඩොලර් බිලියන 12.5ක් ගත්තේ මේගොල්ලන්. එතැනින් තමයි අර්බුදය උත්සන්න වුණේ. මේ ණය ගෙවා ගන්න බැරි වුණු එකේ එක ප්‍රධානම සන්ධිස්ථානයක් තමයි ඒක. එහෙම ණය අරගෙන ආර්ථිකය හැදුවාද? 2015දී ආර්ථික වර්ධනය සියයට 5ට තිබුණා. 2019 වනකොට ආර්ථික වර්ධනය සෘණ අගයක් ගත්තා. ණය අරගෙන ආර්ථිකය හදන්නත් බැරි වුණා. එහෙම කරලා අද කියනවා, ආර්ථිකය වැට්ටුවේ නැහැ කියලා. ආර්ථිකය මේ තත්ත්වයට බිඳ වැට්ටවීමට වග කිව යුතු අය අද නිකම් සුදනෝ ෙගේ වෙලා ජාතික ජන බලවේගය පැත්තට මේ විධියට ඇඟිල්ල දිගු කිරීම පිළිබඳව, ඒ පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ජාතික ජන බලවේගය රජයේ ප්‍රධානතම කාර්යභාරය වුණේ ආර්ථිකය ස්ථාවර කර ගැනීම. ඒ සඳහා මේ වන විට ජාතික ජන බලවේගය ආණ්ඩුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඔස්සේ යම්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

කිසි දුරකට ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. මම ඔබතුමාට සංඛ්‍යාලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. දළ ජාතික නිෂ්පාදිතය 2019දී සියයට 0.2යි; 2022දී ඍණ සියයට 7.2යි. 2025 අගෝස්තු වනකොට එම ප්‍රමාණය ධන 4.9ක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම විරැකියා අනුපාතය 2025 අගෝස්තු වනකොට සියයට 3.8 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම උද්ධමනය අනුපාතය සියයට 1.2ක මට්ටමක තිබෙනවා. විනිමය අනුපාතය ගත්තොත්, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයක් ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව රුපියල් 300ක සාමාන්‍ය අගයක අපි පවත්වාගෙන යනවා. බැංකු පොලී අනුපාතය තනි ඉලක්කමකට - සියයට 8.2ට- අපි ගෙනැවිත් තිබෙනවා. මේ විධියට ආර්ථිකය ස්ථාවර කර ගැනීම සඳහා පසුගිය වසරකට ආසන්න කාලයක් තුළ අපි කටයුතු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, මේ ආර්ථිකය මීට වඩා එහාට ගෙනයන්න ඕනෑ, ආර්ථික වර්ධනයක් දක්වා ගෙනයන්න ඕනෑ බව. නමුත් බිඳ වැටුණු ආර්ථිකයක් ඔස්සේ එය ස්ථාවර කරගෙන ඉදිරියට මේ ආර්ථිකය වර්ධනය කර ගන්න අවශ්‍ය මූලික අඩිතාලම දමා ගැනීම තමයි, පසුගිය වසරක කාලය තුළ අප විසින් ඉටු කරනු ලැබුවේ. ඒ දමා ගත් අඩිතාලම ඔස්සේ මේ ආර්ථිකය ඉදිරි වසර කිහිපය තුළ ඉදිරියට ගෙන යමින් අපි අපේක්ෂා කරපු, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ජනතාවට උදා කරලීමේ අභිප්‍රාය වෙනුවෙන් අපගේ වගකීම අනිවාර්යයෙන්ම ඉටු කරන බව සඳහන් කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

## යෝජිත විදුලි ගාස්තු අඩු කිරීම
## உத்தேச மின் கட்டணத்தைக் குறைத்தல்
## REDUCTION OF PROPOSED ELECTRICITY TARIFF

[අ.භා. 4.59]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පසුගිය මාස හයේදී ලංකා විදුලිබල මණ්ඩලය වෙත රුපියල් බිලියන 9.525ක අලාභයක් සිදුව ඇතැයි ප්‍රකාශ කරමින්, -ඒක පත්තරවලත් පළ වුණා- 2025 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල සීමාව සඳහා සමස්තයක් ලෙස සියයට 6.8ක ගාස්තු වැඩිවීමක් සිදු කළ යුතු බව සඳහන් කරමින් ඒ සඳහා රජය ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවෙන් අනුමැතිය ඉල්ලා ඇත.
>
> මෙම මිල ගණන් සංශෝධනය පිළිබඳව අදහස් දක්වමින් මහජන උපයෝගීතා කොමිෂන් සභාව සඳහන් කර ඇත්තේ මිල ගණන් වගු ගත කර ඇති ආකාරය පිළිබඳව නියාමනයට දැනට කිසිදු අවබෝධයක්ද නැති බවයි. ලංකා විදුලිබල මණ්ඩලයේ මූලාශ්‍රයන් පරිශීලනය කරන විට නිරීක්ෂණය වන්නේ එවැනි දැවැන්ත පාඩුවකට සාධාරණ හේතුවක් නොමැති බවයි.
>
> පසුගිය කාල සීමාව තුළ ලංකා විදුලිබල මණ්ඩලය දිගින් දිගටම ගාස්තු අය කිරීම් වැඩි කරනු ලැබුවේ පිරිවැය කළමනාකරණය කර ගැනීමට හැකි සාධක දක්නට ලැබෙන පසුබිමකදිය. එම නිසා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසියක් සපුරාලීම පමණක්ම අරමුණු කරගෙන මෙම යෝජනාව ඉදිරිපත් කරන බව පැහැදිලිය.
>
> ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ විදුලි ගාස්තු අය කිරීමේ ක්‍රමය, ඛනිජ තෙල් සහ ගෑස් සඳහා වන මිල සූත්‍රය මෙන්ම මිල සංශෝධන ක්‍රියාවලිය වඩා සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයකට යාවත්කාලීන කිරීම සඳහා පොරොන්දුවක් ලබා දී ඇත.
>
> එමෙන්ම, ජනාධිපතිවරණ වේදිකාවේදී ජාතික ජන බලවේගයේ අපේක්ෂකයා ප්‍රකාශ කළේ තමන් බලය ලබා ගත් වහාම විදුලිය ගාස්තුව 1/3 ප්‍රමාණයකින් අඩු කරන බවයි.
>
> අත්‍යවශ්‍ය සේවා සහ භාණ්ඩ මත ඍජු සහ වක්‍ර බදු පනවමින් ඒවායෙහි මිල දරාගත නොහැකි මට්ටමකට වැඩි කර ඇති මේ මොහොතේ යෝජිත විදුලි මිල සංශෝධනය නොකළ යුතු බවත්, අවම වශයෙන් සියයට 15කින් විදුලි බිල අඩු කළ යුතු බවත් මෙම සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් හේතු සාධක සහ සාක්ෂි එක්ක කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. ගරු අමාත්‍යතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව රුපියල් කෝටි 952ක් හෝ ඒ ඇති වෙලා තිබෙන මූල්‍ය හිඟය රුපියල් කෝටි 798ක් කියලා පෙන්වපු තර්කය ඉදිරිපත් කර තිබෙන්නේ යථාර්ථවාදී පදනමක් මත නොවෙයි කියලා අපි හිතනවා. විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කළ තමන්ගේම ගිණුම් වාර්තාව අනුව මේ වර්ෂයේ අප්‍රේල් මාසයේ රුපියල් කෝටි 46ක ආදායමක් උපයා තිබෙනවා; මැයි මාසයේ රුපියල් කෝටි 74ක ආදායමක් උපයා තිබෙනවා; ජූනි මාසයේ රුපියල් කෝටි 411ක ආදායමක් උපයා තිබෙනවා; ජූලි මාසයේ රුපියල් කෝටි 518ක් උපයා තිබෙනවා. අගෝස්තු මාසයේත් ඔවුන් ලාභයක් උපයන්න බලාපොරොත්තු වෙනවා. මම දන්නවා ලාභයක් ඇති කියලා. මම මේවා කිව්වේ, විදුලිබල මණ්ඩලයේම ගිණුම් වාර්තාවකින්. මේ අවස්ථාවේ මම එය **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය තවත් විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මට තවත් විනාඩි දෙකක් ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉහත කී කරුණු අනුව පෙනෙනවා, ලාභයක් තිබෙනවා කියලා; පාඩුවක් නැහැ කියලා. ඒ වාගේම clawback clause එකක් තිබෙන බවත් ගරු ඇමතිතුමා දන්නවා. Clawback clause එක කියන්නේ මේකයි. 2024 පළමුවෙනි මාස 6ට රුපියල් කෝටි 5,110ක් විදුලිබල මණ්ඩලය උපයා තිබෙනවා. 2025 ගිණුමේ ඒ කෝටි 5,100 පෙන්නලා නැහැ. එහි ඒ රුපියල් කෝටි 5,100 ඇතුළත් කළා නම් පාඩුවක් සිද්ධ වෙන්නේ නැහැ.

2025 ජුනි මාසයේ ඔබතුමන්ලා සියයට 15ක විදුලි ගාස්තු වැඩි කිරීමක් සිදු කළා. දැන් ආයෙත් සියයට 6.8කින් ගාස්තු වැඩි කරන්න ඉල්ලනවා. ඒක සාධාරණ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ තිබෙන ප්‍රශ්නය විදුලි පිරිවැය නොවෙයි.

ඊට වඩා දෙයක් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ කොළඹදී තිබුණු Extended Arrangement under the Extended Fund Facility එකේ Third Review එකේදී IMF එකේ බලපෑම මත පරම්පරාගත ණය, නැත්නම් legacy debt ටික එකතු කරලා, රුපියල් කෝටි 18,200ක එම පරම්පරාගත ණය IMF එකේ නියෝග මත පාරිභෝගිකයන්ගෙන් අය කරන්න ජනාධිපතිතුමායි, කැබිනට් මණ්ඩලයයි එකඟ වෙලා තිබෙනවා. ඒක මත තමයි දැන් මේ අය කිරීම් සිදු කරන්න යන්නේ; එය පාරිභෝගිකයන්ගෙන් අය කර ගන්නයි යන්නේ. මේ මඟින් ප්‍රශ්න කීපයක්ම පැන නඟිනවා.

ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම් අනුව අප්‍රේල් මාසයේ ඉඳලා අගෝස්තු මාසය දක්වා ලාභයක් තිබෙනවා. ඒ වාගේම, ඉදිරියේදී එන්නේ මෝසම් කාලය, ගරු ඇමතිතුමනි. ඒ කියන්නේ වැසි කාලය; විදුලි උත්පාදනයට අඩුම වියදම යන කාලය. දැනටමත් අපේ ජලාශවල පිටාර ගැලීම් සිදු වෙනවා. ඒ නිසා විදුලි බිලේ වැඩි වීමක් අවශ්‍ය නැහැ. රජයේ නියෝග මත පරම්පරාගත ණය - legacy debt - tariff formula එකට එකතු කරන්න විධියක් නැහැ. ඔබ විසින් විදුලිය පිරිවැය වැඩි කිරීමක් එක පැත්තකින් සිදු වෙනවා. මොකද, කාර්යක්ෂමතාව අඩු වීමක්. සොබාදනවි ව්‍යාපෘතියේ ධාරිතා අය කිරීම - capacity charge - මාස 6කට රුපියල් කෝටි 7,000ක් වෙනවා. ඒ අනුව විදුලි ඒකකයකට රුපියල ගණනේ අය කිරීමක් සිදු වෙනවා. "සහස්දනවි" ව්‍යාපෘතියත් ආරම්භ කළා නම්, ඒකෙනුත් ධාරිතා අය කිරීම - capacity charge - පාරිභෝගිකයා වෙතම යනකොට ඒ මුදල තවත් වැඩි වෙන්න පුළුවන්. මිල සූත්‍රය - tariff formula- අනුව legacy debt එක ඇතුළත් කරන්න විධියක් නැහැ. මම ඔබතුමන්ලාට කියනවා, එහෙම පුළුවන්කමක් තිබෙනවා නම් කරුණාකරලා ඒක මේ සභාවට පෙන්වන්න කියලා.

ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම්කරණය - accounting - පිළිබඳව සහ data accuracy එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. IMF එක ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒක නිවැරදි කරලා තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

තුන්වැනි එක තමයි, මේ රජය ජනතාවට පොරොන්දුවක් දුන්නා, විදුලි බිල සියයට 30කින් අඩු කරන බවට. කරුණාකරලා මේ සභාවට පෙන්වන්න, මේ කරන energy mix, least-cost dispatch එක ආදි වශයෙන් භාවිත කරන ක්‍රමවේද හරහා විදුලිබිල සියයට 30කින් අඩු කරන්නේ කොහොමද, ඒ සියයට 30 අඩු කරන්නේ කවදාද කියලා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.05]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද ඉතා කාලීන සහ වැදගත් වූ යෝජනාව මම ස්ථිර කරනවා. විදුලි බිල අඩු කිරීමේ ක්‍රමෝපාය ගැන ඉතා වැදගත් කරුණු ගණනාවක් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා සඳහන් කළා. මම ඒවා අනුමත කරනවා. එම නිසා ඒ කරුණු මම නැවත කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ විදුලිබල ක්ෂේත්‍රය ඉතා බරපතළ සන්ධිස්ථානයකට ඇවිත් තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම කාලීන අවශ්‍යතාවක්; අත්‍යවශ්‍ය දෙයක්. එය කඩිනමින්, සාර්ථකව කරන එක තමයි අපේ ප්‍රාර්ථනාව. ලංකා විදුලිබල මණ්ඩලය තුළ වර්තමානයේ පවතින ව්‍යුහය දිගු කාලීනව පවත්වාගෙන යෑම ලංකා විදුලිබල මණ්ඩලයටවත්, එහි සේවකයන්ටවත්, රටටවත් වැදගත් වෙන්නේ නැහැ කියලායි අපේ විශ්වාසය. නමුත්, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය තුළ අද මතු වෙලා තිබෙන අවුල් සහගත තත්ත්වය, වගකීම් විරහිත තත්ත්වය මේ රටේ අනාගතයේ විදුලි බිල දෙගුණ තෙගුණ වීමට හේතුවක් වන්න පුළුවන්. එම සේවකයන්ගේ අනාගතය පිළිබඳව බරපතළ අවිනිශ්චිතතාවක් මතු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා හොඳාකාරවම දන්නවා, ඕනෑම ආයතනයක සේවකයෙකු තමන්ගේ සේවා ස්ථානයේ වෙනසක් වෙනකොට, අයිතියේ වෙනසක් වෙනකොට, පරිපාලනයේ වෙනසක් වෙනකොට අතිශයින් සංවේදියි කියලා. මොකද, තමන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් රැඳී පවතින්නේ එම ආයතනයත් එක්ක. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ සාපේක්ෂව වඩා හොඳ වැටුප් සහ පහසුකම් තිබෙන ආයතනයක් වන ලංකා විදුලිබල මණ්ඩලය ආයතනික වශයෙන් වෙනස් වනකොට, එම ආයතනයේ ඒ වෙනස් වීම වඩා මෘදු ලෙස, වඩා විශ්වසනීය ලෙස සිදු කරන එක ඔබගේ වගකීම; රජයේ වගකීම.

ගරු ඇමතිතුමනි, වර්තමාන විදුලිබල මණ්ඩලය අද වනකොට පෞද්ගලික සමාගම් 6කට වෙන් කරන්න ඔබතුමා කටයුතු කර තිබෙනවා. ඒ පනතේ එහෙම තිබෙනවා. සමාගම් 4ක් මේ වනකොට පිහිටුවා තිබෙනවා. හැබැයි, ඒ සමාගම් 4 සඳහා පත් කර තිබෙන අධ්‍යක්ෂ මණ්ඩලය කවුද? සභාපතිවරුන් කවුද? සේවකයන්ට එම සමාගම්වල සේවය සඳහා කැමැත්තක් තිබෙනවාද කියන එකත් ඔවුන්ගෙන් ලිඛිතව බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඒ සමාගම් ඉදිරි සති කිහිපය තුළ තමන්ගේ වගකීම් ස්වාධීනව පටන් ගන්න තිබෙනවා. දැනට පවතින විදුලිබල මණ්ඩලයේ පාලන ව්‍යුහය කෙටි කාලයක් තුළ -නොවැම්බර් මාසය පමණ වනවිට- සම්පූර්ණයෙන් මාරුවීමට අපේක්ෂා කරනවා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ රටේ පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කරන්නත්, මේ රටේ විදුලිබල පද්ධතිය smart grid එකක් බවට පත් කරන්නත්, අවසානයේ පාරිභෝගිකයාට සාධාරණ මිලකට විදුලිය ලබා ගන්නත්, ආයෝජකයන්ගේ ආයෝජන සම්බන්ධයෙන් විශ්වාසවන්තභාවයක් ඇති කරගන්නත් කියන මේ සියල්ල සඳහා මේ ඇති වන වෙනස්කම අතිශයින් වැදගත්. නමුත් මේ ඇති වන වෙනස්කම ඉතා අපැහැදිලියි. දැන් සමාගම් 4ක් පිහිටුවා තිබෙන බව අපි දන්නවා. ඒ සමාගම්වල අධ්‍යක්ෂවරු කවුද, සභාපතිවරයා කවුද, ඒ සමාගම්වල මූලස්ථානය පිහිටුවන්නේ කොහේද, ඒ සඳහා වන මූලික සැලසුම, ඒ කියන්නේ විදුලිබල මණ්ඩලයේ ආකෘතියේ ඉඳලා පෞද්ගලික සමාගම කියන ව්‍යුහයට මාරු වීම සඳහා වන ඒ සංක්‍රමණික සැලැස්ම මොකක්ද කියලා අප දැනගන්න කැමැතියි. ඔබතුමාට පුළුවන් නම් ඒ ටික කියන්න. මේවා නැති නිසා තමයි ඇමතිතුමනි මේ අවිශ්වාසයක් ඇති වෙලා තිබෙන්නේ. කොච්චර හොඳ වැඩක් වුණත් හරියට කළේ නැත්නම් ඒ වැඩේ අවුල් වෙනවා.

විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සාර්ථක වේවා කියා අවංකවම ප්‍රාර්ථනා කරන කෙනෙකු හැටියට, ඒ ක්ෂේත්‍රය පිළිබඳ වගකීම් දරපු කෙනෙකු හැටියට මගේ හැඟීම තමයි, මේ රජය විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමය කළමනාකරණය කරන්න විද්වත් වෘත්තිකයන් සහ වගකීම් සහිත විද්වත් කණ්ඩායමක් හෝ උපදේශක සමාගමක් පාවිච්චි නොකිරීමේ හේතුව නිසා අද අවුල්සහගත තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියන එක. තනි පුද්ගලයෙක් මත විශ්වාසය තබා වැඩ කිරීම නිසා අවිශ්වාසයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අන්තිම මොහොතේ හෝ ඒ විශ්වාසවන්තභාවය ඇති කර වෘත්තිය ගැටලු විසඳා, ඇති වෙලා තිබෙන අවුල්සහගත තත්ත්වය නැති කර මේ රටේ ජීවනාලිය බඳු විදුලිබල පද්ධතිය ආරක්ෂා කරගෙන අඩු මිලට, සාධාරණ මිලට කර්මාන්තකරුවන්ටත්, ගෘහ ඒකකවලටත් අවශ්‍ය විදුලිය ලබා ගැනීමට අවස්ථාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, ගරු කබීර් හෂීම් මැතිතුමා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව නැවත වරක් ස්තුතිය පළ කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.11]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම විදුලිබල ක්ෂේත්‍රය පිළිබඳව මේ වනවිට විශාල කථාබහක් ඇති වෙලා තිබෙනවා. අපේ රටේ වාගේම ඕනෑම රටක වැදගත්ම ක්ෂේත්‍රයක් තමයි බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ. එම ක්ෂේත්‍රය ස්වාධීනව ඉස්සරහට යන්නට ඕනෑ. විදුලිබල ක්ෂේත්‍රය මීට කලින් ප්‍රතිව්‍යුහගත කරන්න සැලසුම් කර තිබුණු විධියත්, දැන් සැලසුම් කර තිබෙන විධියත් ගත්තාම, ලොකු වෙනස්කම් තිබෙනවා. මීට කලින් සමාගම් 12කට කඩන්න තමයි සැලසුම් සකස් කර තිබුණේ. ඒ ගැන හරියට පැහැදිලිව කියලා තිබුණේත් නැහැ, ඒවා රජයට අයිතිද, පෞද්ගලිකරණය වෙනවාද, මොනවාද කියලා. එහෙම පැහැදිලිතාවක් තිබුණේ නැහැ. නමුත් අපි දැන් කර තිබෙන වෙනස්කම් ඇතුළේ මේ හදන සමාගම් ටික සියයට 100කින් රජයේ අයිතියේ තබා ගන්නවා. ඒ වාගේම භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත මේවා ස්ථිරව පවරනවා. ඒ නිසා private limited කියා තිබුණාට, මේවා පෞද්ගලික සමාගම් කියා හෝ එහෙම නැත්නම් විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කරන්න යනවා කියා සේවකයන් තුළත් බියක් ඇති කරලා, මේ රට අස්ථාවර කරන්න කටයුතු කරමින් පවතින තත්ත්වය ගැන අපේ කනස්සල්ල පළ කරනවා.

දැන් මේ සියල්ලම අවශ්‍ය වෙලා තිබෙන්නේ ඇයි? එක කාරණයක් තමයි, විදුලි බිල අඩු කිරීම. ඒක ඉතාම පැහැදිලියි. විදුලි බිල අඩු කරන්න නම්, විදුලි නිෂ්පාදන මිල අඩු කරන්න ඕනෑ. නිෂ්පාදනය -ජනනය- වාගේම තමයි බෙදා හැරීම සහ සම්ප්‍රේෂණයත් තිබෙනවා. නමුත් අපේ රටේ සම්ප්‍රේෂණ ජාලය ගත්තොත්, පසුගිය කාලයේ ජනනයට ආයෝජනය කර තිබුණු තරමේ ආයෝජනයක් එයට සිදු කර තිබුණේ නැහැ. ඒ වාගේම තමයි බෙදා හැරීමේ පද්ධතියත් සෑහෙන දුරකට දුර්වලයි. ඒ අනුව කාලයක් තිස්සේම මේ පද්ධතිය පවත්වා ගෙන ආපු විධියට දැන් ඒ තුළ ගැටලු විශාල ප්‍රමාණයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා එක්කෝ රජයට පුළුවන් වෙන්න ඕනෑ, සමස්ත ආයෝජනයම සිදු කර සම්ප්‍රේෂණ පද්ධතිය ගොඩනඟලා බෙදා හැරීමේ පද්ධතිය වත්මනට ගැළපෙන විධියට ගොඩ දමන්න.

හැබැයි, අපි විශාල ආර්ථික ප්‍රපාතයකට ගිහිල්ලා දැන් ආර්ථිකය ස්ථාවර කරගෙන සෙමින් ඉදිරියට යමින් ඉන්න රටක්. විදුලිබලයේ ස්වාධීනත්වයත් තියාගෙන පාරිභෝගිකයාට අඩු මිලට විදුලිය සපයන්නත් සැලසුම් කරගෙන අපි කොහොමද මේ ක්ෂේත්‍රයේ ඉස්සරහට යන්නේ? ඒ සඳහා තමයි මේ වෙනස්කම් ටික කරන්න සූදානම් වෙන්නේ. අපි 2030 වර්ෂය වනකොට සියයට 70ක පුනර්ජනීය බලශක්තියකට යෑමට ඉලක්ක කරලා තිබෙනවා. නමුත් මෙතෙක් කල් solar panels ඉතාම අවිධිමත් විධියට තමයි සවි කරලා තිබුණේ. කොහොම වුණත්, ඒ ක්ෂේත්‍රයට ප්‍රවේශ වීම හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට හරියටම තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Smart gridsවලට ගිහිල්ලා තිබුණේත් නැහැ. Solar panels ඉතාම අවිධිමත් විධියට තිබුණේ. ඒ ගිවිසුම්ගත වෙලා තිබුණේ ඒකකයක් ඉහළ මිලකට. ඉන්ධන භාවිතය අඩු කරලා සූර්ය බලශක්තිය නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ විදුලි බිල අඩු කරන්න නම්, අපට නව උපක්‍රම එක්ක යන්න වෙනවා. ඒ නිසා තමයි අපි පුනර්ජනනීය බලශක්තියට අලුත් ක්‍රමයක් හදලා දුන්නේ; යෝජනා කළේ. මට මතකයි, ඒ ගැනත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් විශාල ආන්දෝලනයක් ඇති කළා, අපි පුනර්ජනනීය බලශක්තිය promote කරන්නේ නැහැ කියලා. නමුත් ඒක අසත්‍යයක්.

මේ යෝජනාවේ තිබෙනවා, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල සහ විදුලි බිල විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා. භාණ්ඩ මිල විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබුණේ පසුගිය කාලය ඇතුළත. අපේ ආණ්ඩුව පත් වෙලා මාස 10ක් ඇතුළත යම් ප්‍රමාණයකට භාණ්ඩ මිල අඩු කරගෙන තිබෙනවා වාගේම, ස්ථාවරභාවයකට පත් කරගෙන තිබෙනවා. තවත් අඩු වෙන්න ඕනෑ බව අපි පිළිගන්නවා. ඒ වාගේම තමයි විදුලි බිලත්.

2024.07.16 කාලයේදී විදුලි බිල ගත්තොත් ගෘහස්ථ ඒකක 0-30ත් අතර වාගේ ඒකක ගණනක් පාවිච්චි කරපු විදුලි පාරිභෝගිකයෙකුට රුපියල් 280ක වාගේ උපරිම බිලක් තමයි ආවේ. 2025.01.18 ඉඳලා ඒක රුපියල් 195ට අඩු වුණා. පොඩි ඉහළ යෑමක් වුණු නිසා 2024.06.12 වෙනකොට ඒක රුපියල් 215කට වැඩි වුණා. හැබැයි, මුලින්ම තිබුණේ රුපියල් 280ක්. රුපියල් 280, අඩු වෙලා තිබෙනවා, රුපියල් 215ට. ඒ, ඒකක 30ක් පාවිච්චි කරන අයට. අනෙක් ඒකකවලටත් එහෙම තමයි. ඒ නිසා තිබුණාට වඩා විදුලි බිල අඩුයි. ඒ වාගේම අත්‍යවශ්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයක යම් මිල අඩු වීමක් තිබෙනවා. ඒ සියල්ල ස්ථාවර කරගෙන තමයි රට ඉස්සරහට යන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක අපට තිබෙනවා, එකඟතා. ඒ කොන්දේසිවලට හිර වෙලා වාගේ එකක් කියන්න නේ උත්සාහ කරන්නේ. එහෙම ගැටුමක් නැහැ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟතා හදාගෙන තිබෙනවා. කලින් එකඟතාවලට වඩා ගොඩක් සාකච්ඡා කරලා රටට අවශ්‍ය තැනට ඒ එකඟතා ඇවිල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ඒක නිසා මේ විදුලිබල ක්ෂේත්‍රය තුළින් විදුලි පාරිභෝගිකයාට සුරක්ෂිත සේවාවක්, ගුණාත්මක සේවාවක් සහ අඩු මිලට විදුලිය සැපයීම සඳහා ආණ්ඩුවක් විධියට ගත යුතු සියලු ක්‍රියාමාර්ග අපි ගන්නා බව මා දන්වන්නට කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.17]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி!

இன்றைய தினம் மின் கட்டண அதிகரிப்பு தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ கபீர் ஹஷீம் அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் நேரடியாகவே விடயத்துக்கு வருகின்றேன். மன்னாரில் மேற்கொள்ளப்படவுள்ள காற்றாலை மின் உற்பத்தி விவகாரம் இப்போது வடக்கு மாகாணத்தில் பாரியதொரு பிரச்சினையாக மாறியிருக்கின்றது.

வடக்கைப் பொறுத்தவரையில், மன்னார் என்பது கேந்திர முக்கியத்துவம் வாய்ந்த ஓர் இடமாகும். அங்கு ஏற்கெனவே 35 காற்றாலைகள் நிறுவப்பட்டு இருக்கின்றன. அதற்கு மேலதிகமாக இன்னும் 15 காற்றாலைகளை அங்கு நிறுவுவதற்கான உபகரணங்களைக் கொண்டுசெல்ல முற்பட்டிருக்கிறார்கள். அந்த மக்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்து இது பற்றி கேட்டிருக்கிறார்கள். அப்போது சனாதிபதி அவர்கள், ஒரு மாதத்தில் இவ்விடயம் பற்றி DCC Meetingஇல் கதைத்து, stakeholder meeting ஒன்றைக்கூட்டி மக்களோடும் கதைத்து, இதற்குரிய அனுமதியைப் பெறுமாறு கூறியிருக்கிறார். இவ்விடயம் தொடர்பில் கலந்துரையாடுவதற்கு வந்த அமைச்சரைக்கூட எங்களுடைய மக்கள் மன்னாரிலிருந்து விரட்டியடித்து இருக்கிறார்கள். அது சம்பந்தமான 'வீடியோ'வை நான் பார்த்தேன். அப்படி நிலைமை இருக்கையில், மறுபடியும் மன்னாரில் காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை ஆரம்பிப்பதற்குரிய நடவடிக்கைகளை நேற்றையதினம் எடுத்திருக்கிறார்கள். மன்னார் மக்கள் இப்போது எங்கே போவது? வடக்கு மாகாணத்தில் சுற்றுலா வலயங்களை உருவாக்கப் போவதாக ஒரு சிலர் சொன்னார்கள்.

மின்சாரம் என்பது ஓர் அடிப்படை வசதி! மன்னார் மண்ணை சுடுகாடாக மாற்றி, மின் உற்பத்திக்காக 45 காற்றாலைகளை நிறுவும்போது, எந்த அடிப்படையில் அங்கு அபிவிருத்தி ஏற்படும்? மன்னார் மண் கொஞ்சம் கொஞ்சமாக அழிகின்றது. இந்த நிலையில், எந்த அடிப்படையில் மன்னாரில் அபிவிருத்தியை ஏற்படுத்த முடியுமென கொஞ்சம் யோசித்துப் பாருங்கள்! இவர்கள் செய்வது மாபெரும் அரசியல்! ஆகக் குறைந்தது, phoneஇல் Googleஇல் "US Dollar to LKR" என்று type பண்ணி பாருங்கள்! 290 ரூபாயாக இருந்த US Dollar 302 ரூபாயாக இப்போது மாறியிருக்கிறது. இதைக்கூட விளங்கிக்கொள்ள முடியாத ஒரு பாராளுமன்ற உறுப்பினர், எப்படி ஐயா வடக்கு மாகாணத்தின் அபிவிருத்தியைப் பார்க்க முடியும்? சற்று சிந்தித்துப் பாருங்கள்! நான் கடற்றொழில் அமைச்சரிடம் ஊழல் தொடர்பாக கேள்வி கேட்டு இரண்டு கிழமையாகியும் இன்னும் பதில் இல்லை.

மன்னார் மக்களே! நீங்கள் யாருக்கு வாக்களித்தீர்கள் என்பதைச் சற்றுச் சிந்திக்க வேண்டும். இப்போது உங்களுடைய மண் சுடுகாடாக மாறுகின்றது. மன்னார் மண் சுடுகாடாக மாறக் கூடாது. சனாதிபதி போன்றவர்கள்மீது நீங்கள் இனியும் நம்பிக்கை வைத்திருப்பீர்கள் என்றால், மன்னார் மண்ணிலிருந்து ஒவ்வொரு நாளும் ஒவ்வோர் உடலம் - dead body - வெளியேற்றப்படும். மன்னார் மண் என்னுடைய இதயம் போன்றது. அந்த மக்களுடைய போராட்டத்தில் நானும் இருப்பேன். மன்னாரில் இருக்கின்ற சகல மதத் தலைவர்களுக்கும் - முஸ்லிம், இந்து, கிறிஸ்தவ - ஓர் அன்பான வேண்டுகோளை விடுக்கின்றேன். மன்னார் மண்ணைப் பாதுகாப்பதற்கு, அபிவிருத்தி என்ற போர்வையில் கொண்டுவரப்படுகின்ற காற்றாலை மின் உற்பத்தித் திட்டத்தையும் அங்கு இடம்பெறுகின்ற மண் அகழ்வையும் எல்லோரும் ஒன்றாகச் சேர்ந்து எதிர்க்க வேண்டுமெனக் கேட்டுக்கொண்டு, மீண்டும் கௌரவ கபீர் ஹஷீம் அவர்களுக்கு என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்து விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවින්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.20]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාවෙන් විදුලි බලය ගැන කථා කරන එක ඉතාම

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

කාලෝචිතයි. මේ සභාවේ ඒ සම්බන්ධ ගොඩක් කාරණා කියැවුණා. "අපි විදුලිබිල අඩු කරන්න ඕනෑ, ඒක සියයට 30කින් අඩු කරන්න ඕනෑ සහ සියයට 70ක් පුනර්ජනනීය ඉලක්කයට යන්න ඕනෑ" කියන කාරණා තමයි රජයක් විධියට අපි ඉදිරිපත් කළේ. අපි අදටත් ඒ දේ මත ක්‍රියාත්මක වෙනවා.

විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මේ දවස්වල ගොඩක් දෙනා කථා කරනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනසක් වෙන්න ඕනෑ, reforms සිදු වෙන්න ඕනෑ කියලා. නමුත් අපි දකිනවා මේ දවස්වල ඒ අයගේ අකුරට වැඩ කරන ව්‍යාපාරයක්. ඒ වාගේම වර්ජනයක් කරන බවත් කිව්වා. ඒ වාගේ තත්ත්වයකට ගියා. එතකොට අපිත් කල්පනා කළා මොනවාටද මේ වර්ජනය කරන්නේ කියලා. අපි දැක්කා, කලින් ලංකා විදුලිබල මණ්ඩලය කිසිම විද්‍යානුකූල පදනමක් නැතුව සමාගම් 12කට කඩන්න සැලසුම් කර තිබුණු බව. ඒක අපි බොහොම විද්‍යානුකූල විධියට ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම හා පද්ධති පාලනය කියලා සමාගම් හතරකට අරගෙන, ඊට අතිරේක සමාගම් දෙකක් එක්ක සේවක අයිතිවාසිකම් සුරකිමින් යනකොට, දැන් තිබෙන ගැටලුව මොකක්ද? ජනාධිපතිතුමාත් කියනවා, මේකේ ස්වාධිපත්‍යය ආරක්ෂා කරනවා කියලා. ශ්‍රී ලංකා විදුලිබල පනතේත් තිබෙනවා, සියයට සියයක් මේ සමාගම් හතරම රජය සතු වෙනවා කියලා. සම්ප්‍රේෂණය සියයට 50ක් විතරක් රජයට තිබෙන්නට ඕනෑ. එතැනදී තමයි සේවකයන් කලබල වෙන්නේ. සේවකයන්ව එළියට දමනවා කියලා ගැටලුවක් තිබුණා. සේවකයන් 12,000ක් ඉවත් කරන වැඩ පිළිවෙළක් තිබුණා. ඒ සියල්ල නැතුව, සියලු සේවකයන්ට ඒගොල්ලන්ගේ විශ්‍රාම වැටුප, එහෙම නැත්නම් සේවක අර්ථසාධක අරමුදල වැනි දැනට භුක්ති විඳින කිසිම වරප්‍රසාදයක් නැති කරන්නේ නැත කියන සහතිකය ලබා දීලා තිබෙනවා. ඒ සියල්ල එලෙසින් තිබෙනවාය කියනවා. එතකොට, ඒ අයව වර්ජනයට තල්ලු කළේ ඔබතුමන්ලාගේ unions. ඔබතුමන්ලා මෙහි reforms සිදු කරනවා කියපු කාලයේ අපි දැක්කා නේ. තැපැල වාගේම, මෙතැනත් ඔබතුමන්ලාගේ පක්ෂවලට සම්බන්ධ කණ්ඩායම් ඉන්නවා. අපි ඒකට කියන්නේ "සුන් බුන් විපක්ෂය" කියලා. අන්න ඒ නිසා තමයි, ඒ හැම තැනම සේවකයෝ අනාථ වුණේ. මොකද, එහෙම strike එකක් ඉස්සරහට ගෙනියන්න ශක්තිය නැහැ, ඒකට පදනමක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ නව සමාගම් හරහා, - මේ නව සමාගම් ගැන මෙතැන කියන කොට මෙතුමන්ලා කියනවා, පෞද්ගලික සමාගම් කියලා. ඒ පෞද්ගලික සමාගම් කියන අයට අපි කියනවා, මේවා සියයට සියයක් රජය සතු සමාගම් කියලා. දැනට පවතින සමාගම් (සංශෝධන) පනත නිවැරැදිව කියෙව්වා නම්, මම හිතන විධියට එහෙම කියන්න ඕනෑ නැහැ. ඒ වචන පවා highlight කරන්නේ, සේවකයන් කුලප්පු කරන්න. දැන් ඒ සේවකයන් ගොඩක් දුරට ඒ දේවල් තේරුම් අරගෙන තිබෙනවා.

ඒ වාගේම, මේ ආයතනයේ unionsවලට සම්බන්ධ තවත් කණ්ඩායම් ඉන්නවා. මේක අපි ලෝක පරිමාණයෙන් ගත්තොත්, union එකක් වශයෙන් ඉදිරිපත් කරන්න ඕනෑ සටන් පාඨවලදී ඉතා ග්‍රාම්‍ය ඒවා ඇහෙනවා. අපේ මන්ත්‍රීවරයෙක් smart grid එකක් ගැන කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ඒ smart grid එක එනකොට මේගොල්ලෝ කියනවා, ඒක එන්නේ "මනු කියවන්නා" තනතුර දරන අය ඉවත් කරන්න කියලා. ලෝකය ඉස්සරහට යන්න ඕනෑ. අපට ආයෙත් කුප්පි ලාම්පු යුගයට, බර කරත්ත යුගයට යන්නද කියන්නේ?

අනෙක් එක තමයි, සූර්ය විදුලි බලය. සූර්ය විදුලි බලය, සුළං විදුලි බලය තිබෙන්නට ඕනෑ. ඒවා පුනර්ජනනීය බලශක්ති. ඒවාට බාධා කරන්න යනවා. ඒ නිසා වඩා ශක්තිමත්ව, මේ කාර්යය ඉස්සරහට ගෙනියන්න තමයි මේ රජය අත ගහලා තිබෙන්නේ.

අස විදුලි බිල වැඩිවීම ගැන කථා කරනවා. තෙල් මිල ගැනත් කථා කරනවා නේ. 2024.08.31 දින වන විට රුපියල් 332ට තිබුණු පෙට්‍රල් ලීටරයක මිල දැන් රුපියල් 299යි. පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 33කින් අඩු වෙලා තිබෙනවා. Petrol 95 ලීටරයක මිල රුපියල් 36කින්, ඩීසල් ලීටරයක මිල රුපියල් 24කින්, super diesel ලීටරයක මිල රුපියල් 39කින්, භූමිතෙල් ලීටරයක මිල රුපියල් 17කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි විදුලි බිලත්. ගෘහස්ථව ගත්තාම, අඩුවෙන්ම පාවිච්චි කරන අයගේ විදුලි බිල රුපියල් 280ක් තිබුණු එක, 2025.01.18 ගාස්තු සංශෝධනය අනුව රුපියල් 195ට අඩු වෙලා තිබෙනවා. ඊට පස්සේ දෙවැනි ගාස්තු සංශෝධනයෙන් රුපියල් 215යි. අධි පරිභෝජනයක් තිබුණු අයට රුපියල් 60,160ක්ව තිබුණු විදුලි බිල රුපියල් 48,300ට අඩු වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

මට තව පොඩි කාලයක් ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පොඩි කාලයක්වත් දෙන්න අමාරුයි. තව තත්පර 30ක් විතරක් දෙන්නම්.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

මම අවසන් කරන්නයි හදන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට හැම කාරණයක්ම කියන්න වේලාව මදි නිසා කෙටියෙන් මේ ටිකත් කියන්නම්.

ඔබතුමන්ලා දන්නවා අද හෝටල් ක්ෂේත්‍රයේත්, කර්මාන්ත ක්ෂේත්‍රයේත් විදුලි බිල අඩු වෙලා තිබෙන බව. ඒ නිසා විදුලි බිල වැඩිවීම ගැන කථා කරන්නේ, රෙදි ඇඳගෙනද කියලාත් අහන්න හිතෙනවා. මොකද, ලංකා විදුලිබල මණ්ඩලය මේ තත්ත්වයට පත් කරපු අයම ඔහොම අහන කොට අපිට හිනා යනවා.

අවසාන වශයෙන් මම විශේෂ ඉල්ලීමක් විතරක් කරනවා. මේකේදී ගොඩක් අය කියනවා නේ "කංචනලා කළේ" කියලා. ඒ කරපුවා අපි දන්නවා. Rooftop solar panels කියලා ගැහුවා, නමුත් ඒකේ capacity බැලුවේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්. ඉක්මනින් කථාව අවසන් කරන්න.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මම විශේෂ ඉල්ලීමක් කරනවා. අපිට මේ වැඩේට බාධා කරන්න එපා. අපි කියපු හැමදේම කළා. අද ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා. අපනයන ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, සංචාරක ක්ෂේත්‍රයේ ආදායම, විදේශ ප්‍රේෂණ කියන ඔක්කොම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා ලංකා විදුලිබල මණ්ඩලය අපි ගොඩ දමනවා. හොඳට මතක තබා ගන්න, ලංකා විදුලිබල මණ්ඩලය අයිති ජනතාවට. ජනතාවටයි, සේවකයන්ටයි හැමෝටම ලංකා විදුලිබල මණ්ඩලය අයිතියි. ඒ නිසා තමයි අද ජනතාව තේරුම් අරගෙන තිබෙන්නේ, මේ විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ සටනේ කිසියම් හෝ සාධාරණත්වයක් නැහැ කියලා. ඒ නිසා අපි විපක්ෂයේ කණ්ඩායම්වලින් ඉතා ආදරයෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා ඔය කියන තත්ත්වය භූමියේ දීත් කරන්නම්. ඒකට බාධා කරන්න එපා. ඔබතුමන්ලා අතින් වෙච්ච වැරැදි ටික නිවැරැදි කරගෙන අපි ඉස්සරහට යනකොට, ඒකට සහයෝගය ලබා දෙන්න. ඒ කාර්යක්ෂමතාව, විනිවිදභාවය තුළ තමයි නැවත හදිසි මිලදී ගැනීම් නැති වෙන්නේ. අන්න ඒකට සහයෝගයට ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, it is very regrettable. මට විනාඩි දෙකයි; මෙතුමාට වැඩිපුර කාලය දුන්නා. මමත් වැඩිපුර ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වැඩියෙන් ගන්න පුළුවන්.

[අ.භා. 5.25]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
වැඩිපුර තත්පර 30ක් දෙන්න. ඒක, "කොහේද යන්නේ?" කියලා ඇහුවාම, "මල්ලෙ පොල්" කිව්වා වාගේ කථාවක්. Now, let me start my speech.

Sir, I also agree with this Motion. මේ ආණ්ඩුව එකවරම වෙනත් වෙනත් කථා කියනවා. මෙතැන පැහැදිලිවම තිබෙන්නේ මොකක්ද? සියයට 30ක අඩුවීමක් දෙන්න රජය පොරොන්දු වුණා. රජය දුන් ඒ පොරොන්දු නිසා තමයි, ජනතාව රජයට මේ බලය දුන්නේ. මේ, ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව කියන්නේ බිල්ලෙක්; ඒක නිකම් මවපු දෙයක්. ඒ මැවීම සඳහා රජයේත් වංක සහයෝගයක් තිබෙනවාද කියලා මට නිකම් සැකයක් තිබෙනවා. ඒකයි මේ දිගින් දිගටම එය සාධාරණීකරණය කිරීමට යන්නේ.

Sir, Sri Lanka, today, suffers a two-fold cost burden under the electricity sector, which is neither fair nor sustainable. First, our country remains locked into a coal dependency despite possessing an abundance of renewable resources such as solar power, wind power and hydropower. An invisible social cost and a cost due to polluted air, a damaged ecosystem and public health consequences, none of which are reflected in the CEB balance sheet, are borne by the people.

මේ රටේ සියලුම නිවෙස් සූර්ය බලශක්තිය නිෂ්පාදනය කරන වහළක් සහිත නිවෙස් කිරීමේ ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ කෝ? පාරිභෝගිකයා නිෂ්පාදකයා වීමේ අලුත් ක්‍රමවේදයක් තිබෙනවා. ඔබතුමන්ලා ඒවා දන්නේත් නැතුව ඇති. අද යන්නේ, "නිෂ්භෝගිකයා" කිරීමේ වැඩ පිළිවෙළක්. In English, he is called “prosumer”. I do not think that the Government even knows about such a concept. ඊළඟට, in an attempt to satisfy IMF conditionalities, the Government has imposed arbitrary electricity tariff hikes depending on a false calculation of loss, and the CEB, which was having a profit for six months, is suddenly showing a loss in order to make this price justification. The IMF demanded a cost-reflective pricing to stop fiscal leakage, but instead of reforming to reduce inefficiency or transitioning to a renewable energy, the Government took the easiest and the laziest path of passing the bill directly to the consumer.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. නමුත් ඔබතුමාට තවත් විනාඩියක් දෙන්න පුළුවන්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Thank you very much.

විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව ජනතාව පිට පටවන්න නොවෙයි, ජනතාව මේ ආණ්ඩුව බලයට ගෙනාවේ. நிச்சயமாக வாழ்க்கைச் சுமையை அதிகரிப்பதற்காக மக்கள் இந்த அரசாங்கத்தைக் கொண்டுவரவில்லை. Consumers need not pay higher tariffs because of costly coal imports or because the Government blindly implements IMF directives without social safeguards or policy flexibility.

Therefore, Sir, this is not a reform. What they are trying to do is to impose a punishment on the people. Families already crushed by inflation cannot also carry the burden of mismanagement of the CEB. Small industries which create jobs cannot compete with the energy cost that double overnight.

මේ සියල්ලක්ම, ඒ කියන්නේ විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් දැනට මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ දැක්කාම අපටත් පුදුම හිතෙනවා. ඇයි? ඇත්තටම මේ සම්පූර්ණ Motion එකේ තිබෙන්නේ, ජනතාව මත මේ pricing එක

පටවන්න එපා කියලා. Pricing formula එක හරියට බලන්න; විවෘත මනසින් බලන්න. ඒ pricing formula එක යටතේ ඔබතුමන්ලාට - මේ රජයට - කිසිම අයිතියක් නැහැ, මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් - PUCSL එකෙන් - විදුලි ඒකකයක් සඳහා නියම කරලා තිබෙන මිල ඉවත් කිරීමට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
අවසාන වශයෙන්, මේ කාරණය දේශපාලනීකරණය කර ගන්නේ නැතුව, ජනතාව මත පැටවිලා තිබෙන බර අඩු කිරීම සඳහා කටයුතු කරන ලෙසත්, විදුලි බිල වැඩි නොකරන ලෙසත් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.28]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் மின் கட்டண அதிகரிப்பு தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்திருக்கும் கௌரவ கபீர் ஹஷீம் அவர்களுக்கு இச்சந்தர்ப்பத்தில் மக்கள் சார்பாக நன்றிகூறக் கடமைப்பட்டு இருக்கின்றேன்.

இந்தப் பிரேரணையை முன்வைத்தபோது, ஆளுங்கட்சியினர் மின் கட்டணத்தைக் குறைக்க முடியாதெனக் கூறியதோடு, அதனை எப்படி குறைக்க முடியுமெனவும் வினா எழுப்புகிறார்கள். இவ்வாறு நீங்கள் கூறுவதும் வினா எழுப்புவதும் எங்களுக்கு ஆச்சரியமாகவும் வெட்கமாகவும் இருக்கின்றது. ஏனெனில், நீங்கள்தான் மின் கட்டணத்தை 30 சதவீதத்தால் குறைப்பதாக மக்களுக்கு வாக்குறுதி அளித்தீர்கள். இன்று சாதாரண ஏழை எளிய மக்களுடைய வீடுகள் உட்பட எல்லா வீடுகளிலும் electric உபகரணங்கள் பயன்படுத்தப்படுகின்றன. நாங்கள் மக்கள் சார்பாகத்தான் தெரிவுசெய்யப்பட்டு இங்கு வந்திருக்கிறோமே ஒழிய, industrial மற்றும் ஏனைய துறைகள் சார்பாக அல்ல. எனவே, சாதாரண மக்களுடைய அடிப்படைப் பிரச்சினைகளைத் தீர்ப்பதில் கவனம் செலுத்த வேண்டும். அவர்களுக்காவே நாங்கள் போராடுகின்றோம்; அவர்களுக்காகவே நாங்கள் குரல் எழுப்புகின்றோம். சாதாரணமாக ஒரு மாதத்துக்கு வருகின்ற 1,000 - 2,000 ரூபாய் மின் கட்டணத்தைக்கூட செலுத்த முடியாமல் மக்கள் அவதிப்படுகின்றார்கள். அக்கட்டணத்தைச் செலுத்தத்தவறும் பட்சத்தில், மின் இணைப்பைத் துண்டிக்கின்றார்கள். அதுமாத்திரமல்ல, அந்தக் கட்டணத்துக்கு interestஐயும் - வட்டியையும் - அறவிடுகின்றார்கள். 5,000 ரூபாய் அல்லது 2,000 ரூபாய் மின் கட்டண நிலுவைக்கும், மேலதிகமாக 3,500 ரூபாயை மீள் இணைப்புக் கட்டணமாக அறவிடுகின்றார்கள். இதனைத் தவிர்க்க வேண்டும்.

Solar panelஐப் பொருத்துவதற்குத் தனியார் நிறுவனங்கள் முன்வரும்போது, அதற்குரிய வசதி வாய்ப்புகள் அந்தப் பிரதேசத்தில் இல்லை என்று அங்கிருக்கின்ற உயர் அதிகாரிகள், பொறியியலாளர்கள் கூறுகின்றார்கள். இவ்வாறு தனியார் துறையினருக்குச் சந்தர்ப்பங்களை வழங்காமல், எவ்வாறு நீங்கள் இந்த நாட்டைக் கட்டியெழுப்பப் போகின்றீர்கள்? நீங்கள்தான் கூறினீர்கள், "நிலக்கரி கொள்வனவில் மோசடி இடம்பெறுகிறது; எரிபொருள் விடயத்தில் commission வாங்குகிறார்கள்; நாங்கள் ஆட்சிக்கு வந்தால் இவை எல்லாவற்றையும் நிவர்த்தி செய்வோம்" என்று. நீங்கள் ஆட்சிக்கு வந்த காலத்தில் இருந்து இன்றுவரை இந்த நாட்டில் வரட்சி ஏற்படவில்லை; நீர் தட்டுப்பாடு ஏற்படவில்லை. நீர்மூலம் மின்சாரத்தை உற்பத்தி செய்யக்கூடிய வாய்ப்புகள் இருந்தும்கூட, ஏன் மின் கட்டணத்தைக் குறைக்க முடியாதென நாங்கள் கேட்கின்றோம். மின்சாரத் துறைமூலம் மாத்திரம் இந்த நாட்டை நடாத்திச் செல்லலாம் என்ற விடயத்தைத் தவிர்த்து, ஏழை எளிய மக்களுக்கும் ஏனைய துறைசார்ந்த உற்பத்தியாளர்களுக்கும் நன்மைபயக்கும் வகையில், மின் பாவனையாளர்களுக்குச் சிறந்ததொரு தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும். இதன் அடிப்படையிலேயே இந்தப் பிரேரணை கொண்டுவரப்பட்டு இருக்கிறது. எனவே, இதனை ஏற்றுக்கொள்ள வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.31]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
වෙලාව තමයි ප්‍රශ්නය වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2025 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය ආවරණය වන පරිදි තමයි මෙම විදුලි බිල වැඩි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් PUCSL එකෙන් අවසර ඉල්ලා තිබෙන්නේ. 2025 අවසාන කාර්තුව සඳහා ජල පෝෂක ප්‍රදේශවල ප්‍රමාණවත් ජලාශ මට්ටම් මඟින් ලබා දෙන විදුලි උත්පාදනය ගිගාවොට් පැය 4,388ක් ලෙස පුරෝකථනය කර තිබෙනවා. ඇත්තටම ඒ පුරෝකථනය කරනකොට පවතින කාලගුණික තත්ත්වය අනුව තමයි ගණනය කිරීම් කරන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින්, ඉදිරි මාස තුන සඳහා සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් පුරෝකථනය කර තිබෙනවා. ප්‍රධාන ජල විදුලි බලාගාර සහ තාප විදුලි බලාගාරවල නඩත්තුව ඒ අනුව සැලසුම් කර තිබෙනවා. ඒ අනුව තමයි ඇත්තටම මේ නිර්ණය සිදු වන්නේ. එහෙම නැතුව ඒක කාටවත් හිතෙන විධියටම කරන්නත් බැහැ. සමහර වෙලාවට පුරෝකථනය සාර්ථක නොවෙන්නත් පුළුවන්. මේ දෙපැත්තම මෙහි තිබෙනවා.

මම මේ පිළිතුර කෙටියෙන් කියන්නම්, ගරු මන්ත්‍රීතුමනි. වියදම් ඇස්තමේන්තුවට ඉන්ධන පිරිවැය, ධාරිතා ගාස්තු සහ ණය ආපසු ගෙවීම් පිළිබිඹු වන අතර, උමා ඔය ව්‍යාපෘතියේ ප්‍රමාද ගාස්තු, විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය, ව්‍යාපෘති කළමනාකරණය සහ 2025 වසර සඳහා රක්ෂණ සංචිත සඳහා අමතර ප්‍රතිපාදන ද ඇතුළත් වේ.

2025 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුන සඳහා ලංවිම බෙදා හැරීමේ බලපත්‍රලාභීන් හතරදෙනාගේ වියදම් අනුව තමයි මේ පුරෝකථනය කරලා තිබෙන්නේ.

පවතින අය ක්‍රමය යටතේ 2025 අවසාන කාර්තුවේ ආදායම රුපියල් මිලියන 112,372ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, කාර්තුව සඳහා මුළු පිරිවැය රුපියල් මිලියන 125,377ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. Tariff methodology එක අනුව කාර්තුවේ පාඩුව හෝ ලාභය මෙම කාර්තුවට ගැළපීමට අවශ්‍ය වේ.

ඒ කියන්නේ, "P-2" ලෙස කාර්තු දෙකක් පිටුපසට අරගෙන තමයි ඒකේ ලාභය හෝ පාඩුව මේකට ගළපන්න ඕනෑ. එහෙම නැතුව නිකම් ඉලක්කම් කිව්වාට හරියන්නේ නැහැ. ඒකට methodology එකක් තිබෙනවා.

ඒ අනුව එම අනුරූප කාර්තුව වන්නේ, 2025 දෙවන කාර්තුව වන අතර, එම කාර්තුවේදී රුපියල් මිලියන 5,311ක ඇස්තමේන්තුගත ව්‍යවස්ථාපිත ලාභයක් වාර්තා විය. එයට ප්‍රධාන හේතුව වන්නේ වර්ෂාපතනය වැඩි වීමයි. ඒ ලාභයත් එක්ක තමයි රුපියල් මිලියන 7,994ක් විධියට අලුත් ගණනක් පාඩුව විධියට පෙන්නුම් කරන්නේ. ඒක තමයි සියයට සියයට 6.8ක හිඟයක් කියලා පෙන්වා තිබෙන්නේ.

ඉදිරි වසර 5 තුළ විදුලි ගාස්තුව සියයට 30කින් අඩු කරන්න රජය විධියට අපි තීරණය කරලා, ඒක අරමුණු කරගෙන වැඩ කරගෙන යනවා. විදුලි ගාස්තුව සංශෝධනය කරන්න නෛතික බලය තිබෙන්නේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට. ඒ සඳහා ඔවුන් ඒ අවශ්‍ය දත්ත අරගෙන කටයුතු කරනවා. අපේ බලශක්ති අමාත්‍යාංශයේ කිසිම මැදිහත්වීමකින් තොරව තමයි ඒ කටයුත්ත කරන්නේ. ඒ හින්දා අපි ඒ තීරණය ලැබෙන තුරු බලාගෙන ඉදිමු.

මෙතැනදී විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, පසුගිය කාලය තුළ සිදුවිය යුතු විද්‍යාත්මක හා ධනාත්මක වෙනස්කම් ඒ කාලය තුළ පැවති ජරාජීර්ණ පාලන තන්ත්‍ර තුළ සිදු නොවී, පැවති ආණ්ඩු වාගේම බංකොලොත්භාවය කරා ළඟා වෙමින් පවතින තවත් ආයතනයක පුරෝකථන මත පදනම්ව කරන ලද ඉල්ලීමක් ගැනයි මේ ප්‍රශ්න කරන්නේ කියන එක. තරගකාරිත්වය ඇති කරන්න කියලා සජබයේ හෝ රනිල්-රාජපක්ෂලාගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ද ජනතාව අප බලයට පත් කළේ? මට ඇහුණා මීට කලින් සජබයේ මන්ත්‍රීවරයෙක් අපෙන් අහනවා, සියයට සියයක් රජයට අයත් සමාගම් හැදුවේ ඇයි, විදුලිබල පනත සංශෝධනය නොකරම හිටියා නම් හරි නේ කියලා. ඔව්, එහෙම හිටියා නම් ඇත්තටම ඉතින් ඒගොල්ලන්ගේ ප්‍රතිපත්ති තමයි ක්‍රියාත්මක වෙන්නේ. එහෙම නම් ඒ විනාශකාරී ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම පමණයි වෙන්නේ. මම අහන්නේ, එහෙමද ආසා කරන්නේ කියලායි. හැබැයි, මේ විපක්ෂ වෘත්තීය සමිති අතකොළු නම් කොළඹ නගරයේ පාරට බැහැලා කෑ ගහන්නේ ලංවිම වික්කා, ලංවිම පෞද්ගලීකරණය කළා කියලායි. මෙතැනදි නායකයෝ එකක් කියනවා, පාරෙදි ගෝලයෝ තව එකක් කියනවා. ඇත්තටම ඒ විධියට තමයි රටේ ජනතාවත්, සේවකයනුත් රවටාගෙන ඉන්නේ. දේශපාලනය කියන්නේ ඇත්තටම ඒකද කියලා මම අහන්න කැමැතියි.

අවුරුදු 77ක් පුරා අසාර්ථකභාවය, බංකොලොත්භාවය ප්‍රායෝගිකව සහතික කර රටත්, ජනතාවත් කබලෙන් ළිපට දමපු, රජයේ සම්පත් කාබාසිනියා කරපු ප්‍රතිපත්ති අපි කොහෙත්ම ක්‍රියාත්මක කරන්නේම නැහැ. අපි බලශක්ති ක්ෂේත්‍රය වාගේම එහි නියැළී සිටින සියලු සේවකයින් ආරක්ෂා කිරීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකනවා. විශේෂයෙන්ම ලංවිම තුළ විශාල දෛනික පිරිවැටුමක් පැවතියද, ක්‍රමවත් මූල්‍ය කළමනාකරණයක් හෝ මානව සම්පත් කළමනාකරණයක් නොමැතිව හැම දෙයක්ම එක් තාක්ෂණික වෘත්තීය කණ්ඩායමක් යටතේ පමණක්ම කළ යුතුය යන මුග්ධ මතයක සිට කටයුතු කරන ඉතා සුළු පිරිසක් නිසා එම ආයතනය වැටී ඇති තත්ත්වයෙන් ගොඩ ගැනීම අපේ වගකීමක් වනවා. ඒ අනුව මෙච්චර කල් නොකරපු challenge එකක් අපි භාරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔව්, අපි එය අනිවාර්යයෙන්ම ඉටු කරනවා. එහෙම නැතිව ඔය විටින් විට කරනු ලබන මිල වැඩි කිරීමේ ඉල්ලීම්වලට අපි කලබල විය යුතු නැහැ. අපි බලයට පත් වූ විගසම සියයට 38ක වැඩිවීමක් ඔය වාගේම ඉල්ලුවා. නමුත් තවම අපි බලයට පත්වීමට පෙර තිබිච්ච මිලටත් වඩා සියයට 5ක් අඩුවෙන් විදුලි බිල නඩත්තු කරගෙන යනවා. ඒ වාගේම අපි විදුලිබල ක්ෂේත්‍රය සංවර්ධනය කරනවා. අපි ඉස්සරහට විදුලිය ඒකකයක් මිලදී ගැනීම ඩොලර් ශත 5 දක්වා සීමා කරන්න කටයුතු කරගෙන යනවා. ඒ විධියට තමයි අපි මේ කටයුතු කරන්නේ. මේක දවසෙන් කරන්න බැහැ. අවුරුදු 19ක්, 20ක් රුපියල් 37ට විදුලිය unit එකක් මිලදී ගත් රටක තමයි අපි මේ ජීවත් වෙන්නේ. එම නිසා රුපියල් 17ට, 18ට විදුලිය ඒකකයක් දෙන්න දැන්මම අපට බැහැ. ඒකට අපි ඉස්සෙල්ලා ගන්න ඒවායේ මිල අඩු කරන්න ඕනෑ.

විපක්ෂයේ පරණ සාමාජිකයින් අලුත ඉපදුණා වාගේ තමයි දැන් මේ කථා කරන්නේ. ඒගොල්ලන් ගත්ත වැරදි තීරණ ක්‍රියාත්මක කිරීම නිසා තමයි මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ. පුනර්ජනනීය බලශක්තියෙන් නිපදවන unit එකක් වැඩිම අරන් තිබෙන්නේ රුපියල් 37ට. *[බාධා කිරීමක්]* පුනර්ජනනීය බලශක්තියෙන් නිපදවන විදුලිය ඒකකයක් මිලදී ගන්නා මිල අඩු කරනකොට මෙතැන කෑ ගහනවා, ඔන්න solar ව්‍යාපෘති කඩා වට්ටනවා කියලා. හරි නේ. *[බාධා කිරීමක්]* ඊට පස්සේ කියනවා, මිනිස්සුන්ට දෙන විදුලිය ඒකකවල මිල අඩු කරන්න කියලා. මම මේ මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, අපි කොහේද මිනිසුන්ව ගහලා එළෙව්වේ කියලා. *[බාධා කිරීමක්]* කාවද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. බොරු කියන්න එපා. බොරු කියන්න එපා. ඒ වාගේම මේ මන්ත්‍රීතුමා තව චෝදනාවක් කළා, solar panels ගහන්න එනකොට ව්‍යාපාරිකයන්ව එළවනවා කියලා. මට නම් එහෙම සිද්ධියක් වාර්තා වෙලා නැහැ. ඒ වාගේ බොරු කියන්න එපා. මෙහෙමයි. බොරු කියන්න පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරන්න එපා. එම ඉල්ලීම මම කාරුණිකව කරනවා. මේක ඇතුළේ විතරයි ඔබතුමන්ලාට බොරු කියන්න පුළුවන් වන්නේ. පුළුවන් නම් ඔය දේවල් එළියට ගිහිල්ලා කියන්න බලන්න. *[බාධා කිරීමක්]* ගරු අර්චුනා මන්ත්‍රීතුමා, මේක ඇතුළේ බොරු කියන්න එපා. අපි උදේ 9 සිට සවස 7 වෙනතුරු මෙතැන ඉන්නවා. මම ආවේ මන්නාරමේ ඉඳලා. කොහේ හරි එහෙම තිබෙනවා නම් videos පෙන්වන්න. අපි අභියෝග කරනවා පුළුවන් නම් පෙන්වන්න, අපි බයේ පැනලා ගියා කියලා. අපි මිනිස්සු එක්කයි දේශපාලනය කරන්නේ. ඒ නිසා මේ වාගේ බොරු කියන්න එපා. විපක්ෂය හැමදාම තනිකරම කියන්නේ මේ වාගේ දේවල්. ඔබතුමන්ලා විදුලි බිල අඩු කරනකොටත් කෑ ගහනවා, වැඩි කරනකොටත් කෑ ගහනවා, නිෂ්පාදන මිල අඩු කරනකොටත් කෑ ගහනවා. *[බාධා කිරීමක්]* ඒ විධියට දේශපාලනය කරන්න එපා. ඒ වාගේ පීචං දේශපාලනය කරන්න එපා කියා මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.39ට, 2025 සැප්තැම්බර් 26 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.39க்கு, பாராளுமன்றம் 2025 செப்ரெம்பர் 26, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.39 p.m. until 9.30 a.m. on Friday, 26th September, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.